# බස්නාහිර පළාතේ පළාත් සභාව

## மேல் மாகாண மாகாண சபை

## WESTERN PROVINCE PROVINCIAL COUNCIL

**2018 දෙසැම්බර් 06 වන බ්‍රහස්පතින්දා**

2018மார்கழி 06 வியாழக் கிழமை

Thursday 06th December 2018

**බත්තරමුල්ල , ශ්‍රී ජයවර්ධනපුර , ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, අංක 204 (12 වන මහල) හි පිහිටි බස්නාහිර පළාතේ පළාත් සභාවේ සභා ශාලාවේදී පැවැති සභා රැස්වීම**

பத்தரமுல்ல ,ஸ்ரீ ஜயவர்த்தனபுர ,டென்சில் கொப்பேகடுவ மாவத்தை இலக்கம் 204(12ஆம் மாடி) இல் அமைந்துள்ள மேல் மாகாண மாகாண சபையின் கட்டடத் தொகுதியின் கூட்ட மண்டபத்தில் நடைபெற்ற சபைக் கூட்டம்.

Council meeting was to be held at the Council Hall located in the 12th floor of Western Province Provincial Council at No.204, Denzil Kobbekaduwa Mawatha, Sri Jayawardhanapura, Battaramulla.

**පූ.භා .09.11 ට පළාත් සභාව රැස් විය.**

மு.ப. 09.11 க்கு சபை கூடியது

*The Provincial Council met at 09.11 a.m.*

**ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනාරූඪ විය.**

*திரு .தவிசாளர் [ சுனில் விஜேரத்ன அவர்கள்] தலைமை வகித்தார்.*

*Mr. Chairman [ Sunil Wijerathne ] in the Chair*

# සභාපතිවරයාගේ නිවේදන

## ANNOUNCEMENTS OF CHAIRMAN

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

*i*

*“හෙට දින එනම්, 2018.12.07 වන දින පැවැත්වීමට නියමිත සෞඛ්‍ය සායනය සම්බන්ධයෙන් කොළඹ ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයෙන් නිකුත් කළ පත්‍රිකාවක් අද දින ගරු ඔබතුමන්ලාගේ සභා මේසය මත තබා තිබෙනවා. ඊට සහභාගී වීමට අදහස් කරන ගරු මන්ත්‍රීවරුන් එහි සඳහන් උපදෙස් අනුව කටයුතු කර අවශ්‍ය සායන පහසුකම් ලබා ගන්නා ලෙස ඉතාමත්ම කාරුණිකව ඔබතුමන්ලා වෙත දැනුම් දෙනවා.”*

*ii*

*“ආසන පිළිවෙල යම් වෙනස් වීමකට ලක් වී තිබෙනවා.*

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගරු සභාපතිතුමනි, ඉල්ලීමක් කරනවා. මේ බජට් එක පටන් ගත්තේ හතර, පහ, හය සහ හත. මේ Budget එකට ඉඳගත්ත තැන එක එක දවසේ එක එක්කෙනා එහාට මෙහාට cross කෙරුවා කියලා, ඒක වෙනස් කරන්න එපා ගරු සභාපතිතුමනි. ඊළඟට තිබෙන සභාවට වෙනස් කෙරුවාට කමක් නැහැ. අපේ මේ අභිකුණ්ඨකයෝ වාගේ එක දවසක එක තැනක ඉඳගන්නවා. තව තැනක හෙට ඉඳගන්නවා. තව දෙන්නෙක් හෙට ගියොත් තව තැනකට යයි. මේකේ තේරුම මොකක්ද ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒක තමයි සම්ප්‍රදාය. මේකේ සම්ප්‍රදාය ඒකයි.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

සම්ප්‍රදාය හරි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට ආසනය තිබෙනවා නේ? ඔබතුමා දැන් ඉදිරිපෙළ ආසනයේ නේ.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

සම්ප්‍රදාය හරි. අපි හතර, පහ, හය සහ හත යන දවස් හතර කියලා බජට් එකට දවස් හතරක් වෙන් කර ගත්තා නම් ඒ දවස් හතර ඉඳලා ඊට පස්සේ මාරු කරන්න. ඒක තමයි සම්ප්‍රදාය.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හැමදාම මේ අපි කරපු දේ. අද ඊයේ නොවෙයි. මේ පළාත් සභා ක්‍රමය ආරම්භයේ ඉඳලාම අනුගමනය කළ ක්‍රමය -

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

හෙට තව දෙන්නෙක් මෙහෙට ආවොත් එහෙම ආයේ අතනට යන්න ඕනෑ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එක්සත් ජාතික පක්ෂයට ගිය නිසා ඒ දෙන්නාට අසුන් පැනෙව්වා.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

හරි. හෙට දෙන්නෙක් මෙහෙට ආවොත් මොකද වෙන්නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අපි -

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

හෙට දෙන්නෙක් මෙහෙට ආවොත්, අපි ආයේ හෙට අතනට යනවාද? හෙට උදේට.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒක කරන්න සිද්ධ වෙනවා.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ඒක තමයි. ඒක වැරැදියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා කළබල වෙන්න එපා.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ඉන්න තැන ඉඳගන්න දීලා මේ Budget එක ඉවර වුණාට පස්සේ ඊළඟ සභාව එනවා නේ? ඊළඟ සභාවට වෙනස් කරන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට උසස්වීමක් ලැබිලා තිබෙන්නේ. ඔබතුමා දැන් මුල් පේළියේ.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

උසස්වීම නොවෙයි වෙලා තිබෙන්නේ. සම්ප්‍රදාය නොවෙයි. හෙට ඒ පැත්තෙන් තුන්දෙනෙක් මෙහෙට ආවොත් අපි ආයේ අතනට යන්න ඕනෑ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒක තමයි ක්‍රමය.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

එහෙම නැහැ. අපි ඉල්ලීමක් කළා නේ? අපි ඔබතුමාටත් ඉල්ලීමක් කළා. ලේකම්තුමාටත් ඉල්ලීමක් කළා. ලේකම්තුමා ඊයේ ප්‍රකාශ කළා, ආණ්ඩු පක්ෂය වෙනස් කරන්නේ නැහැයි කියලා. ආණ්ඩු පක්ෂය වෙනස් කරන්නේ නැහැයි කියලා ඊයේ කිව්වා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නමුත් මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමා අපි අද ඊයේ නොවෙයි, මේ Budget එකට විතරක් නොවෙයි.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ඒක හරි. අපි පිළිගන්නවා. ගරු සභාපතිතුමනි, වෙන දවසක කෙරුවාට කමක් නැහැ. සම්ප්‍රදාය තිබෙන්න ඕනෑ Budget එක ඉවර වුණාට පස්සේ හරි විධියට වෙනස් කරන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

Budget එක ඉවර වුණා කියලා එහෙම එකක් නැහැ. Budget එක ඉවර වෙනකන් බලා ඉන්න එකක් නොවෙයි. ඒ කරනදේ අපි කරන්න ඕනෑ. අනික් ගරු මන්ත්‍රීවරුන්ට අසාධාරණයක් සිදු වෙනවා නේ?

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

එහෙමනම් ගරු සභාපතිතුමා පොතේ විධියටම යමු කෝ? වෙනස් කරන්න අපටත් කියන්න එපා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මොකක්ද?

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

සම්ප්‍රදාය විධියටම, රීතිවල තිබෙන විධියටම එහෙම නම් සභාව යමු.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි. හරි. ප්‍රශ්නයක් නැහැ. මම උපරිම උත්සාහ කරනවා. මොකද අපි රීති පොත අමාරුවෙන් හැදුවේ. අවුරුදු ගණනාවක් මහන්සි වෙලා තමයි අපි රීති පොත හැදුවේ. ඒ සඳහා මන්ත්‍රීවරුන් සහාය දෙන්න ඕනෑ. රීතිවලට අභියෝග කිරීම නොවෙයි තිබෙන්නේ. සභාවට. මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමා, මම මෙහෙම කිව්වාට සමාවෙන්න.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගරු සභාපතිතුමනි, එහෙමනම් ගණපූරණය නැහැ. කරුණාකරලා ගණපූරණය සලකලා මේකත් කරන්න. ගණපූරණය සම්බන්ධයෙන් අවධානය යොමු කරන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර සීනුව නාද කරන්න. ඔබතුමන්ලාට ඕනෑ න්‍යාය පත්‍රයට යන්න බැහැ. සභාවේ යන න්‍යාය පත්‍රයක් තිබෙනවා.

මෙම ගරු සභාව ගණපූරණය සම්පූර්ණ වනතුරු කල් තබනවා.

***එවලේ සභාවේ ගණපූරණය නොමැති බව පෙනී ගියෙන් ගරු සභාපතිතුමා විසින් කැඳවීම් සීනුව නාද කරවීමට නියෝග කරන ලදී. පසුවද, ගණ පූරණය ඇති නොවූ බැවින්, පූ.භා. 09.20 ට පළාත් සභාව තාවකාලිකව අත්සිටුවන ලදින්, පූ.භා. 09.38 ට යළිත් රැස් විය.***

*At that juncture, having observed that the Council was in want of quorum, summoning bells were ordered to be rung by Hon. Chairman. Later on even the quorum being incomplete, Provincial Council, having temporarily suspended at 9.20 a.m., assembled again at 09.38 a.m.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

*ii*

*"ආසන පිළිවෙල යම් වෙනස්වීමකට ලක් වී තිබෙන තිබෙනවා. ඒ සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීවරුන් වෙත යම් අපහසුතාවයක් ඇති වී නම් ලිඛිතව මා වෙත හෝ සභා ලේකම්තුමා වෙත දැනුම් දීමක් කරන ලෙස කාරුණිකව ඉල්ලා සිටිනවා. ඉදිරියේදී ඒ පිළිබඳව සුදුසු පරිදි අවශ්‍ය කටයුතු කරන බව කාරුණිකව දැනුම් දෙනවා."*

# වාර්ෂික මුදල් ප්‍රකාශය - 2019

ANNUAL FINANCIAL STATMENT - 2019

***[අවිච්චින්නව - 2018.12.05]***

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මීළඟට 2019 වාර්ෂික මුදල් ප්‍රකාශයේ සඳහන් ප්‍රදානයන් පිළිබඳව සලකා බැලීමට මෙම සභාව පූර්ණ කාරක සභාවක් බවට පත් වෙනවා.

***ඊට අනුකූලව පළාත් සභාව පූර්ණ කාරක සභාව බවට පරිවර්තනය විය.***

*Accordingly, the Provincial Council resolved itself into a Committee of the whole Council.*

## පූර්ණ කාරක සභාව

COMMITTEE OF THE WHOLE COUNCIL

| | | |
|---|---|---|
| **ශීර්ෂ අංක 106** | **-** | **කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග, ධීවර, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සහ ගොවිජන සංවර්ධන අමාත්‍යාංශය** |
| **ශීර්ෂ අංක 117** | **-** | **කෘෂිකර්ම දෙපාර්තමේන්තුව** |
| **ශීර්ෂ අංක 118** | **-** | **ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව** |
| **ශීර්ෂ අංක 119** | **-** | **වාරිමාර්ග දෙපාර්තමේන්තුව** |
| **ශීර්ෂ අංක 120** | **-** | **සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව** |
| Head No 106 | - | Ministry of Agriculture, Land, Irrigation, Fisheries, Animal Production and Health and Agrarian Development |
| Head No 117 | - | Department of Agriculture |
| Head No 118 | - | Land Commissioner's Department |
| Head No 119 | - | Department of Irrigation |
| Head No 120 | - | Department of Animal Production and Health |

***ශීර්ෂ අංක 106, 117, 118, 119 හා 120 යන ශිර්ෂවලින් රුපියල් 10/- බැගින් කපා හැරිය යුතු යැයි යූ. ජෝර්ජ් පෙරේරා - විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා විසින් 2018.12.05 වන දින ඉදිරිපත් කරන ලද ප්‍රශ්නය යළිත් සභාභිමුඛ කරන ලදී.***

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මෙම අවස්ථාවේදී පළාත් සභාව පූර්ණ කාරක සභාවක් බවට පත් වෙනවා. ඒ අනුව කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග, ධීවර, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සහ ගොවිජන සංවර්ධන පිළිබඳ වැය ශීර්ෂයන් එනම් ශීර්ෂ අංක, 106, 117,118, 119 සහ 120 යන වැය ශීර්ෂ සම්බන්ධ විවාදය ඊයේ එනම් 2018.12.05 වන දින ප.ව. 06.33 ට අවසන් වුණා. දැන් වේලාව පෙ.ව. 09.41 යි. මෙතැන් පටන් විවාදය ආරම්භ කිරීමට තිබෙන්නේ. ඒ අනුව මම ආණ්ඩු පක්ෂය වෙනුවෙන් මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව. ඔබතුමාට විනාඩි 07 ක කාලයක් ලබා දෙනවා. විනාඩි 30 ක් විතර අපතේ ගියා.

[පූ.භා.09.41]

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු සභාපතිතුමනි, ඔබතුමාට ස්තූතිවන්ත වෙනවා, ශීර්ෂ අංක, 106, 117,118, 119 සහ 120 යටතේ වචන කිහිපයක් කථා කරන්න අවස්ථාව ලබා දීම ගැන. මේක දීර්ඝ විෂයයක්. දැවැන්ත විෂයයක්. මම හිතන්නේ පළාත් සභාව ඇතුළේ වැඩියෙන්ම මුදල් වියදම් කරන්න ඕනෑ විෂයය. නමුත් ඒ තරම් මුදලක් වාර්ෂිකව ලැබෙන්නේ නැහැ. කොහොම වුණත් අපේ කොළඹ දිස්ත්‍රික්කයට තිබෙන එකම ඇමතිකම මේ කෘෂිකර්ම ඇමතිකම. අපි මේ අමාත්‍යාංශය පිළිබඳව සතුටු වෙනවා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඇයි මහ ඇමති?

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ඔව්. මහ ඇමතිකම මුළු පළාතටම තිබෙනවා. දිස්ත්‍රික්කයටම තිබෙන්නේ මෙච්චරයි. කෘෂිකර්ම ඇමතිතුමා බොහොම සංවේදී ඇමතිවරයෙක්. බොහොම සමීපව කටයුතු කරන කෙනෙක්. ප්‍රශ්න අහන කෙනෙක්. ප්‍රශ්න සොයා බලන කෙනෙක්. ක්ෂේත්‍රයට ගිහිල්ලා ප්‍රශ්න විසඳන්න උත්සාහ කරන කෙනෙක්. එතුමා කෘෂිකර්ම විෂයයකට වාගේ ලැබීම මම හිතන්නේ ගොවියන්ගෙත්, මහජන නියෝජිතයන් විධියට ගොවියන්ට උපකාර කරන අපෙත් වාසනාවක් විධියට අපි සලකනවා. එතුමා වාගේම එතුමාගේ පෞද්ගලික කාර්ය මණ්ඩලය, එතුමාගේ රාජ්‍ය නිලධාරීන් කණ්ඩායම ඒ සියල්ලම එකතු වුණාට පස්සේ කෘෂිකර්මයට විශාල වැඩක් කරන්න පුළුවන්කම තිබෙනවා. එතුමා වාසනාවන්ත වෙලා තිබෙනවා, එවැනි නිලධාරීන් පිරිසක් හරහා තමන්ගේ අමාත්‍යාංශයෙන් ලොකු සේවාවක් කෘෂිකර්මාන්තයට කරන්න.

කෘෂිකර්මය කියලා කියන්නේ, අපේ රටේ සංවර්ධනය කළ හැකි ක්ෂේත්‍රයක් විධියට තමයි අපි සලකන්නේ. ඓතිහාසිකවත් මේ රට කෘෂිකාර්මික රටක්. කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ කෘෂිකාර්මික නිෂ්පාදන සංවර්ධනය කිරීම තුළ තමයි අපට ආර්ථික වශයෙන් විශාල සහනයක් ලබන්න පුළුවන් වන්නේ. අපි විශ්වාස කරනවා, මැතක සිට තාක්ෂණික වශයෙන් අපේ රට සංවර්ධනය කරන්න පුළුවන් කියලා. නමුත් අපි තවමත් විශ්වාස කරන්නේ, කෘෂිකාර්මික ක්ෂේත්‍රය සංවර්ධනය කිරීම තුළ, කෘෂිකාර්මික නිෂ්පාදන සංවර්ධනය කිරීම තුළ මේ නිෂ්පාදන ආර්ථිකය සංවර්ධනය කරන්න පුළුවන් කියන විශ්වාසය තමයි අපට තිබෙන්නේ. මේ සඳහා ගරු ඇමතිතුමා වැඩ පිළිවෙළවල් රාශියක් කරලා තිබෙනවා. ඒ වැඩ පිළිවෙළවල් එකින් එක කියන්න වෙලාවක් නැහැ. විනාඩි 04 යි ඔබතුමා කියලා තිබෙන්නේ. මේ සියල්ල නතර කරලා මම කැමැතියි ගරු ඇමතිතුමාට මතක් කරන්න. ඔබතුමාගේ අමාත්‍යාංශය යටතේ කරන වැඩ කටයුතු සියල්ල කරගන්න පුළුවන් කටයුතුවලදී යම් බාධාවක් වී තිබෙන කාරණාව මතක් කරලා මගේ කථාව හමාර කරන්න. ඒ තමයි කෘෂිකර්ම උපදේශකවරුන්ගේ ගැටලුව. විශේෂයෙන් ගරු සභාපතිතුමනි, මහ කන්නය ආරම්භ වෙලා තිබෙන මේ කාලයේ බස්නාහිර පළාතේ ගොවි ජනතාවට අවශ්‍ය තාක්ෂණික දැනුම ගෙන යන කෘෂිකාර්මික උපදේශකවරුන් තමන්ගේ සේවාවලින් ඈත් වී සිටීම ගොවියන්ට බලපාලා තිබෙන බරපතළ ගැටලුවක් බවට පත් වෙලා තිබෙනවා. මම විශ්වාස කරනවා. ගරු ඇමතිතුමා මැදිහත් වෙලා මේ කාරණාව විසඳන්නත් ඉදිරි කාලයේදී කටයුතු කරයි කියලා. අපි දන්නවා 2014 වර්ෂයේ පළාත් සභාවේ කෘෂිකර්ම අමාත්‍යාංශය මඟින් තීරණයක් ගත්තා, කෘෂිකාර්මික දත්ත පද්ධතියක් සැලසුම් කරන්න. 2013 වර්ෂයේ ජාතික කෘෂිකාර්මික සංගණනයේදී මෙවැනි තොරතුරු පත්‍රිකාවක් අරගෙන ඇවිල්ලා, මේ දත්ත පද්ධතිය එකතු කිරීම ආරම්භ කරනු ලැබුවා. නැවත වතාවක් 2014 දීත් මේ කටයුත්ත කෙරුවා. අපට මතකයි අපි පළාත් කෘෂිකර්ම උපදේශක කාරක සභාවේදීත් මේ දත්ත පද්ධතිය ගැන සමහර කටයුතු කරන්න තොරතුරු

අහලා තිබෙනවා. ඒ නිසා ගරු ඇමතිතුමා පත් වුණු අසීරුතාවත් එක්කම වෙන්න ඇති ඒ තොරතුරු දත්ත පද්ධතිය ස්ථාපිත කිරීමේ ආරම්භය සනිටුහන් කරනු ලැබුයේ. හැබැයි, මේකට නිලධාරීන් පුහුණු කෙරුවා. රාජ්‍ය නොවන සංවිධානවල සහයෝගය ගත්තා. මේ සියල්ල අවුරුදු තුනක් තිස්සේ කෙරුණත්, ඒ කටයුත්ත නිවැරැදිව නොවුණු නිසා කෘෂිකර්ම උපදේශකවරුන්ට මේ කටයුත්ත භාර දුන්නා. මම හිතන්නේ, ඒ අයට තිබෙන අසීමිත වැඩ කන්දරාවත් එක්ක මේ කටයුත්ත දරාගන්න බැරිව යම් අරගලයක්, යම් ගැටුමක් අමාත්‍යාංශයත් එක්ක පටන් ගත්තා. එහි අවසාන ප්‍රතිඵලය විධියට තමයි මේ කෘෂිකර්ම උපදේශකවරුන්ගේ වෘත්තීය ක්‍රියාමාර්ග ආරම්භ කරනු ලැබුයේ. අපි දන්නවා, කෘෂිකර්ම අමාත්‍යාංශයේ ඉන්න ලේකම්තුමා ඉතාම හොඳ නිලධාරියෙක්. බොහොම යහපත් නිලධාරියෙක්. මේ ක්ෂේත්‍රය දිහා බොහොම අවබෝධයෙන්, ප්‍රබෝධමත්ව බලන කෙනෙක් සහ මේ ක්ෂේත්‍රයෙහි වෙහෙසිලා වැඩ කරන කෙනෙක්. එතුමා කෘෂිකර්ම නිලධාරීන්ගේ ප්‍රශ්නය කථා කරන්න 2018.10.15 කළුතර කෘෂිකර්ම උපදේශක කාර්යාලයට ගිය වෙලාවේ යම් ප්‍රශ්නයක් මතු වුණා. මම හිතන්නේ කෘෂිකර්ම ලේකම්තුමාට යම් සිත් වේදනාවක් ඇති වෙන්න ඇති. එහෙම වෙන්න පුළුවන්කම තිබෙනවා. ඒ උපදේශකවරු සහ ලේකම්තුමා අතර හට ගත්ත ගැටුම නිසා තමයි මේ වෘත්තීය ක්‍රියාමාර්ගයකට ගියේ. අපි දන්නවා. යම් ප්‍රශ්නයක් මතු වුණාට පස්සේ දෙපැත්තක් එකම විධියට දිගින් දිගට ගැටෙන්න ගියොත් ඒ ප්‍රශ්නය නිරාකරණය කරගන්න බැරිව යනවා. ඒ නිසා යම් කෙනෙක් පස්සට අඩියක් තියන්නම ඕනෑ.

ඒ නිසා අපි විශ්වාස කරනවා, ලේකම්තුමා යම් අඩියක් පිටුපසට තියලා මේ නිලධාරීන්ගේ ප්‍රශ්නය විසඳන්න කටයුතු කරයි කියලා. එහෙම වුණොතින් මම හිතන්නේ වර්තමානයේ කෘෂිකර්ම ක්ෂේත්‍රයට බලපාලා තිබෙන ප්‍රශ්න, ගැටලු රාශියක් විසඳගන්න පුළුවන්කම තිබෙනවා. කෘෂිකර්ම උපදේශකවරුන්ගේ ඇත්තටම විදේශීය සංචාර, ඒ වාගේම ඔවුන්ට ගෙවන අතිකාල දීමනා වාගේ දේවලුත් නතර වෙ‍ගෙන යනවා, මේ ප්‍රශ්න තව තවත් ඉදිරියට යාමෙන්. මේක ආපස්සට හරවන්න කියලා අපි ඉල්ලා සිටිනවා. ලබන අවුරුද්දේවත් නිසියාකාරයෙන් සේවය ලබලා දෙන්න. දැන් මහ කන්නයේ වගාව ආරම්භ කරලා තිබෙන්නේ. දැන් මහ කන්නයේ ගොයම් වගාව ආරම්භ කරලා තිබෙන්නේ. වී වගාව ආරම්භ කරලා තිබෙන්නේ. මේකට දැන් තාක්ෂණික දැනුම, තාක්ෂණික උපදෙස් අවශ්‍ය කරන වෙලාව. ඒ නිසා මේ කෘෂිකර්ම උපදේශකවරුන්ගේ ගැටලුව විසඳන්න ගරු අමාත්‍යතුමා මැදිහත් වෙලා, ලේකම්තුමා යම්දුරකට මේ ප්‍රශ්නය ගැන සංවේදී වෙලා මේ ප්‍රශ්නය විසඳන්න කටයුතු කෙරුවොත් මම හිතන්නේ, ඔවුන්ගේ ගැටලුව විසඳීම, ඔවුන් තුළින් ඔවුන්ගේ ක්ෂේත්‍රයට යාවී. ඒ හරහා අපට ඉදිරි කාලයේදී විශාල ප්‍රයෝජනයක් ලබා ගන්න හැකි වෙයි කියන කාරණය මතක් කරන ගමන්, මම මීට වැඩිය දීර්ඝව කථා කරන්නේ නැහැ. ගරු අමාත්‍යතුමාට වෙලාව ඉතුරු කරලා මගේ කථාව හමාර කරනවා. බොහොම ස්තුතියි.

[පූ.භා.09.47]

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ගරු සභාපතිතුමනි, හයවැනි පළාත් සභාවේ අවසාන මුදල් ප්‍රකාශය සාකච්ඡා කරන අවස්ථාවේදී කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග, ධීවර, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය, ගොවිජන සංවර්ධන අමාත්‍යාංශය පිළිබඳව මම හිතන්නේ විපක්ෂය පැත්තෙන් කරන්න තිබෙන අවසාන කථාව කරන්න තිබෙන්නේ. ඔබතුමා මගේ කාලයත් සීමා කෙරුවා. හැබැයි මේ පළාත් සභාවේ විපක්ෂය කරන්න ඕනෑ කාර්යභාරය, ආණ්ඩු පක්ෂය විසින් කරන නිසා තමයි අද මේ කාලය අපට සීමා කරන්න සිද්ධ වෙලා තිබෙන්නේ. මේ අමාත්‍යාංශය තමයි ඇත්ත වශයෙන්ම අපේ පළාතේ මහජනතාවට සෘජුව බලපාන, එහෙම නැත්නම් සෘජුව ප්‍රතිලාභ ලැබෙන අමාත්‍යාංශයක් හැටියට අපි දකින්නේ. විශේෂයෙන්ම ගාමිණී තිලකසිරි ගරු ඇමතිතුමා පිළිබඳව මම වචනයක් කියන්න ඕනෑ. එතුමා මේ අමාත්‍යාංශයේ අමාත්‍යවරයා හැටියට, ඔහුගේ කාර්ය මණ්ඩලය නිල්වල ලේකම්තුමාත් සමඟ පුදුමාකාර සහයෝගයකින් තමයි මේ පළාත් සභාවේ -මම දන්නේ නැහැ කවුරු විරුද්ධ වෙයිද කියලා. සියලුම ගරු මන්ත්‍රීවරුන් එක්ක බොහොම සමීප සබඳතාවයකින් වැඩ කටයුතු කෙරුවේ. ඕනෑ වෙලාවක පැය 24 ම ඇහැරන් ඉන්න, දුරකථනයට කථා කළොත් එහෙම ඒ දුරකථනයට ආමන්ත්‍රණය කරලා, මොකද මන්ත්‍රීතුමා කියලා අහන්නේ නැතිව, මොකද මචං වෙන්න ඕනෑය කියලා අහන ඇමතිවරයෙක් තමයි අපට මේ කෘෂිකර්මාන්තයේ ඉන්නේ. ඒක පෞද්ගලික හිතමිත්‍රකම්ද, කොහොමද කියලා මම දන්නේ නැහැ. ඊටත් වඩා මේ කාර් මණ්ඩලය මේ අමාත්‍යාංශයේ කිසිම විධියකට

[ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා]

ප්‍රශ්නයක් ඇති නොකරන, එහෙමත් නැත්නම් තමන්ට ලැබෙන මේ මුදල, මේ සොච්චම් මුදල - මම හැමදාමත් කියනවා. මේ තිබුණු මුදල් ප්‍රකාශන හැම එකේදීම මම කියලා තිබෙනවා. වැඩිපුර මුදල් දෙන්න ඕනෑ අමාත්‍යාංශයට තමයි අඩුවෙන්ම මුදල් දෙන්නේ. කෘෂිකර්ම අමාත්‍යාංශයට -

**ගරු ඉසුර දේවප්‍රිය** (ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බල ශක්ති, පරිසර කටයුතු, ජල සම්පාදන හා ජලාපවාහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමා)

Hon. Isura Devapriya (Chief Minister and Minister of Finance and Planning, Engineering Services, Law and Order, Local Government and Provincial Administration, Economic Promotion, Electricity and Energy, Environmental Affairs, Water Supplies and Drainage and Tourism Affairs)

කෘෂිකර්ම අමාත්‍යාංශයට දෙන්න තිබෙන ඉහළම මුදල් අපි දීලා තිබෙනවා. එහෙම ඉතිහාසයේ දීලා නැහැ. ඔබතුමා ගිහිල්ලා වාර්තා බලන්න. නිකන් මෙතැන ඇවිල්ලා බොරු කියන්න එපා.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**

Hon. Sirikamal Filician de Silva

හොඳයි. බොහොම ස්තූතියි. මම කියන්නේ තව දෙන්න ඕනෑය කියන එක.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා

Hon. Isura Devapriya - Chief Minister

ඒ දෙන්න ඕනෑ ඒවා ඇමතිතුමාට දීලා තිබෙනවා. නිකන් බොරු කියන්න ඕනෑ නැහැ නේ.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**

Hon. Sirikamal Filician de Silva

තමුන්නාන්සේ මේ හැම වෙලාවකම වැරදි පාරක යන්නේ. තව දෙන්න ඕනෑය කියලයි මම කියන්නේ.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා

Hon. Isura Devapriya - Chief Minister

එහෙම සල්ලි දීලා නැහැ, කෘෂිකර්මයට. පොඩි ගණන් දීලා තිබෙන්නේ.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**

Hon. Sirikamal Filician de Silva

ඒක නිසා ඒ ලැබෙන මුදල් උපරිමයෙන්ම ප්‍රයෝජනයට ගන්නවා. ඒක කාටවක්වත් දේශපාලන වශයෙන්, එහෙමත් නැත්නම් පක්ෂ විපක්ෂ ද කියලා බලන්නේ නැහැ. තමන්ට හිතවත් ද කියලා බලන්නේ නැහැ. තමන්ගේ රෙදි හෝදනවාද කියලා බලන්නේ නැහැ. ඒ අවශ්‍ය තැනට තමයි යොදවන්නේ. මම ඔබතුමාගෙන් වෙන කිසි දෙයක් ඉල්ලන්නේ නැහැ. අපේ පළාතේ තිබෙන සුළුවාරිමාර්ග ටික, විශේෂයෙන්ම පසුගිය යහපාලන ආණ්ඩුව තිබෙන කාලයේ මධ්‍යම රජයෙන් ඒ තිබෙන විශාල ඇළවේලි ටික අපට කපලා සකස් කරලා දුන්නා. තමුන්නාන්සේගෙන් මම විශේෂයෙන්ම ඉල්ලීමක් කරනවා. ඒ තිබෙන සුළු වාරිමාර්ග ටික - ඒ නිසා තමයි වත්තල වාගේ ප්‍රදේශවල ගංවතුර පාලනය ඇති වුණේ. ඒක මම කියන්න ඕනෑ. ගංවතුර පාලනය ඇති වුණේ. නැත්නම් මීට වඩා විශාල මුදලක් වියදම් කරන්න සිද්ධ වෙනවා, ගංවතුරෙන් හානි වුණු මිනිසුන්ගේ උවමනා, එපාකම් ඉෂ්ට කරන්න. ඒක නිසා මේ වෙලාවේ මම එය කථා කරමින්, මම මීට වඩා මොකුත්ම කථා කරන්නේ නැහැ. මොකද, මේ රටේ තිබෙන අයහපත් දේශපාලන වාතාවරණයත් එක්ක තමයි අද මේ බස්නාහිර පළාත් සභාවට හැසිරෙන්න සිද්ධ වෙලා තිබෙන්නේ. මීට අවුරුද්දකට, දෙකකට ඉස්සෙල්ලා අපේම අග්‍රාමාත්‍යවරයා අපට කථා කරලා අපේ කණ්ඩායමට කිව්වා, බස්නාහිර පළාත් සභාවේ ඉසුරු මහ ඇමතිතුමාට සහයෝගය දෙන්නය කියලා. එහෙමයි කිව්වේ. එතකොට එහෙම කිව්වාම මම ඇවිල්ලා ගරු ප්‍රධාන ඇමතිතුමාට කිව්වාම -

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා

Hon. Isura Devapriya - Chief Minister

දැනුත් කියන්න පුළුවන් නේ?

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**

Hon. Sirikamal Filician de Silva

උඹලට වැඩිය රනිල් මහත්තයා මගේ යාළුවා කියලා. ඒ වචන වලින් තමයි කිව්වේ.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා

Hon. Isura Devapriya - Chief Minister

දැනුත් කියන්න පුළුවන් නේ?

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

එතකොට අපි ඒ එකඟතාවයට ඇවිල්ලා තමයි -

**ගරු ශිරන්ත අමරසේකර**
Hon. Shirantha Amarasekara

සිරිකමල් ගරු මන්ත්‍රීතුමා, ඒක අපට ඇහුණේ නැහැ. ඒක ආපහු කියන්න.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ඒ විධියට තමයි කටයුතු කරගෙන ගියේ.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

අනික් එක අගමැතිතුමාවත්, එක්සත් ජාතික පක්ෂ නායකයෙක්වත් කිව්වේ නැහැ. ඔබතුමන්ලා අල ඇණුවලට කඩේ යන්නේ.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

එතකොට කිව්වේ, අගමැතිතුමා උඹලට වැඩිය මගේ යාළුවා කියලා. ඒ අගමැතිතුමාට විරුද්ධව තමයි මේ අය අද කටයුතු කරන්නේ. ඒ නිසා මම බොහොම පැහැදිලිව කියනවා -

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

එක්සත් ජාතික පක්ෂයෙන් කිව්වේ නැහැ, ඡන්දය දෙන්න එපාය කියලා.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

මේ මුදල් ප්‍රකාශයට විරුද්ධව පක්ෂයක් විධියට ගන්න තීන්දුවේදී අවසානයේදී ඒකේ මම ඉන්නවා. නමුත් ගාමිණී තිලකසිරි ගරු ඇමතිතුමාගේ අමාත්‍යාංශයේ වැය ශීර්ෂය පිළිබඳව මගේ තිබෙන ප්‍රශංසාව පළ කරමින්, එතුමාට සහාය පළ කරමින් මම නිහඬ වෙනවා. ස්තුතියි.

[පූ.භා.09.51]

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

ගරු සභාපතිතුමනි, මේ අවස්ථාව ලබා දීම ගැන මම ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම කෘෂිකර්ම අමාත්‍යාංශය අපේ ගාමිණී තිලකසිරි ගරු අමාත්‍යතුමාගේ නායකත්වය යටතේ ඒ උපදේශක කාරක සභාවේ කටයුතු කරන්න ලැබීම පිළිබඳවත් මම මේ අවස්ථාවේදී සතුටු වෙනවා. මොකද ඒකට හේතුව අපි දැක්කා, මේ උපදේශක කාරක සභාවන් ගත්තාම මම හිතන්නේ බස්නාහිර පළාතේ නියමිත වේලාවට, නියමිත දිනවල්වලට වැඩිම උපදේශක කාරක සභාවන් පවත්වපු අමාත්‍යාංශය තමයි අපේ කෘෂිකර්ම අමාත්‍යාංශය කියලා කිව්වොත් මම හිතන්නේ මම නිවැරැදියි කියලා. ඒ වාගේම අපි දැකපු දෙයක් තිබුණා, කෘෂිකර්ම අමාත්‍යාංශයේ ගරු ඇමතිතුමාත්, ලේකම්තුමාත්, විශේෂයෙන්ම ගරු අමාත්‍යතුමාගේ කාර්යමණ්ඩලයත්, ඒ නිලධාරි මණ්ඩලයත් මේ රටට යමක් කරන්න ඕනෑය කියන ලොකු උවමනාව ඒ සියලුම දෙනාට තිබෙනවා. ඒ නිසාම අපි දැකපු දෙයක් තිබුණා. මේ කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ අපි දැක්කා මේ ප්‍රදේශවල ඉන්න ගොවි ජනතාවට, ඒ වාගේම පාසල් දූවා දරුවන්ට මේ සියලු දෙනාට කෘෂිකර්මාන්තය පිළිබඳව දැනුවත් කිරීම සඳහා, ඒ පිළිබඳව ආශාවන් ඇති කිරීම සඳහා ලොකු උත්සාහයක් බස්නාහිර පළාත තුළ ගත්තා. ඒක අපි පැහැදිලිව දැක්කා. ඒක අපට පෙන්නලා දුන්නා. බෝම්බුවල කෘෂිකර්ම පුහුණු මධ්‍යස්ථානයේ තිබුණු ඒ ප්‍රදර්ශනයේදී. හෝමගම තිබුණු කෘෂිකර්ම පුහුණු මධ්‍යස්ථානයේදී. ඒ අපි දැකපු දේ තමයි, කෘෂිකර්ම අමාත්‍යාංශය මහන්සි වුණා ප්‍රදේශයේ ගොවි ජනතාවට, ඒ වාගේම ප්‍රදේශයේ පාසල් දරු දැරියන්ට මේ කෘෂිකර්මාන්තය පිළිබඳව ඇල්මක් ඇති කරලා කෘෂිකර්මාන්තය නගා සිටුවන්න වැඩ පිළිවෙළකට යන්න. ඒකත් එක්කම අපි දැක්කා, පුරන් කුඹුරු අස්වද්දන වැඩ පිළිවෙළ තුළ එතුමාට හැකි අයුරින් ඒ පුරන් කුඹුරු අස්වද්දන වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කළා. ඒ වාගේම ඒ පුරන් කුඹුරු අස්වද්දන වැඩ පිළිවෙළේදී පැහැදිලිවම අපි ගරු සභාපතිතුමා හරහා ගරු අමාත්‍යතුමාගෙන් ඉල්ලන එකම ඉල්ලීම තමයි, ඒ පුරන් කුඹුරු අස්වැද්දීමත් සමඟ ඒක පසුවිපරම් කරලා, ඒක තව තවත් යාවත්කාලීන කිරීම සඳහා වැඩ පිළිවෙළක් හදන්නය කියලා.

ඒකත් එක්කම මම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා. ඒ වාගේම මේකට පළාත් සභාවට කරන්න දෙයක් නැහැ. මොකද දැන් ගිය කාලසීමාවේදී ආපසු කෘෂිකර්මාන්තයට වැඩිපුර නැඹුරු වෙලා තිබෙනවා. අපි දැක්කා, එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව විසින් මේ පොහොර සහනාධාරය නැති කළා. ඒ පොහොර සහනාධාරය නැති කළාට පස්සේ, නැවත අපි ආණ්ඩුව භාර ගත්තාට පස්සේ ජනතාවට පොහොර සහනාධාරය දුන්නා. ඒ නිසා කෘෂිකර්මාන්තය

[ගරු ලලිත් එල්ලාවල]

දැන් නැවතත් නභාසිටුවන වැඩ පිළිවෙළකට ඇවිල්ලා. ඒකට අපේ ගාමිණී තිලකසිරි ගරු අමාත්‍යතුමා ගත්තා වූ නායකත්වයට අපේ ගෞරවණීය ස්තුතිය පුද කර සිටිනවා. ඒ වාගේම අපි මතක් කරන්න ඕනෑ. බොහොම කෙටි වේලාවක් තිබෙන නිසා, මේ අමාත්‍යාංශය පුරා කරන දේවල් කියන්න අපට පැයකට වඩා වැඩි කාලයක් යනවා.

ඒකත් එක්කම ගරු සභාපතිතුමනි, අපි දැකපු දෙයක් තිබුණා. පැහැදිලිවම දේශීය සහල් නිෂ්පාදනය සඳහා බස්නාහිර පළාතේ ජනතාවට ලොකු අත්වැලක් වුණා, ගෙවත්තට පැයක් වැඩ සටහන. ඒක ඉතාමත් හොඳ වැඩ සටහනක්. ගරු අමාත්‍යතුමාගෙන් අපි ඉල්ලා සිටිනවා. ඒක පරිසරයට මෙන්ම - ගහට කොළට ආදරය කරන දරුවා මුළු සමාජයටම ආදරෙයි. ඒ නිසා බොහොම අර්ථවත් විධියට මේ වාගේ වැඩ සටහන් සංවිධානය කරලා කිරීම පිළිබඳව අපේ ගෞරවණීය ස්තුතිය මේ අවස්ථාවේදී පුද කරනවා. ඒ වාගේම වාරිමාර්ග කර්මාන්තය ගත්තාම අපි පැහැදිලිවම මතක් කරන්න ඕනෑ, ඒ සඳහා විශාල වෙහෙසක් ගත්ත බව. ඒ වෙහෙස ගැනීමත් එක්කම, මට මතකයි මම පළාත් සභාවට පැමිණි දවසේ සිටම මම කියපු දෙයක් තිබුණා. කණේවෙල අමුණ. කණේවෙල අමුණ ගැන මම පැමිණි දවසේ සිටම හැම කෘෂිකර්ම අමැතිවරයෙකුටම කිව්වා. හැබැයි, ඒ කිසි අමාත්‍යවරයෙකුට මේක කරගන්න බැරි වුණා. මේකේ කියලා තිබෙනවා, අක්කර 200 කට වැඩි ප්‍රමාණයක් කියලා. ගරු සභාපතිතුමනි, අක්කර 200 ක් විතරක් නොවෙයි. තව ගොඩ ඉඩම් විශාල ප්‍රමාණයක් මේකෙන් වගා කෙරෙනවා. ඒ විතරක් නොවෙයි, ගරු සභාපතිතුමනි. මේ කණේවෙල අමුණ අසු ගණන්වල කඩාගෙන යාමත් එක්ක කවදාවක්වත් මේක කරගන්න බැරි වුණා. මේ වතුර රඳා පවතින්නේ නැති නිසා ඒ අහළ පහළ ඉඩම්වල ළිං සිඳී යන්න පටන් ගත්තා. කෘෂිකර්මාන්තයට විතරක් නොවෙයි. පානීය ජලයට පවා හානියක් වුණා. ඒ නිසා ගරු සභාපතිතුමනි, මම සතුටු වෙනවා. කවදාවක්වත් කාටවක්වත් කරන්න බැරි වුණු වැඩේ කළේ ගාමිණී තිලකසිරි ගරු අමාත්‍යතුමාය කියන එක පැහැදිලි කරමින්, මගේ කාලය අවසන් නිසා අවසාන වශයෙන්, ගරු සභාපතිතුමා හරහා ගරු අමාත්‍යතුමාට පොඩ්ඩක් මම මතක් කරනවා.

ගරු අමාත්‍යතුමනි, මේ 2018.10.07 වන දින පේරාදෙණිය පළිබෝධක නාශක රෙජිස්ට්‍රාර් කාර්යාලයේ සොයිඩා ලක්ෂාණි කියන ඒ විද්‍යාඥතිනිය පැහැදිලි කළා. දිස්ත්‍රික්ක හතරක් අරගෙන තිබුණා. විශේෂයෙන්ම මේ ගොටුකොළ, මුකුණුවැන්නා, කංකුං වාගේ අපි පරිභෝජනයට ගන්න පළා වර්ග සම්බන්ධයෙන් පැහැදිලිවම රසායානික වර්ග හතරක් ගැන කියලා තිබුණා. මම මේ නම් ටික කියාගෙන යන විට කාලය යන නිසා, මේ රසායානික වර්ග 70% ක් මම මේ කියපු පළා වර්ගවල තිබෙනවා. ඒ නිසා මම ඉල්ලා සිටින්නේ, මේකට වැඩ පිළිවෙළක් ගන්න. මේවා අපේ බස්නාහිර පළාතේ ජනතාව තමයි වැඩිපුරම පරිභෝජනයට ගන්නේ. ඒ නිසා මේ ගැන වැඩි අවධානයක් යොමු කරලා, මේකට කමිටුවක් පත් කරලා මේකට වැඩ පිළිවෙළක් ගන්නය කියලා ගෞරවයෙන් ඉල්ලා සිටිමින්, ඒ වාගේම ගරු අමාත්‍යතුමා ඇතුළු සියලුදෙනාට මගේ ගෞරවණීය ස්තුතිය පුද කරනවා. අනික් සියලුම අමාත්‍යාංශවලට මෙම අමාත්‍යාංශය ආදර්ශයක් කියමින් මම නවතිනවා. බොහොම ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට බොහොම ස්තුතියි. කෘෂිකර්ම ගරු අමාත්‍යතුමා මා වෙතින් විශේෂ ඉල්ලීමක් කළා. එතුමාගේ කාලයෙන් විනාඩි 04 ක් සමන්මලී සකළසූරිය ගරු මන්ත්‍රීතුමියට දෙන්නය කියලා. එම නිසා ගරු ඇමතිතුමාගේ ඉල්ලීම පරිදි මම ඔබතුමියට ආරාධනා කරනවා. සභාව ඇමතීම සඳහා ඔබතුමියට විනාඩි 04 ක කාලයක් තිබෙනවා.

[පූ.භා.09.58]

**ගරු සමන්මලී සකළසූරිය**
Hon. Samanmalee Sakalasooriya

ගරු සභාපතිතුමාටත්, ඒ වාගේම ගාමිණී තිලකසිරි ගරු අමාත්‍යතුමාටත් මගේ විශේෂ ස්තුතිය. මම වැඩි කාලයක් කථා කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ, අද දිනයේදී ඡන්දය විමසීමට ඇත්තේ ඉතාමත් සුළු කාලයක් නිසා. විශේෂයෙන්ම මේ විවාදය තුළ අපට බොහෝවිට අසන්නට ලැබුණේ ජාතික දේශපාලනයේ කථා. ඒ කෙසේ වෙතත් මම හිතනවා, අපේ මේ අයවැය ඉතාම සුවිශේෂී අයවැයක්. මොකද අද රටේ පාර්ලිමේන්තුවේ අයවැයක් සම්මත වෙලා නැති මොහොතක තමයි අපි බස්නාහිර පළාතේ පළාත් සභාවේ අයවැය ගේන්නේ. ඒ කෙසේ නමුත්

පසුගිය වසර තුළ කෘෂිකර්ම අමාත්‍යාංශයේ උපදේශක කාරක සභාව නියෝජනය කළත්, මම විශේෂයෙන්ම සඳහන් කරන්න ඕනෑ. පසුගිය කාලය තුළ තිබුණු දේශපාලන හැල හැප්පීම් එක්කලා ප්‍රතිපත්ති ගරුකව මම යම් යම් තීරණ ගත්තු නිසා, ඇතැම් කාරණා සඳහා මම සම්බන්ධ වුණේ නැහැ. අදටත් අනික් අය කෙසේ වෙනස් වුණත් මම ප්‍රතිපත්ති ගරුකව කටයුතු කරන නිසා අදටත් මම ඒ ප්‍රතිපත්ති රකිනවා. කෙසේ නමුත් අපේ මේ අමාත්‍ය මණ්ඩලයේ ඉන්න ඉතාමත්ම සමබර අමාත්‍යවරයෙක් නිසා ගාමිණී තිලකසිරි ගරු ඇමතිතුමාගේ වැය ශීර්ෂයට මම කථාවක් කරන්න හිතුවා.

විශේෂයෙන්ම අපේ රට කෘෂිකර්මාන්තය තුළින් ගොඩනඟන්න ඕනෑය කියන තැන ඉන්න තරුණියක් විධියට අපේ රට මේ යන ආකාරය බලපුවාම මම හිතන්නේ බොහෝ මන්ත්‍රීවරු කථා කළා, වස විෂ නැති කෘෂි රටාවක් අපි ගොඩනඟන්නට ඕනෑ. ඒ වාගේම අපි වවාගෙන අපි කන්න ඕනෑය කියන දේවල් දැන් තමයි අපේ ඔළුවට ඇවිල්ලා තිබෙන්නේ. මම හිතන්නේ, අපේ රට අද මේ තත්ත්වයට වැටෙන්න ප්‍රධානම හේතුවක් තමයි, අපි ඇල්පෙනෙත්තේ ඉඳලා, සීනි කැටේ සිට හැම දෙයක්ම පිටරටින් ගේන එකයි. විශේෂයෙන්ම ශ්‍රී ලංකාව වාගේ ඉතාමත්ම ස්වයං පෝෂිත රටක් වෙලා තිබුණු මේ රට, මේ බිම අපි පාවිච්චි කරලා බොහෝ දේවල් කරලා මේ රට ගොඩනඟන්නට අපට හැකියාවක් තිබෙන කොට අදූරදර්ශී දේශපාලඥයන් නිසා, ඒ වාගේම තමන්ගේ බඩ වඩා ගැනීම, තමන්ගේ න්‍යාය පත්‍ර මතම මේ රට අවුරුදු තිහක්, හතළිහක්, පනහක් තිස්සේ කා දැමීම නිසා මම හිතන්නේ, අද වන කොට මේ රට මේ තත්ත්වයට පත් වෙලා තිබෙනවා. මේ සඳහා පක්ෂ විපක්ෂ අප සියලුදෙනාම වගකිවයුතුයි. ඒ නිසා ගාමිණී තිලකසිරි ගරු ඇමතිතුමාට මගේ විශේෂ ස්තුතිය පුද කර සිටිනවා. මගේ ආසනයේ තිබෙන වල්පිට දිස්ත්‍රික් කෘෂිකර්ම පුහුණු මධ්‍යස්ථානයේ නේවාසික ගොඩනැගිල්ලක් ඉදි කරලා තිබෙනවා. මම හිතන්නේ වසර ගණනාවකට පස්සේ කෘෂිකර්මාන්තයට අපට කරන්න පුළුවන් දේවල් බොහොමයක් වුණත් මම හිතන්නේ, අපේ රජයන් දිහා බැලුවත්, පළාත් සභා දිහා බැලුවත් අපි අතින් කෙරිලා තිබෙන්නේ, ඉතාමත් සුළු ප්‍රමාණයක්. මම මට ලැබුණු විනාඩි 04 න් අපේ ගරු ඇමතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා. මේ වස විෂ නැති කෑම රටාවන් කෘෂිකර්මාන්තය දෙසට පසුගිය වසර පහ, හය තුළ, පසුගිය දශකය තුළ අපේ අවධානය යොමු වුණා. බස්නාහිර පළාත විධියට, දැන් මේ Organic කියන එක අලුත් Trend එකක් වෙලා තිබෙනවා. මොකද අපි කන බත් ඇටේ සිට, කන පළතුරු ටිකේ සිට, බොන වතුර ටිකේ ඉඳන් තිබෙන්නේ ගරු සභාපතිතුමනි, වස. මේ වස කියන්නේ, අපේ අනාගත පරපුර විනාශ කරන වස. ආහාර තුළින් තමයි අපේ ජාතිය ගොනඟන්නට පුළුවන්. ඒ නිසා මම ඉල්ලීමක් කරනවා. බස්නාහිර පළාත තුළින් මේ වස විෂ නැති ආහාර රටාව නගා සිටුවන්න කෘෂිකර්මාන්තයට යොදන්න පුළුවන් උපරිම බර දාලා මේක ඉතාමත් හොඳ ව්‍යාපෘතියක් ලෙස රට තුළ ව්‍යාප්ත කරන්නය කියන ඉල්ලීමත් සමඟින්, ඔබතුමා තිරසාර සංවර්ධනය සඳහා වන ජාත්‍යන්තර සමුළුවක් පැවැත් වූවා. අපිත් එයට සහභාගි වුණා. අපිත් සම්බන්ධ වුණා. එවැනි දූරදර්ශී වැඩ කරන්න, ඒ වාගේම මෙතෙක් කල් සම්ප්‍රදායිකව කරගෙන පැමිණි වැඩ නොවෙයි. අනාගතය, තව අවුරුදු 10 ක්, 20 ක්, 30 ක්, 50 ක් ඉස්සරහා බලලා බස්නාහිර පළාත විධියට කරන්න අවශ්‍ය වැඩ කරන්න ඔබතුමාට ශක්තිය, ධෛර්යය ලැබේවා කියලා ප්‍රාර්ථනය කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමියට බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා. ගරු අමාත්‍යතුමාගේ පිළිතුරු කථාව. ඔබතුමාට විනාඩි 12 ක කාලයක් තිබෙනවා.

[පූ.භා.10.03]

**ගරු ගාමිණී තිලකසිරි** (කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග, ධීවර, සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සහ ගොවිජන සංවර්ධන අමාත්‍යතුමා)
Hon. Gamini Thilakasiri (Minister of Agriculture, Land, Irrigation, Fisheries Animal Production and Health and Agrarian Development.)

ගරු සභාපතිතුමනි, මම අද ඉතාම සතුටු වෙනවා. කෘෂිකර්ම අමාත්‍යාංශ වැය ශීර්ෂයේ අවසාන කථාව කරන මේ මොහොතේ, කථා කරපු සියලුම කථිකයන්ගේ පැනයන්වලට පිළිතුරු සැපයීමට නොහැකි වීම පිළිබඳව මම පළමුවෙන්ම කනගාටු වෙනවා. නමුත් අසෝක රන්වල ගරු මන්ත්‍රීතුමා, මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා, අපේ තෙබුවන පියනන්ද හාමුදුරුවෝ ඇතුළු කීප දෙනෙක්ම එක විෂයයක් පිළිබඳව කථා කළා. AI මහත්වරුන්ගේ වෘත්තීය ක්‍රියාමාර්ග ගැනීම. ගරු සභාපතිතුමනි, මේ ප්‍රශ්නය පිළිබඳව මම බොහොම සංවේදීව ගැටලුව විසඳන්න උත්සාහ ගත්ත

[ගරු ගාමිණී තිලකසිරි - අමාත්‍යතුමා]

කෙනෙක්. නමුත් ඒ අයගේ වැරදි මත, වැරදි ක්‍රියාකාරකම් තුළ මේ ගැටලුවේදී මට පැත්තකට වෙලා ඉන්න සිද්ධ වුණා. ඒ තැනට මාව පත් කළේ AI මහත්වරු. මේ ගැටලුව පිළිබඳව මොනවා හරි දෙයක් තිබුණා නම්, මාව මුණගැහෙන්න තිබුණා. මාව මුණගැහිලා කථා කරන්න තිබුණා. ඒ කිසි දෙයක් සිද්ධ වුණේ නැහැ. අපේ ගරු මන්ත්‍රීවරුන්ගේ ඉල්ලීම මත මම කාලයක් දීලා, මේ පිළිබඳව සාකච්ඡා කරලා තීන්දුවක් දුන්නා. තීන්දුව දීලා මම කාමරයෙන් එළියට බහිනකොට මගේ අතට ලැබුණා. ආණ්ඩුකාරතුමා සාකච්ඡාවක් කැඳවලා තිබෙනවා, මේ අයගේ ඉල්ලීම මත කියලා දැනුම්දීමක්. මගේ තීරණය මම පැත්තකින් තිබ්බා. ඒ නිසා මේ වැඩ පිළිවෙළ දිගින් දිගටම ගිහිල්ලා අන්තිමට කමිටුවක් පත් කරන්න වුණා. කමිටුවේ තීන්දුව ක්‍රියාත්මක කරන්නය කියලා මම ලේකම්වරයාට මේ මොහොත වන විට උපදෙස් ලබා දීලා තිබෙනවා. දැන් කිසිම ගැටලුවක් නැහැ. දැන් ප්‍රශ්නය අවසානයි. ලබන සතිය වන විට, ඒ සඳහා ලිපි නිකුත් කිරීම කෙරෙනවා. ප්‍රශ්නය විසඳීමට කටයුතු කරලා තිබෙනවා.

කෘෂිකර්මාන්තය කෙරෙහි මොන පක්ෂයක, මොන තැනක සිටියත් අගය කළ යුතු කාන්තාවක් ඉන්නවා. නිරෝෂා අතුකෝරළ ගරු මන්ත්‍රීතුමිය, මේ සභාවේ ගරු සභාපතිතුමා ප්‍රමුඛ අපි සියලුදෙනාම අගය කළ යුතු කාන්තාවක්. එතුමිය මගේ උපදේශක කාරක සභාවේ සිටියා. මට විශාල දැවැන්ත සහයෝගයක් දුන්නා. මම ආඩම්බර වෙනවා. මම හිතන්නේ ලංකාවේ කිසිම මන්ත්‍රීවරයෙක් නැතිව ඇති. කාබනික පොහොර යොදවලා අක්කර 500 කට වැඩි ප්‍රමාණයක් මේ රට තුළ නිෂ්පාදනය කරන්න කටයුතු කරලා තිබෙනවා. ඒ නිසා එතුමියට මම ස්තුතිවන්ත වෙනවා. ඒ නිසා ඒ පිළිබඳව මම කථා කරන්න යන්නේ නැහැ. මේ පුරන් කුඹුරු ප්‍රශ්නය ගැන කථා කරද්දී මන්ත්‍රීවරු කිහිප දෙනෙක්ම කථා කළා, පුරන් කුඹුරු උත්සව පවත්වලා ඒ කටයුතු ආරම්භ කරනවා. නමුත් ඊට පස්සේ මේකට වෙන්නේ මොකක්ද කියලා සොයා බැලීම අඩුයි කියලා. නැහැ, ගරු සභාපතිතුමනි. මම මේ පිළිබඳව සොයා බැලුවා. එක උදාහරණයක් කියන්නම්. මම 2017 වර්ෂයේදී පුරන් කුඹුරු අස්වැද්දීමේ කටයුතුවලදී නියැදගල ප්‍රදේශයේ අක්කර 40 ක භූමි ප්‍රමාණයක පුරන් කුඹුරු අස්වැද්දීම කළා. ඒ අය මේ සැරෙත් ඒ කටයුත්ත ඉතාමත්ම උවමනාවකින් සිදු කරනවා. ඒ නිසා මම නිරන්තරයෙන්ම පුරන් කුඹුරු - පසුගිය කාලයේ ඕක සිද්ධ වුණා. පුරන් කුඹුරු වැපිරීම උත්සව තියලා වැඩ පටන් ගන්නවා. ඊට පස්සේ අවුරුද්දේ කෙරෙන්නේ නැහැ. නමුත් මම ඒ පිළිබඳව සොයා බලා කටයුතු කළාය කියන එකත් මේ වේලාවේදී මම විශේෂයෙන්ම සඳහන් කරන්න ඕනෑ.

මගේ අමාත්‍යාංශයේ විෂයයන් ගණනාවක්ම තිබෙනවා. ජනතාවට වැඩක් කළ හැකි විෂයයන් තිබෙන්නේ මගේ අමාත්‍යාංශයේ. බිත්තර වී නිෂ්පාදනය ගැන කථා කළාම, 2017, 2018 මහ කන්නයේදී බිත්තර වී බුසල් එක්ලක්ෂ විසි නවදහස් තුන්සිය තිස් අටක් සපයා ගැනීමට හැකි වී අතර 2018, 2019 මහ කන්නයේදී හෙක්ටයාර් විසි නවදහස් හයසිය තිස් පහක් වගා කිරීම තුළින් බුසල් එක්ලක්ෂ හතළිස් අටදහස් එකසිය හැත්තෑ පහක බිත්තර වී සපයා ගැනීමට අපේක්ෂා කරනවා. මම විශේෂයෙන්ම සඳහන් කරන්න ඕනෑ. දේශීය සහල් නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා කෘෂි අධිකාරියේ මැදිහත්වීම මත බස්නාහිර පළාතේ පාරම්පරික දේශීය වී වගාව කරන ගොවීන් 270 ට පහසුකම් ලබා දීලා තිබෙනවා. ඒ වාගේම මහ කන්නය සඳහා අක්කර 08 ක බිම් ප්‍රමාණයක් කාබනික පොහොර භාවිතා කර බිත්තර වී වගා කරන ආදර්ශ වී ගොවිපොළක් මේ මොහොත වන විට මම ස්ථාපිත කරලා තිබෙනවා. විශේෂයෙන්ම කෘෂිකර්මාන්තය යාන්ත්‍රිකකරණය විය යුතුයි. ශ්‍රම හිඟයට පිළියමක් ලෙස වී වගාව යාන්ත්‍රිකරණයට නැඹුරු කිරීම සඳහා අත් ට්‍රැක්ටර්, පැළ සිටුවීමේ යන්ත්‍ර, වල් නෙළන යන්ත්‍ර ගොවීන්ට ලබා දීමට කටයුතු කරලා තිබෙනවා. කෘෂි යාන්ත්‍රීකරණය සඳහා 2018 වර්ෂයේ වෙන් කරනු ලැබූ මුදල රුපියල් මිලියන 31.8 කි. හොරණ, හෝමාගම දිස්ත්‍රික් පුහුණු මධ්‍යස්ථානයන්හි සූර්යය බල පද්ධති ස්ථිපිත කරන්න මම කටයුතු කරලා තිබෙනවා. මිලියන 3.185 ක මුදලක් වැය කරමින් මෙම මධ්‍යස්ථානයන්හි සූර්යය බල පද්ධති ස්ථාපනය කරන්න මේ මොහොත වන විට හැකි වෙලා තිබෙනවා කියන එක, මම විශේෂයෙන්ම සඳහන් කරන්න ඕනෑ.

අද කෘෂිකර්ම විෂයය පිළිබඳව මම දිගින් දිගටම කථා කරන්න යන්නේ නැහැ. වාරිමාර්ග විෂයය ගැන වචනයක් සඳහන් කළොත් කැස්බෑව වැව වටා ඉදි කරන ලද ඇවිදින මංතීරුව ජනතා අයිතියට පත් කළා. අවුරුදු ගණනාවක් තිස්සේ අපේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙන් වාරිමාර්ග

අමාත්‍යාංශයට අයත් වෙලා තිබුණු මේ කැස්බෑව වැව සම්පූර්ණයෙන් කැලෑව වෙලා එක එක්කෙනා අල්ල ගත්ත භූමි ප්‍රමාණයක් බවට පත් වෙලා තිබුණා. මම ඒ සියල්ලක්ම මුදාගෙන, අපේ අයිතිය තහවුරු කරගෙන, කැස්බෑව වැව වටා මංතීරු සකස් කරලා ඒ ප්‍රදේශයේ ජනතාවට ඇවිදීමේ මංතීරු ටික මම සකස් කරලා දුන්නා, අපේ අමාත්‍යාංශය තුළින්. ඒ නිසා අපි විශේෂයෙන්ම සඳහන් කරන්න ඕනෑ. මේ යටතේ ඇළ මාර්ග, වැව්, ට්‍රැක්ටර් පැන්නුම් සහ අමුණු ඉදි කිරීම සඳහා රුපියල් මිලියන 118 ක් මේ වසර සඳහා වැය කරලා තිබෙනවා. නමුත් කනගාටුවෙන් වුණත් මම සඳහන් කරන්න ඕනෑ. ගරු මහ ඇමතිතුමා මෙතැන නැහැ. මම ඉල්ලපු මුදල් මට ලැබුණේ නැහැ. මට ආණ්ඩුවෙන් ලැබුණේ නැහැ. ගරු සභාපතිතුමනි, මධ්‍යම ආණ්ඩුවෙන් මම මිලියන 450 ක මුදලක් ඉල්ලුවා. නමුත් මට ලැබුණේ මිලියන 100 යි. කථා කරන්නේ කෘෂිකර්මාන්තය ගැන. කෘෂිකර්මාන්තය දියුණු කරන්න ඕනෑය කියනවා. කන්න නැති වුණොත් මැරෙන්න වෙයි කියලා කියනවා. අපට වෙන අසහනය ගැන කථා කරනවා. මිලියන 450 ක් ඉල්ලුවාම මට ලැබුණේ මිලියන 100 යි. අද මම ඇළවේලි, වැව්, ඒ සඳහා අවශ්‍ය කරන සියලුම දේවල් සඳහා රුපියල් මිලියන 41 ක මුදලක් ඇස්තමේන්තු කරලා තිබෙනවා. අද මට ඒ මුදල් නැහැ. මම ප්‍රධාන ලේකම්තුමාට කිව්වා. මම ගරු ප්‍රධාන ඇමතිතුමාට කිව්වා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ඇමතිතුමා, මම හිතන්නේ ඔබතුමා ඔය ප්‍රකාශය ගරු ප්‍රධාන ඇමතිතුමා ඉන්න වෙලාවක කිව්වා නම් හොඳයි. ගරු මහ ඇමතිතුමා ඉන්න වෙලාවක ඔබතුමා ඔය ප්‍රකාශය කරන්න.

**ගරු ගාමිණී තිලකසිරි** - අමාත්‍යතුමා
Hon. Gamini Thilakasiri - Minister

නැහැ. නැහැ. ගරු මහ ඇමතිතුමාගේ PDG මුදල් ලැබුණා. ගරු මහ ඇමතිතුමාට දැනගන්න මම මේ කිව්වේ.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

PDG මුදල් නොවෙයි මේ කියන්නේ. මධ්‍යම ආණ්ඩුවේ සල්ලි.

**ගරු ගාමිණී තිලකසිරි** - අමාත්‍යතුමා
Hon. Gamini Thilakasiri - Minister

මහ ඇමතිතුමා දුන්නා. මිලියන 400 ක් ඉල්ලුවාම 50 ක් වැඩි කරලා දුන්නා.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගරු මහ ඇමතිතුමා මිලියන 450 ක් දුන්නා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

මහ ඇමතිතුමා එනවා.

**ගරු ගාමිණී තිලකසිරි** - අමාත්‍යතුමා
Hon. Gamini Thilakasiri - Minister

ගරු සභාපතිතුමනි, මධ්‍යම ආණ්ඩුවෙන් ඉල්ලපු මුදල්. මහ ලොකුවට කෘෂිකර්මාන්තය ගැන කථා කරනවා. පළාත් සභාවට මුදල් ටික දුන්නේ නැහැ. ඇස්තමේන්තු කරපු ව්‍යාපෘති 45 ක් තිබෙනවා. මේ සියලුම දේවල් මේ මන්ත්‍රීවරුන්ගේ ඇස්තමේන්තු කරපු ව්‍යාපෘති. මගේ ඇඟට එනවා. ඇයි? ගාමිණී අයියේ මේක කරන්නේ නැත්තේ කියලා. කරන්නේ කොහොමද ගරු සභාපතිතුමනි, සල්ලි නැතිව. මම ගෙදරින් ගේන්නද? මිලියන 450 ක් ඉල්ලුවාම මිලියන 100 යි මට දුන්නේ. කෘෂිකර්මාන්තය ගැන කථා කරන්නේ. මේවා තමයි වැඩ. ගරු සභාපතිතුමනි, අපි ඉතාමත් හිතට උවමනාවෙන් වැඩ කරලා තිබෙනවා. වාරිමාර්ග ගැන කථා කරන කොට, මෙපමණ කල් වාරිමාර්ග දෙපාර්තමේන්තුවට සවලක් තිබුණේ නැහැ. සවලක්. බාච් එක්ක එක්ස්කැවේටර් යන්ත්‍ර තුනක් අර ගත්තා. මම ලබන අවුරුද්දටත් මුදල් වෙන් කරලා තිබෙනවා. මන්ත්‍රීවරු සියලුදෙනාම මට කියනවා, එක්ස්කැවේටර් යන්ත්‍ර දෙන්න. ගරු ඇමතිතුමනි, ඒකෙන් අපට එල ප්‍රයෝජනයක් ගන්න පුළුවන්. තව තුනකට මම ප්‍රතිපාදන වෙන් කරලා තිබෙනවා. තුන නොවෙයි. එක දිස්ත්‍රික්කයකට එක්ස්කැවේටර් යන්ත්‍ර හතරක් දෙන්න පුළුවන් නම් ඒකත් වටිනවා ගරු සභාපතිතුමනි. මේ මගේ ඉල්ලීම් නොවෙයි. අවශ්‍ය දේවල්වලට අපි මුදල් වෙන් කරන්න ඕනෑ. ගොවියාගේ ඉල්ලීම්. තේරිලා තේරිලා මගේ උපදේශක කාරක සභාවට එන්නේ හැලිච්ච ඇයෝ. හතර පස් දෙනයි ඇත්ත වශයෙන්ම මේ පිළිබඳව ඇහේ තිබෙන මිනිස්සු

[ගරු ගාමිණී තිලකසිරි - අමාත්‍යතුමා]

හැටියට ඉන්නේ. නමුත් විපක්ෂයේ විශාල පිරිසක් කෘෂිකර්මයට ආදරය කරන කට්ටිය ඇවිල්ලා මාත් එක්ක එකතු වෙලා වැඩ කරනවා. මම යම්කිසි දැනුමක් ලබා දුන්නා. අපි සංචාරක ගමන් ගියා නොවෙයි, ගරු සභාපතිතුමනි. මේ ක්‍රමය ආරම්භ කළේ මම. මම වර්ෂයකට වරක් ගෙනහිල්ලා, සමහර ගරු මන්ත්‍රීවරු මේ කෘෂිකර්මය ගැන දන්නේ නැහැ. ඒවා සම්බන්ධයෙන් දැනුවත් කළා. මේකයි කෘෂිකර්මාන්තය කියන්නේ. රටේ තිබෙන කෘෂිකර්මාන්තයේ සියලු අංශ පෙන්නලා ගරු මන්ත්‍රීවරු දැනුවත් කරන්න මම කටයුතු කළයි කියන එක මම සඳහන් කරන්න ඕනෑ.

සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍යය ගැන කථා කරන කොට දොම්පේ, කටාන, වැලිසර, මීගමුව, හෝමගම, බුලත්සිංහල යන පශු වෛද්‍ය කොට්ඨාශවල එළු ගම්මාන ස්ථාපිත කර ගම්පහ, දොම්පේ, වැලිසර, කොස්ගම පශු වෛද්‍ය කාර්යාල ඇති කරලා තිබෙනවා. පශු වෛද්‍ය කාර්යාලය හතරක් අලුත්ම ගොඩනැගිලි බවට පත් කරන්න මම කටයුතු කරලා තිබෙනවා.

**ගරු සුමිත් විජයමුණි ද සොයිසා**
Hon. Sumith Wijayamuni De Soysa

ඇයි කොස්ගම?

**ගරු ගාමිණී තිලකසිරි** - අමාත්‍යතුමා
Hon. Gamini Thilakasiri - Minister

හොරණ එක. මෙතුමන්ලාගේ ඉල්ලීම පරිදි අලුතින් මධ්‍යස්ථාන ඉදි කරන්න -

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon. O. W. Prasanna Sanjeeva

ලබන අවුරුද්දේ බේරුවල එක හදන්න ඕනෑ.

**ගරු ගාමිණී තිලකසිරි** - අමාත්‍යතුමා
Hon. Gamini Thilakasiri - Minister

ඒ සඳහා අපි ප්‍රතිපාදන වෙන් කරලා තිබෙනවා. ඒ නිසා පශු වෛද්‍ය ගැන කථා කරන කොට ඒ අවශ්‍ය සියලු පහසුකම් ටික මම මේ මොහොත වන විට ලබා දෙන්න කටයුතු කරලා තිබෙනවා. ඒ නිසා ගරු සභාපතිතුමනි, කොටදෙනියාව සත්ත්ව පාලන පුහුණු මධ්‍යස්ථානය ගැන කථා කරන කොට එක සතෙක් සිටියේ නැහැ. සත්ත්ව ගොවිපළේ එක සතෙක් සිටියේ නැහැ. වෙලිච්ච සත්තු ටිකක් සිටියේ. සත්ත්ව ගොවිපොළ මම හැදුවා. සියලු දේවල් ටික මම හැදුවා. නමුත් මට කනගාටුයි කියන්න. මගේ කාලවේලාව මදි නිසා. ඒ නිසා ගරු සභාපතිතුමනි, මම ස්තුතිවන්ත වෙනවා. මගේ කථාව කරගන්න බැරි වුණා. මම කනගාටු වෙනවා. මම ස්තුතිවන්ත වෙනවා, අපේ අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාට, අපේ මහින්ද රාජපක්ෂ අගමැතිතුමාට, ආණ්ඩුකාරතුමා මට විශේෂ සහයෝගයක් දුන්නා. ආණ්ඩුකාරතුමා මේ කෘෂිකර්මාන්තයට විශාල ලැදියාවක් දක්වන කෙනෙක්. ආණ්ඩුකාරතුමා, ගරු ප්‍රධාන අමාත්‍යතුමා, ගරු විපක්ෂ නායකතුමා ඇතුළු විපක්ෂයේ ඉන්න සියලුම ගරු මන්ත්‍රීවරු, මගේ ආණ්ඩු පක්ෂයේ ඉන්න සියලුම ගරු මන්ත්‍රීවරුන් උපදේශක කාරක සභාවත් මට දැවැන්ත සහයෝගයක් ලබා දුන්නා. මම නොදන්න දේවල් මට කියලා දුන්නා. ඒ හැම දෙයක් පිළිබඳවම මම අවධානය යොමු කළා. ඒ නිසා අද මම සතුටු වෙනවා. අවසාන අයවැයේදී මට මේ කෘෂිකර්ම අමාත්‍යාංශයෙන් ඉතිහාසයේ මේ අවුරුදු තිහේම කෘෂිකර්ම ඇමැතිවරයෙක් නොකරපු වැඩ විශාල ප්‍රමාණයක් මම මේ පළාත් සභාව වෙනුවෙන් ඉෂ්ට කළයි කියන එක ඉතාමත්ම සතුටින් ප්‍රකාශ කරනවා. ඒ වාගේම මගේ වැය ශීර්ෂයට විරුද්ධව ඡන්දය දුන්නත් මම විශ්වාස කරනවා, 90% ක් හෘද සාක්ෂියට එකඟව ඡන්දය දුන්නොත්, කෘෂිකර්ම අමාත්‍යාංශයට, මට මේ අයගේ සහයෝගය ලැබෙනවා. සියලුදෙනාටම බොහොමත්ම ස්තුතියි.

*පූ.භා. **10.14** ට, අංක **106, 117, 118, 119** හා **120** යන ශීර්ෂ පිළිබඳ සාකච්ඡාව අවසාන විය.*

*Discussion on the Expenditure Head Nos 106, 117, 118, 119 and 120 concluded at 10.14 a.m.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ඇමතිතුමා, බොහොම ස්තුතියි. ශීර්ෂ අංක 106, 117, 118, 119 හා 120 යන වැය ශීර්ෂ පිළිබඳ විවාදය මෙයින් අවසන් වෙනවා. ඒ පිළිබඳව සභාවේ බෙදීමක් තිබෙනවාද?

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ගරු සභාපතිතුමනි, බෙදීමක් තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සභාවේ බෙදීමක් තිබෙන නිසා කරුණාකර සීනුව නාද කරන්න.

***ශීර්ෂ අංක 106 හි සඳහන් මුදල අනුමත කළ යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, පූර්ණ කාරක සභාව පක්ෂව 53 යි, විපක්ෂව 32 යි, වැළකුණු 00 යි යනුවෙන් බෙදුණේය.***

*The question that the amount indicated in the Head No. 106 should be approved was put and the Committee of the Whole Council was divided as 53 for, 32 against and 00 decliners.*

***ශීර්ෂ අංක 117 හි සඳහන් මුදල අනුමත කළ යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, පූර්ණ කාරක සභාව පක්ෂව 53 යි, විපක්ෂව 32 යි, වැළකුණු 00 යි යනුවෙන් බෙදුණේය.***

*The question that the amount indicated in the Head No. 117 should be approved was put and the Committee of the Whole Council was divided as 53 for, 32 against and 00 decliners.*

***ශීර්ෂ අංක 118 හි සඳහන් මුදල අනුමත කළ යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, පූර්ණ කාරක සභාව පක්ෂව 53 යි, විපක්ෂව 32 යි, වැළකුණු 00 යි යනුවෙන් බෙදුණේය.***

*The question that the amount indicated in the Head No. 118 should be approved was put and the Committee of the Whole Council was divided as 53 for, 32 against and 00 decliners.*

***ශීර්ෂ අංක 119 හි සඳහන් මුදල අනුමත කළ යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, පූර්ණ කාරක සභාව පක්ෂව 53 යි, විපක්ෂව 32 යි, වැළකුණු 00 යි යනුවෙන් බෙදුණේය.***

*The question that the amount indicated in the Head No. 119 should be approved was put and the Committee of the Whole Council was divided as 53 for, 32 against and 00 decliners.*

***ශීර්ෂ අංක 120 හි සඳහන් මුදල අනුමත කළ යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, පූර්ණ කාරක සභාව පක්ෂව 53 යි, විපක්ෂව 32 යි, වැළකුණු 00 යි යනුවෙන් බෙදුණේය.***

*The question that the amount indicated in the Head No. 120 should be approved was put and the Committee of the Whole Council was divided as 53 for, 32 against and 00 decliners.*

[සභාවේ සෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මීළඟට න්‍යායපත්‍රානුකූලව තිබෙන්නේ -

**ගරු එම්. නවුසර් ෆවුසි**
Hon. M. Nauzer Fowzie

ගරු සභාපතිතුමනි -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

වරප්‍රසාද ප්‍රශ්නයක්. කරුණාකර නිශ්ශබ්ද වන්න.

**ගරු එම්. නවුසර් ෆවුසි**
Hon. M. Nauzer Fowzie

ගරු සභාපතිතුමනි, 37(1) -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර සභාව නිශ්ශබ්ද වන්න.

**ගරු එම්. නවුසර් ෆවුසි**
Hon. M. Nauzer Fowzie

ගරු සභාපතිතුමනි, 37(1). මම එදා පැති මාරු වෙන කොට මට තම්බියා යන්න යන්න කියලා කිව්වා. එකක්. දෙවැනි එක මෙරිල් ගරු මන්ත්‍රීතුමා කිව්වා, බෝනස් එකෙන් ආපු එකා යන එක හොඳයිද මොනවා දෝ කථාවක් කිව්වා. බෝනස් එකෙන් මම ආවේ හතළිස් තුන්වැනියා හැටියට ඉඳලා නොවෙයි. මෙතැන 10 දෙනෙක් පත් වෙන කොට 11 වැනියාට මම සිටියා. ඒක තමයි මට දුන්නේ. එක්කෝ මට දෙන්න ඕනෑ. නැත්නම් ගරුතර ස්වාමීන් වහන්සේට දෙන්න ඕනෑ. (බාධා කිරීමක්) පොඩ්ඩක් ඉන්න. කොඩිකාර ගරු මන්ත්‍රීතුමා පොඩ්ඩක් ඉන්න. ඔබතුමන්ලා තමයි මහින්ද රාජපක්ෂ මැතිතුමාව කෑවේ. මතක තියා ගන්න.

[සභාවේ සෝෂා]

**ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ**
Hon. Upul Mahendra Rajapaksa

රටවල් ඔක්කොගෙම ගියා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර කෑ ගහන්න එපා.

**ගරු එම්. නවුසර් ෆවුසි**
Hon. M. Nauzer Fowzie

අහගන්න. තම්බියා තමයි, ගරු සභාපතිතුමනි, -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

බාධා කිරීම් කරන්න එපා.

**ගරු එම්. නවුසර් ෆවුසි**
Hon. M. Nauzer Fowzie

තම්බියා තමයි සිංහල ජනතාවගේ, මුස්ලිම් ජනතාවගේ, දෙමළ ජනතාවගේ ආදරය දිනාගෙන තම්බියා තමයි මේකට හතර සැරයක් පත් වුණේ. මගේ පියා අට සැරයක් දින්නා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ප්ලේන් එකේ ළඟින්ම ගියේ මෙයා. රටවල් ඔක්කොගෙම ගියා.

**ගරු එම්. නවුසර් ෆවුසි**
Hon. M. Nauzer Fowzie

සිංහල ජනතාවගේ ආදරය -

[සභාවේ ඝෝෂා]

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ටිකට් ඒජන්සි දා ගත්තා.

**ගරු එම්. නවුසර් ෆවුසි**
Hon. M. Nauzer Fowzie

මේ කොළඹ දිස්ත්‍රික්කයේ සියලු දෙනාම දන්නවා.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

අපි ඒ කාලයේ -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

බාධා කිරීම් කරන්න එපා.

**ගරු එම්. නවුසර් ෆවුසි**
Hon. M. Nauzer Fowzie

ඉතුරු තම්බියෝ ටිකත් එතැන ඉන්න එක සාධාරණ නැහැ. උන් තම්බියා කියනවා නම්. 2005 මැතිවරණයේ -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

තම්බියා වචනය වැරදි වචනයක්ද?

**ගරු එම්. ෂාෆි රහීම්**
Hon. M Shafi Raheem

තම්බියා කියන්නේ මල්ලි නේ.

**ගරු සහන් ප්‍රදීප් විතාන**
Hon. Sahan Pradeep Vithana

ඔබතුමා වීර ක්‍රියාවක් කරලා නොවෙයි නේ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ජාතිවාදය අවුස්සනවා.

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා අවසන් කරන්න. මට තේරෙනවා.

**ගරු එම්. නවුසර් ෆවුසි**
Hon. M. Nauzer Fowzie

ගරු සභාපතිතුමනි, මේ තම්බියෝ ගැන කථා කරන්න එපා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ගරු මන්ත්‍රීතුමා, ජාතිවාදය අවුස්සන්න එපා.

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර වාඩි වෙන්න.

**ගරු එම්. නවුසර් ෆවුසි**
Hon. M. Nauzer Fowzie

එයාට තරහයි.

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon. O. W. Prasanna Sanjeeva

ගරු සභාපතිතුමනි, එතුමා ජාතිවාදය අවුස්සනවා. තාත්තා petroleum එකේ මැලේසියාවේ ඉඩම් ගත්තේ.

**ගරු එම්. නවුසර් ෆවුසි**
Hon. M. Nauzer Fowzie

නැහැ. නැහැ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

දැන් ඉන්නේ CGR ඉඩමේ.

**ගරු එම්. නවුසර් ෆවුසි**
Hon. M. Nauzer Fowzie

අපි හොඳට ජීවත් වෙනවා. ඔබතුමන්ලා වාගේ නොවෙයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර වාඩි වෙන්න.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

කෘෂිකර්ම ඇමතිතුමා, උපුල් මහේන්ද්‍ර ගරු මන්ත්‍රීතුමාට ටිකක් වැඩිපුර දෙන්න හොඳේ.

**ගරු මොරිස් විජේරත්න**
Hon. Moris Vijerathne

නවුසර් කැතයි. අපට තේරුම කියන්න. පාවා දෙන්න එපා.

**ගරු එම්. නවුසර් ෆවුසි**
Hon. M. Nauzer Fowzie

ඔබතුමා නිකන් ඉන්න. අපි දන්නවා.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

දීගේ එකට කන කොට ඔහොම කිව්වේ නැහැ.

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon. O. W. Prasanna Sanjeeva

සභාවේ වැඩිම වුණොත් දවස් දෙකයි එන්නේ. එනවා, කනවා, බොනවා, යනවා.

[සභාවේ ඝෝෂා]

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

භය වෙන්න එපා. භය වෙන්න එපා. හෙට අනිද්දා ඔය කට්ටියට ගෙදරම යන්න වෙනවා. මෙහෙට ආපු අය විතරයි බේරෙන්නේ. අනික් ඔක්කොම ගෙදර.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

මිරිස් කුඩු කල්ලියේ විනය හදන්න කෝ.

**ගරු එම්. ෂාෆි රහීම්**
Hon. M Shafi Raheem

ගරු සභාපතිතුමනි, තම්බි කියන එකයි, මරක්කල කියන එකයි, හම්බයෝ කියන එකයි මේ සභාවට පැහැදිලි කරන්න ඕනෑ. 37(1) -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ආ....37(1).

**ගරු එම්. ෂාෆි රහීම්**
Hon. M Shafi Raheem

මේක පැහැදිලි කිරීමක් කරන්න ඕනෑ.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

නැහැ. නැහැ. පැහැදිලි කිරීම් බැහැ.

[සභාවේ ඝෝෂා]

**ගරු එම්. ෂාෆි රහීම්**
Hon. M Shafi Raheem

මේ සභාවේ පැහැදිලි කිරීමක් අපි කරන්න ඕනෑ. තම්බි කියන්නේ දෙමළ වචනයක්.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

වරප්‍රසාද ප්‍රශ්නයක් නොවෙයි නේ?

**ගරු එම්. ෂාෆි රහීම්**
Hon. M Shafi Raheem

තම්බි කියන්නේ මල්ලි.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

මෙතුමා කොහොමද කථා කරන්නේ?

**ගරු එම්. ෂාෆි රහීම්**
Hon. M Shafi Raheem

මරක්කල කියන්නේ මාව රැක්ක ලේ.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

පැහැදිලි කිරීම් කරන්න බැහැ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

නවුසර් ඉස්කෝලේ ගිහිල්ලා නැහැ නේ? ඉතින් වචන දන්නේ නැහැ.

**ගරු ජගත් අංගගේ**
Hon. Jagath Angage

ජාතිවාදය අවුස්සන ඒවාට අවස්ථාව දෙන්නේ.

**ගරු එම්. ෂාෆි රහීම්**
Hon. M Shafi Raheem

තම්බියා කියන කොටත් තරහ වෙන්න ඕනෑ නැහැ. මරක්කලයා කියන කොටත් තරහ වෙන්න ඕනෑ නැහැ. තම්බි කියන්නේ දෙමළ වචනයක්. මරක්කල කියන්නේ මාව රැකපු ලේ. ඒක අපේ සහෝදර ගරු මන්ත්‍රීවරුන්ට පැහැදිලි කරලා දෙන්න ඕනෑ. ඔබතුමන්ලා මේක ඉගෙන ගන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

න්‍යාය පත්‍රයට යමු.

**ගරු එම්. ෂාෆි රහීම්**
Hon. M Shafi Raheem

තම්බියා කියන කොට, හම්බයා කියන කොට, මරක්කලයා කියන කොට රණ්ඩු වෙනවා. මේවා රණ්ඩු වෙන්න දෙයක් නොවෙයි. අපේ උප්පැන්න සහතිකවල මරක්කලයා කියලා දාලා තිබෙනවා. මරක්කලයා කියන එක පැහැදිලි කරන්න ඕනෑ.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

වාඩි වෙන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර නිශ්ශබ්ද වන්න. අනවශ්‍ය විවාදවලට යන්න එපා.

[සභාවේ ඝෝෂා]

**ගරු එම්. ෂාෆි රහීම්**
Hon. M Shafi Raheem

නුවර ඉඳන් ආපු එකාට නුවරයා කියනවා. මීගමුවේ එකාට, මීගමු එකා කියනවා.

[සභාවේ ඝෝෂා]

මේ සභාවේ තේරුම් ගන්න.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ඔය කට්ටිය ඉස්කෝලේ යන්න.

**ගරු එස්. කුහවරදන්**
Hon. S. Kuhawarthan

ජාතිවාදය අවුස්සන්න එපා කියන්න. කාට වුණත් -

[සභාවේ ඝෝෂා]

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ගරු සභාපතිතුමනි, 37(1).

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon. O. W. Prasanna Sanjeeva

මහින්ද මහත්තයාව කාපු හැටි අපි දන්නවා. කවුද කියලා -

**ගරු එස්. කුහවරදන්**
Hon. S. Kuhawarthan

මේක අපේ රට. එකමුතුවෙන් අපේ රට හදාගෙන ඉස්සරහාට යන ගමන් කරුණාකර ජාතිවාදය අවුස්සන්න එපා.

**ගරු එම්. නවුසර් ෆවුසි**
Hon. M. Nauzer Fowzie

මේ තම්බියා තමයි සිංහල ජනතාවගේ ඡන්දයෙන් අට සැරයක් පාර්ලිමේන්තුවට පත් වුණේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අනවශ්‍ය විවාදවලට යන්න එපා.

**ගරු හෙක්ටර් බෙත්මගේ- සභා නායකතුමා**
Hon. Hector Bethmage - Leader of the House

ගරු සභාපතිතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයක්. දැන් ඊළඟට තිබෙන්නේ මේ අධ්‍යාපන වැය ශීර්ෂය. ඒක නිසා අපේ කාලය අහිමි වෙනවා. ඒක අපි සියලුදෙනාටම අහිමි වෙනවා. ඊළඟ වැය ශීර්ෂයට ප්‍රවිෂ්ට වෙන්න කියලා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

ගරු සභාපතිතුමනි, 37(1) යටතේ මට වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා. මෙතැන හැම මන්ත්‍රී කෙනෙක්ටම නමක් තිබෙනවා. මම එම්.එස්.එම්. ෆයිරූස්, නවුසර් ෆවුසි, ෂාෆි රහීම්. මෙතැන අපේ ෂාෆි රහීම් ගරු මන්ත්‍රීතුමා කියන කථාව සම්පූර්ණයෙන්ම මරක්කලයෙක් විධියට මම ඒකට විරුද්ධ වෙනවා. මෙතුමා සභාවේ කියනවා, තම්බි කියලා කථා කරන්නත් පුළුවන්ලු. මරක්කලයා කියලා කථා කරන්නත් පුළුවන්ලු. මොන ජාතියක් ගැනද මෙතුමා කථා කරන්නේ. මෙතුමා මුස්ලිම් කොංග්‍රස් පක්ෂයේ -

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

එයාට ජාතියක් නැහැ. එතුමා හැරෙන හැරෙන පැත්තට.

**ගරු එම්. ෂාෆි රහීම්**
Hon. M Shafi Raheem

ෆයිරූස් ගරු මන්ත්‍රීතුමා දන්නේ නැත්නම් සොයා බලලා කථා කරන්න. මම කිව්වේ ඒ වාගේ මෝඩ කථාවලට අපි කුලප්පු වෙලා -

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

මුස්ලිම් කෙනෙක්ද මේ කථා කරන්නේ. මූට නමක් තියෙනවාද? තම්බියා කියලා -

**ගරු එම්. ෂාෆි රහීම්**
Hon. M Shafi Raheem

ඒ වාගේ කථාවලට අපි සභාවේ පැටලෙන්න හොඳ නැහැ.

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

මේ සභාවේ තම්බියා කියලා කථා කරන්න පුළුවන්ද?

**ගරු එම්. ෂාෆි රහීම්**
Hon. M Shafi Raheem

තම්බියා කියන එක මොකක්ද කියලා ඉස්සෙල්ලා පැහැදිලි කරන්න කියන්න.

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[Expunged on the order of the chair]*

**ශීර්ෂ අංක 108 - අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යාංශය**

**ශීර්ෂ අංක 126 - අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

Head No 108 - Ministry of Education, Cultural and Arts Affairs, Sports and Yout Affairs and Information Technologe.

Head No 126 - Department of Educaiton

*[සංකේත කපා හැරීම ]*
*[Symbolic write-off]*

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

ගරු සභාපතිතුමනි, *"ශීර්ෂ අංක 108 හා 126 අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යාංශවැය ශීර්ෂයන්ගෙන් රුපියල් 10/- ක සංකේත මුදලක් අඩු කළ යුතු යැයි"* යෝජනා කරනවා.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*Question proposed*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

විවාදය ආරම්භ කරමින් -

**ගරු මොහොමඩ් ෆායිස්**
Hon. Mohamed Faiz

ගරු සභාපතිතුමනි, 37(1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක්. ඊයේ මේ සභාවේ අපි ආණ්ඩු පක්ෂයත් එක්ක එකතු වෙලා, මහ ඇමැතිතුමාගේ Vote එක දිනවන්න අපි අත් ඉස්සුවා. අපට වෙනම පක්ෂයක් තිබෙනවා. අපි මෙතැන වෙන කාගේවත් පක්ෂවලින් ආපු අය නොවෙයි. අඛිල ඉලංගෙ මහජන කොන්ග්‍රසය. රිෂාඩ් බදියුදීන් ඇමැතිතුමාගේ නායකත්වය යටතේ අපි මෙතැනට පත් වෙලා තිබෙන්නේ. ඒ නිසා අපට කවුරුත් තර්ජනය, ගර්ජනය කරලා එහේට එන්න මෙහේට එන්න, එතැනට යන්න මෙතැනට යන්න කියලා කියන්න බැහැ. අපි ස්වාධීනව තමයි තීන්දු තීරණ ගන්නේ. ඒ නිසා අපි මෙතැන කාගෙන්වත් සල්ලි අරගෙන එහෙමත් නැත්නම්, වෙනත් වරප්‍රසාදවලට නොවෙයි අත ඉස්සුවේ. අපි මෙතැන ඉඳලා කාලා බීලා අපිත් දන්නවා කලගුණ සැලකීම කොහොමද කියන එක. මෙතැන අවුරුදු නවයක් කාලා මේ අන්තිම වකවානුව වනකොට, මෙක අවස්ථාවක් කර ගන්නේ නැහැ. අපට ඔයගොල්ලොත් එක්ක ප්‍රශ්නයක් තිබෙනවා නම් ඒක -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පැහැදිලියි. පැහැදිලියි.

**ගරු මොහොමඩ් ෆායිස්**
Hon. Mohamed Faiz

මහ ඇමැතිතුමාත් එක්ක බේරුම් කර ගන්නවා. ඒ නිසා අපේ චරිතය ඝාතනය කරන්න එපා. මෙතැන පොහොට්ටුවට නොවෙයි අපි අත ඉස්සුවේ. අපි අත ඉස්සුවේ මහ ඇමැතිතුමා යටතේ අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ ආණ්ඩුවට, මේ පළාත් සභාවේ ආණ්ඩු පක්ෂයටයි අපි අත ඉස්සුවේ. ඒ නිසා අපි ඒ තැන්වලට ගිහිල්ලා පොළු දාපු අය නොවෙයි. චීන ආණ්ඩුවෙන්, චීනයට ගිහිල්ලා ඒවාට මේවා චෙක් දීලා කටයුතු කරලා නොවෙයි. එයාර් පෝට් එක හරස් කරලා නැහැ. ඒ නිසා මඩ ගහන්න එපා කියන්න. චරිත ඝාතනය කරන්න එපා කියන්න. ඒ කට්ටියගේ උවමනාවලට අත උස්සපු අය අපි දන්නවා. මෙතැනින් සියලුම වරප්‍රසාද අරගෙන අද පිටිපස්සේ දොරෙන් ඇවිල්ලා, ඒ අයගේ වැඩ කටයුතු කරගෙන අමාරුවෙන් තමයි විරුද්ධ වෙන්නේ. නමුත් අපි එහෙම කරන්නේ නැහැ. මුස්ලිම් මනුස්සයෙක් හැටියට මම පක්ෂ නායකතුමාගේ තීන්දු තීරණවලට යටත්ව මම ඊයේ පක්ෂව අත ඉස්සුවා කියන එක මේ අවස්ථාවේදී කියා සිටිනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා සමාවෙන්න. අපට වැය ශීර්ෂවලට යන්න තියෙනවා. ඔබතුමා වාඩි වෙන්න. ගරු මන්ත්‍රීතුමා ඔබතුමාට අවස්ථාව. ඔබතුමාට විනාඩි 08 ක කාලයක් තිබෙනවා.

[පූ.භා.10.34]

**ගරු ඉෆ්තිකාර් ජෙමිල් මරික්කාර්**
Hon. Ifthikar Jemil Marikkar

ගරු සභාපතිතුමනි, බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා, අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ අමාත්‍යාංශය පිළිබඳ වැය ශීර්ෂයේදී කථා කිරීමට අවස්ථාවක් ලැබීම ගැන. ගරු සභාපතිතුමනි, අපි මහජන නියෝජිතයෝ හැටියට මේ ගෞරවනීය සභාව තුළ මහජන සේවාවක් කරන්නටයි මේ වැය ශීර්ෂයට කථා කරන්නේ. අධ්‍යාපනයත්, සංස්කෘතියත් අරගෙන බැලුවාම ආගමත්, ධර්මයත් එක්ක කිට්ටු වන එකට සමාන්තරව දුවන අමාත්‍යාංශ දෙකක් හැටියටයි මේ රටේ පවතින්නේ. ඒ අධ්‍යාපන අමාත්‍යාංශය තුළ මුලින්ම මම හිතන්නේ

පාර්ලිමේන්තුවටත්, දෙවනුව පළාත් සභාවලටත් විනය ඇති කිරීමේ වැඩ සටහනක් ඇති කළ යුතුයි කියන එකත් මේ වැය ශීර්ෂයේදී යෝජනා කරන්න වෙනවා කියන එකත් මට මතක් වෙනවා. අපි මහජනතාවට සේවය කරන්න ඇවිල්ලා ජාතීන් වශයෙන් නියෝජනය වුණත්, මන්ත්‍රීවරයෙක් වුණාම පක්ෂයක් ජාතියක් නැතුව, කුලයක් ජන්මයක් නැතුව මහජන සේවයක් කරන්නයි අපි මේ සභාව නියෝජනය කරන්නේ. මම බොහොම කනගාටු වෙනවා. ජාතියක් ඇදගෙන කථා කිරීමත්, කුලයක්, භාෂාවක් ගැන කථා කිරීමත් ගැන.

අද රටේ ජනගහනයෙන් බස්නාහිර පළාතේ 28% ක් ජීවත් වන ජනසනත්වයක් තුළ, මේ අධ්‍යාපනය අමාත්‍යාංශය තුළ කළ දේවල් බැලුවාම අධ්‍යාපන අමාත්‍යතුමාට බොහොම කනාගාටුවෙන් මතක් කරන්න වෙනවා. අද අධ්‍යාපන අමාත්‍යාංශයට ඇඟිල්ල දික් කරන්න තරම් අවාසනාවන්ත තත්ත්වයක් මතු වෙලා තිබෙනවා කියන එක. ඒ පිළිබඳව අපට කුකුසක්, සැකයක්, විචිකිච්ඡාවක් නැහැ. නියත වශයෙන්ම අධ්‍යාපන අමාත්‍යාංශය පිළිබඳව අපට ප්‍රශ්නාර්ථ ලකුණු ගණනාවක් තිබෙනවා. නමුත් මේ ප්‍රශ්නය ගැන කථා කර කර ඉන්නවාට වඩා මේ රටේ දරුවන්ගේ අධ්‍යාපනය, නුවණ පාදන්නට මේ අධ්‍යාපන අමාත්‍යාංශය මීට වඩා සංවර්ධන මාවතට යොමු කරලා, අධ්‍යාපන මට්ටමෙන් අපි පළාතේ තුන්වැනි තැනට වැටිලා තිබෙන අවස්ථාවක තමයි අපි මේ ඡන්දය පාවිච්චි කරන්නේ. මේ රටේ උසාවියෙන් තහංචි කළ අග්‍රාමාත්‍යවරයෙක්, උසාවියෙන් තහංචි නියෝග දීපු කැබිනට් අමාත්‍ය මණ්ඩලයක් තිබෙන රටක තමයි අපි පළාත් සභාවේ මේ අයවැය ශීර්ෂයට කථා කරන්නේ. මධ්‍යම රජය තුළ අපට තවමත් මුදල් ලැබිලා නැහැ. ලැබෙනවාදෝ නැද්දෝ කියන එක වෙනම කථාවක්. ඒ ලැබුණත්, නැතත් මේ පළාත් සභාව අරගෙන යන්නට ඕනෑ. ඒ නිසා ගරු අධ්‍යාපන ඇමැතිතුමනි, ඔබතුමා නියෝජනය කරන කොට්ඨාශයේත්, ඔබතුමාගේ අගලවත්ත ආසනයේම දෙමළ, මුස්ලිම් දරුවන්ට ඉගෙන ගන්න උසස් පෙළ පාසලක් මේ විනාඩිය වනතුරු නැහැයි කියන එක මම අමාත්‍යතුමාගේ අවධානයට යොමු කරනවා. ඒ නිසා ගරු සභාපතිතුමා මාර්ගයෙන් ගරු ඇමැතිතුමාට මතක් කරනවා ඔබතුමා අධ්‍යාපන අමාත්‍යවරයෙක් හැටියට අවුරුදු ගණනාවක් මේ පළාතේ වැඩ කළත්, ඔබතුමා නියෝජනය කරපු මැතිවරණ කොට්ඨාශය, ඔබතුමාට ආදරය කරපු, ඔබතුමාට ඡන්දය දීපු කොට්ඨාශය අගලවත්ත මැතිවරණ කොට්ඨාශය. මේ මැතිවරණ කොට්ඨාශයේ, උසස් පෙළ දෙමළ මාධ්‍ය සඳහා පාසලක් නැහැ. මතුගම කලාපයට එන්න ඕනෑ. නැත්නම් බේරුවල කලාපයට එන්න ඕනෑ. දෙමළ පාසල් 14 ක් තිබෙන කොට්ඨාශයක්. මුස්ලිම් පාසල් එකක් තිබෙන කොට්ඨාශයක් හැටියට දෙමළ මාධ්‍ය දරුවන්ට සාමාන්‍ය පෙළ විභාගයෙන් පස්සේ මතුගම කලාපයට එන්න වෙනවා. ඒ නිසා මම විශේෂයෙන් ඔබතුමාගේ අවධානයට යොමු කරන්නේ අගලවත්ත ආසනයේ හොඳ සුදුසු පාසලක් තෝරලා උසස් පෙළ දෙමළ මාධ්‍ය පටන් ගන්න ඕනෑය කියලා. අපේ දිස්ත්‍රික්කයේ අමාත්‍යවරයෙක් හැටියට අපි ඔබතුමාට ගරු කරනවා. ඡන්දය බෙදීම මොකක් වුණත්, වක් රටේ අධ්‍යාපනය වෙනුවෙන් මහජන නියෝජිතයෝ හැටියට අපි පෙනී සිටිනවා. කුමන ජාතියට, ආගමට, කුලයට අපි අයත් වුණත්. මේ රටේ දරුවන්ගේ අධ්‍යාපනයට මේ බස්නාහිර පළාතේ බහුතරයක් අපි ඉතිහාසය අරගෙන බැලුවාම, පළමුවැනි තැනට තිබුණු අධ්‍යාපනය පළාතේ තුන්වැනි මට්ටමට වැටීම කනගාටුදායක සිද්ධියක් හැටියටයි අපි දකින්නේ. නැවතත් අපි උත්සාහ කරන්න ඕනෑ රටේ පළමුවැනි තැනට පත් වෙන්නට, රටේ අධ්‍යාපන අමාත්‍යාංශය වෙනස් වෙන්නට ඕනෑ. ඒ නිසා ගරු ඇමැතිතුමනි, ඔබතුමාගේ විශේෂ අවධානය යොමු කරන්න. මේ රටේ සංවර්ධනයත් එක්ක බස්නාහිර පළාතේ අධ්‍යාපනය, කලා කටයුතු වෙන්න පුළුවන්, සංස්කෘතිමය වශයෙන් වෙන්න පුළුවන්, අනෙකුත් ආයතන වෙන්න පුළුවන්, මේ සියලුම ආයතන අරගෙන බැලුවත් බොහොම අඩපණ වුණු තත්ත්වයකට පත් වෙලා තිබෙනවා නම් ඒ පිළිබඳව අපි කථා කළ යුතු වෙනවා. ඒ කථා කරන්නේ ඔබ එක්කවත්, රටේ ජනතාව එක්කවත් තිබෙන තරහකටවත් නොවෙයි. රටේ ජනතාවට තිබෙන ආදරය, රටේ දරුවන් ගැන තිබෙන කැක්කුම, මේ රටේ අනාගතය භාර ගන්න ඉන්න දරුවන්ගේ අනාගය වෙනුවෙන් අපි කථා කළ යුතු වෙනවා. ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා, කළුතර කොට්ඨාශයට දෙමළ මාධ්‍ය ගුරුවරු ලබා දීම පිළිබඳව. විශේෂ ස්තුතියක් කරන්නට ඕනෑ. ඒ වාගේම නැවතත් ඔබතුමා වතු පාසල්වලටත් ගුරුවරුන් ලබා දීම පිළිබඳව මගේ ස්තුතිය මේ අවස්ථාවේදී පුද කරනවා.

නමුත් අපට අඩුපාඩු ගණනාවක් තිබෙනවා. බේරුවල කොට්ඨාශයට ගොඩනැගිල්ලක් ලබා දීමට ඔබතුමාට හැකියාවක් ලැබුණේ නැහැ. අදටත් මතුගම කලාපයේ දෙමළ ගුරු හිඟයක් පවතින ලංකාවේම ගත්තත් අඩුම

[ගරු ඉෆ්තිකාර් ජෙමීල් මරික්කාර්]

දෙමළ ගුරුවරු පවතින කලාපය මතුගම කලාපය. ඒ සඳහා ඔබතුමා විශේෂ අවධානයක් යොමු කළ යුතු වෙනවා. ඒ නිසා ඔබතුමාගේ විශේෂ අවධානය යොමු වෙන්න ඕනෑ අගලවත්ත, මතුගම, කළුතර, බේරුවල අයත් කළුතර දිස්ත්‍රික්කයටත්. ඔබතුමාගේ විශේෂ අවධානය යොමු කරලා දෙමළ ගුරුවරු ලබා දීමට කටයුතු කරන්න ඕනෑ කියන එකත් මේ අවස්ථාවේදී මතක් කරනවා. සංස්කෘතිමය වශයෙන් ගත්තත් අපි ජාතියක් හැටියට බෙදීමක් නැතුව මේ රටේ සංවර්ධනය වෙනුවෙන් පෙනී සිටින්න ඕනෑ. අපි හම්බයෙක්ද, මරක්කලයෙක්ද, මුස්ලිම්ද, දෙමළද, සිංහලද, බෞද්ධද, කතෝලිකද කියන එක නොවෙයි ගරු සභාපතිතුමනි විය යුත්තේ. මේ රටේ සංවර්ධනය වෙනවාද? මේ රටට යහපතක් වෙනවාද? මේ රට නිවැරැදි මඟකට යොමු වෙලා තිබෙනවාද කියන එක අපි සෘජුවම මතක් කරන්න -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ කාලය අවසන්.

**ගරු ඉෆ්තිකාර් ජෙමීල් මරික්කාර්**
Hon. Ifthikar Jemil Marikkar

මට තප්පරයක් දෙන්න. අවසාන වශයෙන් ගරු සභාපතිතුමනි, කාලය කෙටි වුණත් අධ්‍යාපනය තුළ මේ රටේ සංවර්ධනය කරන්නට අපි එක්සත් ජාතික පක්ෂය හැටියට අපේ දායකත්වය හැමදාම ලබා දෙනවා කියන එක මතක් කරමින්, අවසාන වශයෙන් සියලුම අමාත්‍යාංශවල නිලධාරීන්ටත්, අපට සහයෝගය ලබා දීම පිළිබඳව ලේකම් ඇතුළු සියලුම කාර්ය මණ්ඩලයටත් අපේ ගෞරවනීය කෘතවේදීත්වය මේ අවස්ථාවේ පුද කරමින් මා නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[පූ.භා.10.42]

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ගරු සභාපතිතුමනි, ක්‍රීඩා, අධ්‍යාපන, සංස්කෘතික විෂයය සම්බන්ධව හයවැනි පළාත් සභාවේ අයවැයට කථා කරන්න අවස්ථාව ලැබීම ගැන මම සතුටු වෙනවා. මම සතුටු වෙන්න හේතුව තමයි අපේ පවුලේ දහ දෙනාගෙන් අට දෙනෙක්ම විශ්ව විද්‍යාලයට ගිහිල්ලා දෙන්නෙක් කටුබැද්දට ගිහිල්ලා මුළු පවුලේම ඔක්කෝම විශ්ව විද්‍යාලකාරයෝ බවට අපේ අම්මලා තාත්තාලා අපව පත් කළා. ඒ අනුව විදුහල්පතිවරු අට දෙනෙක් ඉන්න පවුලක කෙනෙක් හැටියට මේ අධ්‍යාපන විෂයය ගත්තාම,

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ඔබතුමා මොන විශ්ව විද්‍යාලයේද?

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ඒ අධ්‍යාපන විෂයයට ගැළපෙන ආකාරයෙන් කිසිම ආණ්ඩුවක් කටයුතු කළේ නැහැ. මම ඉස්කෝලය යන කාලේ NGV ශිෂ්‍යත්වයක් කරන්න හම්බ වුණේ. ඒකේ වඩු වැඩ, ලේත් මැෂින්, කොණ්ඩේ කපන ඒවා, කාර්මික විද්‍යාල එතැනින් තමයි අපි ඉස්කෝලේ ඇතුළේ Practical වරිත බවට පත් වුණේ. ඒ කාමරය ඇතුළේ. ඒ නිසා තමයි මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා මේක තේරුම් අරගෙන ලෝකයේ දියුණු වුණු කාර්මික රටවල් එක්ක අපේ මහින්දෝදය විද්‍යාගාර හදන්න අපේ ඉස්කෝල 1000 ක් තෝරාගෙන, 4000 ක් Primary හදලා ඒක ඒකාබද්ධ කරලා මහින්දෝදය විද්‍යාගාරය තුළින් තාක්ෂණ විෂයයන් සම්බන්ධව - ඉංග්‍රීසි භාෂාව, ප්‍රංශ භාෂාව, ජර්මන් භාෂාව, ලෝකයේ තිබෙන අනෙකුත් ඉල්ලුම් කරන රටවල්වල භාෂා ඒකට ඇතුළත් කරලා, ජනාධිපති මහින්ද රාජපක්ෂ මහත්තයාත්, බන්දුල ගුණවර්ධන ඇමැතිතුමා, අධ්‍යාපන ඇමැතිවරයා හැටියටත් කටයුතු කරන්න සූදානම් කළා. අපි Central Government එක ගැන කථා කරනවා. දැන් බස්නාහිර පළාත් සභාව ගත්තාම අපේ කොළඹ නගරය ගන්න. කොළඹ නගරයේ ජාතික පාසල් රාශියක් තිබෙනවා. රෝයල් එක තිබෙනවා. ආනන්ද තියෙනවා. නාලන්ද තියෙනවා. තර්ස්ටන් තියෙනවා. විශාඛා තියෙනවා. දේවි බාලිකා තියෙනවා. ඉතින් මේ වාගේ ජාතික පාසල් රාශියක් කොළඹ නගරයේ තිබෙනවා. කොළඹ නගරයේ ඒ ජාතික පාසල් ගත්තාම, කොළඹ නගරයෙන් සියයට කීයද ඒ ජාතික පාසල්වලට ඇතුළත් වෙන්නේ. ගරු සභාපතිතුමනි, අපේ ඇමැතිතුමා නැහැ නේ? ඇමැතිතුමා ඉන්න එපැයි.

**ගරු සුමිත් විජයමුණි ද සොයිසා**
Hon. Sumith Wijayamuni De Soysa

ඇමැතිතුමා ශරීර කෘත්‍යයකට එළියට ගියා.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ඇමැතිතුමා නැත්නම් අපි කාටද මේවා කියන්නේ? මම කනගාටු වෙනවා. කොළඹ නරගයේ ඉන්න මුස්ලිම්, දෙමළ මන්ත්‍රීවරු ගත්තාම අද බලන්න කොළඹ නගරයේ කුඩා පාසල් ගත්තාම ගුරුවරු කීදෙනෙක් ඒ පාසල්වලට අඩුද? කොළඹ නගරයට ගුරුවරු එන්නේ නැහැ. ගුරුවරු එන්නේ නැති හේතුව මොකක්ද? තිබෙන ප්‍රවාහන පහසුකම් එක්ක කොළඹ නගරයට ඇවිල්ලා යන්න ගියාම කාලය ඉවරයි. ඒ නිසා අපි මීට පෙරත් යෝජනා කළා කොළඹ නගරයේ පාසල්වල, බස්නාහිර පළාත් සභාවට අයිති පාසල් අර තරගකාරී පාසල්වලට සමගාමී ඒවායෙන් Hostel හදන්න කියලා. මේ ගුරුවරුන්ට ඉන්න, විදුහල්පතිවරුන්ට ඉන්න වෙනම නිවාස යෝජනා ක්‍රමයක් හදලා ඒ නිවාස යෝජනා ක්‍රමයේ ගෙවල් ටික ගුරුවරුන්ට දීලා, ඒ දරුවන්ට ඉස්කෝලේ යන්න පහසුකම් ලබලා දීලා තමයි කොළඹ නගරයේ - දැන් මේකේ කියන්නේ මොකක්ද? තරගකාරී අධ්‍යාපනය. මොනවාද? රනිල් වික්‍රමසිංහ මැතිතුමා මොනවාද දෙනවා කිව්වේ? Tab. අද මොකක්ද වුණේ? ටොප්වෙලා ගියා. අද මේ තාක්ෂණ විෂයයත් එක්ක ගත්තාම මේ කම්පියුටරයෙන් පමණක් අධ්‍යාපනය ගන්න බැහැ. ඒකට කාර්මික විද්‍යාල, ඒකට ගැළපෙන Subject මේකට එකතු කරන්න ඕනෑකමක් තිබෙනවා.

ඒත් එක්කම ගරු සභාපතිතුමනි, අද බලන්න ළඟම පාසල හොඳම පාසල. අකිල විරාජ් කාරියවසම් මැතිතුමා මේ යහපාලන ආණ්ඩුව ආවට පස්සේ, අපේ රොඩ්නි ෆ්‍රේසර් මැතිතුමාගේ ගමේ. මගේ ආසනයේ පාසල් දෙකක්. පොල්වත්තේ අපේ රොඩ්නි ෆ්‍රේසර් ගරු මන්ත්‍රීතුමාගේ ගේ ළඟම. අපේ පාසල ළඟම පාසල කියලා හැදුවා. මේ පාසලට එක වැලි කැටයක් දාගන්න බැරි වුණා. උළු ටික මාරුකරලා ලක්ෂ පහක් විතර දාලා, ඇස්බැස්ටෝර් ෂීට් ටිකක් දැම්මා. මෙන්න අපේ පාසල ළඟම පාසල හොඳම පාසල කරපු හැටි. ඉතින් අද මේ ආකාරයට අධ්‍යාපනයට යන්න බැහැ. ඒ නිසා මිශ්‍ර තාක්ෂණ අධ්‍යාපනයක් මේ රටට ගැළපෙන්නේ. පහේ ශිෂ්‍යත්ව ක්‍රමය අම්මා තුන්වැනි පන්තියේ ඉඳලා හැඩ ගැහෙනවා. ඉතින් කාලය යනවා. ශිෂ්‍යත්වයෙන් දරුවන් ඇතුළත් වෙන්නේ සියයට 12 1/2 යි. එතකොට 88 1/2 ක් මේ දරුවන්ට ඒ ශිෂ්‍යත්වයෙන් ලකුණු මට්ටමට යන්න පුළුවන්කමක් නැහැ. ශිෂ්‍යත්ව ක්‍රමයට වඩා ගමේ පාසල හදන ක්‍රමයක් තමයි අපි මේ අධ්‍යාපනයෙන් ගෙන එන්න ඕනෑ. දැන් මේ අධ්‍යාපන විෂයය අපේ ඇමැතිතුමාට කවදාවත් පළාත් සභාවේ මෙහෙම විෂයයන්වලට බෙදුණේ නැහැ. අධ්‍යාපනය තිබෙනවා. ක්‍රීඩා තිබෙනවා. සංස්කෘතික තිබෙනවා. එතකොට මේ තුනම එකට තිබෙන්නේ. දහම් පාසලෙන් පටන් ගත්තාම සංස්කෘතික අමාත්‍යාංශය යටතේ ක්‍රීඩා පිටියත් එක්ක පටන් ගත්තාම, අධ්‍යාපනය. මේ තුන එකට ගැට ගහලා ගෙනියන්න පුළුවන් මේ වාගේ විෂයය ධාරාවක් එක්ක අධ්‍යාපන ඇමැතිවරයෙක් අපට කවදාවත් පත් වුණේ නැහැ. මේ පළාත් සභාවට. නමුත් අධ්‍යාපන ඇමැතිවරයා හැටියට අපේ මිත්‍රයා කරපු දෙයක් නැහැ. කරන්න පුළුවන් දෙයකුත් නැහැ. මොකද, එතුමා එතුමාට දීපු සල්ලි, මේ Budget එකේ පරිපූරක ඇස්තමේන්තුවෙන් දීලා මහ ඇමැතිතුමා ගිහිල්ලා ගල තියලා, බෝඩ් එක ගහලා ගියාට කීදාහක් අවිච්ඡේද වෙලා නැවත අපේ සල්ලි ට්‍රෙෂරියට ගියාද? වෙනත් විෂයන්වලට වියදම් කරන්න පුළුවන් දේවල් ඒකෙන් කර ගන්න වැඩක් නැහැ. මම ක්‍රීඩා අමාත්‍යවරයා හැටියට, සමූපකාර ඇමැතිවරයා හැටියට ඒ දෙක ඒකාබද්ධ කරලා පාසල්වල සමූපකාර අධ්‍යාපන සමිති හදලා ඒකට ක්‍රීඩා අමාත්‍යාංශය එකතු කරලා දිස්ත්‍රික්ක තුනට Swimming Pool දෙකක් මට දෙන්න පුළුවන්කම ලැබුණා. අද කොට්ටාව ධර්මපාලයේ මම හදපු Swimming Pool එක සමූපකාර මේලා එකත් එක්ක එකතු කරලා ඒ ඉස්කෝලේ දරුවන් විතරක් නොවෙයි, වටපිට තිබෙන ඉස්කෝලවලට, සවස්වරුවේ ව්‍යායාම කරන්න එන අය ආවාම ලක්ෂ පහක්, හයක්, හතක් අතර ආදායමක් මේ ඉස්කෝලයට දැන් ලැබෙනවා. දැන් බලන්න එහෙම සැලසුම් සහගතව වැඩ කරන්න පුළුවන් අමාත්‍යාංශයක් මේක. ඉතින් අද එහෙම කරන්න පුළුවන්කමක් නැහැ.

දැන් බලන්න ඉඩමක් දෙනවා. අලුත් චක්‍රලේඛය. අපේ යසපාල කෝරලගේ නියෝජ්‍ය සභාපතිතුමා මේ සභාවට ගෙන ආවා. මේ චක්‍රලේඛය අනුව පන්ති කාමරයේ දරුවෝ අඩු කරලා, පන්ති කාමරයේ දරුවන් 35 ට අඩු කරන්න. නමුත් දැනට 45, 50, 55 දක්වා පන්ති කාමරයේ ළමුන් ඉන්න පාසල් තිබෙනවා. දැන් මේ පන්ති කාමරය අඩු වනකොට වටපිට ඉන්න දරුවාට යන්න පන්ති කාමර අඩු වෙනවා. නමුත් මෙතුමාගේ අධ්‍යාපන වැය ශීර්ෂයත් එක්ක ඒ අඩු වන කාමරයට, කාමරයක් හදන්න ඕනෑ කියලා මුදලක් වෙන් කරලා සැලැස්මක් ඇති කරලා නැහැ,

කලාපවලට. ඒ කලාපවලින් ජනප්‍රිය පාසල්වලින් අඩු වන දරුවෝ සංඛ්‍යාවට ඇතුළත් වෙන්න අපි කාමරයක් දෙන්නේ කොහොමද? එහෙම එකක් හදලා නැහැ. අවුරුද්දෙන් අවුරුද්ද මේක අඩු වනකොට පන්ති පහක් තිබුණු ඉස්කෝලයේ දහ දෙනෙක් අඩු වනකොට පනස් දෙනෙකුට ඉඩ පහසුකම් අවශ්‍ය වෙනවා. එතකොට පනස් දෙනා පළමුවැනි පන්තියෙන් පටන් ගත්තාම 13 වැනි පන්තිය දක්වා ඉස්කෝලේ යන්න ඕනෑ. එතකොට එහෙම යන්න ක්‍රමවේදයක් මේ සැලැස්ම තුළ අද නැහැ. අද අපි ඔබතුමා මගින් ගරු ඇමැතිතුමාට යෝජනා කරනවා. ඉදිරි කාල පරිච්ඡේදයේදී ඒ සැලසුම නිලධාරී මහත්වරු එක්ක කථා කරලා, ඉංජිනේරු මහත්වරු එක්ක කථා කරලා, අධ්‍යාපන ඇමැතිවරු එක්ක කථා කරලා මේ සැලැස්මට මෙය ඇතුළත් වෙන්න ඕනෑ. නැත්නම් දෙමව්පියෝ පාරට බහිනවා. දැනටමත් උද්ඝෝෂණ තිබෙනවා. අපේ දරුවෝ දාලා දෙන්න. සෑම අම්මා කෙනෙක්ම, තාත්තා කෙනෙක්ම තමන්ගේ දරුවා හොඳ තැනකට ගෙනියන්න, වෛද්‍යවරයෙක් කර ගන්න. එහෙම නැත්නම් ඉංජිනේරුවෙක් කර ගන්න, නැත්නම් ගුරුවරයෙක් කර ගන්න, නැත්නම් විදේශ රටකට යවන්න එහෙම නැත්නම් තාක්ෂණ විෂයට යොමු කරවන්න කැමැතියි. අම්මා තාත්තා එහෙම බලාපොරොත්තු වෙනවා. සෑම දුප්පත් පවුලක සිටම පොහොසත් පවුලක් දක්වා එහෙම බලාපොරොත්තු වෙනවා. රොඩ්නි ෆ්‍රේසර් ගරු මන්ත්‍රීතුමා දන්නවා. එතුමා මේ විෂයයන් සම්බන්ධව ටියුෂන් දෙනවා.

අද බලන්න. මේ අධ්‍යාපන ක්‍රමය හරියට තිබුණා. අපේ කාලයේ ටියුෂන් පන්ති ගියේ නැහැ. එහෙම ටියුෂන් පන්ති තිබුණෙත් නැහැ. නමුත් අද වෙලා තිබෙන්නේ පාසල් ඇරිලා දවල්ට කන්නෙත් නැහැ. බෑග් එකේ දාගෙන ගේන පාන් කෑල්ල කාලා ආයෙත් ඇඳුම් මාරු කරන්නේ නැතුව යන්නේ, ටියුෂන් පන්තිවලට. මේකට විකල්පය මොකක්ද? මේකට කරන්න ඕනෑපාසලක පැය දෙකක් මේ විෂයය ධාරාව, අධ්‍යාපනය අඩු දරුවන්ට උගන්වන්න කටයුතු කිරීමයි. ඒකට පළාත් සභාවේ අපේ මුදල්වලින් ඒක අයට පොඩි බටා එකක් දෙන්න ඕනෑ. ඒගොල්ලන්ට -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා ඔබතුමාගේ කාලය අවසන්. කථාව අවසන් කරන්න.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

විනාඩියක් දෙන්න. එතකොට ගාමිණී තිලකසිරි ගරු ඇමැතිතුමා බන්දුල ගුණවර්ධන ගරු ඇමැතිතුමා හෝමාගම ජනාධිපති විද්‍යාලය හදලා, ලංකාවේ තරගකාරීව තිබුණු ආනන්ද, නාලන්ද, රෝයල්, තර්ස්ටන් කියන එදා සුද්දාගේ කාලයේ ඉඳලා ආපු ඉස්කෝලවලට වඩා දියුණු කරන්න පුළුවන් වුණේ -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා සමාවෙන්න. ඔබතුමාගේ කාලය අවසන්. කරුණාකර වාඩි වෙන්න.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

එතුමාත් විශ්ව විද්‍යාලයේ හිටපු කෙනෙක්. එතුමාත් වෘත්තීය සමිති කළ කෙනෙක්. මේ සම්බන්ධව එතුමාගේ මොළය පෑදේවා කියලා ප්‍රාර්ථනා කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය සභාපති යසපාල කෝරලගේ මැතිතුමා මූලාසනයේ අසුන් ගන්නවා ඇති.

***ඊට අනුකූලව ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු නියෝජ්‍ය සභාපතිතුමා [යසපාල කෝරලගේ මහතා] මූලාසනාරූඪ විය.***

*Accordingly Hon. Chairman [Mr. Sunil Wijeratne] left the Chair and Hon. Deputy Chairman [Mr. Yasapala Koralage] took the Chair.*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මීළඟට රොඩ්නි ෆ්‍රේසර් ගරු මන්ත්‍රීතුමාට විනාඩි 10 ක කාලයක් ලබා දෙනවා.

[පූ.භා.10.54]

**ගරු රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ස්තුතිවන්ත වෙනවා. ප්‍රථමයෙන්ම කනගාටුව

ප්‍රකාශ කරනවා හෘදය සාක්ෂියට එකඟව යම් යම් අවස්ථාවලදී කටයුතු කරන්නට නොහැකිවීම පිළිබඳව. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, උපාලි කොඩිකාර ගරු මන්ත්‍රීතුමා මෙතැනින් ගියා. එතුමා කථා කළා වත්මනේ බන්දුල ගුණවර්ධනයන් පිළිබඳව එහෙම. එතුමා සැබවින්ම මගෙත් ගුරුවරයා. අපේ පාසලේ ආදි ශිෂ්‍යයෙක්. මම ඉගෙන ගත්තේ ලුම්බිණි මහ විද්‍යාලයේ. ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය මගෙත් විශ්ව විද්‍යාලය. අපේ විශ්ව විද්‍යාලයේ සහ විද්‍යෝදය විශ්ව විද්‍යාලයේ වියතෙක්. එතුමාත් විශාල සේවාවක් කළා මේ ක්ෂේත්‍රයට. එතුමා එහෙම නොකළා කියලා කියන්න බැහැ. විශේෂයෙන් මගේ පාසල ජාතික පාසලක් බවට පත් කරන්න විශාල කැප කිරීමක් කරපු අය. නමුත් එකක් මතක තියාගන්න ඕනෑ. උපාලි කොඩිකාර මැතිතුමා එතුමාගේ බුද්ධිය මත තමයි එතුමා තීරණය කරන්න ඇත්තේ. මේ රටේ නිදහස් අධ්‍යාපනය හඳුන්වා දුන්නේ එක්සත් ජාතික පක්ෂය. එක්සත් ජාතික පක්ෂයේ සී.ඩබ්ලිව්.ඩබ්ලිව්. කන්නන්ගරයන්. අපේ අධ්‍යාපන ඇමැතිතුමාගේ, වත්මන් පළාත් අමාත්‍යතුමාගේ අගලවත්ත ප්‍රදේශය නියෝජනය කරපු පුද්ගලයෙක්. ඒ නිසා අපට පුංචි ආඩම්බරයක් තිබෙනවා. අර සූප්පුවේ සිට උපාධිය තෙක් වාගේ අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ තිබෙන්නා වූ සියලු කඩඉම් හැම දෙයක්ම ලබා දීලා තිබෙන්නේ, එක්සත් ජාතික පක්ෂය. ඒ නිසා එක්සත් ජාතික පාක්ෂිකයන් හැටියට අපි කරලා තිබෙන සේවාවන් අතිවිශාලයි. මම හිතන්නේ එතුමා හිටියා නම් වඩා හොඳයි.

මහින්දෝදය පාසල් පමණක් නොවෙයි. අපි තමයි පාසල් පද්ධතිය, නිදහස් අධ්‍යාපනය, දරුවාට නිදහස් පොත්පත් ටික ලබා ගන්න දුන්නේ. ඇඳුම් පැළඳුම් ටික ලබා දුන්නේ. ඒ වාගේම දිවා ආහාර වේලක් ලබා දුන්නේ. මැදි මහ විද්‍යාල ලබා දුන්නේ. විද්‍යා පීඨ ඇති කරලා විද්‍යා පීඨ ගුරුවරුන් බිහි කළේ. තරුණ සේවා සභාව පිහිටුවලා ඒ සඳහා අවශ්‍ය කරන පසුබිම හදලා දුන්නේ. තාක්ෂණ විෂයය ධාරාවන් සඳහා වෙනමම කාර්මික විද්‍යාල ඇති කිරීම කරලා ඒ කටයුතු කළේ. ඒ නිසා අපි ඉතාමත් සතුටට පත් වෙනවා. ගරු ඇමැතිතුමා, ඔබතුමා දන්නවා ඇති ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ලබන දරුවෝ හතළිස් පන් ලක්ෂයක් ජීවත් වෙනවා. මේ හතළිස් පන් ලක්ෂයටම සුරක්ෂා රක්ෂණය ලබා දුන්නේ පසුගිය කාලයේ එක්සත් ජාතික පක්ෂය. ඒ නිසා අපි විශේෂයෙන්ම ස්තුතිවන්ත වෙන්න ඕනෑ අකිල විරාජ් කාරියවසම් ගරු ඇමැතිතුමාට. එතුමා විශාල මිල කරන්න බැරි ආකාරයේ සේවාවන් රාශියක් කරපු නායකයෙක්. අද ඔබතුමාත් ගුරුවරයෙක්. ඔතැන හිටියාට. මම නම් තවමත් ගුරු වෘත්තියේ නියැළිලා ඉන්නවා. ඔබතුමා ඇත් වුණාට. ඔබතුමා මේ ක්ෂේත්‍රය පිළිබඳව දන්නවා.

අකිල විරාජ් කාරියවසම් මැතිතුමා ගත්තොත් එතුමාගේ අමාත්‍යාංශය හරහා කවදාවත් නිලධාරීන්ට ඇඟිල්ල දික් කරලා මේ දෙය කරන්න, මේ දෙය කරන්න එපැයි කියලා කියපු පුද්ගලයෙක් නොවෙයි. ඒ නිසා එතුමා දන්නවා මේ සංක්‍රාන්ති සමය තුළ වත්මනේ මහින්ද රාජපක්ෂ මැතිතුමා අගමැතිවරයෙක් බවට පත් කළාට පස්සේ එතුමාගේ කාලය තුළදී අඩුම තරමින් මේ වනකොට නිදහසේ ඇඳුම් ටික ලබා ගන්න පුළුවන්කමක් ඇති කරලා දීලා නැහැ. ජනවාරි 01 වැනිදා වනකොට දරුවාට නිල ඇඳුම් ඇඳගෙන යන්න පුළුවන්කම ලබලා දීලා නැහැ. එතකොට බස්නාහිර පළාත තුළ ඉන්නා වූ සියලුම දරුවොත් ඒකට මුහුණ දෙනවා. ඇත්තටම මම නම් සතුටට පත් වෙනවා. අපේ මහරගම කලාපය තුළ මනෝ ගනේෂන් ඇමැතිතුමා හරහා මට පුළුවන්කම ලැබුණා පාසල් විශාල සංඛ්‍යාවකට අවශ්‍ය කරන නිල ඇඳුම් සංඛ්‍යාවක් ලබා දෙන්න. ඒ නිසා අපි ඇත්තටම සතුටු වෙනවා. එක්සත් ජාතික පක්ෂය තුළ මම හිතන්නේ බුද්ධියෙන් හෙබි මන්ත්‍රීවරු තමයි වැඩි පිරිසක් ඉන්නේ. බුද්ධියෙන් අඩු අය අපේ නැහැ. අපි මන්ත්‍රීවරයෙක් හැටියට ගන්න කොට අපේ අධ්‍යාපන සුදුසුකම් අපි අනිවාර්යයෙන්ම සපුරා තිබෙන්න ඕනෑ. අපි සිරිකොතේ ෆෝම් එකක් පුරවනකොට ඔබේ අධ්‍යාපන සුදුසුකම් මොනවාද කියලා බලපානවා. ඒ අනුව තමයි අපට තීරණය කිරීමක් කරන්න අවස්ථාව ලබා දෙන්නේ. ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපේ උපාලි කොඩිකාර මැතිතුමා හිටියා නම් වඩා හොඳයි. එතුමාගේ පුද්ගලිකත්වය හුවා දක්වනවා නොවෙයි. එතුමා කිව්වා මගේ ප්‍රදේශය ආසන්නයේ තිබෙන හොඳම පාසල ළඟම පාසල යටතේ පාසලක් හදන්න ලැහැස්ති වුණා. නමුත් මොනවත් කර ගන්න බැරි වුණා කියලා. අපේ වත්මන් අධ්‍යාපන ඇමැතිතුමා දැන් මෙතැන ඉන්නවා. එතුමා දන්නවා ඇති ඔය කථා කරන්නේ පන්නිපිටිය, දෙපානම, ධර්මපාල කණිෂ්ටය පිළිබඳව. හොඳම පාසල ළඟම පාසල යටතේ මට ලබා දුන්නා. මම ලක්ෂ 85 ක් ලබා ගත්තා. ලක්ෂ 85 ක් ලබාගෙන ඒ පාසල ඉතාමත් දියුණු ආකාරයේ පාසලක් බවට පත් කරලා තිබෙනවා. බිම ටෙරාසෝ කරලා. Sliding Windows දාලා. වහලය

[ ගරු රොහිනි රුඩොල්ෆ් ප්‍රේසර් ]

වෙනස් කරලා. ඉස්සරහ පිට්ටනිය වාගේ ලස්සනට අලංකාර කරලා. ඒ පාසලේම දරුවෝ 16 දෙනයි හිටියේ. අද මේ වනකොට පළමුවැනි ශ්‍රේණියේ 27 දෙනෙක් බවට පත් කරගන්න පුළුවන් වුණා. ඒ වාගේම පස්වන ශ්‍රේණිය දක්වා දරුවෝ දෙන්නයි, තුන්දෙනයි හිටියේ. අද පස්වන ශ්‍රේණියේ ළමයින් 27 දෙනෙක්. සියල්ලටම ලකුණු 100 ට වඩා ලකුණු ප්‍රමාණයක් ගෙන එන්න පුළුවන්කම ලැබුණා. ඒ නිසා අපට මේ අවස්ථාවේ මේ ස්ථානය නැතත් අපේ පක්ෂයේ ලේකම්තුමා, අකිල විරාජ් කාරියවසම් මැතිතුමා සමස්ත ශ්‍රී ලංකාව තුළත්, ඒ වාගේම බස්නාහිර පළාත තුළත් මේ අධ්‍යාපනය ඉදිරියට අරගෙන යන්න වෙර දැරීම පිළිබඳව ඉතාමත් සතුටට පත් වෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම හැමදාම කථා කරන දෙයක් තමයි මම මේ අමාත්‍යාංශ උපදේශක කාරක සභාව නියෝජනය කරන මන්ත්‍රීවරයෙක්. අමාත්‍යතුමා දන්නවා කිසිම දවසක අපි උපදේශක කාරක සභාවට නැවිත් ඉඳලා, ඊට එරෙහිව කටයුතු කරපු පුද්ගලයෝ නොවෙයි. ඉඳලා හිටලා අපි සහභාගී වෙලා නැහැ. ඒ වාගේම ව්‍යුහ කමිටු තිබෙන කොට ඒවායේත් එහෙමයි. ඒවාට ගිහිල්ලා ප්‍රදේශයේ තිබෙන පාසල්වලට අවශ්‍ය කරන සියලු දේවල්වලදී අපි ඒ ඒ අවශ්‍යතා කරලා තිබෙනවා. ඇත්ත වශයෙන්ම මහ ඇමැතිතුමා මට - මම ඒකයි මුලින් කිව්වේ හෘදය සාක්ෂියට එකඟව කටයුතු කරන්න නොලැබීම පිළිබඳව කියලා. මහ ඇමැතිතුමා මගේ ප්‍රදේශයේ ඉන්න ජන නායකයා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ වෙන්න පුළුවන්. නමුත් මට ඕනෑම පාසලකට ගිහිල්ලා ප්‍රධානත්වය අරගෙන වැඩ කටයුතු කරන්න එතුමා අවස්ථාව ලබා දීලා තිබෙනවා. ඒක මේ අවස්ථාවේදී විශේෂයෙන්ම සඳහන් කරන්න ඕනෑ. මහරගම ශ්‍රී ජයවර්ධනපුර අධ්‍යාපන කලාපයේ කටයුතු කරගෙන යැමේදී බොහෝ දුරට අධ්‍යාපන ඇමැතිතුමා අවසර දීලා තිබෙනවා මහ ඇමැතිතුමාට, එතුමාට රිසි සේ කටයුතු කරගෙන යැමට. ඒ නිසා අපි ඉතාමත් සතුටට පත් වෙනවා. මහරගම ශ්‍රී ලංකාවේ පස්වන ශ්‍රේණියේ හතරවන ස්ථානයත්, ඒ වාගේම පිලියන්දල කලාපයේ පළමුවන ස්ථානයටත් ගෙන එන්න පුළුවන්කමක් ලැබුණා. විශේෂයෙන් වැඩි ළමුන් සංඛ්‍යාවක් සමත් කරපු ප්‍රදේශවල මහ ඇමැතිතුමා කරන කාර්ය භාරය පිළිබඳව සතුටට පත් වෙනවා. එතුමා එක සංකල්පයක් හඳුන්වා දීලා තිබෙනවා. බස්නාහිර පළාතේ කළුතර, කොළඹ, ඒ වාගේම ගම්පහ කියන ප්‍රදේශවල එක පාසලක් අරගෙන ඒ පාසල දියුණු කරන්න.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපේ පාසල් පද්ධතිය ගත්තාම අපේ පාසල් පද්ධතිය තුළ භේදයක් දකින්න ලැබෙනවා. ඒ භේදය තමයි එදා අපි පාසල් යද්දී උපාලි කොඩිකාර මැතිතුමා කියපු ආකාරයෙන් ඒ පාසල් පද්ධතියයි, අද පාසල් පද්ධතියයි අතර වෙනසක් තිබෙනවා. එදා අපි ගියේ රජයේ පාසලකට. එදා ජාතික පාසල් සහ පළාත් පාසල් කියලා භේදයක් දකින්න ලැබුණේ නැහැ. සියලුම පාසල් ඒක හා සමානයි. සියලුම සම්පත් සමානා ආකාරයෙන් බෙදී යැමක් තිබුණා. අද එහෙම නොවෙයි. අද ගත්තොත් එහෙම පළාත් පාසල්වලට සම්පත් බෙදී යැමේ අඩුවක් තිබෙනවා. ඒ වාගේම ජාතික පාසල් ගත්තාම, වැඩි සම්පත් ප්‍රමාණයක් ලැබෙනවා. ඒ නිසා එතැනම පන්ති භේදයක් ඇති කරලා තිබෙනවා. එහෙම නැත්නම් Royal College එක ඉස්සරහා අවිස්සාවේල්ලට යන බස් එකක් නතර කරන්න බැහැ. කොහොමද එහෙම නම් ආනන්ද, නාලන්ද, තර්ස්ටන්, විශාඛා, දේවි බාලිකා වාගේ පාසල් ඉස්සරහා පිට වෙනත් පාසල් ඉස්සරහා පිට - ප්‍රදේශයේ ඉන්න දරුවෝ නම් ගන්නේ කොහොමද ඒ පාසල අද්දර පාසල ඇරෙන කොට දරුවෝ රැගෙන යන්න පිට පළාත්වල බස් තිබීම පිළිබඳව ඔබතුමාට තේරෙනවා ඇති. දරුවෝ ඇතුළත් කර ගන්න කොට අපට ගැටළුවක් වෙලා තිබෙන්නේ. අමාත්‍යතුමාත් දන්නවා. මේ කටයුත්තේදී අමාත්‍යතුමාත් ඊට එරෙහිව ඉන්නවා. අපි හොඳ දරුවෝ බිහි කරනවා. බස්නාහිර පළාතේ ගත්තාම පළාත් පාසල්වල ඉන්න දරුවෝ තමයි ශිෂ්‍යත්වයෙන් ඉහළ සමත්වීම් ලබා ගත්තාට පස්සේ අපි මේ හදාගත්තු අපේ දරුවෝ ටික ජාතික පාසල්වලට යනවා. අපි ගත්තොත් මහරගම කලාපයටම ජාතික පාසලක් නැහැ. කැස්බෑවට අයිති ධර්මපාල විද්‍යාලය කැස්බෑවටයි අයිති. අපි හොඳ ළමයි බිහි කරලා පස් වන ශ්‍රේණියේ දක්ෂ ළමයින් ටික අර පාසල්වලට භාර දෙනවා. ඒ පාසල් තමයි හැමදාම ඉහළට ගිහිල්ලා තිබෙන්නේ.

ඔබතුමා සොයා බලන්න ඔය කියන පාසල්වල Royal College එක වේවා, එක එක ආයතනවල වෙන්න පුළුවන්. පස්වන ශ්‍රේණියේ ඉහළ ලකුණු ලබාගත්තු පාසල් කොහේද තියෙන්නේ. මේ අපේ පාසල් තිබෙන්නේ. මහ ඇමැතිතුමා කියන ආකාරයට අපේම පාසලක් තිබෙන්න ඕනෑ. අපේ හොඳ සම්පත්වලින් හෙබි දක්ෂ දරුවෝ පාසල්වලට යන්නේ. ගරු ඇමැතිතුමනි, එක කරුණක් තමයි අපේ පාසල් ඔබතුමා පස්වන ශ්‍රේණියට සීමා කරලා තිබෙනවා. පාර්ලිමේන්තුව ළඟ ඉඳලා පන්නිපිටිය දක්වා ගත්තොත්

පස්වන ශ්‍රේණියෙන් ඉහළට තිබෙන පාසල් නැහැ. මේ මැත තිබෙන සුභූති විද්‍යාලය ජාතික පාසලක්. ඊට එහා තිබෙනවා පැලවත්ත විද්‍යාලය, ඒ විද්‍යාලයේ පමණයි උසස් පෙළ දක්වා තිබෙන්නේ. පන්නිපිටිය දක්වාම තිබෙන්නේ පස්වන ශ්‍රේණිය දක්වා පමණයි. ඔබතුමන්ලා විශ්වාස කරනවා ඇති කොළඹ ඉන්න සියල්ලම එක ආදායම් මට්ටමක ඉන්න අය කියලා. මම ඊයේත් කිව්වා, අපේ ජාතික ආදායමෙන් 59% ක් ලබා ගන්නේ බස්නාහිර පළාත. ඒ බස්නාහිර පළාතේ 59% න් 80% ක් ගන්නේ ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ලොකු මිනිස්සු. 20% ක් තියෙන්නේ. ඒ 20% ලබා ගන්නේ 80% ක් වාගේ ප්‍රමාණයක්. හරි දරිද්‍රතාවයෙන් පෙළෙන්නා වූ පිරිසක් ඉන්නේ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපේ ප්‍රදේශවල පාසල් නොයන දරුවෝ ඉන්නවා. අපේ ගෙවල් පැත්තේ ඉන්නවා. මට මෙතැන ඉඳලා ගෙදර යන්න විනාඩි 06 ක් යන්නේ නැහැ. කලල්ගොඩ පැත්තේ දරුවෝ ඉන්නවා පාසල් යන්නේ නැතුව. මොකද, හයවැනි ශ්‍රේණියෙන් පස්සේ යන්න පාසලක් නැහැ. පළමුවැනි වාරයේ යනවා. දෙවැනි වාරයේ යනවා. ඊට පස්සේ ඒ ළමයාට යන්න පුළුවන්කමක් නැහැ. තවමත් අඹුඩය ගහගෙන අපේ පැතිවල වගා කරනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මගේ ගේ පිටිපස්සේ තිබෙන්නේ වෙල. කොපමණ කොළඹට ආසන්නයේ හිටියත් අර පරණ දර්ශනයම වෙලේ දකින්න ලැබෙනවා. ඒ දරුවන්ට අද වෙලා තිබෙන්නේ මොකක්ද? එතැනින් එහාට යන්න තැනක් නැහැ. විශේෂයෙන්ම මම අපේ අකිල විරාජ් කාරියවසම් මැතිතුමාටත්, රනිල් වික්‍රමසිංහ මැතිතුමාටත් ස්තූතිවන්ත වෙනවා. එතුමන්ලා ඉදිරිය පිළිබඳව, අනාගතය පිළිබඳව දැක්මක් තිබුණු නායකයෝ. එතුමන්ලා බොහෝ අවස්ථාවලදී 11 වැනි ශ්‍රේණියෙන් පස්සේ දරුවාව ත්‍රිවීල් එකකට සීමා කළේ නැහැ. දරුවාව ඉහළ තත්ත්වයකට යවන්න හැම වෙලාවේම උත්සාහ කළා. ඒ නිසා තමයි තාක්ෂණික විෂයය ධාරාවන් හඳුන්වා දීලා, ඒ තාක්ෂණික විෂයයන් ධාරාවන්වලට යොමු වෙන්නට දරුවාව බිහි කළේ. උපාලි කොඩිකාර ගරු මන්ත්‍රීතුමා කිව්වා එතුමාගේ කාලයේ කොණ්ඩ කපන ඒවා තිබුණා, ඔව් ඒ වාගේ දේවල් තිබුණා. මටත් මතකයි. අපේ පාසල ලුම්බිණි විද්‍යාලය. ලුම්බිණි විද්‍යාලයේ යකඩ, මැටි එහෙම කර්මාන්ත තිබුණා. විවිධ කර්මාන්තවලට යොමු වෙන්න පුළුවන් ආකාරයේ. එක එක තමන්ගේ දක්ෂතා තිබෙන. අද පාසල්වල ඒවා නැහැ. අද පාසල් තාක්ෂණික පැත්තට පමණයි යොමු වෙලා තිබෙන්නේ. මට මතකයි මම මෑතකදී ආචාර්ය හර්ෂ ද සිල්වා මැතිතුමාත් එක්ක ගිහිල්ලා ශ්‍රී ජයවර්ධනපුර කලාපයට අයිති ශ්‍රී ජයවර්ධනපුර පාසල. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ශ්‍රී ජයවර්ධනපුර පාසල කියලා කියන්නේ, ශ්‍රී ලංකාවේ ආනන්ද සමරකෝන් එතකොට ජෝන් ද සිල්වා ඉගෙන ගත්තු පාසල. ඇතුළට ගිහිල්ලා බැලුවොත් තාර ටික දාගන්න බැහැ. සැලළිහිණි සංදේශය ලියලා තිබෙන්නේ එහේ. මේ පාසලේ තමයි මුලින්ම සුහුරු පන්ති හඳුන්වා දුන්නේ. Smart Classes. මම මේ මෑතදීත් ඒ පාසලට ගියා. ඔබතුමාත් සහභාගී වුණා. හයවැනි ශ්‍රේණියේ දරුවෝ ඉන්නවා ඉතාමත් දක්ෂයි. Tab එකෙන් තමයි උගන්වන්නේ. ඒ ළමයාට සියලු විෂයය ධාරාවන් පුංචි Tab එකක ගොනු කරලා තිබෙනවා. නමුත් මම කියන්නේ නැහැ මේක හොඳ දෙයක් කියලා. මොකද හේතුව? වත්මනේ අපට එරෙහි වුණු ජනාධිපතිතුමා. එතුමාත් එතුමාගේ ප්‍රකාශවලදී කථා කරලා තිබෙනවා. ඇත්තටම සෞන්දර්යාත්මක දරුවෙක් බිහි කරන්නේ නැහැ. තාක්ෂණික දරුවෝ පමණයි ඒ තුළින් බිහි වෙන්නේ. ගරු නියෝජ්‍ය සභාපතිතුමා මාර්ගයෙන් ගරු ඇමැතිතුමාගෙන් ඉල්ලා සිටිනවා මෙතැන අධ්‍යාපනඥයන් රැඳී ඉන්නවා නම් අපි පාසල් යද්දී -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමාගේ කාලය අවසන් වෙනවා.

**ගරු රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

මට පොඩි කාලයක් දෙන්න. අපි පාසල් යන කාලයේ ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම කථා කරන්න ඉගෙන ගත්තේ ලුම්බිණි විද්‍යාලයෙන්. අපට නාට්‍ය පුරුදු කළේ පාසලෙන්. අපට කවිය, ගීතය ලියන්න පුරුදු කළේ පාසලෙන්. අද පාසල්වල ඒක දකින්න ලැබෙන්නේ නැහැ. අපේ හාමුදුරුවනේ එළිවැට කියන්නේ, එළිසමය කියන්නේ මොනවත් දන්නේ නැහැ. අද හයිකු කවි කියලා කියන්නේ මොනවාද කියලා දන්නේ නැහැ. කවි පෙළක් ලියන්න කිව්වොත් කවි පෙළ ලියා ගන්න දරුවෙක් දන්නේ නැහැ. නිර්මාණශීලී දරුවෝ බිහි වෙලා නැහැ. මම ඉතාම කනගාටුවට පත් වෙනවා. මහ ඇමැතිතුමා කිව්වා මේකේ කලාකරුවන් විශාල සංඛ්‍යාවක් ඉන්නවා. කලාකරුවෝ විශාල සංඛ්‍යාවක් හිටියත් සංස්කෘතික අංශය හරහා අපට

[ ගරු රොඩ්නි රුඩොල්ෆ් ෆ්‍රේසර් ]

කටයුත්තක් කළේ නැහැයි කියලා. මම මේ රටේ ඉන්න කලාකරුවෙක් හැටියට මට සංස්කෘතිය පිළිබඳව කථා කරන්න වෙලාවක් නැහැ. නැත්නම් බොහෝ කරුණු තිබෙනවා. මම මෙතුමා එක්කත් කිය කියා හිටියේ ලියාගෙන ඇවිල්ලා ලැහැස්ති වෙලා වැඩක් නැහැ. මොකද, විනාඩි 10 ක් තුළදී කථා කරන්න දෙයක් නැහැ. කථා කරන්න නැඟිටින කොට විනාඩි 10 ඉවර වෙනවා. ඒ නිසා මේ අයවැයට කැමැතිද අකැමැතිද කියාල නිකන් ලියුමක් ලියලා දැම්මා නම් - මොකද, ගරු ඇමැතිතුමනි, අපට කිසිම අවස්ථාවක මේකේ තිබෙන අන්තර්ගතය, මේකේ වියදම් කරන්න තිබෙන ප්‍රමාණය මහේන්ද්‍ර මන්ත්‍රීතුමන්ලා එහෙම කථා කරන කොට මමත් හරි ආසයි. අන්තර්ගතයට ගිහිල්ලා කරුණු කියා පානවා. දැන් මේකේ අපට කථා කරන්න කිසි දෙයක් නැහැ. උපාලි කොඩිකාර ගරු මන්ත්‍රීතුමා කථා කරපු දේවල්වලට උත්තර දෙනවා. තව කෙනෙක් කථා කරපු දේවල්වලට උත්තර දෙනවා. එච්චරයි. ඉතින් ඒකද අයවැය කියලා කියන්නේ?

ඒ වාගේම ගරු නියෝජ්‍ය සභාපතිතුමා මඟින් මම ගරු ඇමැතිතුමාගෙන් ඉල්ලනවා. අපි ක්‍රීඩාව පිළිබඳව කථා කරනවා. අපි මේ මෑතදීත් නෙට්බෝල් ක්‍රීඩාවට යොමු වෙලා හිටපු ඒ දරුවන්ව දිරිමත් කිරීම සඳහා තුන් දෙනෙක් ගෙනැල්ලා ලක්ෂ පහක වාගේ මුදලක් ලබා දුන්නා. ඒ වාගේම ශිෂ්‍යත්වය සමත් වුණු දරුවන් ගෙනැල්ලා ඔවුන්ට රුපියල් ලක්ෂ තුන, හතර, පහ ගණනේ බෙදා දීමක් කරලා, දිරිමත් කිරීමක් කරන්න උත්සාහ කළා. ගරු ඇමැතිතුමා බස්නාහිර පළාතේ ඉන්න සියලුම කලාකරුවෝ ගෙනැල්ලා බහුතරයක් කලාකරුවන් ඒ ඇගයීමට ලක් කරලා, රුපියල් 10,000 බැගින් ලබා දුන්නා. නමුත් නිලධාරීන්ද මොකක් හරි හේතුවක් නිසාද දන්නේ නැහැ මේ පිළිබඳව ජනමාධ්‍ය තුළින් කථා කරන්නේ නැහැ. බස්නාහිර පළාතේ අපි මෑතකදී විශාල කලාකරුවෝ සංඛ්‍යාවක් ඇගයීමට ලක් කළා. ඒක ජාති භේදයෙන් තොරව ද්‍රවිඩ, සිංහල, දෙමළ, මුස්ලිම් මේ සියලුම අය ගෙන්නලා ඒ අයට දුන්නා. නමුත් මේක දකින්න ලැබෙන්නේ නැහැ. දැන් නාඩා කියන ආයතනය හුදෙකලා වෙලා තිබෙන්නේ. මම නම් ඔබතුමාගෙන් නාඩා කියන ආයතනය - ඔබතුමා ඉදිරි කාලයේත් රැදෙනවා නම් මෙතැන හොඳ දක්ෂතාවයන්ගෙන් හෙබි අය ඉන්න ඕනෑ. අඩුම තරමේ ඉංග්‍රීසි කථා කරගන්න පුළුවන් නායකයෝ එතැන ඉන්න ඕනෑ. මොකද හේතුව, එතැන ආදායම් ලබන ස්ථානයක් බවට පත් වෙන්න ඕනෑ. හෝටල්වලට ගිහිල්ලා, හෝටල්වල කළමනාකාරීත්වයත් එක්ක කථා කරලා ඒ අයත් එක්ක සාකච්ඡා කරන්න ඕනෑ මේ ආයතනයේ අපේ ඉඩ තිබෙනවා. ඕනෑම වෙලාවක එන්න. මේ මේ පහසුකම් තිබෙනවා. ඔයගොල්ලන්ගේ Promotion එහෙම කරන්න. ඒ නිසා ඒක ආදායම් නොලබන ආයතනයක් බවට පත් වෙලා. කලාකරුවන්ට රාත්‍රිය ගත කරන්න පුළුවන්. ඒ ස්ථානවල රාත්‍රියට ඉන්න පුළුවන් කියලා - මම නම් දන්නේ නැහැ, ඒක අකුරකට සීමා වුණා විතරයි. ඒවා ඉන් එහාට කෙරුණේ නැහැ. අපි කරපු නාට්‍යයක් නැහැ. අඩුම තරමින් මේ බස්නාහිර පළාතෙන් කරපු නාට්‍යයක් නම් දකින්නට ලැබුණේ නැහැ. ඒ කියන්නේ වෙනම නාට්‍යයක් නැහැ නේ?

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

මේක ඇතුළේ කෙරුවා.

**ගරු රොඩ්නි රුඩොල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

ඒ නාට්‍ය පමණයි තිබෙන්නේ. ඒ නිසා කලාකරුවෝ විශාල සංඛ්‍යාවක් ඉන්නවා. රොජර් සෙනෙවිරත්න ඉන්නවා. රවීන්ද්‍ර යසස් ඉන්නවා. නලින් ප්‍රදීප් උඩවෙල ඉන්නවා. මම ඉන්නවා. තව කීදෙනෙක් ඉන්නවාද? ඉතින් අඩුම තරමින් මහවැලියෙන් වැඩ ගනිව්, ගනිව් කිව්වාට, මහවැලියෙන් වැඩ ගත්තේ නැහැ වාගේ අපෙන් කිසිම වැඩක් ගත්තේ නැහැ. ඔබතුමාගේ කාර්ය භාරය නොවෙයි තිබෙන්නේ. නිලධාරීන් අපෙන් වැඩ ගත්තේ නැහැ. ඒ වගේම මම ඔබතුමාගෙන් අවසාන වශයෙන් ඉල්ලා සිටිනවා. පාසල් දරුවන් තුළ බස පිළිබඳව කථා කරන්න උගන්වන්න වැඩි අවස්ථාවක් දෙන්න ඕනෑ කියලා. විදුහල්පතිවරුන්ට දෙන්න ඕනෑ. **எனக்கு நல்லா தமிழாலயும் கதைக்க முடியும்.** I Can Speak English too. මට දෙමළෙන් කථා කරන්න පුළුවන්. ඉංග්‍රීසි භාෂාවෙන් කථා කරන්න පුළුවන්. සිංහල භාෂාවෙන් කථා කරන්න පුළුවන්. මගේ මව සිංහල. මගේ තාත්තා ඇවිල්ලා ස්කොට්ලන්ත ජාතිකයෙක්. මට දෙමළ භාෂාව පිළිබඳව ගැටළුවකුත් නැහැ. මම යාපනයට ගියාම දෙමළෙන් කථා කරනවා. කොළඹ ඉංග්‍රීසි සිංහල. මේ භාෂාව පිළිබඳව මට

ගැටළුවක් නැහැ. ව්‍යාකරණ පිළිබඳවත් කිසිම ගැටළුවක් නැහැ. (බාධා කිරීමක්) ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ශ්‍රී ලංකාවේ සිංහල බස පිළිබඳව ප්‍රධානම තැනැත්තෙක් හැටියට ඉන්නේ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සුනිල් ආරියරත්නයන්. සුනිල් ආරියරත්නයන් නන්දා මාලනියට ගීතයක් ලියලා තිබෙනවා. ඒ නන්දා මාලනීට ලියලා තිබෙන ගීතය තමයි,

ඉගෙන ගන්ට බැහැ ලෙහෙසී
ඉගෙන ගත්තොතින් වාසී
රජයෙක් වෙන්ට ලෝවාසී
ඉගෙන ගනින් ඉංග්‍රීසී කියලා.

මේ ලියලා තිබෙන්නේ, මහාචාර්ය ජේ.බී. දිසානායකයන් හැරුණාම සුනිල් ආරියරත්න. ඉතින් හිතන්න සිංහල පිළිබඳ ජ්‍යෙෂ්ඨ මහාචාර්යතුමා ඉඳන් කියනවා රජයෙක් වෙන්න ලෝවාසී, ඉගෙන ගනින් ඉංග්‍රීසී කියලා. ඒ නිසා මම හිතන්නේ ඇමැතිතුමා බස පිළිබඳව උගන්වන්නත් මීට වඩා වැඩි කාලයක් යොමු කරයි කියලා. ඒ නිසා බොහොම ස්තූතියි. මගේ මිත්‍ර ගරු මන්ත්‍රීතුමාටත් ස්තූතිය පුද කරනවා මේ අවස්ථාව ලබා දීම පිළිබඳව.

[පූ.භා.11.13]

**ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ**
Hon. Upul Mahendra Rajapaksa

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ප්‍රථමයෙන්ම මම සමාව අයදිනවා. අද දිනයේ මගේ ගමනාගමනයේදී ඇති වුණු අපහසුතාවයක් නිසා පසුගිය වැය ශීර්ෂයට ඡන්දය විමසන වෙලාවේදී මට වෙලාවට සහභාගී වෙන්න බැරි වුණා. විශේෂයෙන් අධ්‍යාපනය ගැන අදහසක් ප්‍රකාශ කරන්න ලැබීම ගැන සතුටු වෙනවා. විශේෂයෙන් අධ්‍යාපනය වෙනුවෙන් අවස්ථා දෙකකදී කාරණා දෙකක් කථා කරන්න තිබෙනවා. එකක් තමයි මේ බස්නාහිර පළාතේ අධ්‍යාපන ක්‍රියාවලිය සහ විශේෂයෙන් අත්තනගල්ල ආසනයේ අධ්‍යාපනය ගැනත් මට කථා කරන්න සිද්ධ වෙනවා. විශේෂයෙන් මේ අධ්‍යාපන ක්‍රමය ගැන ඉස්සෙල්ලාම හිතන කොට මම විශ්වාස කරන්නේ, හැම කෙනාම ශිෂ්‍යත්වය පිළිබඳව කථා කළාට, ඒ පිළිබඳව සමාජයේ විවිධ කතිකාවන් ආවත් අවසානයේ හැම තිස්සේම ආපහු අමතක වෙලා යනවා. ඊට පස්සේ තරගයට යොමු වීම තමයි සිද්ධ වෙන්නේ. අපි හැමෝම හෘදය සාක්ෂියට අනුව කථා කරලා බලන්න ඕනෑ. පුංචි කාලේ ඔබත්, මමත් පාසල් යන කාලේ එක විෂයයකට ලකුණු 75 ක් ගත්තා නම් අපේ අම්මටයි, තාත්තාටයි මොන තරම් සතුටක්ද? අපට A සාමාර්ථයක් D සාමාර්ථයක් ලැබිලා මොනතරම් සතුටින්ද ගෙදර ආවේ? හැබැයි අර අවුරුදු හයක්, හතක් වුණු අපේ දරුවා පාසල් ගිහිල්ලා ලකුණු 167 ක් ගත්තත් අසමත් කියලා ප්‍රතිඵලය ආවාම දරුවාට පුතේ කියලා කථා කරන්නේ නැති සමාජයක අපි ජීවත් වෙන්නේ. මීහරකා, ගොනා, බූරුවා ඒ වචන අහලා දරුවෝ මොනතරම් කම්පාවට පත් වෙනවා ඇතිද? ඒ නිසා ශිෂ්‍යත්ව විභාගය අධිවේගී ශිෂ්‍යත්වයක්. ලබන වසර, ඊළඟ වසර වනකොට තවත් බොහෝ ලකුණු වැඩි වෙන්න පුළුවන්. ඒ ලකුණු වැඩි වනකොට මේ හා සමාන ලකුණු ප්‍රමාණයක් අපේ දරුවන්ට ගන්න පුළුවන්ද? මේ ඉන්න අපි ඔක්කෝම ශිෂ්‍යත්ව විභාගයෙන් සමත් වුණු අයද? ඇයි දරුවන්ගේ ළමා කාලය සියල්ල විනාශ කරලා දාලා ශිෂ්‍යත්වය වෙනුවෙන් පෙළඹවීමෙන් අපේ ඉලක්කයන් සපුරා ගන්න පුංචි දරුවන්ගේ ජීවිත අපි මොනතරම් සපුරා ගන්න ඕනෑද?

අත්තනගල්ල ආසනයෙන් ලකුණු 199 ක් අරගෙන දරුවෙක් ශිෂ්‍යත්වය සමත් වුණා. අපේ හිතවතෙකුගේ. ඒ නිසා අපි සතුටු වෙනවා වාගේම ලකුණු අඩුවෙන් ගන්න දරුවන්ට අද තිබෙන ප්‍රශ්නය තමයි පාසලක් සොයා ගැනීම. මේ අත්තනගල්ල ආසනය පුරාම පාසල් ගණනාවකම ශිෂ්‍යත්ව විභාගය සමත් අයට සහතික දෙන්න ගියත් තාත්තා කෙනෙක් වශයෙන් මට දැනෙන දේ තමයි ලකුණු 180 ක් ගත්තු ළමයාට ඉස්කෝලයක් තියෙයි. ලකුණු 175 ක් ගත්තු ළමයාට ඉස්කෝලයක් නැහැ. ඒ අම්මලා සතුටු වෙන්නේ නැහැ. ඉතින් මේ අධ්‍යාපන ක්‍රමයේ කොතැන හරි වැරැද්දක් තිබෙනවා. එය නිවැරැදි කරන්න ඕනෑ. උවමනා ජනප්‍රිය පාසල් නම්, ඒ ජනප්‍රිය පාසල් අපේ අධ්‍යාපන කොට්ඨාශය තුළ ගොඩ නගලා විශ්වාසය ඇති කරන්නට ඕනෑ කියලයි මම විශ්වාස කරන්නේ.

ඒ වාගේම තමයි මේ අධ්‍යාපන බලධාරීන් මොන විධියට චක්‍රලේඛ නිකුත් කරනවාද කියන එක පිළිබඳව මට අවබෝධයක් නැහැ. නමුත් ඒ අය කියනවා ප්‍රාථමික පාසල්වලට සෞන්දර්ය ගුරුවරු දීමේ අවශ්‍යතාවයක් නැහැ. ඒ පාසල්වලට ක්‍රීඩා ගුරුවරු දීමේ අවශ්‍යතාවයක් නැහැ. ඔවුන් ඉන්නේ ඉතාමත් ඈත නිර්ණායක තුළ. ඉස්සර නම් ගුරුවරු බඳවා ගත්තේ එක්කෝ විද්‍යා පීඨයක පුහුණුව ලබපු ගුරුවරයෙක්. ඇයට සහ ඔහුට හොඳ පුහුණුවක් ලබා දීලා ගුරුවරයෙක් වශයෙන් පාසලට එනවා වෙන්න පුළුවන්.

[ ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ ]

ඒ තුළ සෙනෙහස, දයාව, කරුණාව, කුසලතාවය, මහජන සබඳතා සියලු දේවල් ප්‍රගුණ කරලා එච්චත්, අද දිනයේ මොකක්ද කරන්නේ? අද දිනයේ කරන්නේ උපාධියත් තිබෙන කෙනෙකුට පත් වීමක් දීලා පාසලකට එව්වාට පස්සේ ප්‍රාථමික අධ්‍යාපනයත් කඩා වැටෙනවා. ව්‍යාකරණ ටික දන්නේ නැහැ. අකුරක් ලියන්න දන්නේ නැහැ. එහෙම නැත්නම් ළමයින්ට දෙන්න ඕනෑ සෙනෙහස ආදරය දන්නේ නැහැ. සමහර විට හිත වෙනස් කරගෙන ඉන්නවා උපාධිධාරියෙක් නිසා. එතකොට අපි මේ බලාපොරොත්තු වන ඉලක්කගත අධ්‍යාපනයේ ප්‍රාථමික මට්ටමින් සිද්ධ වෙනවාද? දරුවාගේ කුසලතා පරිපූර්ණත්වයට පත් වෙනවාද? දරුවාගේ ක්‍රීඩාව පරිපූර්ණත්වයට පත් වෙනවාද? ඒ නිසා බලධාරීන් වශයෙන් චක්‍රලේඛයට යටත් වෙනවාට වඩා පුංචි දරුවා තුළයි නැටුම තිබෙන්නේ. පුංචි දරුවාගේ ඇඟ තුළ තමයි කලාවේ හැකියාව තිබෙන්නේ. දරුවාගේ විභව ශක්තීන් ටික ඔප මට්ටම් කරන්නේ කවුද? මේ දරුවා උපතින් ගේන විභව ශක්තීන් ටික කළමනාරකණය කර ගන්න, අපේ අධ්‍යාපන ක්ෂේත්‍රය හරහා මේ සෞන්දර්යට හා ක්‍රීඩාවට පුංචි දරුවෝ යොමු කරවන්නට අපි යම් කටයුත්තක් කරන්නට ඕනෑ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, චක්‍රලේඛයේ තිබෙනවා සෞන්දර්ය ගුරුවරු දෙන්න බැහැ කියන එක. නමුත් අද මම මේ වකවානුව තුළ දීර්ඝ වශයෙන් පාසල්වලට සම්බන්ධ වුණු මහජන නියෝජිතයෙක් නිසා අපි දැක්කා මනරම් සංදර්ශන ගණනාවක්. සාමාන්‍යයෙන් පෙර පාසල්වල අවසාන කාලයේ තිබෙන දරුවන්ගේ Concert එක වාගේ පාසල් අතරත් අද මේවා සීඝ්‍ර වශයෙන් දියුණු වෙලා, පිටින් ගුරුවරු ගෙනැල්ලා, නැත්නම් පරිබාහිර පුද්ගයෝ ඇවිල්ලා තමයි දරුවන්ගේ මේ කුසලතා ටික පරිපූර්ණත්වයට පත් කරවන්නේ. තාත්තා කෙනෙක් වශයෙන් ගියාම නෙතට කඳුලක් එනවා. මේ අපේ දරුවෝ නේද? මේ දරුවෝ නේද අපි කුසලතාවයෙන් යටපත් කරලා, ක්‍රීඩාවෙන් යටපත් කරලා මේ ඉලක්කගත අධ්‍යාපනයක් සඳහා පමණක් මෙහෙයවන්න උත්සාහ කරන්නේ? ඒ නිසා අපේ පුංචි දරුවන්ගේ ළමා ලෝකයේ අයිතීන් සුරක්ෂිත කරන්න, ළමයාගේ ළමා කාලයේ තිබෙන හැකියාවන් ඔප මට්ටම් කරන්න දැනුම විතරක් නොවෙයි. ඒ කුසලතාවයෙන්, ආකල්පවලින් දරුවන් වැඩිදියුණු කරන්න මේ අධ්‍යාපන ක්‍රමය මුල ඉඳලා හැදෙන්න ඕනෑ කියලයි මම විශ්වාස කරන්නේ.

ඒ වාගේම විශේෂයෙන්ම අපේ ගුරුවරු දිහා බැලුවාම, ගුරුවරුත් එක්ක කථා කළාම තිබෙන ප්‍රධාන කාරණයක් තමයි ගුරුවරු ප්‍රශ්න ගණනාවකින් පෙළෙනවා. ගුරුවරු අපට නිතර කියන දෙයක් තමයි මන්ත්‍රීතුමා අපි මේ ගුරුවරු වශයෙන් සේවය කළාට අපට නිවාස ක්‍රමයක් - මේ රටේ තිබෙන නිවාස අධිකාරියට කථා කරලා, එහෙම නැත්නම් පළාත් සභාව මගින් ගුරුවරුන්ට නිවාස දෙන ක්‍රමයක් හදලා දෙන්න. ඒ වාගේම තමයි අපි ඇවිල්ලා මෙතැන කථා කරනවා. අනේ ඇමැතිතුමා, මහ ඇමැතිතුමා අපට පස් මහල් ගොඩනැගිල්ලක් දෙන්න. තුන් මහල් ගොඩනැගිල්ලක් දෙන්න. ඔබ යන්න පාසලට. පාසලට ගියාම ගුරුතුමියලා අපට කියනවා මන්ත්‍රීතුමා උඩට නඟින්න අමාරුයි. එක්කෝ සීනි අමාරුව. එක්කෝ රුධිර පීඩනය. නැත්නම් විවිධ රෝගවලින් පෙළෙන ඒ අය කියනවා අනේ අපට තට්ටු තුනක් නැඟලා උගන්වන්න යන්න බැහැ. පහළින් පන්ති කාමරයක් හදලා දෙන්න. දරුවෝ ටික පල්ලෙහාට ගෙනැල්ලා අධ්‍යාපනය ලබලා දෙන්න. ඒ නිසා ප්‍රායෝගිකව මේ සමාජයේ තිබෙන දේවල්. අපට පුළුවන් තට්ටු පහක ගොඩනැගිල්ලක් ගහලා සතුටු වෙන්න. හැබැයි ගුරුවරුයා කම්මැලි කරනවා පන්තියට යන්න. කොහොමද මම නැඟලා ගිහිල්ලා දරුවාට අධ්‍යාපනය දෙන්නේ. එහෙම නම් මේවාට ක්‍රමවේද තියෙන්නට ඕනෑ. එහෙම නම් ඒ පිළිබඳව අපි සොයා බලන්න ඕනෑ. මානසික ආතතියෙන් ඉන්න ගුරුවරු කොපමණ ඉන්නවාද? මනසේ විවිධ වූ රෝග තත්ත්වයන්ට පත් වූ ගුරුවරු කොපමණ ඉන්නවාද? අපචාරවලට පත් වූ ගුරුවරු කොපමණ ඉන්නවාද? පාසල් තුළ උගන්වන්න දන්නේ නැති ගුරුවරු කොපමණ ඉන්නවාද. හිස්ගෙඩි ගණනින් බලලා ගුරු තුලනය වුණා. ගුරුවරු ඉන්නවා. පන්ති කාමරයට එහෙම ගුරුවරයෙක් ඇද්ද කියන එක අපි කල්පනා කරන්න ඕනෑ.

ඒ වාගේම තමයි අපි හොඳ වුණත්, නරක වුණත් 1 -13 දක්වා අධ්‍යාපන ක්‍රමය ගැන මොන ආණ්ඩුවෙන් කළත් ඒක හොඳ අධ්‍යාපන ක්‍රමයක්. ඒක අපි අගය කරන්නට ඕනෑ. සාමාන්‍ය පෙළ අසමත් වුණා කියලා දරුවා නිකම්ම ගෙදර යන්නේ නැහැ. වෘත්තියක් ඉගෙන ගෙන දරුවා එළියට යන්නේ. ඒ වාගේම තමයි මහින්දෝදය පාසල් ක්‍රමයත් අපි

අගය කරන්නට ඕනෑ. අද අධ්‍යාපන ක්‍රමය තුළ විශාල ඉල්ලුමක් තාක්ෂණ පීඨයට ලැබිලා තිබෙනවා. ඒ වාගේම තමයි අපට මේ අධ්‍යාපන ක්‍රමයේ තිබෙන ගැටළුව. උසස් පෙළ මොනවා හරි විෂයයන් තුනක් කරලා ඒ අය විශ්ව විද්‍යාලයට යනවා. මේ බස්නාහිර පළාතේ ඉඳලා ඕනෑම තැනකට කථා කරලා මේ ඉන්න නිලධාරීන්ගෙන් අහලා බලන්න උපාධිධාරීන් කියලා පත්වීම් අරගෙන එන අයට ලියුමක් ලියන්න පුළුවන්කමක් තිබෙනවාද? ඒ අයට ලියුමක් ගලපා ගන්න පුළුවන්කම තිබෙනවාද? ඔවුන්ට මේ පිළිබඳව අවබෝධයක් තිබෙනවාද? එහෙම නම් මේ අධ්‍යාපන ක්‍රමයේ, මේ රජයට, මේ ආයතනවලට නිලධාරීන් බඳවා ගන්න කොට අඩු තරමින් තරග විභාග ක්‍රමයක් තියන්න ඕනෑ. එහෙම නැත්නම් අඩුම වශයෙන් ගණනක් දෙකක් හරි හදන්න දීලා, එක්කෝ අත්අකුරු ටික හරි බලලා මේවාට බඳවා ගන්න ඕනෑ. මේ ක්ෂේත්‍රයෙන් විශාල වශයෙන් මොනවා හරි විෂයයන් තුනක් කරලා විශ්ව විද්‍යාලයට ගිහිල්ලා ගන්නා උපාධිය තුළ රැකියා දීම තුළ සියලු ක්ෂේත්‍රයන් බිඳ වැටිලා තිබෙනවා. මේවායේ ගුණාත්මකභාවය බිඳ වැටිලා තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අත්තනගල්ල ආසනයේ, ඒ ප්‍රදේශයේ මන්ත්‍රීතුමා වශයෙන් මම සමීක්ෂණයක් කළා. මගේ ළඟ නාම ලේඛනය තිබෙනවා. එක ඉස්කෝල විස්සක ළමයින් 90 දෙනෙක් ඉන්නවා පහේ පන්තියේ අකුරක් කියන්න හෝ ලියන්න බැරි ළමයින්. අකුරක් ලියන්නත් බැරි, කියන්නත් බැරි ළමයින් පහේ පන්තියේ 90 ක් ඉන්නවා. ඒ වෙනුවෙන් අපි ගන්න තීන්දුව මොකක්ද? මම කියන්නේ තුනේ පන්තියේ ගුරුවරයාට දඬුවම් කරන්න ඕනෑ. හතරේ පන්තියේ ගුරුවරයාට දඬුවම් කරන්නට ඕනෑ. අකුරු බැරි දරුවෝ පහේ පන්තියට එන්නේ කොහොමද? මේ තරගකාරී රටාව තුළ ශිෂ්‍යත්ව විභාගයෙන් ලකුණු 100 ගන්න උගන්වන කොට අකුරු ලියන්න බැරි ළමයා ගැන සොයා බලපු ගුරුවරයා කවුද? එහෙම නැත්නම් නිලධාරියා කවුද? එහෙම අකුරු ලියන්න බැරි ළමයින් 90 ක් ඉන්නවා, අපේ අත්තනගල්ල ආසනයේ පාසල් 20 ක් තුළ. ඛේදවාචකයක් කියන එකයි මම ඔබට කියන්නේ. ඒ වාගේම තමයි අපේ ඓතිහාසික විහාරස්ථානයක් කේන්ද්‍ර කරගෙන පුංචි කෞතුකාගාරයක් හැදුවා. ඒ කෞතුකාගාරයේ අපේ ගමේ තිබෙන නඟුල, වියගහ, කුරක්කන් ගල, බුසල, සේරුව එහෙම නැත්නම් හුණ්ඩුව විවිධ වර්ගයේ දේවල් අරගෙන ගියා. අද පාසල්වලින් දරුවෝ අරගෙන බස් එනවා, මේවා බලන්න. මොකද, පුංචි දරුවන්ගේ පරිසරය ප්‍රශ්න පත්‍රයට මෙන්න මේ කාරණා අහනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙන්නේ.

**ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ**
Hon. Upul Mahendra Rajapaksa

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මට විනාඩිය නම් පොඩ්ඩක් මදි වෙයි. ඒ නිසා කෞතුකාගාර හදලා හරි මේ දරුවන්ට කටයුතු කරන්න ඕනෑ. ඒ නිසා ඇමැතිතුමා නැති වුණත් මම කියන්න ඕනෑ. ඛේදවාචකය තමයි මම මේ සභාවට ඇවිල්ලා මහ ලොකුවට කථා කරනවා. මම මේ අධ්‍යාපනය ගැන හොඳට අදහස් දක්වනවා. මම අපේ ගමේ අයට කථා කරලා කිව්වා මට දරුවෝ තුන්දෙනෙක් ඉන්නවා. ගමේ පාසලක් අපි හදා ගමු. මමත් ළමයි තුන් දෙනාව ගමේ ඉස්කෝලයට දාන්නම්. මගේ සහෝදරයින්ට, ගමේ නෑදෑයින්ට කියලා ඒ ගමේ පාසලේ ළමයින් 40 ක් හිටපු පාසල අද ළමයින් 400 දක්වා වැඩි කරලා තිබෙනවා. ඒ ප්‍රදේශයේ හොඳ පාසලක්. ඉතා පිටිසර ගමක. හැබැයි මම අපේ ඇමැතිතුමාට ඇවිල්ලා කිව්වා. ඇමැතිතුමා අවුරුදු 05 ක් මම මෙහෙම කරපු කෙනෙක්. මගේ නංගිගේ දරුවා යශෝදර පාසලට දාලා දෙන්න. අවුරුදු 05 ක් කිව්වා. තවම ඒක කරලා දුන්නේ නැහැ. සංඝබෝධි විද්‍යාලයේ ළමයින් යශෝදරාවට ගියා. මේකේ ඉන්න මන්ත්‍රීතුමන්ලාගේ ළමයි ගියා. හිටපු විදුහල්පතිවරුන්ගේ ළමයි ගියා මේ යශෝදරා පාසලට. හැබැයි ඇමැතිතුමා මගේ වැඩේ කරලා දුන්නේ නැහැ. මම කැපකිරීමක් කළා, ඒ පාසල් අධ්‍යාපනය නඟා සිටුවන්න. මගේ තහරකුත් නැහැ. මම විරුද්ධව ඡන්දය දෙන්නෙත් නැහැ. නමුත් ඇමැතිතුමා දැනගන්න ඕනෑ අපටත් යම් සාධාරණයක් කරන්න. ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, විනාඩියක් දෙන්න. මම මේ අධ්‍යාපනය ගැන යම් හරි සැනසිල්ලකින් කථා කරන්නේ අපේ අත්තනගල්ලේ ඉන්න පන්නිල කියන හාමුදුරුවෝ නිසා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා කාලය පිළිබඳ ගැටළුවක් එනවා.

**ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ**
Hon. Upul Mahendra Rajapaksa

මට විනාඩියක් දෙන්න. මම ගිය අයවැයේත් කිව්වා අත්තනගල්ලේ ඉන්න පන්හිල නායක හාමුදුරුවෝ මේ වනකොට ඉස්කෝල 25 ක් හදලා තිබෙනවා. එක පාසලක ගොඩනැගිල්ලේ වටිනාකම ලක්ෂ 200 යි. දැන් අපේ හාමුදුරුවෝ කයිනයට ඇමරිකා ගිහිල්ලා. අපේ ප්‍රදේශයේ හම්බ වුණු වෙලාවක මට කථා කළා. මන්ත්‍රීතුමා මම නැවත ඉස්කෝල පහකට මුල්ගල තියනවා. ඔබතුමාට මොකක් හරි අවශ්‍යතාවයක් තියෙනවා නම් කියන්න. අද ගොඩනැගිලි 25 ක්, තෙමහල් ගොඩනැගිලි හදලා ලක්ෂ 200 ගණනේ වියදම් කරලා මොනතරම් සේවයක් මේ අධ්‍යාපනය වෙනුවෙන් කරනවාද? මොන හාමුදුරුවෝද ඉතිහාසයේ එහෙම පාසල් හදලා තිබෙන්නේ. ඕනෑතරම් හාමුදුරුවරු මේ සමාජයේ බිහි වෙලා තිබෙන්න පුළුවන්. ඕනෑතරම් වීරත්වය තිබෙන්න පුළුවන්. කොයි හාමුදුරුවෝද මේ වාගේ තමන් මුදල් වියදම් කරලා තිබෙන්නේ? තමන්ට රජයෙන් දුන්නු නිල වාහනය විකුණලා පාසලක් හැදුවා. ජනවාරි 26 වැනිදා රදාවඩුන්න කියන, මීරිගම ආසනයේ පාසලකුත් ඒ වාගේම අත්තනගල්ලේ තව පාසලකුත් විවෘත කරනවා.

ඒ වාගේම ඊයේ පෙරේරදා වහරක, කැගල්ල ප්‍රදේශයේ පාසලකුත් උන් වහන්සේ හැදුවා. මම මේ සභාවේදී නිර්ලෝභීව කියනවා මතු බුදු වෙන්නට ඕනෑ හාමුදුරු කෙනෙක්. පාසල් අධ්‍යාපනය වෙනුවෙන්, තමන්ගේ ප්‍රදේශයේ දරුවෝ වෙනුවෙන් දරුවෝ 1000 කට ශිෂ්‍යත්ව ආධාර දෙනවා. නැති බැරි මිනිස්සුන්ට ගෙවල් හදලා දෙනවා. සම්පූර්ණයෙන්ම වතුපිටිවල රෝහල නඩත්තු කරන්නේ අපේ හාමුදුරුවෝ. මතු බුදු වෙන්න පෙරුම් පුරන හාමුදුරුවන්ට අපි අපේ ගෞරවය දක්වන්නට ඕනෑ. ඒ වාගේම තමයි අත්තනගල්ල ආසනයේ තල්ගස්මොටේ කියන ප්‍රාථමික විදුහලට අළුබෝමුල්ලේ සුමනසාර හාමුදුරුවෝ තට්ටු පහක ගොඩනැගිල්ලක් දුන්නා. අඩි 120 ක් දිගයි. අඩි 90 ක් පළලයි. මුළු ඉස්කෝලයේම පුටුවේ ඉඳලා සියලු දේවල් ඒ හාමුදුරුවෝ ලබා දෙනවා. තට්ටු පහක ගොඩනැගිල්ලක් ලබා දුන්නා. දැනට පාසලේ තාප්පය පවා ඉදි කරලා ලබන අවුරුද්දේ අපේ ඇමැතිතුමාට ලැජ්ජාවක් නැතුව අත්තනගල්ල ආසනයට ඇවිල්ලා ඒ ගොඩනැගිල්ලත් විවෘත කරන්න පුළුවන්. මගේ කාලය හමාරයි. මගේ නංගිගේ දරුවාගේ - ඇමැතිතුමා මට නොසැලකුවාට සහෝදරකම නැති වුණත් ඇමැතිතුමාට මේ තිබෙන අසහනකාරී වෙලාවේ මම එතුමාගේ පැත්තේ ඉඳගෙන අවංකවම ඡන්දය දෙනවා කියලා ප්‍රකාශ කරමින් මම නිහඬ වෙනවා.

[පූ.භා.11.27]

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, හොරා ගත්තු කේජු කැල්ල තමුන්ගේ කටට දාගන්න කාක්කාට මියුරු ගී කියනවා වාගේ අපේ මන්ත්‍රී කණ්ඩායමත් බලය සොයාගෙන තැන් තැන්වල සාකච්ඡා කරන වෙලාවක් තමයි දකින්නේ. එවැනි පරිසරයක ඉඳලා තමයි අපි අද කථා කරන්නේ. ඉතින් පළමුවෙන්ම අපේ අධ්‍යාපනය හොරා ගැනීමත්, හොරා ගැනීම බෙදා ගැනීම සඳහාත් යන සංකල්පය අධ්‍යාපනයෙන්ම අවබෝධයක් ඇතුව, ඒ අධ්‍යාපන ක්‍රමයෙන්ම වෙනස් වෙලා, නිවැරදි සංකල්පවලට එන්න ඕනෑ කියන යෝජනාව මම ඔබතුමාට පළමුව කරනවා. අපේ පෙළ පොත්වලත් හොරා කන හැටි, හොරා කාපුවා බෙදා ගන්න හැටි අපි ඇතුළත් කරන්න හොඳ නැහැ. මම හිතන්නේ ඒ කාලයේ අධ්‍යාපන පොත්වල ඒවා තිබුණා. ඒ පුරුද්දට දන්නේ නැහැ දැන් හොරා කන්න තමයි ඉහළ දේශපාලන තලයත්, පහළ දේශපාලන තලයත් පුරුදු වෙලා තිබෙන්නේ. ඒ නිසා හොරා ගත්තු ඒවා බොදා ගන්න නිලධාරීන් ඒ සඳහා සන්තෝෂයෙන් ඉන්නවා. ඉතින් මේ ක්‍රමය වෙනස් වුණේ නැත්නම් මේ ලංකාවේ අපි කොපමණ තර්ක විතර්ක කළත්, කොපමණ අලුත් නීති ගෙනාවත් මේ රට ඉස්සරහාට යන්නේ නැහැ. ඒ නිසා අද අපි සන්තෝෂ වෙනවා යම්තාක් දුරකට හරි හොඳ දර්ශනයක් තිබෙන, උවමනාවක් තිබෙන මන්ත්‍රීවරු කිහිප දෙනෙක් හරි බිහි වෙලා ඉන්නවා. ඒ නිසා ඒක ගැන අපි සතුටු වෙනවා. මම හැමෝම කියපු කාරණා එක්ක කථා කරන්නේ නැතුව මම කියන්න කැමැතියි, තොරතුරු තාක්ෂණ ප්‍රඥප්තියක් මේ පළාත් සභාවට ගෙන ආවා සංශෝධනයක් සඳහා. ඒක සම්මත වුණේ අඩුපාඩු සහිතවයි. ජනතා විමුක්ති පෙරමුණ ඡන්දය පාවිච්චි කළේ නැහැ. විරුද්ධ වුණා. ඒක හරියාකාරව සම්මත වෙලා නොවෙයි තිබෙන්නේ. මම හිතුවා අධ්‍යාපන ඇමැතිතුමා මේ අඩුපාඩු හදාගන්න මේක නැවත ඉදිරිපත් කරයි කියලා. මේ වනකල් ඉදිරිපත් වුණේ නැහැ. ඒ නිසා ඔබතුමාගේ සේවා කාලය ඉවර වෙලා යනකොටත් මේක අඩුපාඩුව සහිතවයි තිබෙන්නේ. ඒ නිසා මේක වැදගත් කාරණාවක්.

මම මතක් කරනවා. මේ අයවැය විවාදයේදී මේවා හරිගස්සන්න. අපි ඉන්නේ අඩුපාඩු තියලා යන්න නොවෙයි. මෙතැන හරි වැඩක් කරලා යන්න තිබෙන්නේ. ඒ නිසා එය හරිගස්සන්න. ඒ වාගේම මම දැක්කා අපේ ක්‍රීඩා ප්‍රඥප්තිය තිබෙනවා. මේකේ දිස්ත්‍රික්කයේ ඉඩම් මණ්ඩල, පළාත් ක්‍රීඩා මණ්ඩල, ප්‍රාදේශීය ක්‍රීඩා මණ්ඩල පත් වෙන්න ඕනෑ. මේවා ගැන කිසිම අවධානයක් යොමු වෙලා නැහැ. ඒ ආයතන ඒ ආයතනවලට ඕනෑ විධියට වැඩ කරනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපට ඇති තරම් නීති තිබෙනවා. ක්‍රමවේද තිබෙනවා. දවස ගාණේ එක එක ඒවාට චක්‍රලේඛත් ගහනවා. නමුත් මේවා ක්‍රියාත්මක වෙනවාද කියන පසුවිපරම නැහැ. අද ඒ ක්‍රීඩාවේ වගකීම ගන්න ඕනෑ අය, ඒ වගකීම ගන්නේ නැති නිසා බොහොම දක්ෂ තරුණ තරුණියෝ ආවත්. ඒගොල්ලන් කල එළි වෙලා ඉස්සරහාට එන්නේ නැහැ. අපි මේ ප්‍රඥප්තිවලින් බලාපොරොත්තු වෙලා තිබෙන්නේ, ඒ පත් කරන කාර්ය මණ්ඩලය ඒ වැඩේ හරියට කෙරුවා නම් අද දක්ෂ ක්‍රීඩකයෝ, ලෝක පූජිත ක්‍රීඩකයෝ බිහි කරන්න අපට පුළුවන්කම තිබෙනවා. එහෙම දක්ෂ අය ඉන්නවා. මේ අඩුපාඩුවත් මම ඔබතුමාගේ අවධානයට යොමු කරනවා.

ඒ වාගේම මේ පාසල්වල භාණ්ඩ විගණනය කිරීම සම්බන්ධව නිසි වාර්තා ඇවිල්ලා නැහැ කොයිම අවස්ථාවකවත්. මීගමුව කලාපයේ විතරක් ආයතන120 ක් තිබෙනවා. ඒවාවල සුළු ප්‍රමාණයකයි මේ පිළිබඳව හරියට කරලා තිබෙන්නේ. ඉතින් මේ වාගේ මුළු පළාත් සභාවම බැලුවොත් විශාල වශයෙන් කරන්න වැඩ තිබෙනවා. සමහර වෙලාවට තේ එකක් බිබී කථා කරන නිලධාරීන් අපි දැකලා තිබෙනවා. හැබැයි, පැය අටක් වැඩ කරන කොට 16 ක් වැඩ කරන නිලධාරීනුත් ඉන්නවා. අපි ඒ අයට ප්‍රශංසා කරන ගමන්ම මෙන්න මෙවැනි කළ යුතු රාජකාරියෙන් මග ඇරලා කේජු කැල්ල දිහා බලාගෙන ඉන්න අයට මම කියන්න ඕනෑ. අපි බුද්ධිමත් දරු පරම්පරාවක් හදන්න නම්, අපි ආදර්ශය දෙන්න ඕනෑ. ඉහළ ඉන්න දේශපාලන නායකයා හොඳ ආදර්ශයක් දුන්නොත් තමයි අපි ඒක පිළිපැදලා, තව ඉස්සරහාට හොඳ ගමනක් යන්නේ. ඒ වාගේ තමයි. අධ්‍යාපනයේ දරුවන්ට උගන්වන ගුරුවරයා පළාත් අධ්‍යාපන කාර්යාලයේ, ඒ වාගේම කොට්ඨාශ අධ්‍යාපන කාර්යාලයේ හරි මග පෙන්වීමක් දුන්නාම තමයි පාසල හරි ගමනක් යන්නේ. අඩුපාඩු එකක් නොවෙයි.

මම ඊළඟට කියන්න ඕනෑ. අපේ සෞන්දර්ය නිකේතනය ගැන. සෞන්දර්ය නිකේතනයේ රෙස්ටුරන්ට් එකක් පවත්වාගෙන යන්න කුලියට දීලා තිබෙනවා. බොලිවුඩ් එක්ස්ප්‍රස් රෙස්ටුරන්ට්. මේක 2014 සිට 2019 වන තෙක් අවුරුදු පහකට දීලා තිබෙනවා. අපේ ඇමතිතුමා දන්නවා ඇති. මම හිතන්නේ, මේකට ගිවිසුමක්වත් ගහලා තිබුණේ නැහැ. සංස්කෘතිය කියන්නේ මොකක්ද? රෙස්ටුරන්ට් එකක්ද? මම මේ වැදගත් කාරණා කිහිපයයි කථා කරන්නේ. විනාඩි දහයයි නේ තිබෙන්නේ. මට පැය තුන හතරක් දෙනවා නම් මම මුල ඉඳලා අගට කියා දෙනවා, කොහොමද අධ්‍යාපනය හදන්නේ කියලා. ඒ නිසා මේ සංස්කෘතිය අද නැති වෙලා ගිහිල්ලා නිසා තමයි විඥානය කියන එක ළමයින් ළඟ නැත්තේ. මොකක් හරි බොරුවක් කිව්වාම ඒක අහලා කටයුතු කරනවා මිසක්, ඒ විඥානයෙන් කටයුතු කරන්නේ නැහැ. ඒ නිසා අපි අද මේ තත්ත්වයෙන් අධ්‍යාපනය ලබලා මේ සභාවලට ඇවිල්ලා කථා කරන්නේ, අපේ විඥානය යම්කිසි විධියකින් අපි වැඩි දියුණු කරගෙන තිබෙන නිසා. එහෙම නැත්නම් අපටත් අර කේජු කැලි දෙන පැතිවලට යන්න සිද්ධ වෙනවා. අද අපි දකිනවා නේ? අධ්‍යාපනය විතරක් නොවෙයි. සල්ලිවලට ගන්න බැරි මනුස්සයෙක් ලංකාවේ ඉන්නවා නම් හරි පුදුමයි. ඉතාම සුළු සංඛ්‍යාවයි ඉන්නේ. මුදලට ගන්න බැරි මිනිස්සු. අපි වර්ධනය කරන්න ඕනෑ අධ්‍යාපනයෙන් කොලිටියක්. එහෙම නැත්නම් මොකක් හරි ප්‍රතිපත්තියක්. එක විධියට පිහිටුවලා ඉන්න පුළුවන් වැදගත් මිනිස්සු බිහි කරන්න ඕනෑ. ඒ අය තමයි පාසල්වලින් එළියට එන්න ඕනෑ. මේ සංකල්ප, මේ ආකල්ප වැඩි දියුණු කරන්න නම් අපි අධ්‍යාපනය ගැන නිරන්තර අවබෝධයෙන් ඉන්න ඕනෑ. පාසල මේ දේ කරනවාද කියලා බලන්න ඕනෑ. නිරන්තර අධීක්ෂණයකට ලක් වෙන්න ඕනෑ. ඒ පාසල් ගොඩනැගිලි හැදීමේදී මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමා විසර්ජන ගිණුමක් ඉදිරිපත් කරද්දී විරුද්ධ වෙලා අපේ මහ ඇමතිතුමාගේ ඉල්ලීම පරිදි ඒක ආපහු ඉවත් කර ගත්තා. මම අහන්නේ, එතුමන්ලාගේ කොට්ඨාශවලට වැඩිය ලැබෙන කොට කථා කරන්නේ නැහැ. හැබැයි, වෙන කොට්ඨාශයකට පොඩ්ඩක් හරි වැඩියෙන් ගිහිල්ලා තිබුණොත් කථා කරනවා. මේ කටාන අධ්‍යාපන කොට්ඨාශයේ කඩා වැටුණු පාසල් තිබෙනවා. වැසිකිළි කැසිකිළි පහසුකම් නැති විද්‍යාල රාශියක්

තිබෙනවා. අපි දීර්ඝ කාලීන ඉල්ලීම් කරලා යම් මුදලක් අනුමත කර ගෙන තිබුණාම, ඊට විරුද්ධ වෙනවා. ලක්ෂ 395 ක් 400 ක් ඒ කොටඨාශවලට වෙන් කර ගන්නවා, විවිධ වැඩවලට. අපි විරුද්ධ වෙන්නේ නැහැ. නමුත් එක කොට්ඨාශයක ගොඩනැගිල්ලක් හදලා ඉවර නම් අනික් කොට්ඨාශය හදන්න වියදම් කරන්න ඕනෑ. එතකොට අනික් කොට්ඨාශයට ඒ මුදල දෙන්නේ නැතිව හදපු එකකටම නැවත දෙන්න බැහැ. ඒ නිසා විවිධ අවස්ථාවල විෂම වෙන්න පුළුවන්. ඒ කරලා, මේකට විරුද්ධ වෙන එක නොවෙයි ක්‍රමය. ඒ නිසා අපි කියන්නේ, අවුරුදු දහයකින් පහළොවකින් හැදුනේ නැති පාසල් ගොඩනැගිලි තිබෙනවා නම් ඒවා අපි අනිවාර්යයෙන් කරන්න ඕනෑ. ඒ ප්‍රඥප්ති ඉවත් කිරීම ගැන මම නම් විරුද්ධ වෙනවා.

ඒ වාගේම මම කියන්න ඕනෑ. අපේ ප්‍රධාන අමාත්‍යතුමා කළේ මොකක්ද? මේ අමාත්‍යාංශවලට යම් සුළු ප්‍රමාණයක් මුදල් වෙන් කරලා, පසුව පරිපූරක මගින් ගෙනැල්ලා එතුමාට උවමනා ආකාරයට සමාන ඉල්ලීම්වලට ඉඩ දීලා එතුමා මේ අමාත්‍යාංශවල බලය, විමධ්‍යගත කරපු බලය මධ්‍යගත කරන්න උත්සාහ කළා. මම භය නැතිව විවේචනය කරනවා. මේ ඇමතිතුමන්ලාට එකට ඉන්න නිසා මොකුත් කියන්න බැහැ. අපට පේනවා මේක. මේ පළාත් සභාවේ බලය විමධ්‍යගත කිරීමක් තිබෙන්නේ. විමධ්‍යගත කරනවාය කියන්නේ එක්කෙනෙක් බලය බදා ගෙන එක තැනක ක්‍රියා කරනවාට වැඩිය, බෙදලා දීමෙන් කාර්යක්ෂම සේවයක් ඉෂ්ට කර ගන්න තමයි තිබෙන්නේ. අමාත්‍යවරු හතර දෙනෙක් ඉන්න කොට මහ ඇමතිතුමාගේ නියමය පරිදි තමයි විශාල මුදල් ප්‍රමාණයක් වියදම් වෙන්නේ. ඒ අමාත්‍යාංශවලටත් ඇඟිලි ගහනවා. ඉතින් මේක හොඳ ක්‍රමයක් නොවෙයි. ඒ නිසා මම ඒ අමාත්‍යතුමාගෙන් ඉල්ලනවා. තමන්ට අවශ්‍ය කරන ගොඩනැඟිල්ල ද, සේවාවන් ද සපයන්නේ. ඒ මුදල මධ්‍යම ආණ්ඩුවෙන් හෝ ප්‍රධාන අමාත්‍යතුමාගෙන් හෝ කථා කරලා අරගෙන මේ අඩුපාඩු ටික හරිසගස්සන්න පියවර ගන්නය කියලා මම ඉල්ලීමක් කරනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමිය, ඔබතුමියට තව විනාඩියක කාලයක් තිබෙනවා.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

විශේෂයෙන්ම මේ අයවැයේදී මම ඔබතුමාටත් මතක් කරනවා. අපි දවස් හයක් අයවැය විවාදය සඳහා ඉල්ලුවා සභා කටයුතු කාරක සභාවේදී. හතරකට සීමා කළා. මේ විධියට වහලා ගහන අයවැයකට නම් කථා කරන්න ඉස්සරහාට ඉඩ තියන්න එපා. අයවැය කියන්නේ, සමස්ත බස්නාහිර පළාතේ සම්පූර්ණ දේවල් අපට කථා කරන්න ඕනෑ. ඒ නිසා මේ අයවැයට වැඩි කාලයක් ලබා දෙන ලෙස සභා කටයුතු කාරක සභාවට ගරු නියෝජ්‍ය සභාපතිතුමා මගින් ඉල්ලීමක් කරනවා.

ඒ වාගේම මේ ගරු පුහුණුව, ඒ වාගේම ශිෂ්‍යත්ව ලබා දීම ඇතුළු අංශවල විශාල ගැටළු තිබෙනවා. ඒවා නිසි ක්‍රමවේද අනුව, චක්‍රලේඛ අනුව සිදු වෙන්නේ නැහැ. අන්තිමට චූටි ප්‍රශ්නයක් අල්ලාගෙන ගුරුවරුන්ට දඬුවම් කරන්න. ශිෂ්‍යයන්ට දඬුවම් කරන්නත් නොවෙයි. මේ ක්‍රමවේදය මුල සිට හරිගස්සන්න ඕනෑ. දැන් අපේ රටට වෙලා තිබෙන අවුල තමයි අධ්‍යාපනයටත් වෙලා තිබෙන්නේ. සෑම තැනකම ප්‍රධාන තැන වෙන වෙන ප්‍රශ්නවලට ගියාම, කළ යුතු දේ අමතක වෙලා. මුළු රටටම වෙලා තිබෙන්නේ ඒකයි. ඒ නිසා මේ අධ්‍යාපනයට අකිල විරාජ් කාරියවසම් ගරු ඇමතිතුමා නිල ඇඳුම දෙන කොට විශාල නිලධාරීන් සංඛ්‍යාවක් පාවිච්චි කරන්න ඕනෑ. ඒවාවල අක්‍රමිකතා වෙනවා. මුදල කෙලින්ම දෙමව්පියන්ට දුන්නාම ඉතාම හොඳ ක්‍රමයක්. නමුත් ඒක අගය කරන්න තරම් පිටකොන්දක් තිබුණේ නැහැ. මේ අපේ සමහර අධ්‍යාපන අංශවල අයට. ඒ අය දේශපාලනය කරේ දා ගෙන, දේශපාලන කේජු කැලි කන්න බලාගෙන ඒක විකෘති කරන්න උත්සාහ කළා.

**ගරු ලලිත් වර්ණකුමාර**
Hon. Lalith Warna Kumara

රෙදි දෙන එක ඊට වඩා හොඳයි නේ?

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

අද නිල ඇඳුම දී ගන්නත් බැරිව ගිහිල්ලා තිබෙනවා. කේජු කන්න කෑ ගහන්නේ නැතිව තමන්ට හම්බ වුණු ප්‍රමාණය කාලා ඉන්න. ඒ නිසා මම ගරු ඇමතිතුමාගෙන් ඉල්ලනවා. ඔබතුමා හරි දේ කරන්න. එතකොට ඔබතුමාට කවුරුත් ගරු කරයි. බොහොම ස්තුතියි.

[පූ.භා.11.37]

**ගරු නිමල් චන්ද්‍රරත්න**
Hon. Nimal Chandraratna

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම ස්තුතිවන්ත වෙනවා ඇත්තටම අපේ දිස්ත්‍රික්කයේ රංජිත් සෝමවංශ ඇමතිතුමාගේ අධ්‍යාපන අමාත්‍යාංශය සම්බන්ධයෙන් විවාදයට සම්බන්ධ වෙන්න අවස්ථාව ලැබීම ගැන. ඒ වාගේම ඔබතුමා හොරණ කලාපයේ කෙනෙකු වශයෙන් මූලාසනයේ සිටීම සම්බන්ධයෙනුත් මම සන්තෝෂ වෙනවා. මම හිතන්නේ, අපි අධ්‍යාපනය වෙනුවෙන් වෙහෙස වුණු, මහන්සි වුණු හොරණ කලාපය හැටියට අපේ ලලිත් වර්ණකුමාර ගරු මන්ත්‍රීතුමාත් මෙතැන ඉන්නවා. අපි තුන් දෙනා හැමදාම ඒ ව්‍යුහ කමිටුවට සහභාගී වෙලා ඒ සඳහා දායකත්වය දීපු අය. මම හිතන්නේ, අපේ රංජිත් සෝමවංශ ගරු ඇමතිතුමා කළුතර දිස්ත්‍රික්කයේ ඇමතිවරයෙක් හැටියට, අධ්‍යාපන ඇමතිවරයා හැටියට පත් වෙන කොට අපි බොහොම සන්තෝෂ වුණා. ඒ කළුතර දිස්ත්‍රික්කයේ අය හැටියට. මම හිතන්නේ අපි එදා එතුමාගෙන් කළුතර දිස්ත්‍රික්කය තුළ විශාල වැඩ කොටසක් බලාපොරොත්තු වුණා. ඒක ප්‍රමාණවත්ව වුණාද නැද්ද කියන කාරණය මම සහතික දෙන්න යන්නේ නැහැ. කොහොම වුණත් මම ස්තුතිවන්ත වෙනවා රංජිත් සෝමවංශ ඇමතිතුමාට. කළුතර දිස්ත්‍රික්කය වෙනුවෙන් කරපු වැඩ කොටසට අපේ කෘතඥතාවය ප්‍රථමයෙන්ම පුද කර සිටිනවා.

මම මේ සභාවේ කථා කරපු හැම අවස්ථාවලදී සඳහන් කරලා තිබෙනවා. අධ්‍යාපනයේදී, ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තියක් අපට තිබෙන්න ඕනෑය කියන කාරණාව, මම හැමදාම කියන දෙයක්. හැබැයි, අපේ ජීවිත කාලය තුළ මේ රටේ ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තියක් ඇති වෙයි කියලා විශ්වාස කරන්න පුළුවන් තත්ත්වයක නොවෙයි මේ රට ගමන් කරන්නේ. ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තියක් අපේ රටට හදා ගන්න පුළුවන් නම් මම හිතන්නේ වටිනවා. මේ රටේ ජාතික ආර්ථික ප්‍රතිපත්තියක් නැති වුණත්, ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තියක් තුළින් හොඳ දරු පරපුරක් බිහි කරලා මේ රට දියුණු කරන්න පුළුවන් එකම මාර්ගය එය හැටියටයි මට නම් පෙනෙන්නේ. මොකද මම එහෙම කියන්නේ. එක එක ආණ්ඩු පත් වුණාම අධ්‍යාපනයට එක එක සංකල්ප ගේනවා. ඒ හොඳ දේවල් ගේනවා. හැබැයි, ඒ ගේන හොඳ සංකල්ප ආණ්ඩු වෙනස් වුණු හැටිය වෙනස් වෙනවා. මෙහේ ලංකාව තුළ ආණ්ඩු වෙනස් වුණාම අධ්‍යාපන සංකල්ප වෙනස් වෙනවා විතරක් නොවෙයි. ඇමතිවරයා වෙනස් වුණාමත් සංකල්ප වෙනස් වෙනවා. ඊළඟට ඇමතිවරයා මාරු වුණාම මුළු විෂය මාලාවම වෙනස් වෙනවා. මම හිතන්නේ, දියුණු රටවල ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තියක් තිබෙනවා. ඒ ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තියේ තිබෙන මුද්‍රිත පොතක එක පිටුවක කොටසක් ඒගොල්ලෝ වෙනස් කරන්නෙත් බොහොම විද්වත් කමිටුවකින්. ඒක තර්කානුකූලව සහ විද්‍යානුකූලව කාලයට ගැලපෙන ආකාරයට තමයි වෙනස් කරන්නේ. හැබැයි, අපේ රටේ එහෙම නොවෙයි. අපේ රටේ ආණ්ඩු මාරු වුණාම විතරක් නොවෙයි, ඇමතිවරයා මාරු වුණාමත් අධ්‍යාපන ප්‍රතිපත්තිය සහ විෂය වෙනස් කරනවා. අපි උදාහරණයක් කියන්නේ. අපේ පසුගිය ආණ්ඩුවේ ද්විතියික පාසල් සංකල්පය හොඳ දෙයක්. ඒක එක එක ආසනවල අය, එක එක විධියට ඒක අර්ථකථනය කර ගත්තා. ග්‍රහණය කර ගත්තා. නමුත් අපි ඒක හොඳින් ක්‍රියාත්මක කළ ආසනයක් හැටියට බණ්ඩාරගම ආසනයේ ද්විතියික පාසල් සංකල්පය යටතේ ද්විතියික පාසල් පහක් හදන්න අපට හැකියාව ලැබුණා. ඒ අනුව අපි වහපු පාසල් පහකුත් ඇරලා, අලුත් පාසල් පවා හදන්න අපට අවසථාව ලැබුණා. නමුත් ඒ සංකල්පය ඊට පස්සේ ආපු රජය විසින් - "ළඟම පාසල හොඳම පාසල" කියන සංකල්පය හොඳ සංකල්පයක්. ඒක හොඳ සංකල්පයක්. හැබැයි, ඒ සංකල්පය භූමිය තුළ ක්‍රියාත්මක වුණාද කියන එක නැවත හිතන්න ඕනෑ කාරණයක්.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ළඟම පාසල හොඳම පාසල වැඩ සටහනේ ජාතික වැඩ සටහන ආරම්භ කළේ මගේ ආසනයේ. බණ්ඩාරගම ආසනයේ රඹුක්කන විද්‍යාලෝක විද්‍යාලය තමයි අකිල විරාජ් කාරියවසම් ගරු ඇමතිතුමා ඇවිල්ලා ජාතික වැඩ සටහන ආරම්භ කළේ. නමුත් අදත් ඒ පාසලේ දරුවෝ ඉන්නේ ටකරම් මඩුවක. අදත් ඉන්නේ ටකරම් මඩුවක. එතකොට, මේ ළඟම පාසල හොඳම පාසල සංකල්පය ආරම්භ කරපු පාසලේ දරුවෝ ඉන්නේත් අද ටකරම් ගහපු මඩුවක. ඉතින් මේ අඩුපාඩු. ඇත්තටම කොයි ආණ්ඩුවක් ඇවිල්ලා හරි අධ්‍යාපනයට යහපත් දෙයක් කරනවා නම් කැමැති අය අපි. අපි කියන්නේ, ද්විතියක පාසල් සංකල්පය හෝ ළඟම පාසල හොඳම පාසල කියන සංකල්පය හොඳ වචනයක්. හොඳ සංකල්පයක්. හැබැයි, ළඟම පාසල හොඳම පාසල කියන සංකල්පය තුළම තිබෙන දේ ඉෂ්ට වෙනවාද කියන එක ගැටලුවක්. දැන් ඇත්තටම ළඟම පාසල හොඳම පාසල කියන එක සන්තෝෂයට කාරණයක්. මොකද, අපි ඇත්තටම හිතුවා ළඟම පාසල

[ ගරු නිමල් චන්ද්‍රරත්න ]

හොඳම පාසල කිව්වාම මේ පාසල් පද්ධතියම, සියලු පාසල්, පුංචි පාසල්, සිංහල, ද්‍රවිඩ, මුස්ලිම් මේ සියලු පාසල් එක විට සංවර්ධනය කරන වැඩ සටහනක් හැටියට තමයි අපි ඒක දැක්කේ. නමුත් ගරු ඇමතිතුමනි, අපි ඒක ක්‍රියාත්මක කිරීමේදී ලොකු අඩුපාඩු රාශියක් තිබෙනවා. මම එක උදාහරණයක් විතරක් කියන්නම්. දැන් පතහවත්ත ස්වර්ණජෝති විද්‍යාලයේ ළමයින්ට ඉගෙන ගන්න පන්ති කාමර හතරක් හෝ පහක් තිබෙන ගොඩනැගිල්ලක් ඕනෑ. නමුත් ඒ පාසලට ලබා දීලා තිබෙන්නේ, විදුහල්පති නිවාසයක් සහ ගුරු නිවාසයක්. දොඹගොඩ සීලරතන විද්‍යාලයට දෙන්න ඕනෑ ද්විතියික පාසල් වැඩ සටහන යටතේ තාක්ෂණාගාරය දීලා තිබෙනවා, තාක්ෂණ පීඨයක්. තාක්ෂණ පීඨයක් ඕනෑ ඉස්කෝලෙට ලබා දුන්නේ ළමයි 700 කට විතර වාඩි වෙන්න පුළුවන් කැන්ටින් එකක්. ළමයින්ට ඒක ඇත්තටම ඕනෑ. නමුත් මේක නොවෙයි. ඉස්සෙල්ලා වෙන්න ඕනෑ දේ හඳුනාගත්තේ නැහැ. මම දන්නේ නැහැ, මේ යටතේ කවුරු මේවා පෙළ ගැස්සුවාද කියන කාරණය. පළාත් සභා හැටියට අපේ නිලධාරීනුත්, අපිත් වගකියන්න ඕනෑ. මේ පෙළගැස්වීම හොඳට කරලා නැහැ. ගරු ඇමතිතුමා, දැන් අපේ නිලධාරීන්ගෙන් ඇහුවාම කියන්නේ ඒගොල්ලෝ දන්නේ නැහැයි කියලා. ඉසුරුපායෙන් ඇහුවාම කියනවා, පළාත් සභාවෙන් තමයි අපට මේක දුන්නේ කියලා. නමුත් කොහෙන් දුන්නාද? කොහෙන් ආවාද කියලා අන්තිමට කවුරුවත් දන්නෙත් නැහැ. හැබැයි, ඕනෑ නැති දේවල් තමයි සමහර වෙලාවට පාසල්වලට හම්බ වෙලා තිබෙන්නේ. හොඳ දේවලුත් හම්බ වුණු තැන් තිබෙනවා. ඉතින් ඒ නිසා තමයි මම ඇත්තටම කියන්නේ, මේ ලංකාවට අපි කවුරු හරි මැදිහත් වෙලා ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තියක් ඇති කරන්න පුළුවන් නම්, ඒක මේ රටට ඉතාමත් යහපත් දෙයක්. මොකද, මේ රට දියුණු කරන්න ජාතික ආර්ථික ප්‍රතිපත්තියක් නැහැ. නමුත් ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තියක් ඊට වඩා ලේසියෙන් හදන්න පුළුවන්. හැබැයි, අමාරු කාර්යයක්. ඒක හදා ගන්න පුළුවන් නම් මම හිතන්නේ, මේ රටට ඉතාමත් යහපත් රටේ, අනාගතයට යහපත් කියන එකත් සඳහන් කරන්න ඕනෑ.

ඊළඟට අපේ පාසල් පද්ධතියට පසුගිය දවස්වල අපේ රංජිත් සෝමවංශ ඇමතිතුමා, ගරු ප්‍රධාන අමාත්‍යතුමා මැදිහත් වෙලා අපට මුදල් ලබා දුන්නා. ඒ මුදල් ලබා දීපු පාසල්වල අපේ හොරණ කලාපය ගත්තාම - මම හොරණ කලාපය ගැන විශේෂයෙන් කථා කරන්නේ. ඒ පාසල්වල ගත්තාම සමහර ගොඩනැගිලි හදන්න අපට ලක්ෂ 75 ක් 100 ක් දුන්නා. හැබැයි, ලක්ෂ 75, 100 දුන්න ගොඩනැගිලිවල වැඩ අවසන් කරන්න තව ලක්ෂ පහක්, හයක්, දහයක් අඩු වෙලා තිබෙනවා. ඇමතිතුමා මේක අවධානයට ගන්න. දැන් වැඩ අවසන් කරන්න විධියක් නැතිව ඉන්නවා. හොරණ කලාපය තිබෙනවා. බුලත්සිංහල කොට්ඨාශය තිබෙනවා. බණ්ඩාරගම කොට්ඨාශය තිබෙනවා. සමහර ඉස්කෝලවලට අපි දැන් ලක්ෂ 100 ක් දීලා තිබෙනවා. නමුත් ඒකට 112 ක් යනවා. ඒ ලක්ෂ 12 නැතිව ඒ වැඩේ අවසන් වෙන්නේ නැතිව පවතිනවා. ඒ නිසා ඒ සඳහා අවධානය යොමු කරන්නය කියලා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. මොකද, ඒ හිඟ මුදල් ඉතාමත් සුළු ප්‍රමාණයයි. මේක ඉක්මණින් දිය යුතුයි කියලා මම විශ්වාස කරනවා.

ඊළඟට අපේ ඇස නොගැටෙන තව දරුවන් කොටසක් ඉන්නවා, අපේ රට තුළ. ඒ විශේෂ අවශ්‍යතා තිබෙන දරුවෝ. විශේෂ අවශ්‍යතා තිබෙන දරුවන්ට මම හිතන්නේ මීට වඩා අවධානයක් යොමු කරන්න ඕනෑ කියලයි මම විශ්වාස කරන්නේ. අපි පිටරටවල ගියාම දැකලා තිබෙනවා. ඒ විශේෂ අවශ්‍යතා ඇති දරුවන්ට දීලා තිබෙන පහසුකම් ටික. ඒ අයට දක්වන ආදරය. ඒ නිසා මම ඉල්ලා සිටින්නේ, ඇත්තටම විශේෂ අධ්‍යාපනය අවශ්‍ය දරුවන්ට - එහෙම දරුවෙකු ගෙදර ඉන්න කොට, දරුවෝ පස් දෙනෙකු ගෙදර ඉන්නවා නම් ඒ අම්මා තාත්තා වැඩියෙන්ම ආදරේ අර දරුවාට. විශේෂ අධ්‍යාපනය ඇති දරුවාට. ඒ ආබාධිත දරුවාට. ඒ වාගේම තමයි පාසලේදීත් එහෙම දරුවන්ට ආදරය කරන ගුරුවරු පිරිසක් මේ පාසල් පද්ධතියට බන්දවා ගන්න ඕනෑ. නමුත් අපි දන්න විධියට මේ පාසල් පද්ධතිය තුළ විශේෂ අධ්‍යාපනය සඳහා අවශ්‍ය බරපතළ ගුරු හිඟයක් තිබෙනවා. හැබැයි, ඒකට පිළියමකුත් තිබෙනවා. මම දන්නා විධියට මේ ඊයේ පෙරෙයිදා අවුරුදු හතරක පුහුණුවකින් අනතුරුව විභාග දෙපාර්තමේන්තුවෙනුත් සම්බන්ධ වෙලා, විවෘත විශ්ව විද්‍යාලයේ විශේෂ අධ්‍යාපන ගුරුවරුන් පිරිසකට උපාධිය ලබා දුන්නා. අපේ අධ්‍යාපන ඇමතිතුමා දන්නවා. ඒ නිසා මම හිතන්නේ, ඉදිරි කාලය තුළ ඒ දරුවන්ගේ අධ්‍යාපනය සඳහා ගුරු මහත්ම මහත්මීන් බඳවා ගන්න කටයුතු කරන්නය කියන විශේෂ ඉල්ලීමත් මම කරනවා. ඇත්තටම

නිලධාරීන් මෙතැන අහගෙන ඉන්නවා. මේක විශේෂ අවධානයට ගන්න. ගුරුවරු ඉන්නවා. ඒගොල්ලෝ අවුරුදු හතරක් ඒ පාඨමාලාව හදාරලා උපාධිය අරගෙන තිබෙන්නේ. ඒකේ වයස ඉක්මවලා ගිය අය ඉන්නවා. ඒ අය නැතිව වයස සම්පූර්ණ වුණු අයට ඒ අවස්ථාව ලබා දෙන්නය කියන ඉල්ලීම කරනවා.

ඒ වාගේම විශේෂ හදිසි අවශ්‍යතාවයක් තිබෙනවා. මහ බෙල්ලන ප්‍රාථමික විද්‍යාලයේ. දැන් දරුවෝ විශාල පිරිසක් එළියේ ඉන්නවා. ඉස්කෝලවලට ඇතුළත් වෙන්න බැරිව. අවට දරුවෝ. දැන් ව්‍යුහ කමිටුවට දාලා, උපදේශක කාරක සභාවට දාලා එන්න ගියොත් එහෙම තව මාස තුනක්වත් යනවා. ඒ නිසා මේක අවධානයට යොමු කරලා, මහබෙල්ලන ප්‍රාථමික විද්‍යාලයේ දරුවන්ට විශේෂයෙන්ම ඉදිරි දින කිහිපය තුළදී පිළියමක් යොදන්නය කියලා ඉල්ලීම කරමින්, අපේ ජීවිත කාලය තුළ මැරෙන්න ඉස්සෙල්ලා මේ ශ්‍රී ලංකාව තුළ ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තියක් ඇති වේවායි කියලා ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු අර්ෂාඩ් නිසාම්ඩීන්**
Hon. Arshad Nizamdeen

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, 37(1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක්. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපේ නවුසර් ෆවුසි මන්ත්‍රීතුමා කිව්වා, තම්බියා කියලා වචනයක් පාවිච්චි කළාය කියලා. එහෙම පාවිච්චි කළා නම් අපි තරයේ හෙළා දකිනවා. ඒ නාමය -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමාට පුද්ගලිකව කිව්වා නොවෙයි නේ?

**ගරු අර්ෂාඩ් නිසාම්ඩීන්**
Hon. Arshad Nizamdeen

නැහැ. ඒ නාමය මුස්ලිම් හැටියට ඒක එනවා. අපහාසාත්මකවත්, උපහාසාත්මකවත් පාවිච්චි කරන්න පුළුවන්.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, ඒක අපේ කෙනෙක් කිව්වා නම් මම ඒක -

**ගරු අර්ෂාඩ් නිසාම්ඩීන්**
Hon. Arshad Nizamdeen

නැහැ. ඒක කිව්වාද නැද්ද කියලා -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඒක ඕගොල්ලෝම නේ කථා කර ගත්තේ.

**ගරු අර්ෂාඩ් නිසාම්ඩීන්**
Hon. Arshad Nizamdeen

කිව්වාද නැද්ද කියලා මම දන්නේ නැහැ. එතුමා මේ සභාවේදී තමයි කිව්වේ. ඒක අපි තරයේ හෙළා දකිනවා. ඒ වාගේම මේක මගේ ප්‍රශ්නයක්. මුහුණු පොතේ දාලා තිබුණා. මගේ නමයි, අපේ ෂාෆි රහීම් ගරු මන්ත්‍රීතුමාගේ නමයි, ෆායිස් ගරු මන්ත්‍රීතුමාගේ නමයි දාලා අපි මේකට ඡන්දය දුන්නේ මුදල් ලබා ගෙන කියලා. එවැනි කථා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, මට කාලය දෙන්න බැහැ.

**ගරු අර්ෂාඩ් නිසාම්ඩීන්**
Hon. Arshad Nizamdeen

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒක අපේ වරප්‍රසාද ප්‍රශ්නයක්. මගේ නම පාවිච්චි කරලා තිබෙනවා. මේකට කථා කරන්න පොඩ්ඩක් දෙන්න. ඒ මුහුණු පොතේ share කරලා තිබෙන්නේ එක්සත් ජාතික පක්ෂයේ නාගරික මන්ත්‍රීවරයෙක්. ඒ නාගරික මන්ත්‍රීවරයා finance කමිටුවේදී මුදල් අරගෙන පොහොට්ටුවේ සභිකයෙකුට පාවා දීපු දවසුත් තිබෙනවා. අපි නම් එහෙම කරලා නැහැ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි මේ ඡන්දය දුන්නේ අපේ උවමනාවට නොවෙයි. ජනතාවගේ උවමනාවට.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

පැහැදිලියි.

**ගරු අර්ෂාඩ් නිසාම්ඩීන්**
Hon. Arshad Nizamdeen

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපේ ප්‍රදේශයේ ටී.බී ජයා සහ සහිරා විද්‍යාලවල ළමයින් කන්ටේනර්වල අවුරුදු

ගණනක් හිටියා. මේ සභාවේදී කිහිප අවස්ථාවක් මම කථා කළා. යහපාලන රජයකුත් තිබුණා. එක්සත් ජාතික පක්ෂයේ අධ්‍යාපන ඇමතිවරයෙකුත් හිටියා. ඒ අමාත්‍යවරයාට අපි ලියුම් දැම්මා. ඒ ප්‍රදේශයේ මන්ත්‍රීවරුත් ඉන්නවා. අපේ සංවිධායකවරු. කිසිම කෙනෙකු ඇවිල්ලා බැලුවේ නැහැ. නමුත් අපේ ඇමතිතුමා ඇවිල්ලා බලලා එක් කෝටි හැත්තෑ ලක්ෂයක් පාස් කරලා, අද ඒ ළමයින් වෙනුවෙන් බිල්ඩින් එක හදනවා. ඒ අයට අපි උදව් කරන්නේ නැතිව අපි ගුණමකුවන් වෙන්නද? ඒ වාගේම තවත් පාසලක් තිබෙනවා. අල් ඉක්බාල් විදුහල. ඒ විදුහලේ බිල්ඩිම කැඩෙන්න ඔන්න මෙන්න. අපේ ප්‍රධාන ලේකම්තුමා සාක්ෂි දරයි. අපේ රණසිංහ මහත්තයා සාක්ෂි දරයි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

බොහොම හොඳයි. මීළඟට සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව ලබා දෙනවා.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

***[නැඟී සිටියේය. ]***
*[Stood.]*

**ගරු අර්ෂාඩ් නිසාම්ඩීන්**
Hon. Arshad Nizamdeen

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පොඩ්ඩක් ඉන්න. ඒකටත් මුදල් දුන්නා. ලක්ෂ 320 ක් මුදල් දුන්නා. ඒ බිල්ඩිම කඩලා හදන්න. එවැනි දේවල් කරපු අයට අපි උදව් කරන්නේ නැතිව - අපේ ජනතාව වෙනුවෙන් අපි කරන්නේ. මුහුණු පොතේ දේවල්වලට -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ෆයිරෝස් තමයි ඔක්කොම කළේ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, මට කාලයත් එක්ක ගැටළුවක් තිබෙනවා. ගරු මන්ත්‍රීතුමා කථා කරන්න.

[පූ.භා.11.51]

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම ස්තුතිවන්ත වෙනවා, මට මේ අවස්ථාව ලබා දීම පිළිබඳව. මට මේ වෙලාවේ වචනක් කියන්න ඕනෑ. මම මේ කථාව ආරම්භ කරන්න හිතපු අවස්ථාව පොඩ්ඩක් වෙනස් වුණා. නිමල් චන්ද්‍රරත්න ගරු මන්ත්‍රීතුමාගේ කථාවෙන් පස්සේ. මොකද, මම කියන්න හිටපු දේවල්වලින් භාගයකට වඩා එතුමා කිව්වා. එකක් ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තියක් සෑදීම සහ මේ අඩක් නිම කරපු පාසල් ගොඩනැගිලි අවසන් කිරීම පිළිබඳව. එතුමා ඒ පිළිබඳව හොඳින් විවරණයක යෙදුණා. ඒ නිසා මගෙත් ඒ මතයම තිබෙනවා. අපි දැන් මේ සභාව ඇතුළේ විවිධ විධියට කළකෝලාහල සිදු කර ගත්තත්, අපි මේ අධ්‍යාපනය කියන විෂය පිළිබඳව හුඟාක් වෙලාවට එක මතයක ඉඳගෙන තමයි තීන්දු තීරණ ගන්නේ. අධ්‍යාපන උපදේශක කාරක සභාවේදී වෙන්න පුළුවන්, එහෙම නැත්නම් කලාප රැස්වීමේදී වෙන්න පුළුවන්. දැන් මම නියෝජනය කරන කැලණිය කලාපයේ හැම මාසයකම නොවරදවාම අපේ පක්ෂ විපක්ෂ සියලුම මන්ත්‍රීවරු එකතු වෙලා, ඒ කලාපයේ අධ්‍යාපනය පිළිබඳව හොඳ වැදගත් තීන්දු තීරණවලට එළඹෙනවා. අපේ ඉන්න නිලධාරීන් ඒවාට අනුගත වෙලා, ඒ පිළිබඳව මම හිතන්නේ ඉතාමත් හොඳ සාධනීය ලක්ෂණ පෙන්වලා තිබෙනවා.

විශේෂයෙන්ම මේ අධ්‍යාපන අමාත්‍යාංශය රංජිත් සෝමවංශ මැතිතුමා භාර ගත්තායින් පස්සේ එතුමා තමයි, මේ බස්නාහිර පළාත් සභාවේ අමාත්‍ය මණ්ඩලයේ ඉන්න වැඩිපුරම පීඩාවට ලක් වුණු ඇමතිවරයා. මට පෙනෙන විධියට තමයි මම කියන්නේ. මොකද, අපි දැකලා තිබෙනවා, විවිධ අවස්ථාවලදී එතුමා මොන තරම් අසරණ තත්ත්වයට, අපහසු තත්ත්වයට මේ සභාවේ පත් වෙනවාද කියලා. තමන්ගේම පක්ෂයේ, තමන්ගේම ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන්ගෙන්. ඇමතිවරුන්ගෙන්. ඒකේ අපි හොඳ උදාහරණයක් දැක්කා. අධ්‍යාපන ඇමතිවරයාගේ කාර්යභාරය බොහෝ වෙලාවට සමහර අවස්ථාවලදී ගරු ප්‍රධාන අමාත්‍යතුමා කරට අරගෙන කරපු අවස්ථා තිබෙනවා. අපි එතුමාට ස්තුතිවන්ත වෙනවා. විශේෂයෙන්ම එවැනි කාරණාවලදී එතුමා ඒ මූලිකත්වය අරගෙන අධ්‍යාපන ඇමතිතුමා සම්බන්ධ වුණත්, නූනත් එතුමා යම් යම් වැදගත් තීන්දු තීරණවලට එළඹිලා

තිබෙනවා. අපි දන්නේ නැහැ මොකක්ද ඒකේ ඇතුළාන්තය කියලා. ඒ කොහොම වුණත් බල්ලාගේ වැඩේ බූරුවා කරනවා කියන එක නොවෙයි මම මේ කියන්නේ. නමුත් අධ්‍යාපන ඇමතිවරයා හැටියට එතුමාගේ භූමිකාව හරියට මේ සභාව තුළ එතුමාට කර ගන්න ලැබුණාද කියන ප්‍රශ්නය, ප්‍රශ්නයක් හැටියට අනාගතයේදී ඉතිරි වෙයි. ඒ කොහොම වුණත් ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ මාර්ගයෙන් අපි විශේෂයෙන්ම මේ සභාව නියෝජනය කරන කතෝලික මන්ත්‍රීවරු පසුගිය දවසක කතෝලික අධ්‍යාපන විෂය භාරව ඉන්න ගරු පියතුමන්ලා එකක් එකතු වෙලා වැදගත් තීන්දු තීරණ කිහිපයකට ආවා. ඒවා වර්ෂ ගණනාවක් තිස්සේ, එහෙම නැත්නම් 1961 දී මේ පාසල් රජයට පවරා ගත්තාට පස්සේ දවසින් දවස, දවසින් දවස උඩු දුවලා කැකෑරිලා තිබුණු ප්‍රශ්න. ඒවා බොහොමයකට සාධනීය විසඳුම් ලබා ගන්න ගරු අධ්‍යාපන ඇමතිතුමාගේ උදව්වෙන් ගරු ප්‍රධාන අමාත්‍යතුමා අපට ඒ අවස්ථාව උදා කරලා දුන්නා. ඒකට මම ස්තුතිවන්ත වෙන්නට ඕනෑ.

සමහර ප්‍රශ්න අපට විසඳා ගන්න බැහැ. ඒවා නීති මාර්ගයට, උසාවි මාර්ගයට ගිහිල්ලා තිබෙනවා. නමුත් මේ සභාව හරහා විසඳා ගන්න පුළුවන් ප්‍රශ්න කඩිනමින් විසඳා ගන්න එතුමා ඒ අවස්ථාව ලබා දීලා තිබෙනවා. ඒ වාගේම තමයි මම බොහොම වැදගත් ඉල්ලීමක් කරන්න තිබෙනවා. අර කිව්වා වාගේ තරහයක් නැති, ප්‍රශ්නයක් නැති පාසල්වලට පළමුවැනි ශ්‍රේණියට දරුවන් ඇතුළත් කිරීමේදී - මේක අපි ඉස්සෙල්ලා දැක්කා. ප්‍රසන්න රණතුංග මැතිතුමා අධ්‍යාපන ඇමතිවරයා හැටියට ඉන්න කොට, මහ ඇමතිවරයා හැටියට ඉන්නකොට සමහර වෙලාවට ජූනි මාසය, ජූලි මාසය, අගෝස්තු මාසය වනකල් ගියා. එහෙම කරන්න එපා. මේ දරුවන්ගේ අනාගතය. ඒ නිසා කරන්න පුළුවන් තැන්වල - ගරු අධ්‍යාපන ඇමතිතුමනි, ඔබතුමාට පුළුවන් මේක කරන්න. පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂතුමා හරහා මේ දෙසැම්බර් මාසේ ඉවර වෙන්න ඉස්සෙල්ලා ඒ කරන්න පුළුවන් තැන්වල, ප්‍රශ්නයක් නැති තැන්වල මේ ප්‍රශ්නය අවසාන කරලා ඒ දෙමව්පියන්ගේ මානසිකත්වය අවබෝධ කරගෙන, ඒ දරුවන්ට නිසි අධ්‍යාපනයක් ලබා දෙන්න තිබෙන අයිතිය අරන් දෙන්න කියන ඉල්ලීම මම කරන්න කැමැතියි.

ඒ වාගේම තමයි විශේෂයෙන්ම අපට මේ සභාව පටන් ගන්න කොටම පෙරෙයිදා පාසල් සම්බන්ධයෙන් අපට ව්‍යාපෘති යෝජනා ඇවිල්ලා තිබුණා. මේකේ සඳහන් කරලා තිබෙනවා, පාසල් මොනවාද කියලා. අපි කලාප මට්ටමෙන්, කොට්ඨාශ මට්ටමෙන් තීරණය කරලා එවපු දේවල්. විශේෂයෙන්ම කැලණිය කලාපයේ, වත්තල කොට්ඨාශයේ ඉතාමත්ම දුෂ්කර පාසල් දෙකක් තමයි, දික්ඕවිට ශාස්ත්‍රාලෝක විද්‍යාලය සහ පල්ලියවත්ත දොන් බොස්කෝ විද්‍යාලය කියලා කියන්නේ. මුහුදේ කෙළවරේ දුප්පත් ධීවරයින්ගේ දරුවන් යන ඉස්කෝල. වසර ගණනාවකින් කිසිම කෙනෙකු සත පහක් වෙන් කරලා නැහැ. මේ යෝජනාවලින් ඒ විද්‍යාල දෙකේ ගොඩනැගිලි දෙක හදන්න වෙන් කරලා තිබෙනවා. ආරම්භ කරලා තිබෙනවා. ලක්ෂ 80 ක් වෙන් කළාම ලක්ෂ 70 ක් දීලා එවනවා. 10 ක් කපලා. අර කිව්වා වාගේ ඉතිරි 10 කොහෙන්ද සොයන්නේ? වැඩේ ඉවර වෙන්නේ නැහැ. ඒ නිසා එක එක්කෙනාට විශේෂ වෙන්න ප්‍රශ්න තිබෙන්න පුළුවන්. හැබැයි, මේ සභාවේ කොයිම වෙලාවකවත් සමතුලිතතාවයකින් ගිහිල්ලා නැහැ. ඔය කථා කරලා විරුද්ධත්වය ප්‍රකාශ කරපු මන්ත්‍රීවරුන්ව, අනික් අංශවලින් අනික් මන්ත්‍රීවරු අභිබවා කොපමණ මුදල් ප්‍රමාණයක් අරන් තිබෙනවාද කියලා තමන්ගේ හෘදය සාක්ෂියට තට්ටු කරලා අහලා බලන්න කියන්න. එහෙම කල්පනා කළොත් මේ කථා කරන මම වාගේ සිය දහස් ගුණයක් ඒ මන්ත්‍රීවරු අරගෙන තිබෙනවා. ඒ නිසා කරුණාකරලා මේ දුප්පත් දරුවන්ට හැදෙන විද්‍යාල ටික නතර කරන්න එපා. අඩු පහසුකම් යටතේ ජීවත් වන දරුවෝ. අඩු මුදලක් තමයි ලැබිලා තිබෙන්නේ. මම දන්නේ නැහැ අනික් කොට්ඨාශවලට කොහොමද කියලා. නමුත් වත්තල කොට්ඨාශයේ, කැලණිය කලාපයේ ඉතාමත්ම සාධාරණව ඒ මුදල බෙදලා තිබෙනවා. ලබා දීලා තිබෙනවා. ඒක ඉවත් කරන්න මොන විධියකටවත් කටයුතු කරන්න එපැයි කියන කාරණාව මම මේ වෙලාවේ ප්‍රකාශ කරන්න කැමැතියි.

ඒ වාගේම තමයි කැලණිය කලාපයේ අපට අපේ කියලා කලාප කාර්යාලයක් තිබුණේ නැහැ. අපි හිටියේ ඇත්ත වශයෙන්ම ඉතාමත් අසීරු තත්ත්වයක. නමුත් පාඨලී චම්පික රණවක ඇමතිතුමාත්, ලසන්ත අලගියවන්න ගරු ඇමතිතුමාත් මූලික වෙලා අපේ මේ පළාත් සභාවේ ප්‍රදීප් පෙරේරා ගරු මන්ත්‍රීතුමාගේ මූලිකත්වයෙන් මහර හන්දියේ ඉතාමත් හොඳ ගොඩනැගිල්ල අපට හම්බ වුණා. ඒ පිළිබඳව මම ස්තුතිවන්ත වෙන්න ඕනෑ. මම හිතන්නේ, ඒකට වැඩි වැය බරක් දරන්න වුණෙත් නැහැ, මේ සභාවට. හේතුව, යම්කිසි ගැටළුවක් මතු වෙලා, දැන් කොහොම හරි ඒක අපට වාසි වෙන විධියට තමයි ඒ ගොඩනැගිල්ලේ

[ ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා ]

මේ තත්ත්වයට පත් වෙලා තිබෙන්නේ. දැන් ඒ නිසා අපේ කලාප අධ්‍යක්ෂතුමියට, කොට්ඨාශ අධ්‍යක්ෂතුමන්ලාට, අනික් නිලධාරී මහත්වරුන්ට ඉතාමත්ම හොඳ කාර්යාලයක් ලැබිලා තිබෙනවා. මේ පළාතේ මේ දරුවෝ වෙනුවෙන් පරිපාලන කටයුතු, අධ්‍යාපන කටයුතු කරන්න. ඒ නිසා මම මේ වෙලාවේ ඒකත් ස්තුතිවන්තව ප්‍රකාශ කරන්න ඕනෑ.

ඒ වාගේම තමයි දුෂ්කර පාසල් කියලා අපි දැන් සාමාන්‍යයෙන් කල්පනා කළාම කළුතර දිස්ත්‍රික්කයේ බොහොම දුෂ්කර පාසල් තිබෙන්න පුළුවන්. හැබැයි, කැලණිය කලාපයේත් එහෙම දුෂ්කර පාසල් තිබෙනවා. කවුරුත් හිතන්නේ නැහැ වත්තලත් එහෙම දුෂ්කර පාසල් තිබෙනවාද කියලා. මම කිව්වා වාගේ ඉස්සර උස්වැටකෙයියාවට, පල්ලියවත්තට, දික්ඕවිටට ගුරුවරු යන්න කැමැති නැහැ. මොකද, බස් දෙක තුනකින් යන්න ඕනෑ. අඩුම තරමින් කොළඹ ඉඳලා යනවා නම්, බස් දෙකකින් තුනකින් යන්න ඕනෑ. ඒ නිසා මේ පාසල්වලට ගුරුවරු ඇතුළත් කරද්දී අලුතින් ගුරුවරු බඳවා ගන්න කොට ඒ අලුත් ගුරුවරු ටික දානවා. ඒ ගුරුවරුන්ට ඇත්ත වශයෙන්ම පුහුණුවක් නැහැ. අලුත්ම ගුරුවරු දාන්නේ. ඒ නිසා මේ ගුරු තුලනය කරන එක පිළිබඳව ගුරු සංගම් අතර විවිධ ගැටළු තිබෙන්න පුළුවන්. මම දැක්කා ඊයේ පෙරෙයිදාත් පොඩි ප්‍රශ්නයක් අපේ වත්තල කොට්ඨාශයේත් ඇති වෙලා තිබෙනවා. මම ඒවා ප්‍රසිද්ධියේ කථා කරන්න කැමැති වෙන්නේ නැහැ. නමුත් ගුරුවරු ඒ පාසල්වලට අනුයුක්ත කරද්දී අර අලුත් පත්වීම් ලබන ගුරුවරු විතරක් නොවෙයි. පුහුණු ගුරුවරුන්ව මේ විද්‍යාලවලට දාන්න. යම් යම් ප්‍රශ්න තිබෙන්න පුළුවන්. මේක ඉතාමත්ම සංකීර්ණ ප්‍රශ්නයක්. විශේෂයෙන්ම මොකද, දුෂ්කර පාසල්වලට - දුෂ්කර පාසල් කියලා කියන්නේ මේ රටේ ඉන්න, අපේ පළාතේ ඉන්න, අපේ ප්‍රදේශයේ අන්තිම අඩු ආදායම්ලාභී දරුවෝ ඉගෙන ගන්න පාසල්. ඒ පාසල්වලට තමයි ඇත්ත වශයෙන්ම සත්කාර කරන්න ඕනෑ.

ඒ වාගේම තමයි වත්තල ශාන්ත ආනා විද්‍යාලය. අවුරුදු එකසිය ගණනක් පරණ ගොඩනැගිල්ලක් තිබුණා. මම මේක ගිය පළාත් සභා රැස්වීමේදීත් කිව්වා. අන්තිමට ඒ ගොඩනැගිල්ල කඩා ඉවත් කරන්නය කියලා තීරණය කරපුවාම ඒ දරුවන්ට ඉගෙන ගන්න තැනක් තිබුණේ නැහැ. ඒ විදුහල්පති කන්‍යා සොහොයුරිය මොකද කළේ? හට් ගෙනැල්ලා - අර අපි මළ ගෙවල්වලට ගහන හට් තිබෙන්නේ. අපි දෙන ඒවා. ඒවා ගෙනැල්ලා තමයි ළමයින්ගේ ඉගෙනීමේ කටයුතු කළේ. ඒ නිසා මම ඔබතුමාගේ මාර්ගයෙන් ඉල්ලා සිටිනවා. ලබන අවුරුද්දේ, මේ ප්‍රශ්නය අවසාන කරලා ඒ විද්‍යාලයේ ගොඩනැගිල්ල හදලා දෙන්න කියලා. ඉතින් මේ වෙලාවේ මගේ කාලය අවසන් නිසා. මගේ කාලයෙන් විනාඩි 03 ක් දුන්නා. මට කියන්න දේවල් ගොඩක් තිබෙනවා. ඒ නිසා මම කථා කරන්න යන්නේ නැහැ. මොකද, රොඩ්නි ෆ්‍රේසර් ගරු මන්ත්‍රීතුමාට ඒ අවස්ථාව ලබා දීපු නිසා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපේ අධ්‍යාපන ඇමතිතුමාට ඇත්ත වශයෙන්ම මම කියන්න ඕනෑ. මම ඒ අධ්‍යාපන උපදේශක කාරක සභාව තමයි නියෝජනය කළේ. හැබැයි, මම එතුමාගේ අධ්‍යාපන අමාත්‍යාංශයේ උපදේශක කාරක සභාවෙන් ඉවත් වුණා. ඉවත් වෙලා මම ගියා පළාත් අධ්‍යාපන එකට. මොකද, හේතුව තිබුණේ. අධ්‍යාපන අමාත්‍යාංශයෙන් අපට කර ගන්න තිබෙන්නේ බොහොම සීමිත දෙයයි. හැබැයි, අසීමිත දේවල් අනික් අමාත්‍යාංශවලින් කර ගන්න පුළුවන්. ඒක මම විතරක් නොවෙයි. ඉස්සෙල්ලාම මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා මේ සභාවේ ප්‍රකාශයක් කළා. එතුමාගේ අදහසයි, එතුමා ඒකෙන් ඉවත් වුණු අදහසයි, මගේ තිබුණු අදහසයි දෙකක්.

**ගරු හෙක්ටර් බෙත්මගේ- සභා නායකතුමා**
Hon. Hector Bethmage - Leader of the House

ඔබතුමා මොකකටද ගියා කිව්වේ?

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ඒක මම ඔබතුමාට වෙන වෙලාවක කියන්නම්.

**ගරු හෙක්ටර් බෙත්මගේ- සභා නායකතුමා**
Hon. Hector Bethmage - Leader of the House

ඔබතුමා කිව්වේ, පළාත් අධ්‍යාපන එකට කියලා. ඒ විධියට රෙකෝඩ් වෙයි.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

මොකක්ද?

**ගරු හෙක්ටර් බෙත්මගේ- සභා නායකතුමා**
Hon. Hector Bethmage - Leader of the House

ඔබතුමා, අධ්‍යාපන අමාත්‍යාංශයේ ඉඳලා -

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ ඉඳලා පළාත් මාර්ග එකට.

**ගරු හෙක්ටර් බෙත්මගේ- සභා නායකතුමා**
Hon. Hector Bethmage - Leader of the House

ඒකනේ? තමුන්නාන්සේට පක්ෂව මම කථා කළේ.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

සමාවෙන්න. වචන වැරදුණා නම්, සමාවෙන්න. සන්තෝෂ වෙනවා, මගේ පැරණි මිත්‍රයා හැම වෙලාවේම මාව නිවැරදි කරන්න උත්සාහ කිරීම පිළිබඳව. ඒ නිසා රංජිත් සෝමවංශ මැතිතුමා බොහොම ඉවසීමෙන් යුතුව මේ කටයුතු කෙරුවා. එතුමාට ලැබුණු සීමිත ප්‍රතිපාදන, සීමිත බලතල, බලපෑම්, කෙණෙහිලිකම්. ඒ සියලු දේවල් මධ්‍යයේ එතුමා මේක නිවැරදි මාර්ගයේ ගෙනියන්න උත්සාහ කළා. සමහර වෙලාවට දැන් ඉස්සෙල්ලා ගාමිණී තිලකසිරි ගරු ඇමතිතුමාගේ වැය ශීර්ෂය සම්මත කරන වෙලාවේ මම බොහොම ප්‍රසිද්ධියේ කණ්ඩායම් රැස්වීමේදී කිව්වා, මම එතුමාට පක්ෂව තමයි ඡන්දය දෙන්න හිටියෙත් කියලා. ඒ නිසා අවසානයේදී මේ මුදල් ප්‍රකාශනයේදී අපේ කණ්ඩායම ගන්න තීන්දුව පිළිබඳව මම එකඟ වෙනවා. හැබැයි, යම්කිසි අවස්ථාවක ආණ්ඩු පක්ෂයේම කෙණෙහිලිකම් කරන මන්ත්‍රීවරු, එතුමාගේ සහෝදර මන්ත්‍රීවරු එතුමාගේ වැය ශීර්ෂය පරාජය කරන්න කටයුතු කළොත් මම සහ විශාල පිරිසක් එතුමාට පක්ෂව ඡන්දය පාවිච්චි කරනවාය කියන එක කියමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

**ගරු හෙක්ටර් බෙත්මගේ- සභා නායකතුමා**
Hon. Hector Bethmage - Leader of the House

නැති අර්බුද ඇති කරන්න එපා. නිකම් වහෙන් ඔරෝ භාෂාවෙන් -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මීළඟට හෙක්ටර් බෙත්මගේ ගරු සභානායකතුමාට අවස්ථාව ලබා දෙනවා.

[පූ.භා.12.00]

**ගරු හෙක්ටර් බෙත්මගේ- සභා නායකතුමා**
Hon. Hector Bethmage - Leader of the House

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා අපේ රංජිත් සෝමවංශ ගරු අධ්‍යාපන ඇමතිතුමාගේ විෂය පථය පිළිබඳව වචන ස්වල්පයක් කථා කරන්න අවස්ථාව ලබා දීම පිළිබඳව. මම මේ අවස්ථාවේදී පැවති සහ පවතින තත්ත්වතයන් පිළිබඳව කථා කරන්න යන්නේ නැහැ. නමුත් මම මේ අධ්‍යාපනයේ උන්නතිය සඳහා යම්කිසි අදහස් කිහිපයක් ප්‍රකාශ කරන්න, මම මේක අවස්ථාවක් කර ගන්නවා. මම ලබපු, ලබමින් සිටින අත්දැකීම් එක්ක. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අධ්‍යාපනයේ මූලික හරය වෙලා තිබෙන රටට හොඳ උගත්, බුද්ධිමත්, ප්‍රඥාවන්ත පිරිසක් හැදුවොත් හොඳ රටවැසියෝ බිහි වෙනවාය කියන කාරණාව පෙරදැරි කර ගෙන තමයි අපි අධ්‍යාපනය පිළිබඳව හැම වෙලාවේම කටයුතු කරන්නේ. එහිදී ප්‍රධාන භූමිකාව දරුවන් වෙනුවෙන් කරන්නේ ගුරුවරයා. එහෙම නැත්නම් ගුරුවරිය. නැත්නම් අපි කියනවා, ගුරු වෘත්තිකයන් කියලා. මම විශ්වාස කරනවා, මේ ගුරු වෘත්තිය හරියටම දරුවන්ට ගැලපෙන ආකාරයෙන් කෙරෙන්න නම්, ඒ ගුරුවරයාගේ හොඳ මානසික තෘප්තියක් තිබෙන්න ඕනෑ. පන්ති කාමරයට එන කොට ඔළුවේ කිසිම බරක් නැතිව සැහැල්ලුවෙන් පන්ති කාමරයට එන්න තිබෙන්න ඕනෑ. එහෙම නොවුණොත් කොයි තරම් ඉගැන්නුවත් ඒ මානසික ඒකාග්‍රතාවය නැතිව ඒ දරුවන්ට ඒවා කාන්දු වෙන්නේ නැහැ. අවශෝෂණය වෙන්නේ නැහැ. මම මේ කියන්න යන්නේ අද අපේ ගුරුවරු හුඟාක් වෙලාවට තමන් සේවය කරන තැනට වඩා හුඟාක් බැහැරින් තමයි තමන්ගේ නිවස තිබෙන්නේ. අපි මොන මොනවා හරි කරලා ඒගොල්ලන්ට පත්වීම් දෙනවා. අපි කියනවා, දුෂ්කර පාසල්වලට යන්නය කියලා. මම මෙතැනදී යෝජනාවක් ගේන්නේ අපි අලුත් පත්වීම් දෙන කොට, අනිවාර්යයෙන්ම ඒ පත්වීම්ලා හියාගෙන් අහන්න ඕනෑ. මෙන්න මේ පාසල් තිබෙන්නේ. මේකෙන් වඩාත්ම සුදුසු පාසල තෝරා ගන්නය කියලා. මොකද, මම එහෙම කියන්නේ. පසුගිය කාලයේ ගුරු පත්වීම් ලබා දෙන

[ ගරු හෙක්ටර් බෙත්මගේ - සභානායකතුමා ]

අවස්ථාවේදී, අපි ඔවුන්ට දුන්නේ ඇත ගුරු පත්වීම්. හැබැයි, එදා පත්වීම් දෙන කොට අපේ නායකකාරකාදීන් කථාවක් කරලා කියනවා. තරහා වෙන්න එපා. මේ ගුරු පත්වීම් ලැබුවායින් පස්සේ කිසිම විධියකින් මේවා වෙනස් කරන්න බැහැයි කියලා. හැබැයි, ඒක සද්භාවයෙන් කියන්නේ. එහෙම සද්භාවයෙන් කියන්න ඉස්සෙල්ලා අපේ නිලධාරීන් සහ අපේ ඉහළ බලධාරීන් ඔවුන් එක්ක සාකච්ඡා කරලා වඩාත්ම නිවැරදි තැනට දෙන්න ඕනෑ. හැබැයි, එහෙම නිවැරදි තැනක් නැත්නම් කරන්න දෙයක් නැහැ. මොකද, මම එහෙම කියන්නේ. කොයි තරම් ගුරුවරුන්ට පත්වීම් දුන්නත් ඊට පහුවෙනිදා ඉඳන්ම මේවා හදා ගන්න එනවා. අධ්‍යාපන ඇමතිතුමා ළඟට එනවා. ලේකම්තුමා ළඟට එනවා. පළාත් අධ්‍යක්ෂතුමා ළඟට එනවා. වර්ෂය පුරාම මේ තත්ත්වය තිබෙන කොට මම හිතනවා, ඒක අධ්‍යාපනයට විශාල බලපෑමක් කරනවා. නරකට. ඒ නිසා මම කියනවා, ඒ කාරණාවේදී සැලකිලිමත් වෙන්නය කියලා.

ඒ වාගේම තමයි ගුරු තුලනය. අපි හැම වෙලාවේම කියනවා ගුරු තුලනය කරන්න කියලා. ඒ ගුරු තුලනයේදීත් ඒ ගුරුවරයාත් එක්ක කථා බහ කරලා ඔබ වඩාත්ම කැමැති තැන කොතැනද? ඔබට වඩාත්ම කැමැති තැන ඉල්ලුවත් ඔබට දෙන්න බැහැ. ඊළඟ තැන මෙතැනයි කියලා ඒ කාරණාව ඉෂ්ට කරන්න ඕනෑ. එහෙම නැතිව අපි ආපු ගමන් ඇඟට පැනලා කලාපයට ගියාම කලාප අධ්‍යක්ෂතුමිය වෙන්න පුළුවන්. අධ්‍යක්ෂතුමා වෙන්න පුළුවන්. නැහැ මෙතැනට යන්න ඕනෑය කිව්වාම එයා යයි. රස්සාවට යයි. රස්සාවට තිබෙන ආදරය, රස්සාවට තිබෙන භය නිසා. නමුත් අපි බලාපොරොත්තු වන අධ්‍යාපනය ඒ දරුවාට ලැබෙන්නේ නැහැයි කියන විශ්වාසය තිබෙනවා.

ඊළඟට ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඔබතුමා මාර්ගයෙන් මම ගරු අමාත්‍යතුමාට යෝජනාවක් කරනවා. අපි පැහැර හරින ඉතාමත් කනගාටුදායක තත්ත්වයක් තිබෙනවා. විදුහල්පති භූමිකාවේ ඉන්නකල් සර් කියනවා. විදුහල්පතිතුමා කියනවා. සලකනවා. ගුරු වෘත්තියේ ඉස්කෝලේ මහත්තයා, ඉස්කෝලේ හාමිනේ ඉන්නකල්ම ගරු කරනවා. සලකනවා. හැබැයි, මතක තියා ගන්න පෙන්ෂන් ගියාට පස්සේ රස්තියාදු වෙන්න ඕනෑ. කියන්න බැරි තරම් රස්තියාදු වෙන්න ඕනෑ. මේක එක කලාපයකට විතරක් නොවෙයි. මම හිතන්නේ, මේක බස්නාහිර පළාතට විතරක් නොවෙයි. ජාතික පාසල්වලටත් එක්කම සමස්ත රටේම තිබෙන ප්‍රශ්නයක්. ඒ නිසා අපි ආකල්පමය වෙනසක් ඇති කර වන්න ඕනෑ. අධ්‍යාපන ඇමතිවරයාගේ ඉඳලා, අධ්‍යාපන ලේකම්වරයාගේ ඉඳලා පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරයා, කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරු, සියලු දෙනාම පණිවුඩයකින් විතරක් නොවෙයි. චක්‍රලේඛයකින් අරින්න ඕනෑ. විශ්‍රාම ගිය විදුහල්පතිවරයෙක් හෝ නිලධාරියෙක් ආවොත් ඔහුට හෝ ඇයට ප්‍රමුඛත්වය දීලා, ඒ විශ්‍රාම වැටුප ලබා දීමට අවශ්‍ය සියල්ලම ඉෂ්ට කරන්නය කියලා. මම මේ කියන්නේ. මම දන්නවා. ඉතාමත්ම කීර්තිමත් විදුහල්පතිවරු සේවය කරලා, කරලා අන්තිමට ගියාම ලිපිකරුවා ගණන් ගන්නෙත් නැහැ. කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරයාව හෝ අධ්‍යක්ෂවරියව ගණන් ගන්නෙත් නැහැ. මේ මම කියන්නේ, එක කලාපයක් නොවෙයි. මේක පොදු තත්ත්වයක්. ඒ නිසා මේක බැහැර කරන්න ඕනෑ. එහෙම වුණොත් තමයි අපට ජනතා විශ්වාසය, එහෙම නැත්නම් අධ්‍යාපනයේ ගුරු වෘත්තියේ තිබෙන විශ්වාසය දිනා ගන්න පුළුවන් වෙන්නේ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, දැන් අපේ ප්‍රශ්නයක් තිබෙනවා. සිරිකමල් පිලිෂියන් ද සිල්වා ගරු මන්ත්‍රීතුමාත් කියපු දේට මම එකඟයි. එතුමා මගේ දේශපාලන ධර්මයට විරුද්ධ ධර්මයක් අදහන මන්ත්‍රීවරයෙක් වුණත්. අපි මේ සම්පත් බෙදන කොට සමව බෙදනවාය කියන කාරණාව පිළිබඳව මම හිතන්නේ පරස්පරතාවයක් තිබෙනවා. මොකද, මම බෞද්ධයෙකු හැටියට මම නිදර්ශනයක් කියන්නේ. ලංකාවේ තිබෙනවා එක එක මට්ටම්වල විහාරස්ථාන. ඉතාමත්ම සල්ලි තිබෙන, ඉතාමත්ම සම්පත් තිබෙන, ඉතාමත් සැපවත් පන්සල් තිබෙනවා. ඒ වාගේම එදා දානේ වේලක්වත් ලැබෙන්නේ නැති, අඩු ගණනේ බෝධියක්වත් නැති, අඩු ගණනේ විහාර ගෙයක්වත් නැති පන්සල් තිබෙනවා. එහෙම නම් රජයෙන් මුදලක් දෙන කොට සියලුම පන්සල්වලට එක මුදලක්ම දුන්නොත් මම හිතන්නේ අසාධාරණයක් වෙනවා. මම හිතන්නේ තිබෙන පන්සල්වලටත් ඒක ලැබෙනවා. නැති පන්සල්වලටත් ලැබෙනවා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ආගමික ස්ථාන.

**ගරු හෙක්ටර් බෙත්මගේ- සභා නායකතුමා**
Hon. Hector Bethmage - Leader of the House

ආගමික ස්ථාන. සමාවෙන්න. පන්සල් විතරක් නොවෙයි. ආගමික ස්ථාන. ඒ වාගේම මේ පාසල්වලට, අධ්‍යාපනයටත් අපි මුදල් ලබා දෙන කොට ඒ පාසලේ අවශ්‍යතාවයන් සලකලා මුදල් ලබා දීම පිළිබඳව සලකන්නය කියන කාරණාව කියන්නේ. මොකද, අපේ සමහර විට ඇතැම් තැන්වලින් යෝජනාවක් එන්න පුළුවන් මේ මුදල් සියල්ලම සමසේ බෙදී යන්න පුළුවන් කියලා. එහෙම කෙරෙන්න දෙන්න එපා කියන කාරණාව තමයි මම මේ අවස්ථාවේදී අවධානයට යොමු කරන්නේ.

මම දීර්ඝව කථා කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. විශේෂයෙන් අපේ අධ්‍යාපන ඇමතිතුමාගේ අමාත්‍යාංශයේ නිලධාරීන් ඉතාමත්ම හොඳ කාර්යභාරයක් කරනවා. මම ඒක මතක් කරන්න ඕනැ. විශේෂයෙන්ම අපේ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂතුමා. එතුමාට අපි මොනවා හරි ගිහිල්ලා කිව්වාම, ටිකක් කුරුකුරු ගාන්නත් වෙනවා. හැබැයි, ඒ වුණත් කොහොම හරි කරලා දෙනවා. ඒ වාගේම අපේ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරු. සියලු දෙනාම සහයෝගය ලබා දෙමින් මම හිතන්නේ, අධ්‍යාපනයේ උන්නතිය සඳහා කැප වෙලා කටයුතු කරනවා. විශේෂයෙන්ම මම නියෝජනය කරන ශ්‍රී ජයවර්ධනපුර අධ්‍යාපන කලාපයේ මම ආඩම්බරයෙන් කියන්න ඕනැ. අපේ තිබෙන ප්‍රතිව්‍යූහ කමිටුව. ඒකේ සියලුම පක්ෂ නියෝජනය කරන අය ඉන්නවා. මම ඉන්නවා. ප්‍රදීප් උඳුගොඩ ගරු මන්ත්‍රීතුමා, ජගත් කුමාර ගරු මන්ත්‍රීතුමා, ඒ වාගේම මංජුල බුද්ධදාස මැතිතුමා ඉන්නවා. ජනතා විමුක්ති පෙරමුණ - මම හිතන්නේ අද ඡන්දය විරුද්ධව දෙයි. ජනතා විමුක්ති පෙරමුණේ සරත් පතිරණ ගරු මන්ත්‍රීතුමා ඉන්නවා. අපි සියලු දෙනාම ඒකරාශී වෙලා, අපි සියලු දෙනාම එක හැඟීමෙන් යුක්තව අපේ ප්‍රදේශයේ දරුවන්ගේ දියුණුවට වැඩ කරනවා. ඉතින් මම මේ අවස්ථාවේදී ගරු අධ්‍යාපන ඇමතිතුමාගෙන් ඉල්ලා සිටින්නේ, මම හැම වෙලාවේම පුන පුනා කියනවා. අප්‍රේල් 22 වැනිදා කාලය හමාරයි. අප්‍රේල් 22 වැනිදා වෙන කොට අපි ලබන අවුරුද්දේ සියලුම සැලසුම් සහගත දේවල් ඒවා ඒ ආකාරයෙන්ම කර ගෙන යන්න ඕනැ. මොකද, ඒක මග නවතින්න බැහැ. ඉතින් මම විශ්වාස කරනවා. අපි එදා ඉදිරිපත් කරපු සැලැස්ම අනුව ඒ යෝජනා ඉදිරිපත් කරලා තිබෙන සියලුම කතිකාවන් කරලා, ඒ සියලුම තැන්වල කතිකාවන් කරලා ඒ මුදල් ඒ විධියටම යොදවන හැටියට ඉතාමත්ම ඕනෑකමින් ඉල්ලා සිටිනවා. විශේෂයෙන්ම මේක සඳහන් වෙන්න ඕනැ. හැන්සාඩ්ගත වෙන්න ඕනැ. අපේ ශ්‍රී ජයවර්ධනපුර අධ්‍යාපන කලාපයේ විශිෂ්ට ගනයේ පාසලක් වන කඩුවෙල මැතිවරණ කොට්ඨාශයේ, මා නියෝජනය කරන මැතිවරණ කොට්ඨාශයේ පාසලක් වන මාලබේ ආදර්ශ පිරිමි විද්‍යාලයට. විශේෂයෙන් මම මේ අවස්ථාවේ ගෞරවයෙන් සඳහන් කරන්න ඕනැ. ප්‍රධාන අමාත්‍ය ඉසුර දේවප්‍රිය මැතිතුමාගේ මූලික උවමනාව තුළත්, ඒ වාගේම අපේ අධ්‍යාපන ඇමතිතුමාගේ මූලික උවමනාව තුළත් ඉතාමත් ප්‍රශස්ත ගනයේ පිහිනුම් තටාකයක් ඉදි කරන්න සියලුම කටයුතු සලස්වලා ඉවර වෙලා තිබෙනවා. ඒ නිසා ඒ පිහිනුම් තටාකය ඉදි කිරීමේ වැඩ පිළිවෙළ පටන් ගත්තාම, ඒක නිම කිරීම දක්වාම මේ පළාත් සභාවේ ආශිර්වාදය, ප්‍රධාන අමාත්‍යතුමාගේ ආශිර්වාදය, අධ්‍යාපන අමාත්‍යතුමාගේ ආශිර්වාදය ඉංජිනේරු අංශවල, සියලුම අධ්‍යාපන ක්ෂේත්‍රවල ආශිර්වාදය ලබා දීලා මෙම කටයුත්ත ඉවර කරලා දෙන හැටියට මම ඉල්ලා සිටින අතරම, ඒක මේ සභාවේ ස්ථාපිත යෝජනාවක් හැටියටත් සඳහන් කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

[අ.භා.12.09]

**ගරු කේ.ටී. කුරුසාමි**
Hon. K.T. Kurusamy

கௌரவ பிரதித் தவிசாளர் அவர்களே, கல்வி அமைச்சர் அவர்களே, உண்மையிலேயே எனக்கு தமிழில் பேசுவதற்கு ஆசை. හෙඩ්ෆෝන් දාන්න ඕනැ නැහැ. සිංහලෙන් කථා කරන්නම්. නමුත් මගේ මව් භාෂාවෙන් මේක ආරම්භ කරන්න ඕන නිසා. எனக்கு தமிழில் நன்றாக பேச முடியும் என்றாலும், நான் இங்கு சொல்ல நினைக்கும் விடயங்களை இங்கே இருக்கக் கூடிய எங்களுடைய சிங்கள சக உறுப்பினர்களுக்கு மற்றும் சிங்கள உத்தியோகத்தர்களுக்கு புரிந்து கொள்ள முடியாத காரணத்தினால்,இங்கே மொழிபெயர்ப்பு இருந்தாலும் நான் நேரடியாக சிங்கள மொழியிலேயே பேச விரும்புகின்றேன்.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම කියන්න ආවේ මම දෙමළ භාෂාවෙන් කථා කරන්න ආසයි. නමුත් මෙතැන පරිවර්ථනයකුත් තිබෙනවා. නමුත් මම කියන දේවල්, මම දෙමළෙන් කථා කරලා සිංහලෙන් පරිවර්ථනය කරනවාට වඩා මම දන්න සිංහලෙන් කථා කරන්න

[ ගරු කේ.ටී. කුරුසාමි ]

කැමැතියි. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, රංජිත් සෝමවංශ ගරු ඇමතිතුමාගේ අධ්‍යාපන අමාත්‍යාංශය ගැන කථා කරන කොට මම මේ සභාවට මන්ත්‍රීවරයෙකු හැටියට පත් වෙලා අවුරුදු තුනහා මාරක් විතර වෙනවා. නමුත් කොළඹ නගර සභාවේ අවුරුදු 12 ක් මන්ත්‍රී ධුරයේ ඉඳලා තමයි මෙම පළාත් සභාවට පත් වෙලා ආවේ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ අවස්ථාවේදී පළමුවෙන්ම මම ඔබතුමාට ස්තූතිවන්ත වෙනවා. ඒ වාගේම මට අමතක වෙන්න ඉස්සෙල්ලා ඔබතුමාගේ කාර්ය මණ්ඩලය, ඒ වාගේම අපේ අමාත්‍යාංශයේ ලේකම්වරු සියලු දෙනාටම, ඒ වාගේම පළාත් අධ්‍යක්ෂතුමා, කලාප අධ්‍යක්ෂවරු, නිලධාරීන් සියලු දෙනාම පැමිණ සිටිනවා. යම්කිසි මගේ දේශපාලන කටයුතුවලට අධ්‍යාපන අමාත්‍යාංශය තුළින් ඔබතුමන්ලා කරපු උදව්වලට ඇත්තටම මම ස්තූතිවන්ත වෙනවා. නමුත් ගරු ඇමතිතුමනි, ඔබතුමා ඉතා මිත්‍රශීලීව, ඉතා හොඳින් ආශ්‍රය කරන එකට මම මේ අවස්ථාවේදී සතුට පළ කරනවා. සමහර විට ඔබතුමා ආහාර ගන්නා විට බත් හෝ මොකක් හරි කෑමක් කන කොට වරෙන් ගුරු ඉඳගනින් කියලා ඒ වාගේ හැඟීමක් තිබෙන, හොඳ හිතක් තිබෙන හොඳ ඇමතිවරයෙක්.

දැන් මම මේ කියන්න යන සමහර අඩුපාඩු ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මෙතුමාගේ අඩුපාඩු නොවෙයි. පසුගිය අවුරුදු තුනක කාලය තුළ මේ පළාත් සභාවේද, එහෙම නැත්නම් උපදේශක කාරක සභාවලද, එහෙම නැත්නම් කලාප කාර්යාලවල රැස්වීම්වලදී කියලා, කියලා මට කරන්න බැරි වුණු දේවල්. කරුණාකරලා ඔබතුමාට සහ මේ පැමිණ සිටින අපේ අමාත්‍යාංශයේ නිලධාරී මඩුල්ලට මම කියන්න කැමැතියි, ඉතා අනුකම්පාවකින් සාධාරණයක් ඉටු කරන්නය කියලා. මේ ශ්‍රී ලංකාවට අවුරුදු 30 කට ඉස්සෙල්ලා පළාත් සභාවක් ඇති කෙරුවේ බලය, වැඩියෙන්ම අපේ වාගේ සුළු ජාතීන්ට, මේ රටේ ජීවත් වන සුළු ජාතීන්ට බලය බෙදා දීම සඳහායි. මේ පළාත් සභා ක්‍රමය මේ රටට ගෙනාවේ ඒ සඳහායි. නමුත් ඔබතුමා හිතලා බලන්න. මම කියපු දෙයක් තමයි අවුරුදු තුනකට ඉස්සෙල්ලාම 2015 දී ඔබතුමා අධ්‍යාපන ඇමති ධුරයට පත් වෙන කොට එදා විවාදයේදී මම කියපු දෙයක් තමයි අර වත්තල දෙමළ පාසල ගැන. අද අවුරුදු 30 ක් වෙනවා. කියන්න ලැජ්ජයි. සියලුම අපේ නිලධාරී මඩුල්ල - මෙය ජාතිවාදයක් කියලා හිතන්න එපා. කරුණාකරලා සාධාරණය දිහා බලන්න. මම මුළු බස්නාහිර පළාතටම ගිහිල්ලා - අනික් පළාත්වල ගම්පහ දිස්ත්‍රික්කයේ ඔක්කෝගේම අඩුපාඩු තිබෙනවා. සිංහල පාසල්වල අඩුපාඩු තිබෙනවා. මුස්ලිම් දූ දරුවන්ට අඩුපාඩු තිබෙනවා. නමුත් ඒ ඔක්කෝටම යන්න බැහැ. ලැබෙන මිනිත්තු 10 තුළ මේ කොළඹ දිස්ත්‍රික්කය ගත්තොත් පොඩ්ඩක් එහාට ගියොත් - දැන් ඇමතිතුමා දන්නවා. එදා අපි වත්තල පාසල හරි ගස්සන්න කියන කොට ඔබතුමාත් පොරොන්දු වුණා. මේ අවුරුදු 30 ක කාලය තුළ අපි එක දෙමළ පාසලක් මේ කලාපය තුළ හෝ මේ දිස්ත්‍රික්කය තුළ හදලා තිබෙනවාද? එතකොට හොඳ චාන්ස් එකක් අපට ලැබුණා. අදත් බලන්න.

ගරු ඇමතිතුමනි, නිලධාරී මහත්වරුනි, ගම්පහ දිස්ත්‍රික්කයේ වත්තල ප්‍රදේශය හැම අවුරුද්දේම 1 වසර ළමයි දහස් දෙනෙක් එනකොට 200 කට තමයි හම්බ වෙන්නේ. ඉතිරි ළමයි 800 කොහේටද යන්නේ? එතකොට දෙමළ හින්දු ළමයින්ට යන්න ඉස්කෝලයක් නැහැ. එතකොට ඒ ළමයි යන්නේ වෙන වෙන පාසල්වලට. අපට ඉඩම් ලැබුණා. මුදල් ලැබුණා. සියලු දේ ලැබුණා. නමුත් මේ පළාත් සභාව, ඔබතුමාගේ අමාත්‍යාංශය මොකක් හරි කාරණාවක්, යම්කිසි දේශපාලන ප්‍රශ්න ඇති වුණා තමයි. නමුත් අපි ඒක කෙරුවේ නැහැ. ඒ එකක්. ඒ නිසා මම කියන්නේ ගරු ඇමතිතුමනි, කරුණාකරලා මාස තුනක කාලයක් තිබෙනවා. එහෙම නැත්නම් ලබන අලුත් සභාවේ හරි මේක කරන්න. නැත්නම් ලොකු අපරාධයක් කියලා මම කියන්න කැමැතියි.

අද මේ බස්නාහිර පළාතේ 150 කට වඩා දෙමළ පාසල් තිබෙනවා. දෙමළ මාධ්‍ය ඉගෙන ගන්න දූ දරුවන් 90,000 කට වඩා ඉන්නවා. ඒ වාගේම 3800 කට වැඩිය ගුරුවරුන් ඉන්නවා. නමුත් මට කියන්න ලැජ්ජයි. මේ කොළඹ දිස්ත්‍රික්කයේ පාසල් 44 කට වැඩිය තිබෙනවා. කවුරු කවුරු දන්නවාද කියලා මම දන්නේ නැහැ. තිබෙන දෙමළ පාසල් - ජාතික පාසල් 03 ක් තිබෙනවා. පළාත් පාසල් විතරක් මම කියන්නේ නැහැ. ජාතික පාසල් 3 ක් තිබෙනවා. 44 ක් විතර දෙමළ පාසල් - මෙතැන දෙමළ පාසල් විතරක් 20 කට වැඩිය තිබෙනවා. හැම පාසලක්ම හදලා අවුරුදු 50 කට 60 කට වැඩි පාසල්. නමුත් එක පාසලකවත් ගරු ඇමතිතුමනි, නිලධාරී මහත්වරුනි, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ ඉතිහාසයේ අවුරුදු 50 ක් 60 ක් තිබෙන දෙමළ පාසල්වල එක පාසලකවත්

Swimming Pool එකක් නැහැ. එක පාසලකවත් ක්‍රීඩාංගනයක් නැහැ. එතකොට මම අහන්නේ, මේ දෙමළ දූ දරුවෝ කොහේ ගිහිල්ලාද සෙල්ලම් කරන්නේ? දැන් අපි කථා කරනවා. ඔබතුමාගේ අමාත්‍යාංශය ගත්තාම පළාත් අධ්‍යාපනය, සංස්කෘතික, කලා කටයුතු, ක්‍රීඩා, යෞවන කටයුතු, තොරතුරු තාක්ෂණය කියන අමාත්‍යාංශ රාශියකින් යුක්තයි. ඉතින් මේ සියලු දේ තිබිලත් මම අහන්නේ, අපේ ළමයින්ට සෙල්ලම් කරන්න ක්‍රීඩාංගනයක් නැත්නම්. මේ ඔක්කොම ඇතුළත් වෙනවා නේ? අධ්‍යාපනය ඇතුළත් වෙනවා. කලාව ඇතුළත් වෙනවා. ක්‍රීඩාව ඇතුළත් වෙනවා. තාක්ෂණය ඇතුළත් වෙනවා. මේ එකක් හරි අපට තව වෙන තුරු කරන්න බැරි වෙලා, අවුරුදු 50 ක් 60 ක් වී තිබෙනවා. එතකොට නිකම් හිතලා බලන්න. දෙමළ ළමයින්ට එක ක්‍රීඩාංගනයක් නැත්නම් - අඩුපාඩු සිංහල ළමයින්ටත් තිබෙනවා. මම දෙමළ මන්ත්‍රීවරයෙක්. ඒ නිසා ජාතිවාදයක් කියලා හිතන්න එපා. මේ මම කියන එක ඕගොල්ලෝ දැන ගන්න ඕනැ. Swimming Pool එකක් නැහැ. ක්‍රීඩාංගනයක් නැහැ. එතකොට ටිකක් හිතලා බලන්න. සෙනසුරාදා ඉරිදා දවස්වල තමන්ගේ ඉස්කෝලවල ක්‍රීඩාංගනයක් නැති උසස් පෙළ ඉගෙනුම ලබන තරුණයෝ සෙනසුරාදා, ඉරිදා තමන්ගේ පළාතේ තිබෙන ක්‍රීඩාංගනයකට සෙල්ලම් කරන්න යන කොට - දැන් කොළඹ මහ නගර සභාවට අයත් ක්‍රීඩාංගන තිබෙනවා. එතකොට ඒවාවල ඒ ප්‍රදේශයේ ඉන්න අය තමයි සෙල්ලම් කරන්නේ. ඉරිදා දවසක. පෝය නිවාඩු දවසක. එතකොට පිට පළාතක ඉන්න තරුණ තරුණයින්ට එන්න බැහැ. ටිකක් හිතලා බලන්න. අපේ දරුවන්ගේ - ඇත්තටම දෙමළ අධ්‍යාපනය පළාතෙන්ම එක කාලයක් තුළ අන්තිම - ශ්‍රේණිගත කරන කොට මම හිතන්නේ බස්නාහිර පළාත පළමුවැනියාට තිබුණාලු. නමුත් දැන් දෙවැනියාට ගිහිල්ලා තිබෙන්නේ දෙමළ අධ්‍යාපනය නිසා. එතකොට මේ වාගේ අඩුපාඩු. මම දුක් වෙනවා. Swimming Pool එකක් නැත්නම්, ක්‍රීඩාංගනයක් නැත්නම් ළමයින් කොහේ ගිහිල්ලාද සෙල්ලම් කරන්නේ?

ඒ වාගේම මම කිව්වා. පාසල් 150 ක් තිබෙන කොට ගරු ඇමතිතුමනි, දැන් කොළඹ කලාප කාර්යාලය තිබෙනවා. ඒ කාලේ ඉඳලා මම කියාගෙන එන දෙයක් තමයි, අපි බලය බෙදා දීලා, දෙමළ භාෂාව කියන්නේ රජයේ භාෂාවක්. සිංහල සහ දෙමළ භාෂාවන් දෙමළ භාෂාව රජයේ භාෂාවක් වෙලා දැන් අවුරුදු 30 ක් වෙනවා. මම මේ අවුරුදු තුනක් තිස්සේ කිය කියා ඉන්නවා. අර දෙමළෙන් කියනවා වචනයක්. **செவிடன் காதில் ஊதின சங்கு** කියලා. ඒ කියන්නේ, බීරි කෙනෙකුගේ කනට නලාවක් පිම්බා වාගේ තමයි. මමත් මේ අවුරුදු තුනක් විතර කිව්වා. ඒ නිසා තව වෙන තුරු -

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

බීරි අලින්ට වීණා ගහනවා.

**ගරු කේ.ටී. කුරුසාමි**
Hon. K.T. Kurusamy

අන්න ඒ වාගේ තමයි. ඒ වාගේ තමයි අපිත් කෑ ගහගෙන ඉන්නේ. ඉතින් ඔබතුමා හොඳයි. මම කියනවා නේ? කවදාවත් දෙමළ මන්ත්‍රීතුමා කියන දේ මම කරන්නේ නැහැයි කියලා. නිලධාරීන්, ඔබතුමා හෝ දෙමළ සිසුන්ට අපි කරන්න කැමැති නැහැ කියන අදහස නැහැ. හිත හොඳයි. කිසිම මන්ත්‍රීවරයෙකුට එහෙම නැහැ. මම කථා කරන කොටත් කියනවා. මම හැමදාම කියනවා. මම දෙමළ මන්ත්‍රීවරයෙකු හැටියට මම හැමදාම කියන්නේ, මම ශ්‍රී ලාංකිකයෙක් හැටියට තමයි කථා කරන්න කැමැති. ඒ නිසා කරුණාකරලා මේ අඩුපාඩු බලන්න. දැන් අද කොළඹ කලාපය තුළ අධ්‍යක්ෂතුමා ඉන්නවා. වඩා හොඳ කෙනෙක්. අපි ඕනැ දෙයක් කිව්වොත් කරනවා. නමුත් එතුමාටවත් කරන්න බැරි තරමට වැඩ, ෆයිල් ගොඩ වෙලා. මම කියන්න කැමැතියි. කරුණාකරලා, කොළඹ කලාපය තුළින් හරි අපේ ගුරුවරු යන කොට දෙමළ භාෂාවෙන්, එහෙම නැත්නම් කොළඹ කලාපය තුළ දෙමළ භාෂාවට කියලා වෙනම කලාපයක් ඇති කරන තරමට වැඩ පිරිලා තිබෙනවා. එහෙම නැති වුණොත් අඩුම ගණනේ Assistant Directors පත් කරන්න. තවම පත් කරලා නැහැ. ඒ වාගේම අධ්‍යාපනය වෙනුවෙන්. ඊයේත් මම කිව්වා. සමහර දේවල් මට කරලා දෙන්න. අපේ මහ ඇමතිතුමා මුදල් වශයෙන් මට දීලා තිබෙනවා. ඒකට මම ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම මේ අඩුපාඩු ටික. දෙමළෙන් ලියුම් යවන්න ඕනැ එක. දෙමළ Subject vice Directors අවශ්‍යයි. ඒ වාගේම සම්පත් දායකත්වය. ඉතින් මම අහන්නේ, ඇයි මේ අඩුපාඩු? (බාධා කිරීමක්) ඒ නිසා ගරු ඇමතිතුමනි, කරුණාකරලා ඔබතුමාගෙන් ඉල්ලුම් කරන්නේ මේ අවුරුදු තුනක් කියලා තව මාස තුනකින්, හතරකින් ඉවර වෙන කොට ලබන ජනවාරි වන කොට මේ කියපු දේ අඩුම

[ ගරු කේ.ටී. කුරුසාමි ]

ගණනේ දෙමළ භාෂාවෙන් ලියුම් යවන්න. මේ Assistant Directors ලා, දෙමළ Directors ලා පත් කරන්න. ඒ ටික ඔබතුමා කරන්න ඕනෑය කියලා ඉල්ලා සිටිමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

[අ.භා.12.20]

**ගරු නීල් සුනේත්‍ර ලාල් ප්‍රනාන්දු**
Hon. Neel Sunethra Lal Fernando

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම ප්‍රථමයෙන් ස්තුතිවන්ත වෙනවා අද මේ අවස්ථාව මට ලබා දීම පිළිබඳව. ඒ වාගේම අධ්‍යාපන උපදේශක කාරක සභාවේ සාමාජිකයෙකු වශයෙනුත්, වැටුප් රහිත නිවාඩු ලබා සිටින ගුරුවරයෙකු ලෙසත්, ඒ වාගේම 1993 එක්සත් ජාතික පක්ෂ රජයෙන් දේශපාලන පළිගැනීමකට ලක් වුණු ගුරුවරයෙකු ලෙසත් තමයි අද මම මේ විවාදයට සහභාගී වෙන්නේ. මම හිතන්නේ අධ්‍යාපනය කියන්නේ මහා පුළුල් විෂයයක්. මේකේ තෙරක් නැහැ. තෙරක් නොමැති මහා සාගරයක් වාගේ අපි අධ්‍යාපනය පිළිබඳව කල්පනා කරලා බැලුවොත්, අධ්‍යාපනය කවර රටක හෝ දිගු කාලීන ආයෝජනයක්. ඒ ආයෝජනයේ ප්‍රතිඵල ලබා ගන්න අපට විශාල කාලයක් ගත වුණත්, අපි ඒ පිළිබඳව, එහි වටිනාකම පිළිබඳව මන්දෝත්සාහී නොවී සමස්ත සමාජයටම වැඩ කටයුතු කරන විෂයයක් ලෙස අධ්‍යාපනය අපට හඳුන්වන්න පුළුවන්. එදා අපේ මුතුන් මිත්තන් වැලි පිල්ලේ අධ්‍යාපනයේ අකුරු කරවීම, ඒ වාගේම ගල්ලෑල්ල, ගල් කූර, අද හුණු කෑල්ල, කළු ලෑල්ල ඒ වාගේම වයිට් බෝඩ් එක, මාකර් එක. මේ සියලු සම්ප්‍රදායානුකූල ඒ ක්‍රමයන් බැහැර කරලා, අද අධ්‍යාපන ක්‍රමය පරිගණක යන්ත්‍රය, ටැබ් එක දක්වා පරිවර්තනය වන යුගයක අපි මේ කථා කරන්නේ. මම හිතන්නේ තවමත් අපි අපේ සම්ප්‍රදායනුකූල අධ්‍යාපන ක්‍රම භාවිතා කරමින් රටේ අධ්‍යාපනය ඉදිරියට ගෙන ගියත්, වර්තමාන සිසු පරපුරේ මානසික මට්ටම මීට වඩා වෙනස් තත්ත්වයකට පත් වෙලා තිබෙනවා. ඒ නිසා හැම තිස්සේම අපේ දරුවෝ නව තාක්ෂණ ක්‍රමවේදයන් සොයා ගෙන තමයි යන්නේ. ඒ නිසා අපි ඒ තත්ත්වයට අනුගත වෙන්න, පන්ති කාමරය තුළ ලබා දෙන දැනුම පරිගණකය තුළින් ලබා දෙන තත්ත්වයට පත් කර ගැනීමට මම හිතන විධියට අධ්‍යාපන ක්‍රියාවලිය දියුණු කර ගන්න අපට අවශ්‍යතාවයක් දැන් ඇති වෙලා තිබෙන යුගයකයි අපි ඉන්නේ. ඒ නිසා මම හිතන්නේ ගරු අමාත්‍යතුමා හොඳ වැඩ පිළිවෙළක් ආරම්භ කරලා තිබෙනවා. Smart Class room කියන ක්‍රමය. නමුත් මේ පිළිබඳව දැනුමක්, අවබෝධයක් අපි කිසි කෙනෙකුට අපේ මන්ත්‍රීවරුන්ට තවම නිසි ආකාරයෙන් ලැබුණේ නැහැ. ඒ ක්‍රමය පිළිබඳව එතුමා යම් වැඩ පිළිවෙළක් සකස් කරලා තිබෙන බව අපට මේ පොතේ දැන ගන්නට ලැබිලා තිබෙනවා. මම හිතනවා, ඒක ඉදිරියට විශේෂයෙන්ම කළුතර දිස්ත්‍රික්කයේ, පාසල් වෙනුවෙනුත් ඒ කාර්යය නිසි ආකාරයෙන් ඉටු කරයි කියලා.

ඒ වාගේම විශේෂයෙන්ම මතක් කරන්න ඕනෑ. අධ්‍යාපන උපදේශක කාරක සභාවේ සාමාජිකයෙකු වශයෙන් මේ අධ්‍යාපන උපදේශක කාරක සභාව පිළිබඳව ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, කිසිම ආකාරයකින් මම නම් සෑහීමකට පත් වෙන්නේ නැහැ. එතුමා ඒක නිසි ආකාරයෙන් පැවැත්වුවත් කිසිම ඵලදායී යෝජනාවක් අධ්‍යාපන උපදේශක කාරක සභාවට ආවේ නැහැ. කලාප මට්ටමින්, කලාප අධ්‍යක්ෂවරුන්ගේ යම් යම් යෝජනා හැරුණු කොට කිසිම ඵලදායී යෝජනාවක් අපේ අධ්‍යාපන උපදේශක කාරක සභාවෙන් සිදු වුණේ නැහැ. ඒක පිළිගන්න ඕනෑ ගරු ඇමතිතුමා. ව්‍යුහ කමිටුවල, කළුතර අධ්‍යක්ෂතුමිය ඇතුළු අපි ව්‍යුහ කමිටුවත්, ඒ ව්‍යුහ කමිටුවල තිබෙන යෝජනා ඉතාමත්ම ක්‍රමානුකූල ලෙස ඒ කාර්යය අපි නිසියාකාරයෙන් ඒ කොට්ඨාශවලට සම්පත් බෙදී යන විධියට ව්‍යුහ කමිටුවල අපි කටයුතු කළා. ඒ තරම්වත් තත්ත්වයක් අධ්‍යාපන උපදේශක කාරක සභාවේ ඵලදායී යෝජනාවක් මම හිතන්නේ පසුගිය කාලය තුළ අපට ලබා ගන්න බැරි වුණා. ඒ පිළිබඳව ගරු අධ්‍යාපන ඇමතිතුමාගේ අවධානය තවදුරටත් යොමු කරනවා.

ඒ වාගේම විශේෂයෙන්ම මම මතක් කරන්න ඕනෑ. දැනට අපේ අධ්‍යාපන ඇමතිතුමා කළුතර දිස්ත්‍රික්කය නියෝජනය කරන ඇමතිවරයෙක් වශයෙන් කළුතර අධ්‍යාපන කලාප කාර්යාලය අද අපට ඒ ගොඩනැගිල්ල අයිති වෙලා තිබෙන්නේ, කළුතර මහා විද්‍යාලයට. ඒක ජාතික පාසලක්. ඒ මහා විද්‍යාලයෙන් දැනට ඉල්ලීමක් කරලා තිබෙනවා වහාම කලාප අධ්‍යාපන කාර්යාලය ඉන් ඉවත් කර ගන්නය කියලා. මම දන්නවා. සුමිත් ලාල් මැන්දිස් ගරු ඇමතිතුමාත්, අපි සියලු දෙනා එකතු වෙලා දැනට කළුතර කලාප අධ්‍යාපන කාර්යාලයට ස්ථානයක් ලබා ගැනීමට හොඳ ඉඩමක් සොයමින් පවතිනවා. මම හිතන්නේ, ඒ පිළිබඳව සුමිත් ලාල් මැන්දිස් ගරු අමාත්‍යතුමා

ඉඩමක් සොයා ගෙන තිබෙන බව මට දැන ගන්න ලැබුණා. එහි හොඳ කලාප කාර්යාලයක් සකස් කර ගැනීම සඳහා ලබන වර්ෂයේ මුදල් ප්‍රතිපාදන වෙන් කරලා දෙන්නය කියලා මම ඉතාමත්ම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා. ඒ වාගේම මම හිතන්නේ, අද ගුරු හිඟයට විසඳුමක් ලෙස අඛණ්ඩව ගුරුවරුන් බඳවා ගැනීම පසුගිය කාලය තුළ සිදු වුණා. 2014 ගුරු විභාගය පාදක කර ගෙන ගුරුවරුන් 912 ක ප්‍රමාණයක්, ඊට අධික ප්‍රමාණයක් අධ්‍යාපන ඇමතිතුමා බඳවා ගැනීම සිදු කළා. (බාධා කිරීමක්) නිශ්චිත ලෙස අනුගත කිරීමේදී, ස්ථානගත කිරීමේදී යම් යම් ප්‍රශ්න ඇති වුණා.

ඒ වාගේම මම විශේෂයෙන්ම ගරු අමාත්‍යතුමාට ස්තුතිවන්ත වෙනවා. පානදුර කොට්ඨාශ අධ්‍යාපන කාර්යාලයේ ප්‍රදේශය තුළ දැනට ගුරු හිඟයක් ඇත්තටම නැහැ. හැම ගුරුවරයෙක්ම අපට ලබා දීලා තිබෙනවා. ඒ වාගේම කළුතර දුෂ්කර ප්‍රදේශයන්. තවමත් ගුරු හිඟය පවතිනවා. විශේෂයෙන්ම දෙමළ මාධ්‍ය ගුරුවරුන් 105 දෙනෙක් පමණ බඳවා ගැනීම සිදු වුණත් ඒක ප්‍රමාණවත් නැහැ. මම දැක්කා ඒක ඔබතුමාගේ මේ පොතේ සඳහන් වෙලා තිබෙනවා. කොන්ත්‍රාත් පදනම මත දෙමළ මාධ්‍ය ගුරුවරුන් බඳවා ගැනීම ඉටු කරන්න සූදානම් වෙනවා කියලා. ඒ යෝජනාවත් ක්‍රියාත්මක කරන ලෙස මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ඒ වාගේම ගරු අමාත්‍යතුමනි, විශේෂයෙන්ම ගුරුවරුන්ගේ පවතින ගැටළු, විශේෂයෙන්ම උසස්වීම්, ස්ථාන මාරු වීම්, දරුවන් පාසලට ඇතුළත් කර ගැනීම්, ඒ වාගේම ණය ලබා ගැනීම, නිවාඩු වැටුප් වර්ධක ආදිය ලබා ගැනීම ඉතාමත්ම දුෂ්කරතාවයට පත් වෙලා තිබෙනවා. ඔබතුමාගේ මහජන දිනය දවසේ සමහර ගුරුවරු සිය දරුවන් වඩා ගෙන මෙතැන පැය ගණන් රස්තියාදු වෙනවා මම දැකලා තිබෙනවා. ඒ නිසා ඒ ගුරුවරුන්ගේ ප්‍රශ්න විසඳන්න විශේෂ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන ලෙස ඉල්ලා සිටිනවා. කලාප කාර්යාලවල ඔබතුමාගේ බලය විමධ්‍යගත කිරීමක් හෝ ඔබතුමාගේ නිලධාරියෙක් ඒ කලාප කාර්යාලවලට යොමු කරලා ඒ ගුරුවරුන්ගේ ගැටළු විසඳලා ඔවුන්ගේ රැකියාවේ සංතෘප්තභාවය ලබා දෙන්නය කියලා ඉල්ලා සිටිනවා.

ඒ වාගේම විශේෂයෙන්ම අපේ සිරිකමල් පිලීෂියන් ද සිල්වා ගරු මන්ත්‍රීතුමා මතක් කළා. ගුරුවරුන්ගේ විශ්‍රාම වැටුප් ලබා ගැනීමේදී, පාරිතෝෂිත දීමනා ලබා ගැනීමේදී එතුමන්ලා ඉතාමත්ම දුෂ්කර තත්ත්වයට පත් වෙලා තිබෙන්නේ. සමහර අයට වසර ගණනාවක් යනවා විශ්‍රාම වැටුප සකස් කර ගන්න. සමහරුන්ගේ පෞද්ගලික ලිපි ගොනුවල තිබෙන අඩුපාඩු ඒ විෂය භාර අය දැනුම් දීමක් කරන්නේ නැහැ. ඒ නිසා අඩුම ගණනේ විශ්‍රාම යැමට වසරකට පෙර වත් මේ පිළිබඳව ඒ ගුරුවරුන් දැනුවත් කිරීමක් කරලා ඔවුන්ගේ විශ්‍රාම යන දිනට විශ්‍රාම වැටුප හා පාරිතෝෂිත දීමනාව ලබා දීමට වැඩ පිළිවෙළක් සකස් කරන්නය කියලා මම ඉල්ලා සිටිනවා.

විශේෂයෙන්ම ගරු අමාත්‍යතුමනි, මේ වසරේ, 2019 වර්ෂයට ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ අයවැය ප්‍රකාශනයේ රුපියල් මිලියන 2454 ක මුදලක් අධ්‍යාපනය වෙනුවෙන් වෙන් කරලා තිබෙනවා. අපි එතුමාට ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම 2018 වර්ෂයේ මිලියන 7455 ක මුදලක් වෙන් කළා. විශේෂයෙන්ම අවසාන වශයෙන් ඔබතුමාගෙන් මම ඉල්ලා සිටින්නේ, ඒ පරිපූරක ඇස්තමේන්තුවලින් ආරම්භ කරන ගොඩනැගිලි සහ දැනට අඩක් නිම කර ඇති ගොඩනැගිලි වෙනුවෙන් ලබන වර්ෂයේ මුදල් ප්‍රතිපාදන වෙන් කරලා ඒ කාර්යයන් නිම කරලා, ඒ ගොඩනැගිලි දරුවන්ගේ අයිතියට පැවරීමට කටයුතු කරන ලෙස ඉල්ලා සිටිනවා. ගරු අමාත්‍යතුමාගේ වැය ශීර්ෂය වෙනුවෙන් මගේ සුභාශිංසන ප්‍රකාශ කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

[අ.භා.12.29]

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මට මේ අවස්ථාව ලබා දීම ගැන පළමුවෙන්ම ස්තුතිවන්ත වෙනවා. රංජිත් සෝමවංශ ගරු ඇමැතිතුමාගේ උපදේශක කාරක සභාවේ ඉන්න මන්ත්‍රීවරයෙක් වශයෙන් ඇත්තටම අපට තිබෙන ප්‍රශ්න මේ වෙලාවේ කථා කිරීමට ලැබීම ලොකු භාග්‍යයක් කියලා මම හිතනවා. අපට තිබෙන ලොකුම ප්‍රශ්නය තමයි - මේ වෙලාවේ ඇමැතිතුමා ඉන්න ඕනෑ. ඇමැතිතුමා නැඟිටලා ගියා. අපි කථා කරන්නේ කවුරුන් සඳහාද? අපි කාටද කථා කරන්නේ? ඇමැතිතුමා සීට් එකේ හිටියොත් තමයි අපට කථා කරන්න පුළුවන්. අපි කියන්නේ අද කොළඹ තිබෙන ලොකුම ප්‍රශ්නය තමයි අපේ දූ දරුවන්ගේ පාසල් ප්‍රශ්නය. පළමුවැනි ශ්‍රේණියට ළමුන් ඇතුළත්

[ ගරු එම්.එස්.එම්. ෆයිරෝස් ]

කරන්න ගියා නම් කොළඹ කියන්නේ, ඔබතුමන්ලා දන්නවා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, හරි දුෂ්කර පළාතක්. මැද කොළඹ ආසනය කියන්නේ, එක වත්තක් ඇතුළත ගෙවල් එකසිය ගණනක් තිබෙනවා. එකසිය හැටේ පදිංචි වෙලා ඉන්නේ පවුල් 160 ක්. තාත්තාගේ නමට ගෙවල් තියෙන්නේ. දරුවෝ හතර පස් දෙනෙක් ඉන්නවා නම් අර දරුවෝ හතර පස් දෙනා බැඳලා එක ගෙදරක තමයි උඩට, උඩට තට්ටු ගහලා එක එක කාමරවල වාසය කරන්නේ. ඉතින් ළමයින්ගේ Application එකක් ඉස්කෝලයට දැම්මාම එතැනින් අහන්නේ ඔප්පුව කෝ කියලා. ඔප්පුව තියෙන්නේ තාත්තාගේ නමට. නැත්නම් අම්මාගේ නමට. නැත්නම් අක්කාගේ නමට ඔප්පුව තියෙන්නේ. නැත්නම් අයියාගේ නමට ඔප්පුව තියෙන්නේ. මෙතැන ඔප්පුව නැහැ කිව්වාම Marks කැපෙනවා. පාසල ළඟම ඉන්න දරුවාව ඒ පාසලට දාගන්න බැහැ. මේක අපේ මුස්ලිම් දරුවන්ට වැඩි හරියක්ම වෙලා තිබෙන ප්‍රශ්නයක්. අපට මේක හරි ප්‍රශ්නයක්. ඒ නිසා මහජන නියෝජිතයෙක් වශයෙන් මේ ළමයින් ටික දාගන්න බැරුව, දෙමව්පියෝ හැමදාම උදේ 6.00 ඉඳලා අපේ ගෙවල්වල වාඩි වෙලා ඉන්නේ. අද කොළඹ ජාත්‍යන්තර පාසල් බිහි වුණේ කොහොමද? පාසලකට ළමයෙක්, දරුවෙක් දාගන්න බැරි නම් ජාත්‍යන්තර පාසලකට දානවා. ජාත්‍යන්තර පාසලට තාත්තා මුදල් ගෙවනවා. අවුරුදු දෙකක්, තුනක්, හතරක් International School එකට සල්ලි ගෙවනවා. ඊට පස්සේ ගෙවන්න බැරි වුණු ගමන් ඒ ළමයා අනාථ වෙනවා. පස්සේ උස්සගෙන එනවා අපේ ළඟට. ළමයාව කොහේ හරි පාසලකට දාලා දෙන්න මන්ත්‍රීතුමා කියලා. එතකොටත් පාසලකට ළමයෙක් දාගන්න බැහැ. එතැන ඉගෙන ගෙන තිබෙන්නේ ඉංග්‍රීසි භාෂාව නේ? මෙතැන ආවාම සිංහල. නැත්නම් දෙමළ භාෂාව.

**ගරු සුමිත් විජයමුණි ද සොයිසා**
Hon. Sumith Wijayamuni De Soysa

ඔිකේ ප්‍රශ්නය තිබෙන්නේ, පළාත් සභාවේ නොවෙයි. රේඛීය අමාත්‍යාංශයේ.

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

නැහැ, නැහැ.

**ගරු සුමිත් විජයමුණි ද සොයිසා**
Hon. Sumith Wijayamuni De Soysa

චක්‍රලේඛය.

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

පළාත් සභා ඉස්කෝල. ඔබතුමන්ලා දන්නේ නැත්නම් පොඩ්ඩක් අහගන්න.

**ගරු සුමිත් විජයමුණි ද සොයිසා**
Hon. Sumith Wijayamuni De Soysa

පළාත් චක්‍රලේඛය වෙනස් කළා.

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

පළාත් සභා පාසල් තමයි කොළඹ වැඩි හරියක් තියෙන්නේ. මැද කොළඹ ආසනය ගත්තාම ජාතික පාසල් දෙකයි තියෙන්නේ. පළාත් සභා පාසල්වලට ළමයි දාගන්න බැරි වුණාම තමයි ගිහිල්ලා -

**ගරු සුමිත් විජයමුණි ද සොයිසා**
Hon. Sumith Wijayamuni De Soysa

ඒක මහ ආණ්ඩුව වෙනස් කරන්න ඕනෑ.

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

මහ ආණ්ඩුව තමයි -

**ගරු සුමිත් විජයමුණි ද සොයිසා**
Hon. Sumith Wijayamuni De Soysa

මහ ආණ්ඩුව වෙනස් කළේ නැහැ.

**ගරු නීල් සුනේත්‍ර ලාල් ප්‍රනාන්දු**
Hon. Neel Sunethra Lal Fernando

මධ්‍යම රජයේ චක්‍රලේඛය.

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

ප්‍රතිපත්තියක් හදලා ගෙනාවේ, මහ ආණ්ඩුවෙන් තමයි.

**ගරු සුමිත් විජයමුණි ද සොයිසා**
Hon. Sumith Wijayamuni De Soysa

පළත් සභා චක්‍රලේඛයේ ළමයින්ට ඉඩ තිබුණා. පෝෂිත පාසල්වල.

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

ගරු මන්ත්‍රීතුමා මේක ඔබේ දරුවාටත් මගේ දරුවන්ටත් වන දෙයක්. මේ ගැන අපි කථා කරන්නේ මේක තේරුම් අරගෙන මොනවා හරි පිළිවෙළක් හදාගන්න ඕනෑ නිසයි. ළමයින්ට හැමදාම මේ ආකාරයෙන් කරන්න බැහැ. ඔබතුමන්ලා බලන්න බදාදා දවසක කොළඹ කලාප කාර්යාලයේ අපේ අධ්‍යාපන ඇමැතිතුමා හම්බ වෙන්න දෙමව්පියෝ කොපමණ ඇවිල්ලා, බඩ ගානවාද කියලා. අධ්‍යාපන ඇමැතිතුමාගේ කාර්යාලයට ගිහිල්ලා බැලුවාම කොටුව Railway Station එක වාගේ. අධ්‍යාපන ඇමැතිතුමාගේ මේසේ උඩත් මිනිස්සු නැඟලා ඉන්නේ. කර උඩ නැඟලා ඉන්නේ. මොකක්ද මේ? පාසල් ප්‍රශ්නය. මේක අපි හරියට හදාගන්න ඕනෑ. ලොකුම ප්‍රශ්නය ඒක තමයි. ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි -

**ගරු සුමිත් විජයමුණි ද සොයිසා**
Hon. Sumith Wijayamuni De Soysa

රේඛීය අමාත්‍යාංශයේ චක්‍රලේඛය ප්‍රශ්නය උග්‍ර කළා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා -

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

හැම අවුරුද්දකම මම මේ අයවැය කථාවේදී මේ පිළිබඳව කථා කරනවා. මම මේ බස්නාහිර පළාත් සභාවේ අවුරුදු 15 ක් ඉන්න මන්ත්‍රීවරයෙක්. මැද කොළඹ ආසනයේ ප්‍රධාන සංවිධායකවරයෙක්. අපට කියන්න ලැජ්ජයි. අපේ පළාතේ ඔක්කෝම තිබෙන්නේ, බස්නාහිර පළාත් සභාවේ පාසල්. අපි මේක ව්‍යූහ කමිටුවේ හැමදාම කථා කරන දෙයක්. මේ ළමයින් ටිකට මොකද කරන්නේ? එක පාසලකට Application 750 ක් එනවා. එක පාසලක පන්ති කාමර තුනකට නැත්නම් හතරකටයි ළමයි භාර ගන්නේ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, ෆයිරූස් ගරු මන්ත්‍රීතුමා කියන්නේ පළාත් සභාවේත්, මධ්‍යම ආණ්ඩුවේත් මොකේ හරි තිබෙන ප්‍රශ්නයක් අපට විසඳන්න කියලා නේ?

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

මොකක්ද නියෝජ්‍ය සභාපතිතුමා?

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

පළාත් සභාවේ හරි මධ්‍යම ආණ්ඩුවේ හරි මොකක් හරි ප්‍රශ්නයක් තිබෙනවා කියලා එතුමා කියන්නේ.

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

ප්‍රශ්නයක් තිබෙනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ප්‍රශ්නයක් තිබෙනවා. ඒකට ඇහුම්කන් දෙන්න.

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

අනෙක් මන්ත්‍රීවරුත් මේක දැනගන්න ඕනෑ. මන්ත්‍රීවරු 104 දෙනාම මේක භාර ගන්න ඕනෑ. මේක මම ඔබතුමන්ලාත් එක්ක Argue කරන්න යනවා නොවෙයි. ඔබතුමන්ලා වැරැදි කරනවා කියලා කථා කරනවා නොවෙයි.

**ගරු සුමිත් විජයමුණි ද සොයිසා**
Hon. Sumith Wijayamuni De Soysa

අපිත් ඔබතුමාගේ පැත්තේ ඉන්නේ.

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

මම කථාව පටන් ගන්න කොට ඇමැතිතුමා නැඟිටලා ගියා. ඇමැතිතුමා මෙතැන ඉන්න ඕනෑ.

**ගරු නීල් සුනේත්‍ර ලාල් ප්‍රනාන්දු**
Hon. Neel Sunethra Lal Fernando

අපට ස්වාධීන චක්‍රලේඛයක් හදා ගන්න දෙන්න කියන්න.

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

මේකට මොකක් හරි පිළිවෙළක් හදාගන්න ඕනෑ. මොනවා කථා කළත් වැඩක් නැහැ. ළමයින් ටික පාසලට දාගන්න බැරි නම්. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම ඉන්න මැද කොළඹ ආසනයේ 1 සිට 5 දක්වා පාසල් හතරක් පහක් විතර තිබෙනවා. පහෙන් පස්සේ හයවැනි ශ්‍රේණියට යන්න පාසලක් නැහැ. මගේ ළඟ පාසල් තුනක ළමයින්ගේ List එක තියෙනවා. හොඳට Marks ගත්තු ළමයින් ඉන්නවා. ඒ අයට ඉල්ලන පාසල - වැඩියෙන්ම ගැහැණු ළමයි තමයි ඉන්නේ. ඒ ළමයි ටික දාගන්න කොළඹ කොහේද පාසලක් තියෙන්නේ? පළමුවැනි ශ්‍රේණියට ළමයින් ටික දාගන්න බැරි වුණු ඒකේ පහෙන් පස්සේ හයවැනි ශ්‍රේණියට ළමයින් ටික දාගන්නේ කොහොමද? හැමදාම තිබෙන ප්‍රශ්නයක්. මම කථා කරන කොට ඇමතිතුමා පොඩ්ඩක් නැඟිටලා යනවා තමයි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ශරීර අවශ්‍යතාවයක් සඳහා ගියේ. ප්‍රශ්නයක් නැහැ.

**ගරු රංජිත් සෝමවංශ** (අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමා)
Hon. Ranjith Somawansa (Minister of Education, Cultural and Arts Affairs, Sports and Youth Affairs and Information Technology.)

එහෙම නැහැ. පොඩි අවශ්‍යතාවයකට ගියේ.

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

ඇමතිතුමා මමත් ඒකයි කියන්නේ. පළමුවැනි ශ්‍රේණියට - තව වෙලාව දෙනවා නම් මම ආයෙත් විස්තර කරලා දෙන්නම්.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

බාධා කරන්න එපා. මට කාලය දෙන්න එපා.

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

ගරු නියෝජ්‍ය සභාපතිතුමා කාලය දෙනවා නම් මට ඇමතිතුමාට විස්තර කරලා දෙන්න පුළුවන්. මම කථා කළේ, ළමයින් ටික පාසලට ඇතුළත් කිරීම සම්බන්ධව. පළමුවැනි ශ්‍රේණියට ළමයෙක් දානවා නම් තිබෙන ලොකුම ප්‍රශ්නය තමයි ඔප්පු ප්‍රශ්නය. කොළඹ කියන්නේ හරි දුෂ්කර පළාතක්. එක වත්තක් ඇතුළේ ගෙවල් 60 ක්, 70 ක්, 80, 150 ක් තියෙනවා. තාත්තාගේ නමට ඉඩම තියෙන්නේ. මුස්ලිම් අය දන්නවා ළමයින් පස් දෙනා, හය දෙනා, හත් දෙනා ඔක්කෝම බැඳලා ඉන්නේ. ඒ ළමයින්ගේ දරුවෝ ඉස්කෝලයට දාන්න ගියා නම් ඔප්පුව ඉල්ලනවා. තාත්තාගේ නමට තියෙන ඔප්පුව ගිහිල්ලා දීලා වැඩක් නැහැ. ඒක භාර ගන්නේ නැහැ. අම්මාගේ නමට ඔප්පුව ඉල්ලනවා. ඉතින් කොහොමද ඇමතිතුමා මේ ප්‍රශ්නය ඉවර කරන්නේ? ව්‍යුහ කමිටුවේදී අපි මේ ප්‍රශ්නය ගැන කථා කළා.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

මට ඒ ගැන අවංකවම අවබෝධයක් තිබෙනවා. ඒ ප්‍රශ්නය මගේ නිලධාරීන් ආණ්ඩුකාරතුමාත් එක්ක කථා කරලා විසඳුමක් දෙන්න ලොකු උත්සාහයක් කරලා තිබෙන්නේ. අකිල ඇමැතිතුමාත් දැන් ඒක පිළිගන්නවා. ඒක ඒ වෙලාවේ එයාලත් පිළිගත්තේ නැහැ. එයාලා තමයි ලෙඩේ දැම්මේ. ඔප්පුව කොහේද තියෙන්නේ?

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා මට වෙලාව දෙන්න බැහැ.

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

ගරු ඇමැතිතුමා මේකෙන් වෙන්නේ මොකක්ද දන්නවාද? අපේ ළමයින්ගේ අනාගතය නැති වෙනවා. මේ ළමයින්ව ගෙනිහිල්ලා ජාත්‍යන්තර පාසලකට දානවා. ළඟ තියෙන පාසලට ළමයින්ව දාගන්න බැහැ. අපේ දූදරුවන් දාගන්න බැරි වුණු ගමන් ගෙනිහිල්ලා ජාත්‍යන්තර පාසලකට තමයි ළමයින්ව බස්සන්නේ. තාත්තා රට ඉන්නවා. තාත්තා අවුරුදු දෙකක් හරි තුනක් හරි රට ඉඳලා මෙහාට ආවාම -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමාට තව විනාඩියයි තියෙන්නේ.

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

මේ ගැන කථා කරනවා. මේක වැරැද්දක් නොවෙයි. මෙතැන ඉන්න අපි 104 දෙනාටම බලපාන ප්‍රශ්නයක්. මේ ප්‍රශ්නය අපි ඔක්කෝම ඔළුවට ගන්න ඕනෑ. නැත්නම් ඇයි කොළඹ මෙපමණ ජාත්‍යයන්තර පාසල් බිහි වුණේ? හැම තැනම ජාත්‍යන්තර පාසල්. දෙමටගොඩට යන්න. මේ හන්දියේ ඉඳලා කොලොන්නාව කෙළවරට ගන්න කෝ? මාසයකට රුපියල් 15,000 ක් ගෙවලා කුළියට ගෙයක් ගන්නවා. එතැන ජාත්‍යන්තර පාසලක්.

**ගරු සුමිත් විජයමුණි ද සොයිසා**
Hon. Sumith Wijayamuni De Soysa

තේ කඩවලට වඩා වැඩියි දැන් ජාත්‍යන්තර පාසල්.

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

හැම තැනම ජාත්‍යන්තර පාසල්. එහෙම නම් මේ ගැන කවුරු හරි කථා කරන්න. හැමදාම මෙතැන ඉඳලා බයිලා ගහලා හරි යන්නේ නැහැ. ළමයින්ගේ ප්‍රශ්න ගැන, දරුවන්ගේ ප්‍රශ්න ගැන කථා කරන්න අපි සභාවට ඇවිල්ලා වාඩි වෙන්නේ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, නවවැනි ශ්‍රේණියට ගියපු ජාත්‍යන්තර පාසල්වල ළමයින් O/L කරන කොට අපේ ළඟට දුවගෙන එනවා රජයේ පාසලකට ආලා දෙන්න කියලා. කොහොමද ඒක කරන්නේ? ඒක කරන්න බැරි වැඩක්. ඒක නිසා මම අධ්‍යාපන ඇමැතිතුමාගෙන් විශේෂ ඉල්ලීමක් කරනවා මේ ගැන උනන්දු වෙන්න.

තව එකක් තමයි ගිය සැරේ රටඉඳි ප්‍රශ්නය. මේ සභාවේත් මේක ගන්න ඕනෑ. මෙවර නෝම්බි අවුරුද්ද එනකොට මේ සභාව නැහැ. මේ සභාව අප්‍රේල් මාසේ 22 ඉවරයි. අවුරුද්ද එන්නේ මැයි මාසේ. ඊට කලින් කවුරු හරි ලියුම් ගහයි ඔබතුමාගෙන් බඩු ඉල්ලන්න. ඒකට පොඩ්ඩක් කල්පනාවෙන් වැඩ කරන්න කියලා ඉල්ලමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. ස්තුතියි.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ෆයිරූස් ගරු මන්ත්‍රීතුමා කථා කරද්දී ඉෆ්තිකාර් ගරු මන්ත්‍රීතුමා මට කියනවා එයාට නැතුව රටඉඳි ටිකක් මට දෙන්න කියලා. අර පිටිපස්සේ ඉඳලා කියනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ප්‍රසන්න සංජීව ගරු මන්ත්‍රීතුමාට විනාඩි 10 ක කාලයක් තිබෙනවා.

[අ.භා.12.39]

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon. O. W. Prasanna Sanjeeva

ගරු සභාපතිතුමනි, බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා. ගරු අධ්‍යාපන ඇමැතිතුමාගේ වැය ශීර්ෂය සම්බන්ධයෙන් කථා කරන මොහොතේ අවස්ථාව ලබා දීම ගැන. බස්නාහිර පළතේ අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යාංශයේ වැය ශිර්ෂය සාකච්ඡාව වන මොහොතේ අපි හදවතින්ම සතුටු වෙනවා විනාඩියක් දෙකක් කථා කරන්න ලැබීම ගැන. අපි දන්නවා ගරු ඇමැතිතුමා මේ අමාත්‍යාංශය භාර ගත්තු දවසේ ඉඳලා විවිධ බාධක, කම්කටොළු මැද්දේ කටයුතු කරන්නේ. ඉතිහාසයේ අධ්‍යාපනයෙන් පෝෂණය වෙලා, විශ්ව විද්‍යාලයට ගිහිල්ලා ඒ අධ්‍යාපනය ලබලා දේශපාලනයට අවතීරණය වෙලා දීර්ඝ කාලයක් පළිගැනීම්වලට ලක් වෙලා මම හිතන්නේ දහසකුත් බාධක මැද්දේ තමයි මේ ගමන ආවේ. මම සතුටු වෙනවා දිස්ත්‍රික්කයේ ඇමැතිවරයෙක් හැටියට, මන්ත්‍රීවරයෙක් හැටියට තමුන්නාන්සේට මේ අමාත්‍යාංශය ලැබුණාට පස්සේ අවශ්‍යතාවය වෙනුවෙන් කටයුතු කරන්න ගියාට පස්සේ, අපි දැක්කා ආපු නොයෙකුත් බාධක. තමුන්නාන්සේගේ අවශ්‍යතාවය වෙනුවෙන් තමුන්නාන්සේ කටයුතු කරගෙන යද්දී ඒක වේගවත්ව යන්න හදන කොට ආපහු පිටිපස්සට එන අවස්ථා අපි ගොඩක් දැක්කා. මීට ඉස්සර හිටපු අපේ ප්‍රධාන ඇමැතිතුමාට - මේ විෂයය සම්බන්ධ වුණේ කලින් ප්‍රධාන ඇමැතිතුමාට.

ඒ වාගේම පළාත් සභාවේ හිටපු ප්‍රධාන අමාත්‍ය ප්‍රසන්න රණතුංග මැතිතුමාට. ඒ ඇමැතිතුමාට මේ පළාත් සභාවේ විෂයය කරගෙන යද්දී මම දැක්කා මෙතැන ඉන්න ලේකම්තුමා ප්‍රධාන සමස්ත නිලධාරීන් ඒ අවශ්‍ය කරන කාර්ය භාරය කරගෙන යන්න උපරිම සහයෝගය දුන්නා. හැබැයි එසේ අපි මේ නිලධාරීන්ට දොස් කියනවා නොවෙයි. ලේකම්තුමා ප්‍රධාන අධ්‍යාපන අමාත්‍යාංශයේ ඉන්න අනෙකුත් අධ්‍යක්ෂවරු, ඒ සියලු නිලධාරීන් ශක්තියක් ලබා දුන්නා. හැබැයි ලබා දුන්නත් ඔබතුමා මේ අමාත්‍යාංශය භාර

[ ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව ]

ගත්තු කාලය තුළදී අපි දැක්කා, පොඩ්ඩක් මන්දගාමීව ක්‍රියාත්මක වෙන්න, කටයුතු සිදු වෙනවා. පක්ෂ විපක්ෂ මන්ත්‍රීවරු යනවා. ගියාට පස්සේ ආපහු ලිපිය පස්සට එනවා. මෙවැනි නොයෙකුත් බාධක තිබුණා. මම හිතන්නේ මේ වනකොට ක්‍රියාකාරීව අවශ්‍ය කරන කටයුතු කරා යන්න ඔබතුමාට ඒ සහයෝගය සියයට සියයක් නොලැබුණත්, අවශ්‍යතාවය වෙනුවෙන් ඒක ලැබිලා තිබෙනවා. ඒ ලැබීම තුළදී මම හිතන්නේ පසුගිය කාල වකවානුවේදී අපි දැක්කා මේ අධ්‍යාපනය වෙනුවෙන් මුදල් වෙන් කරන කොට දිස්ත්‍රික්ක තුනේ පාසල්වල තිබෙන ප්‍රශ්න හැබැයි, මේ දිස්ත්‍රික්ක තුනේ තිබෙන ප්‍රශ්න එක පාරටම විසඳන්න බැහැ. සමහර විට අපි බේරුවල ආසනය හැටියට, කළුතර දිස්ත්‍රික්කය හැටියට අපේ පැත්තට මුදල් ටික වෙන් වනකොට, මේ ඉන්න අපේ මන්ත්‍රීවරු ඔක්කෝටම වෙන් කර ගන්න බැරි වුණත් අපේ ව්‍යූහ කමිටුවේ ඉන්න අධ්‍යක්ෂතුමිය ප්‍රධාන නිලධාරී, මන්ත්‍රී මණ්ඩලය එකට වාඩි වෙලා තීන්දු තීරණ ගන්න කොට සියලුම දේවල් තීරණය කරලා අපට සියයට සියයක් කර ගන්න බැරි වුණා. මේ පැත්තෙන් ගොඩනැගිල්ලට සල්ලි වෙන් කරන කොට එහා පැත්තේ පාසලේ ගොඩනැගිල්ල ඉබේම කඩාගෙන වැටෙනවා. හැබැයි, ඉංජිනේරුවාට කියන්න බැහැ මේ පාසලේ ගොඩනැගිල්ල එකපාරටම කඩාගෙන වැටුණාය කියලා. නමුත් නොහිතන විධියට බාධක කම්කටොළුවලට මුහුණ දෙනවා. හැබැයි, ඒක හදන්න ගියත්, ඒකට මුදල් නැති වෙනවා. මම හිතන්නේ මේ කටයුත්තේදී අපි තීරණයක් ගන්න ඕනෑ. ඉදිරි කාල වකවානුවට අඩක් නිම කළ ගොඩනැගිලි ටික අහවර කරලා, එහෙම නැත්නම් භාගෙට කඩාගෙන වැටුණු ගොඩනැගිලිවල වහලවල් ටික හදන්න අවශ්‍යතා ලබා දීලා කටයුතු කරන්න ඔබතුමාගේ නායකත්වය යටතේ මම හිතන්නේ, ඒ දේවල් ක්‍රියාත්මක වෙන්න ඕනෑ.

අපි හදවතින්ම ස්තූතිවන්ත වෙනවා අපේ රණසිංහ මහත්මයාට. එතුමා ඒ කටයුතු කරද්දී මුදල් වෙන් කිරීම තුළදී, ඉංජිනේරු කාර්යාලය තුළ ඉතාමත් විධිමත් විධියට අපට අවශ්‍ය කරන ශක්තිය ලබා දුන්නා. හැබැයි මම ඉල්ලීමක් කරනවා ඊළඟ අවුරුද්ද වනකොට ඒ මුදල් වෙන් කළත්, සමහර ගොඩනැගිලි හදන්න ගියාට පස්සේ පිට්ටනි මැද්දේ, පිට්ටනි අයින්වල ක්‍රීඩා පිටිවල ගොඩනැගිලි හදන එක වහාම නවත්වන්න ඕනෑ. අපි ඉදිරි කාලය තුළදී කල්පනා කරන්න ඕනෑ හැම පාසලකටම අවශ්‍ය කරන Master Plan එකක් හදලා ඒ Master Plan එකට අනුව කටයුතු කළා නම් මම හිතන්නේ, අධ්‍යාපන අමාත්‍යාංශයට මීට වඩා විධිමත් වැඩ පිළිවෙළක් දියත් කරන්න පුළුවන්කම තිබෙනවා. මම හිතන්නේ මේ පොතේ තිබෙන සියලු කටයුතු ගැන කථා කරන්න ගියොත් වෙලාව මදී වෙනවා.

පාසල් දරුවෝ ගැන කථා කළා. පාසල්වලට ගියාම දරුවෝ දාගන්න බැරි වෙනවා. ඒවාට හේතුව තමයි, අද ගමේ තිබෙන පුංචි පාසල වැහෙන්න හේතුව, අපේ ඉන්න මේ ආදරණීය දෙමව්පියෝ. අපේ දෙමව්පියන්ට අවශ්‍යතාවය වෙන්නේ හැම දරුවාම නගරයේ පාසලට ගෙන යන්න. කොහොම හරි කරලා දරුවෙක් අම්මාගේ බඩේ පිළිසිඳගත්තු දවසේ ඉඳලා මම හිතන්නේ, කළුතර හෝ කොළඹ ගිහිල්ලා කුළියට හෝ බද්දට නිවසක් හෝ අරගෙන ඒ දරුවාව පළමුවැනි වසරට ඇතුළත් කර ගන්න අවශ්‍ය කරන පසුබිම නිර්මාණය කර ගන්න බලාපොරොත්තු වෙනවා. අන්න ගමේ පාසල වැහෙන පළමුවැනි දේ. ගමේ පාසලට අවශ්‍ය කරන සම්පත් ටික, ගුරු හිඟය පුරවාලා ඉක්මණින්ම ගුරුවරු ලබා දෙන්න ඕනෑ. ඉංග්‍රීසි මාධ්‍ය, දෙමළ මාධ්‍ය, සිංහල, ගණිතය ඒ හැම විෂයයකටම අවශ්‍ය කරන ගුරුවරු ටික ඉක්මණින් බඳවා ගැනීමේ ක්‍රමවේදය අපේ ලේකම්තුමා ප්‍රධාන නිලධාරීන්ට අපි මතක් කරනවා. ඉක්මණින් මේ දේ කරන්න ඕනෑ. එහෙම වුණොත් තමයි ඒ අවශ්‍යතා වෙනුවෙන් කටයුතු කරන්න පුළුවන්කම තිබෙන්නේ.

පසුගිය කාලවලදී අපි ඔබතුමාගේ අමාත්‍යාංශයේ තිබෙන ක්‍රීඩා පිළිබඳව කථා කළා. අපි සතුටු වෙන්න ඕනෑ. අද උපදේශක කාරක සභාවලදී ගත්තු තීන්දු තීරණවලින් මේ වසරේදීත් අපට දෙන්න පුළුවන්කම ලැබුණා ලක්ෂයක් දක්වා. ජාත්‍යන්තර තලයට ගිහිල්ලා තරග කරලා එන ක්‍රීඩකයාට පළමුවැනි ස්ථානය, දෙවැනි ස්ථානය, තුන්වැනි ස්ථානය කියන කොට ඒ අවශ්‍ය කරන Model එක අනුව ඔහුට ලක්ෂයක් දක්වා මුදල් වෙන් කරන්න. ඒ පරිත්‍යාග කරන්න අවශ්‍ය කරන ශක්තිය, ඒ මුදල් අමාත්‍යාංශයෙන් වෙන් කරලා ලබා දීම ගැන අපි හදවතින්ම සතුටු වෙනවා.

ඊට අමතරව තොරතුරු තාක්ෂණය පිළිබඳව කථා කරද්දී අද පාසල්වල එන්න එන්න නවීන තාක්ෂණයේ දියුණුවත්

සමග එක බොත්තමක් තද කළ පමණින් අහහරු ලෝකයට යන්න පුළුවන් යුගයක අපි ජීවත් වෙන්නේ. හැබැයි ගමේ පාසලට නගරයේ තිබෙන පහසුකම් ටික නැහැ. එහෙම නම් ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේක මම හිතන්නේ හරියට තුලනය කරන්න සිද්ධ වෙනවා. ගමේ පාසලට අවශ්‍ය කරන ශක්තිය ලබා දුන්නොත් තමයි ගමේ දරුවාත් එක බොත්තමක් තද කරලා හරි, අර යන්න පුළුවන් අහහරු ලෝකයට යන්න පුළුවන් ශක්තිය නිර්මාණය කර ගන්න පුළුවන් වෙන්නේ. ඒ නිසා නිලධාරීන්ගේ කාර්යක්ෂමතාවය වැඩිදියුණු කර ගන්න අවශ්‍ය කරන ඒ ශක්තිය ලබා දෙන්න ඕනෑ.

අපි දකිනවා සමහර තැන්වල නිලධාරීන් ක්‍රියා කරනවා මන්දගාමීයි. සමහර නිලධාරීයෙක් ක්‍රියා කරනවා. අනෙක් නිලධාරියා කකුලෙන් අදිනවා. ඒකේ දේශපාලනය එනවා. පාසලට එනකොට පාසලේ දේශපාලනය ක්‍රියාත්මක වෙනවා. මම හිතන්නේ ඒවා අවම කර ගත යුතු වෙනවා. මානසිකව ඔහුට වැඩ කරන්න පුළුවන් ශක්තිය ලබා දෙන්න ඕනෑ. වැඩ කරන්නේ නැති නිලධාරීන් ඉන්නවා නම් ඒ අවස්ථාවේ මාරු කරන්න. පාසල්වල විවිධ විවිධ ප්‍රශ්න තිබෙනවා. කාර්යාලවලත් තිබෙනවා. එහෙම කෙරුනොත් තමයි අවශ්‍යතාවය වෙනුවෙන් ගමනක් යන්න පුළුවන්කම ලැබෙන්නේ. ඒ නිසා තමයි අද සමහර තැන්වල ලේකම්තුමාට මතක් කරනවා.

මම හිතන්නේ මේවාට විසඳුමක් නැහැ. සමහර ගුරුවරු දරුවන්ට කුණුහරුපයෙන් බණිනවා. එහෙම නැත්නම් මානසික ලෙඩ රෝග තිබෙන ගුරුවරු ඉන්නවා. හැබැයි මේකට විකල්පයක් නැහැ. මම හිතන්නේ වෛද්‍ය පරීක්ෂණ මගින් මේවා බලලා ක්‍රියාත්මක කරන්න කටයුතු කරන්න ඕනෑ. නැත්නම් ඒ දරුවාට - අවස්ථාවක් වුණාම දෙමව්පියෝ විරුද්ධ වෙනවා. අපි දැක්කා පසුගිය කාලයේ කළුතර පැත්තේ පාසලක එක දරුවෙකුගේ අතින් තෙල් ටිකක් ගාගත්තා කියලා ගුරුවරයා මාරු වුණා. හැබැයි අද ඒ දරුවන්ගේ පන්තියට ගුරුවරයෙක් නැහැ. දැන් මාස තුනක් විතර වෙනවා. ඒ පාසලේම දෙමව්පියෝ, ඒ පන්තියේම දරුවෝ කොටසක් තමයි විරුද්ධ වෙලා කිව්වේ, මේ ගුරුවරයා මාරු කරන්න කියලා. හැබැයි, කියන සැනින් මාරු කළා. අද මොකද වෙන්නේ? අර පහේ පන්තියේ, තුනේ පන්තියේ දරුවන්ට අධ්‍යාපනය නැති වෙනවා. අද මේවා හරියට කල්පනා කරලා බලලා වැඩ කළොත් ඒ අවශ්‍යතාවය වෙනුවෙන් ගමනක් යන්න පුළුවන් වෙනවා. අද බේරුවල ආසනය තුළ පාසල්වලට අලුතෙන් ගොඩනැගිලි ලබා දීලා, ඒ අවශ්‍ය කරන ශක්තිය, ව්‍යුහ කමිටුවේ ඉන්න අපේ සහෝදර මන්ත්‍රීවරුන්ගේ ඉල්ලීමත් එක්ක අපේ පක්ෂ විපක්ෂ ඉල්ලීමත් එක්ක, අද බේරුවල ආසනයේ පාසල් විශාල ප්‍රමාණයක් හැදෙනවා. අපට ලොකු ශක්තියක් ලබා දුන්නා. අළුත්ගම සංසමිත්තේ ඉඩම අත්පත් කර ගැනීමේදී බන්දුල මහත්මයා විශාල ශක්තියක් ලබා දුන්නා. අමාත්‍යතුමා එය අපට ලබා දුන්නා. ඒ දවස්වල අපට මේක ඉක්මණින් කරගන්න අපට උදව් කරපු රාජිත සේනාරත්න ඇමැතිතුමා මතක් කරනවා. ඒ ඉඩම අත්පත් කර ගැනීමේ කටයුත්තට - එහා පැත්තේ අධ්‍යක්ෂතුමිය ඉන්නවා. විදුහල්පතිතුමිය. මේකට මහන්සි වුණු සියලු දෙනාට මම හදවතින් ස්තුතිවන්ත වෙනවා. ඒ පාසල තුළ තෙමහල් ගොඩනැගිල්ලක් ඉදි වේගෙන යනවා. මොකද, මම පුංචි කාලේ ගිය පාසල. එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව කාලයේ ඒ ඉඩම් අත්පත් කර ගන්න බැරි වුණා. අල්ලපු වැටේ තිබුණු ඉඩම ගන්න බැරි වුණා. ඒ අල්ලපු වැටේ තිබුණේ එක්සත් ජාතික පාක්ෂිකයන්ගේ හිස් ඉඩම. හැබැයි එදා බැරි වුණු දේ අද මම කළා. මම ඊට අවශ්‍ය කරන ශක්තිය නිර්මාණය කරලා කොට්ඨාශ කාර්යාලයක්, මම හිතන්නේ බේරුවල ආසනයට ඒ අවශ්‍ය කරන ශක්තිය අද මේ අමාත්‍යාංශය තුළින් ලබා දුන්නා.

ගරු ඇමැතිතුමනි, ඔබතුමා ඇතුළු ඒ උදව් උපකාර කළ සියලු දෙනාට අපි හදවතින්ම ස්තුතිවන්ත වෙනවා. ලේකම්තුමා ප්‍රධාන සහෝදර සියලු නිලධාරීන්ට ඒ වාගේම රණසිංහ මහතා ප්‍රධාන අපට මුදල් අනුමත කරලා, ඒ ගොඩනැගිලි අනුමත කරලා දෙන ඒ නිලධාරී කණ්ඩායම, බන්දුල මහතා ප්‍රමුඛ සමස්ත නිලධාරී මණ්ඩලය සහ ඔබතුමාගේ පෞද්ගලික ලේකම්තුමා ප්‍රධාන පෞද්ගලික නිලධාරී මණ්ඩලයේ සියලු දෙනාට හදවතින්ම ස්තුතිවන්ත වෙනවා. ඔබතුමාගේ වැය ශීර්ෂය පමණක් නොවෙයි. ඉදිරි කාලය තුළ ක්‍රියාත්මක වන හැම දේකටම අපි ඒ ශක්තිය ලබා දෙනවා. ඒ වාගේම මම විනාඩියක් ගන්නවා. අතන ඉන්නවා කළුතර අධ්‍යක්ෂතුමිය ප්‍රධාන ඒ කාර්ය මණ්ඩලය. අපි ව්‍යුහ කමිටුවත් එක්ක එකතු වෙලා ලබා දෙන ශක්තිය වෙනුවෙන් හැම දෙනාටම හදවතින්ම ස්තුතිවන්ත වෙමින් මගේ වචන කිහිපය අවසන් කරනවා. ඔබ සැමට ස්තුතියි.

[අ.භා.12.50]

**ගරු පී.ඩී. අබේරත්න**
Hon. P. D. Abeyrathne

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අධ්‍යාපනය කියන්නේ රටේ ඉතාම වැදගත් අමාත්‍යාංශයක් විධියට සලකන්න පුළුවන්. අපේ අනාගත පරපුර බුද්ධිමත් පිරිසක් විධියට සමාජගත කරන්න, ඒ වාගේම දැනුවත් භාවයක් ඇති කරන්න බෙහෙවින් උපකාර වෙන්නේ අධ්‍යාපනය. එහෙම නම් අධ්‍යාපනය සාර්ථක වුණොත් තමයි අපේ රටේ අනාගතය සාර්ථක වෙන්නේ. ඒ කාර්ය භාරයට කටයුතු කරන අපේ රංජිත් සෝමවංශ ගරු ඇමැතිතුමාත්, මාත්, නියෝජනය කරන්නේ එකම මැතිවරණ කොට්ඨාශයක්. අගලවත්ත මැතිවරණ කොට්ඨාශයේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂ සංවිධායක විධියට ගරු ඇමැතිතුමා කටයුතු කරනවා. මම එක්සත් ජාතික පක්ෂ සංවිධායක හැටියට කටයුතු කරනවා. අපි දේශපාලන මත දෙකක් වුණත් බොහොම සමගියෙන්, සමාදානයෙන් අපේ ආසනයේ සංවර්ධනය වෙනුවෙන් අපි අත්වැල් බැඳගෙන වැඩ කටයුතු කරනවා. ගරු ඇමැතිතුමා අධ්‍යාපනය නඟා සිටුවීම සඳහා විශාල උනන්දුවෙන්, උත්සාහයෙන් කටයුතු කරන ඇමැතිවරයෙක්. එතුමා පසුගිය කාලය තුළ විවිධ බාධක මධ්‍යයේ තමයි මේ කටයුතු කළේ. එතුමාට මඩ පහරවල් ගැහුවා. අභූත චෝදනා ගෙන ආවා. අපහාස, උපහාසවලට ලක් වුණා. මුදල් කප්පාදු වුණා. ඒ මොනවා ආවත් එතුමා එතුමාගේ වැඩ පිළිවෙළ අත්හැරියේ නැහැ. ධෛර්යවන්තව එතුමා කටයුතු කළා. අද වනකොට ඒවා මඟ හැරගෙන, එතුමා අධ්‍යාපනය වෙනුවෙන් වැඩ කටයුතු කරලා තිබෙනවා. ඒ කාර්ය භාරය සාර්ථක කර ගන්න පුළුවන් වුණේ ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලය, කලාප කාර්යාලවල අධ්‍යක්ෂ මණ්ඩලය ඇතුළු කාර්ය මණ්ඩලය, ඒ වාගේම කොට්ඨාශවල කාර්ය මණ්ඩලය සහ අපේ ගරු හවතුන් විදුහල්පතිවරු ගත්තු උත්සාහයේ, සහයෝගයේ ප්‍රතිඵලයක් වශයෙන්.

විශේෂයෙන්ම අධ්‍යාපනය ගැන කථා කරන කොට කළුතර දිස්ත්‍රික්කය අපට බලපාන්නේ. අගලවත්ත මැතිවරණ කොට්ඨාශයේ ඉතාම දුෂ්කර, කටුක පරිසරයක තිබෙන කොට්ඨාශයක්. අපේ 50% ට අඩු දරුවන් ඉන්න පාසල් ගණන බැලුවාම වැඩියෙන්ම පාසල් තිබෙන්නේ, කළුතර දිස්ත්‍රික්කයේ. ඒකෙනුත් වැඩි හරියක් තියෙන්නේ අගලවත්තට. අගලවත්ත ඒ තත්ත්වයට පත් වෙලා තිබෙන්නේ දුෂ්කරතාවය, දරිද්‍රතාවය සහ අපහසුකම් මධ්‍යයේ තිබෙන පාසල් නිසයි. මේ පාසල් වර්ධනය කිරීම සඳහා අපි විශාල උනන්දුවක්, උත්සාහයක් ගන්නවා. ඒවාට විශේෂයෙන් බලපාන හේතු තිබෙනවා. ගුරු හිඟය. සමහර දුෂ්කර පාසල්වල, ළමුන් අඩු පාසල්වල ඉංග්‍රීසි ගුරුවරුන්ගේ අඩුපාඩු, නැටුම් ගුරුවරුන්ගේ අඩුපාඩු ඒ වාගේම තවත් ගුරුවරුන්ගේ අඩුපාඩු තිබෙනවා. ඒ නිසා ඒ පාසල් නඟා සිටුවන්න ලොකු අපහසුතාවයක් තිබෙනවා. ගුරු භවතුන් කොපමණ මහන්සි වුණත්, අඩුපාඩු තිබුණත් ඒවා නඟා සිටුවන්න අමාරුයි. මේ පාසල් නඟා සිටුවීම සඳහා විශේෂයෙන් අඩුපාඩු සොයා බලා අනෙක් පාසල්වලට වැඩිය - අපි දකිනවා, නගරයේ තිබෙන පාසල්වල සියලුම අඩුපාඩුකම් සපුරලා තිබෙන්නේ. ඒ දුෂ්කර පාසල්වල තමයි මේ තත්ත්වය අඩු වෙලා තිබෙන අයුරු. ඒ නිසා ගරු ඇමැතිතුමා නැතත් මම එතුමාගේ අවධානයට යොමු කරනවා. අනෙක් පාසල්වලට වැඩිය ඒ දුෂ්කර පාසල්වලට මීට වඩා අවධානය යොමු කළ යුතුයි කියන එක මම විශේෂයෙන්ම මතක් කරන්න කැමැතියි. ඒ වාගේම පාසල්වලට පයින් ගිහිල්ලා ගුරුවරු දරුවන්ට උගන්වන්නේ. ඒ වාගේ පාසල්වල ඉන්න ගුරුවරුන්ට විශේෂ කැපවීමක් කරන්න වෙලා තිබෙනවා. ඒ නිසා ඒ අය ගැන විශේෂ සැලකිල්ලක් දැක්විය ගත යුතුයි කියන එක මම විශේෂයෙන් මතක් කරන්න ඕනෑ.

ඒ වාගේම අපේ අගලවත්ත මැතිවරණ කොට්ඨාශය දිහා බැලුවාම ගණිතය සහ ඉංග්‍රීසි පහළ මට්ටමක තිබෙනවා කියලා කනගාටුවෙන් වුණත් කියන්න ඕනෑ. අපි සෑම විභාග ප්‍රතිඵලයක්ම බැලුවාම ගණිතය සහ භාෂාව ඉතාම අඩු මට්ටමකින් සමත් වන කොට්ඨාශයක් හැටියට අපි දකිනවා. ඒකට විවිධ හේතු තිබෙනවා. අද අපේ ඇමැතිතුමා ගණිතය ගුරුවරුන් පුහුණු කිරීමට පවා වැඩ පිළිවෙළක් සකස් කරලා තිබෙනවා. කොහොම වුණත් අපට සාර්ථක ඉලක්කයක් කරා තවම එන්න බැරි වෙලා තිබෙනවා. ඒක අපට ලොකු පාඩුවක්. ඒ වාගේම දරුවන්ටත් ලොකු පාඩුවක්. ගණිතය සහ භාෂාව අසමත් වීම තුළින් රැකියාවකට යන්න ගියාම ලොකු අපහසුතාවයකට පත් වෙනවා. ඒ නිසා මේ වැඩ පිළිවෙළ ගැන කලාප කාර්යාල රැස්වීම්වලදී අපි නිතර කථා කරලා තිබෙනවා. ඇමැතිතුමා යම්කිසි ක්‍රියා මාර්ගයක් යොමු කරලා තිබෙනවා. නමුත් ඒක සාර්ථක වුණා කියලා අපට සෑහීමකට පත් වෙන්න බැහැයි කියන එක මම මතක් කරන්න කැමැතියි.

ඒ වාගේම තමයි ලියන්න සහ කියවන්න බැරි දරුවන් බොහෝමයක් පාසල්වල ඉන්නවා. ඒ අයගේ විවිධ දුෂ්කරතා උඩ වෙන්න පුළුවන්. වෙනත් හේතු වෙන්න පුළුවන්. මානසික හේතු වෙන්න පුළුවන්. දරුවන් ගැන විශේෂ අවධානය යොමු කරන්න වැඩ පිළිවෙළක් සකස් කළ යුතුයි. ඒ දරුවන් පන්තියෙන් පන්තියට පාස් කරගෙන ගියොත් ඒ අය අතරමග නැවතිලා සමාජගත වෙන්නේ දැනුවත් කෙනෙක් විධියට නොවෙයි. ඒ නිසා ඒක සමාජයට විශාල පාඩුවක් වෙන්න පුළුවන්. සමාජ දූෂණයට ගොදුරු වෙන්න පුළුවන්. ඒ නිසා ඒ ගැනත් විශේෂයෙන් සොයා බලා කටයුතු කළ යුතුයි කියලා මම මතක් කරනවා.

ඒ වාගේම වතු පාසල් සහ දෙමළ පාසල් අපේ කොට්ඨාශයේ ගොඩක් තිබෙනවා. වතු පාසල්වල සහ දෙමළ පාසල්වල ගුරු හිඟය විශාල වශයෙන් බලපානවා. ඒකට ප්‍රධාන කාරණයක් හැටියට මම දකින්නේ ගුරුවරුන් බඳවා ගැනීමේදී ද්‍රවිඩ ගුරුවරුන් නොවෙයි බඳවා ගන්නේ. මුස්ලිම් ගුරුවරුන්. මම දන්නේ නැහැ මොන හේතුවක්ද කියලා. මුස්ලිම් ගුරුවරු ඇවිල්ලා ඒ අය වැඩ භාර ගත්තු දවසේ ඉඳලාම වෙන ඉස්කෝලයකට යන්න තමයි බලාපොරොත්තු වෙන්නේ. ඒ නිසා වතුවල ගුරුවරුන්ගේ හිඟය ප්‍රධාන වශයෙන් බලපානවා. ඒකට ප්‍රධාන හේතුව තමයි සෑම වතුවල තිබෙන පාසලට විශාල දුරක් පයින් යන්න තිබෙනවා. ඒ නිසා පිටින් එන ගුරුවරයෙක් යන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. මේකට ඒකායන මාර්ගය හැටියට මම දකින්නේ වතුවලම ඉන්න අයට ගුරු පත්වීම් දෙන්න විශේෂ වැඩ සටහනක් යෙදුවොත්, අපි දන්නවා අද ද්‍රවිඩ භාෂාවෙන් උගන්වන්න පුළුවන් දරුවෝ වතුවල ඕනෑතරම් ඉන්නවා. ඒ අයට ඒ අවස්ථාව ලැබෙන්නේ නැහැ. ඒ නිසා ගුරු ඇමැතිතුමාගේ අවධානයට යොමු කරනවා. වතු පාසල්වලට, ද්‍රවිඩ පාසල්වලට ගුරුවරුන් තෝරා ගැනීමේදී ඒ වතුවලින්ම ගුරුවරුන් බඳවා ගන්න පුළුවන් වැඩ පිළිවෙළ සකස් කළොත් ඒ අඩුපාඩුව පිරිමහන්න, දරුවන්ට නියම අධ්‍යාපනයක් ලබා දෙන්න හොඳ අවස්ථාවක් ලැබෙනවා. හුඟක් දුර බැහැරට යනකොට වෙලාවට පාසලකට ගුරුවරයෙක් එන්නේ නැහැ. ඒක අපි දකින දෙයක්. මොනවා කිව්වත්, කවුරුත් පිළිනොගත්තත්, ඒක පිළිගන්න වෙනවා. අපි දන්නවා බස් එකෙන් ඇවිල්ලා පයින් පාසලට යනකොට කාලය පහු වෙනවා. එතකොට ඉස්කෝලේ පටන් අරගෙන පැයක්, පැය 1 1/2 ක් ගිහිල්ලා ගුරුවරයා යනවා. ඊළඟට පාසල ඇරෙන්න කලින් පිටත් වෙනවා. මේවා සාමාන්‍යයෙන් දකින්න ලැබෙන දේවල්. ඒ නිසා ළමයින්ට උගන්වන කාලය අඩු වෙනවා. මේවාගේ බාධක මැඩ ගන්න නම් අපට ඒ ප්‍රදේශයේම ගුරුවරු තෝරා ගැනීමට කටයුතු කළ යුතුයි කියන එකයි මගේ මතය හැටියට මම දකින්නේ. ගුරු හිඟය වාගේම විදුහල්පතිවරු පත් කිරීමේත් අසාධාරණයක් තිබෙනවා කියලා මම මතක් කරන්න කැමැතියි. ශ්‍රේණිධාරී නොවන වැඩ බලන විදුහල්පතිවරු පත් කිරීමේදී ගුරුවරුන් හැටියට ශ්‍රේණිධාරී ගුරුවරු කටයුතු කරනවා. විදුහල්පති ශ්‍රේණිය තිබෙන අය ගුරුවරු හැටියට කටයුතු කරද්දී, ශ්‍රේණියක් නැති කෙනෙක් වැඩ බලන විදුහල්පතිවරයෙක් විධියට දැම්මාම ගුරුවරුන්ගේ මානසිකත්වය කඩා වැටෙනවා. ඒ කඩා වැටීම තුළින් තෘප්තිමත්ව අධ්‍යාපනය ලබා දෙන්න හැකියාවක් ලැබෙන්නේ නැහැ. ගුරුවරුයාගේ මානසිකත්වය හොඳින් තිබුණොත් තමයි ළමයින්ට හොඳ අධ්‍යාපනයක් ලබා දෙන්න පුළුවන්කම ලැබෙන්නේ. ඒ නිසා මම ඇමැතිතුමාගේ අවධානයට යොමු කරනවා. සෑම විදුහල්පතිවරයෙක්ම ශ්‍රේණිධාරී විධියට නියමානුකූලව පත් කරන්න පුළුවන්කමක් ලැබෙනවා නම් ගුරුවරුන්ගේ මානසිකත්වය මීට වැඩිය ඉදිරියට ගිහිල්ලා, මීට වැඩිය හොඳ අධ්‍යාපනයක් ලබා දීමට බෙහෙවින් අවස්ථාව ලැබෙනවා කියන එක. ඒ වාගේම ක්‍රීඩා කුසලතාවය ගැන බැලුවාම ක්‍රීඩාවට හැකියාව තිබෙන දරුවෝ අපේ ප්‍රදේශයේ ඕනෑතරම් ඉන්නවා. බස්නාහිර පළාත බැලුවාම සමස්ත ලංකාවේම පළාත් ක්‍රීඩා බැලුවාම අපි තමයි සෑම එකකින්ම ජයග්‍රහණය කරන්නේ. අපට ඒ ජයග්‍රහණ ලැබෙනවා. ඒකට හේතු සාධක ගොඩක් තිබෙනවා. ජනගහනය වැඩිම පළාත අපි. පහසුකම් වැඩිම පළාත අපි. මේ සියලුම ඒවා තිබෙනවා. නමුත් ගමේ ගොඩේ ඉන්න දක්ෂ දරුවෝ ඉදිරියට ගැනීම තමයි අපේ වගකීමක් වෙන්නේ.

නිදර්ශනයක් වශයෙන් මම දකිනවා. අපේ කඹුරාවෙල ඉස්කෝලයෙන් මෑත කාලයේ හොඳ ක්‍රිකට් ක්‍රීඩකයෙක් බිහි වුණා. ලංකාවේ ධරණීතලයේම පාසල් අතර ශ්‍රේෂ්ට ක්‍රීඩකයෙක් හැටියට ඒ දරුවා අද කොළඹ පාසලකට ඇතුළත් වෙලා ඉන්නවා. ඒ වාගේ දරුවෝ බිහි කරන්න හැකියාව තිබෙනවා. අපේ ගුරුවරුන්ගේ දක්ෂතාවය. ක්‍රීඩා පුහුණු ගුරුවරුන්ගේ දක්ෂතාවය සහ ඒ දරුවන්ගේ හැකියාව උඩ. එවැනි අවස්ථා ලබා දීම තුළින් අපේ ගමේ සැඟවිලා සිටින දක්ෂ දරුවන්ට අවස්ථාව ලබා දෙන්න හොඳ අවස්ථාවක් ලැබෙනවා. ඒ නිසා ගමේ පාසලේ ක්‍රීඩා

[ ගරු පී.ඩී. අබේරත්න ]

තත්ත්වය මීට වැඩිය දියුණු කරන්න, අඩුපාඩු සකස් කරන්න කටයුතු කළොත් අපේ ගම්වල ඉන්න හැකියාව තිබෙන දරුවෝ ඉදිරියට ගන්න පුළුවන් වෙයි කියලා මම විශේෂයෙන් මතක් කරන්න කැමැතියි. මට දීර්ඝව කථා කරන්න වෙලාවක් නැහැ.

අවසාන වශයෙන් කියන්නේ රජය ලබා දුන් සුරක්ෂා රක්ෂණ ක්‍රමය. ඒ වාගේම හොඳම පාසල ළඟම පාසල. අද අපේ රටේ දරුවන්ගේ අධ්‍යාපනය සාර්ථක කර ගන්න අනාගතය ගැන බලාපොරොත්තු තියාගන්න හොඳ ශක්තියක් ඇති වෙලා තිබෙනවා. මේ සෑම කාර්යයක් තුළින්ම අපි බලාපොරොත්තු වෙන්නේ, මේ රටේ අනාගතයට පිරිපුන් දරුවන් පිරිසක් මේ රටට බිහි කරන්න. ඒ බලාපොරොත්තුව සාර්ථක කරගන්න අපි සැම දෙනාටම වාසනාව ලැබේවා කියලා ප්‍රාර්ථනා කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

[අ.භා.12.59]

**ගරු කෝකිලා හර්ෂනී ගුණවර්ධන**
Hon. Kokila Harshani Goonawardhana

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ප්‍රථමයෙන් ස්තුතිවන්ත වෙනවා මේ විනාඩි 02 ක කාලයක ලබා දීම සම්බන්ධයෙන්. සමස්ත රටේ පාසල් යන දරුවන්ගෙන් 23% ක් ඉන්නේ බස්නාහිර පළාත් සභාවේ තමයි. පාසල් යන දරුවෝ. මම දැකපු ප්‍රධාන ගැටළුවක් සම්බන්ධයෙන් යෝජනාවක් ඉදිරිපත් කරන්න තමයි මම මේ කාලය යොදා ගන්නේ. 1 - 5 ශ්‍රේණි තිබෙන පාසල්වලට අපි දන්නවා අද වනකොට සෞන්දර්ය විෂයය උගන්වන්න වෙනම ගුරුවරු නැහැ. සෞන්දර්ය විෂයය වෙනුවෙන් ප්‍රාථමික අංශයේ ගුරුවරයා පුහුණු කරලා තමයි සෞන්දර්ය විෂයය ඒ දරුවන්ට උගන්වන්නේ. මේ අයවැය විවාදයේදී මම යෝජනාවක් හැටියට ගරු ඇමැතිතුමාට කියනවා. අපි දකින කාරණයක් තමයි 1 - 5 පාසල් වැසීගෙන යෑමේ තර්ජනයකට මුහුණ දෙනවා. බොහෝ අවස්ථාවන්වලදී. ඒ පාසල් ගොඩ නඟන්නත්, ඒ වාගේම දරුවන්ගේ පැත්තෙන් හිතපුවාම දරුවන්ට අත්‍යවශ්‍යම කාරණාවක් තමයි අපි දකිනවා මිනී මරාගන්න සමාජ බිහි වෙලා තිබෙන්නේ. ඒ වාගේම වැරදි වැඩවලට ඇබ්බැහි වන සමාජ බිහි වෙලා තිබෙන්නේ. මේකට ප්‍රධාන හේතුව තමයි දරුවෝ කලාව සහ සෞන්දර්යයත් එක්ක ඒකාබද්ධ වෙන්න ඒ දරුවන්ට තිබෙන අවස්ථාව අඩුකම. ඒ නිසා මම යෝජනාවක් හැටියට මේ අවස්ථාවේදී ඉදිරිපත් කරනවා, අඩුම තරමින් පාසල් දෙකකට එක ගුරුවරයෙක්, අඩුම තරමින් දවස් දෙකක්වත් එක සෞන්දර්ය ගුරුවරයෙක් මේ 1 -5 ශ්‍රේණිවල ඉන්න දරුවන්ගේ පාසල්වලට යොමු කරන්න කටයුතු කරන්න කියන යෝජනාව මම මේ අවස්ථාවේදී ඉදිරිපත් කරනවා. ඒත් එක්කම තව යෝජනාවක් තිබෙනවා. මම හිතන්නේ පසුගිය කාල වකවානුව තුළ අපේ පාසල අපේ දැතින් සුරකිමු කියන සංකල්පය ක්‍රියාත්මක කෙරුවා. ඒකේ ප්‍රතිඵලයක් විධියට සමර ගාපු ඉස්කෝලවල තීන්ත ගාන්න පුළුවන් වාතාවරණයක් අපට තිබුණා. ප්‍රසන්න රණතුංග මහ ඇමැතිතුමා අධ්‍යාපන ධුරය දරන කාලේ. අද වනකොට ඒ වැඩ සටහන ඇණ හිටලා තියෙනවා. පාසලකට රුපියල් 50,000/- ක් දුන්නාම ලක්ෂයක, එකහමාරක වැඩ කරන්න පුළුවන් වාතාවරණයක් අපේ පාසල අපේ දැතින් සුරකිමු කියන වැඩ සටහනත් එක්ක ඒකාබද්ධ වෙලා තිබුණා. ඒ නිසා මම යෝජනාවක් හැටියට ඉදිරිපත් කරනවා 2019 වර්ෂයට එනකොට මේ වැඩ සටහන් නැවත ක්‍රියාත්මක කරන්න පටන් ගන්න. ඒකේ ප්‍රතිලාභ ගණනාවක් තිබෙනවා. එකක් තමයි ගම්වල ඉන්න දරුවන්ට සුන්දර ලස්සන පාසලක් ලැබෙනවා. අනෙක් එක තමයි පුංචි මුදලක් දීලා, රුපියල් 50,000/- ට ලක්ෂ එකහමාරක ලක්ෂ දෙකක වැඩ කොටසක් දෙමව්පියෝ එකතු වෙලා කරනවා. මෙන්න මේ කාරණා දෙක පිළිබඳව යෝජනා කරන්න මම කාලය ඉල්ලා ගත්තේ. බොහොම ස්තුතිවන්ත වෙනවා. වෙලාවක් දෙන්න බැරිකම තියෙද්දිත් මේ යෝජනා දෙක ඉදිරිපත් කිරීමට වෙලාව ලබා දීම සම්බන්ධයෙන් ගරු අමාත්‍යතුමාටත්, සංවිධායකතුමාටත් ස්තුතිවන්ත වෙනවා. බොහොම ස්තුතියි.

[අ.භා.01.02]

**ගරු මොහොමඩ් ෆායිස්**
Hon. Mohamed Faiz

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ වෙලාවේ මම හිතන විධියට අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු, තොරතුරු තාක්ෂණය අමාත්‍යාංශය සම්බන්ධයෙන් කථා කිරීමට අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ස්තුතිවන්ත වෙනවා. අපේ අධ්‍යාපන ඇමැතිතුමා විශාල ප්‍රයත්නයක් දරනවා බස්නාහිර පළාතේ කොළඹනාරටිය වාගේ තිබෙන මේ අධ්‍යාපන විෂය යටතේ,

පාසල් පද්ධති සියල්ලක්ම සංවර්ධනය කරගෙන ඉදිරියට යන්නට. නමුත් එතුමාට වෙන් කරන ලද මුදල් තුළ මම හිතන විධියට මේ තත්ත්වයට යන්නට බැරි වීම ඉතාමත්ම කනගාටුදායක සිදුවීමක්. ඒත් එක්කම එතුමාට පුළුවන් විධියට මම හිතන හැටියට එතුමා විශාල වශයෙන්, එතුමාගේ ශක්ති ප්‍රමාණයෙන් අපත් එක්ක එකතු වෙලා මන්ත්‍රීවරුන්ගේ ඉල්ලීම අනුව විශාල සහයෝගයක් ලබා දෙමින් සිටින වකවානුවක් මේ. අපගේ පළාත් සභාවේ පස්වැනි අවුරුද්ද. අවසන් අයවැය. අප්‍රේල් 22 වැනිදා වනකොට අපි විසුරුවා හැරෙන වකවානුව තුළදී, අන්තිම කාලයේදීවත් අපට යහපත් චේතනාවෙන්, මේ දරුවන්ගේ අධ්‍යාපනය වෙනුවෙන් විශාල වැඩ කටයුතු කරන්න හැකි වේවා කියලා ප්‍රාර්ථනා කරනවා. ඒ වාගේම මම හිතනවා උතුරු කොළඹ, මැද කොළඹ ගත්තොත් විශාල ගුරු හිඟයකට අපි මුහුණ දීලා තිබෙනවා. ඒ වාගේම අපි පාසල්වල භෞතික සම්පත් ඇතුළු මේ ගොඩනැගිලි අංග සම්පූර්ණ කරන්න විශාල වෑයමක් දැරුවත්, සමහර වෙලාවට අමාත්‍යාංශයේ මුදල් නැතිවීම හේතුවෙන් අපට ඒවා සියල්ලක්ම අතපසු වෙලා තිබෙනවා. අපට ඒ හැකියාව ලැබෙනවා මහ ඇමැතිතුමා පසුගිය පරිපූරකය ගෙනැල්ලා, ඒ පරිපූරකය තුළින් අපට යම්කිසි කොටසක්, අඩක් නිම වූ ගොඩනැගිලි ඉදි කරන්නටත්, ඒ වාගේම සමහර පාසල්වල පන්ති කන්ටේනර් පෙට්ටි තුළ තිබෙනවා.

ඒ වාගේම කහිරියා මුස්ලිම් බාලිකා විදුහලේ මම හිතන්නේ 2009 ඉඳලා තවමත් ඒ දරුවෝ ෂෙඩ්වල තමයි අධ්‍යාපනය ලබන්නේ. අව්වට වේලෙනවා. වැස්සට තෙමෙනවා. මෙවන් යුගයක මම හිතන විධියට අගනුවර කියපුවාම කවුරුත් හිතන්නේ කොළඹට කිරි. අනෙක් පැත්තට කැකිරි කියන එක. කවුරු හරි ගියොත් මේ අවාසනාවන්ත සිදුවීම බලාගන්නට පුළුවන්. එකේ අපි ගොඩනැගිල්ලක් හදන්නට සැලසුම් කළත්, අන්තිමට මුදල් නැති වීම හේතුවෙන් අපට ඒක කර ගන්නට බැරි වෙලා තිබෙනවා. ඒ නිසා අපි බලාපොරොත්තු වෙනවා, ලබන මාසේ කුවේට් තානාපති කාර්යාලය විසින් අපට තට්ටු දෙකක ගොඩනැගිල්ලක් හදලා දෙනවා කියන එක එතුමන්ලා භාර අරගෙන තිබෙනවා. අපි එළැඹෙන 15 වැනිදා කහිරියා විදුහලේ එක් ගොඩනැගිල්ලකට මුල්ගල තැබීමටත් බලාපොරොත්තු වෙනවා. මම හිතන්නේ, අධ්‍යාපන ඇමැතිතුමාත් ඒකට සහභාගී වෙලා අපට ඒ සහයෝගය ලබා දෙන්නට ඕනෑ. ඒ වාගේම පසුගිය කාලයේදී අපට අතපසුවීම් බොහොමයක් වෙලා තිබෙනවා. නමුත් ඒ සියල්ලක්ම අපට ඉදිරියට ගෙන යන්නට ඒවා කථා කරන එකේ තේරුමක් නැහැ. නමුත් මේ ගුරුවරුන් බඳවා ගැනීමේදී එතුමා මූලිකත්වය ලබා දීලා දෙමළ මාධ්‍ය ගුරුවරු, වතුවලට ගුරුවරු ඒ වාගේම 960 කට වැඩිය මේ අවුරුද්ද තුළ එතුමා ලබා දීලා තිබෙනවා. අපි දන්නවා, 2019 ජනවාරි 01 වැනිදා තවත් ගුරුවරු 500 කට, 600 කට වැඩිය බඳවා ගන්නවා. ඒ වාගේම විද්‍යාව, ගණිතය වැනි විෂයයන්වලට මම හිතන විධියට තවත් ගුරුවරු 300 කට වැඩි ප්‍රමාණයක් බඳවා ගැනීමට අපි බලාපොරොත්තු වෙනවා. එහිදී කොළඹ කලාපයට විශේෂ සැලකිල්ලක් කරන්න අපි බලාපොරොත්තු වෙනවා. කොළඹ කලාපයට ආවාම මම හිතන විධියට උතුරු කොළඹ කොට්ඨාශය විශාල වශයෙන් දුෂ්කර පළාතක් හැටියට අපි හඳුන්වනවා. නමුත් කොළඹ කලාපයට මෙපමණයි ගුරුවරු කියලා යැව්වාට, ඒ ගුරුවරු 100 ක් යැව්වා නම් මම හිතන විධියට අපට අන්තිමට ඉතුරු වෙන්නේ 30 ක් නැත්නම් 40 ක්. ලේකම්තුමා විසින් මම හිතන්නේ විශාල ප්‍රයත්නයක් දැරුවත්, කොළඹ කලාපය තුළ ගුරුවරු අතිරික්තයි කියලා කිව්වට මම හිතන්නේ, අපට විෂයයන් වශයෙන් විශාල පුරප්පාඩුවක් තිබෙනවා. ඒ නිසා අපි බලාපොරොත්තු වෙනවා, මේ අන්තිම වකවානුව තුළදී මේ උතුරු කොළඹ, මැද කොළඹ, ඒ වාගේම කොළඹ කලාපය තුළ, බොරැල්ල, ඒ සියලුම පාසල්වල තිබෙන්නා වූ ප්‍රශ්න ටික, ගැටළු ටික විසඳලා අපට ඒ සහයෝගය ලබා දෙන්න කටයුතු කරයි කියලා.

මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය සභාපතිතුමා මාර්ගයෙන් ගරු අධ්‍යාපන ඇමැතිතුමාගෙන් මම තව දෙයක් ඉල්ලා සිටිනවා. මුස්ලිම් දරුවන් ඉගෙන ගන්න සිංහල පාසල්වල අපේ පූතාලාට සිකුරාදා යාඥාව සඳහා චක්‍රලේඛයක් තිබෙනවා. සමහර පාසල්වල වෙමින් පවතිනවා. සමහර පාසල්වල යවන්නේ නැහැ. ඒ නිසා එක්තරා විදුහල්පතිතුමියක් අපේ කලාප අධ්‍යක්ෂතුමාට ලිඛිතව ලිපියක් යොමු කරලා තිබෙනවා. සිකුරාදා දවසේ පල්ලියට යවන්නේ නැත්නම් ඒ දරුවෝ එදාට එන්නේ නැහැයි කියලා. චක්‍රලේඛයක් තිබෙනවා නම්, ඒ විදුහල්පතිතුමියට ඒක කරන්නට බැරි ඇයි? ඒ නිසා විශාල අභියෝග රාශියකට අපි මුහුණ දීලා තිබෙනවා. 1, 5, 6 ට යන්න ගුරුවරු නැහැ. 6 පවත්වාගෙන යන්න ක්‍රමවේදයක් නැතුව අපි විශාල වශයෙන් පසුතැවිලි වෙනවා. ඒ නිසා සමහර පාසල්වල ශාන්ත සෙබෙස්තියන් අලුත් කඩේ පාසලේ 6 යට යන දරුවෝ තවමත් පාසල්වලට ඇතුළත් කර ගන්නට බැරි වෙලා තිබෙනවා. ඒ නිසා හැම දෙනාම ෆාතිමා, කහිරියා

[ ගරු මොහොමඩ් ෆායිස් ]

විතරක් ඉල්ලුවාම අපට පහසුකම් නැති නිසා අපි අකරතැබ්බයකට මුහුණ දීලා තිබෙනවා. ඒ නිසා අධ්‍යාපන ලේකම්තුමාගෙන් අපි විශේෂ ඉල්ලීමක් කරනවා. නැවතත් චක්‍රලේඛ අලුත් කරලා, මේ විදුහල්පතිවරුන් දැනුවත් කරලා, මුස්ලිම් දරුවෝ ඉගෙන ගන්න සිංහල මාධ්‍ය පාසල්වල දරුවන්ව සිකුරාදා දිනයේදී යාඥාවට යන්න අවකාශ සලසා දෙන්නය කියලා. සමහර විදුහල්පතිවරු ඒ අයගේ සීමාව අභිබවා ලිපි සකස් කරලා තිබෙනවා. එක්තරා පාසලක විදුහල්පතිවරියක් කියනවා 12.00 ට පාසලෙන් පිටවීම ඉල්ලීම ප්‍රතික්ෂේප කරන විට ඔවුන් පාසලට පැමිණීම වැළැක්වෙනවා කියලා. එතුමිය ලිඛිතව ලබා දීල තිබෙනවා. ඒ නිසා එතුමිය දන්නේ නැතුව ඇති. මේ චක්‍රලේඛය නැවතත් ඒ පාසල්වලට යවලා එතුමියට පරීක්ෂණයක් කරන්න කියලා ඉල්ලීමක් කරනවා.

මෙකේ ප්‍රශ්න රාශියක් තිබෙනවා. මේ ගැන කථා කළොත් මගේ වෙලාව නැති වෙනවා. ඒ නිසා අපි මහවත්ත ශාන්ත අන්තෝනි සිංහල විදුහලේ විදුහල්පතිතුමා අධ්‍යාපනය පහත් මට්ටමට ගෙනැල්ලා තියෙනවා. අවුරුද්දකට වැඩියි. ලේකම්තුමා විසින් එතුමාව වෙනත් පාසලකට යොමු කරන්න ලිපියක් යැව්වත්, අද වනකල් ඒකවත් අපට කර ගන්නට බැරි වුණා. සමහර වෙලාවට අපේ අධ්‍යාපන ඇමැතිතුමා, අපේ කලාප අධ්‍යක්ෂතුමාට දුරකථනයෙන් කියලා තිබෙනවා එයාව යවන්න එපා කියලා. මම දන්නේ නැහැ ඒකේ ඇත්ත නැත්ත මොකක්ද කියන එක. නමුත් ඇමැතිතුමාගෙන් ඇහුවාම කියනවා ඇමැතිතුමා එහෙම කළේ නැහැයි කියන එක. ඒ නිසා අපි ඔක්කෝම එක තැනක වාඩි වෙලා උපදේශක කාරක සභාවේ කථා කළත් මේවා තවම ක්‍රියාත්මක වුණේ නැහැ. අද අයවැයේ කථා කරන්න තිබෙන දේවල් නොවෙයි කථා කරන්නට වෙන්නේ. ඒ නිසා මේ ගැටළු ටික නිරාකරණය කර ගන්නේ කොහොමද කියන එක පිළිබඳව අපට ප්‍රශ්නයක් තිබෙනවා. ඒ නිසා අපේ පළාත් අධ්‍යක්ෂතුමා, අධ්‍යාපන ලේකම්තුමා, ඒ සියලු දෙනා අපට විශාල සහයෝගයක් ලබා දෙනවා මේ අමාත්‍යාංශය කරගෙන යන්නට. නමුත් මුදල් නැති වීම නිසා අපි විශාල ප්‍රශ්නයකට මුහුණ දීලා තිබෙනවා. අපි බලාපොරොත්තු වෙනවා ලබන අවුරුද්දේ විශාල වැඩ කොටසකට යන්නට. ඒ නිසා අධ්‍යාපන අමාත්‍යාංශයේ වැය ශීර්ෂය වෙනුවෙන් මට ලබා දුන් වෙලාව සම්බන්ධයෙන් ස්තුතිය ප්‍රකාශ කරනවා. මෙම වැය ශීර්ෂයට මගේ ප්‍රශංසාව පළ කරමින් නිහඬ වෙනවා. ස්තුතියි.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, දිවා ආහාරයට නවත්වන්න කලින් පුංචි කාරණයකට අවධාරණය යොමු කරන්න ඕනෑ. විශේෂයෙන්ම උදේ අයවැය විවාදය පටන් ගැනීමේදී ගණපූරණය පිළිබඳ ප්‍රශ්නයක් මත පැය 1/2 ක් ප්‍රමාද වුණා. ඒ වාගේම ඊළඟට ඉතුරු වෙලා තිබෙන්නේ පුංචි කාලයක්. අධ්‍යාපනය සම්බන්ධයෙන් මමත් මේ විවාදයට එකතු වෙන්න ඉන්නවා. ඒ නිසා කෑම වෙලාව ටිකක් උඩට අරගෙන හරි අපට නියමිත පරිදි කාලය ලබා දෙන්න කියන ඉල්ලීම කරනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඒ නිසා තමයි මම මේ ටික වෙලාවක් ගත්තේ.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මම මීටත් වැඩිය ගත්තොත් ඒක හොඳ නැහැ. ඒ නිසා අවශ්‍ය -

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ටිකක් කලින් ගමු.

**ගරු මොහොමඩ් ෆායිස්**
Hon. Mohamed Faiz

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මට විනාඩි 12 ක් වෙන් කරලා තියෙද්දී ඔබතුමා ඒක විනාඩි 08 ක් කළා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔව්. හරි. බොහොම ස්තුතියි. දැන් පූර්ණ කාරක සභාව දිවා ආහාරය සඳහා පස්වරු 02.00 දක්වා තාවකාලිකව

අත්සිටුවනවා. නියමිත වෙලාවට සභාවේ අසුන් ගන්නය කියන ඉල්ලීම ඉල්ලනවා.

***ඊට අනුකූලව පූර්ණ කාරක සභාව තාවකාලිකව අත් සිටුවන දින් අ.භා. 02.09 ට ගරු සභාපතිතුමාගේ ප්‍රධානත්වයෙන් යළිත් රැස් විය.***

*Accordingly the Committee of the Whole Council temporarily suspended and. it resumed at 02.09 p.m with Hon Chairman in the Chair.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එස්.එම්. සකාවුල්ලා ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි 08 ක කාලයක් තිබෙනවා.

[අ.භා.02.12]

**ගරු එස්.එම්. සකාවුල්ලා**
Hon. S.M. Sakaulla

ගරු සභාපතිතුමනි, අද අධ්‍යාපන විෂයය ක්ෂේත්‍රය සම්බන්ධයෙන් කථා කිරීමට විනාඩි 08 ක් හෝ ලබා දීම ගැන ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම විශේෂයෙන්ම මතක් කරන්න ඕනෑ පසුගිය අවුරුදු ගණනාවක් තිස්සේ අපට තිබුණා - විශේෂයෙන්ම මම මුස්ලිම් ජාතිකයෙක් හැටියට ගම්පහ දිස්ත්‍රික්කයේ අපි මේ පළාත් සභාව තුළ ලොකු හඬක් නැඟුවා. දෙමළ මාධ්‍ය ගුරුවරු ලබා දීම සම්බන්ධව. ඒකට අවධානය යොමු කරලා අධ්‍යාපන අමාත්‍යවරයා දෙමළ මාධ්‍ය ගුරුවරු ගම්පහ දිස්ත්‍රික්කයටත් විතරක් නොවෙයි, කොළඹ දිස්ත්‍රික්කයට ඒ වාගේම කළුතර දිස්ත්‍රික්කයටත් අවශ්‍ය පුරප්පාඩු සම්පූර්ණ කරන්න ලබා දුන් සහයෝගය සම්බන්ධයෙන් එතුමාට විශේෂයෙන්ම ස්තුතිවන්ත වෙනවා.

ඒ වාගේම ගරු සභාපතිතුමනි, මම නියෝජනය කරන ගම්පහ දිස්ත්‍රික්කයේ මීගමුව මැතිවරණ බල ප්‍රදේශය. මීගමුව කියන්නේ බහු ආගමික, බහු සංස්කෘතික ජනතාවක් සිටින, මුස්ලිම්, දෙමළ, කතෝලික, බෞද්ධ සියලු දෙනා එකට ජීවත් වන නගරයක්. ඒ නිසා මීගමුව වාගේ බල ප්‍රදේශයක අධ්‍යාපනය ගත්තාම කතෝලික පාසල් තිබෙනවා. දෙමළ මාධ්‍ය පාසල් තිබෙනවා. දෙමළ මාධ්‍යයේ මුස්ලිම් පාසල් තිබෙනවා. බෞද්ධ පාසල් තිබෙනවා. ඒ නිසා අනෙකුත් ප්‍රදේශවලට වඩා සුවිශේෂී අවධානයක් යොමු කරන්න ඕනෑ ආසනයක් තමයි මීගමුව ආසනය කියන්නේ. ඒ නිසා පසුගිය කාලය තුළ අපි දැක්කා පළමුවැනි වසරට දරුවෝ ඇතුළත් කර ගන්න කොට ගරු සභාපතිතුමනි, මේ අධ්‍යාපන ක්ෂේත්‍රයේ චක්‍රලේඛවල තිබෙන ගැටළු නිසා දේශපාලඥයන් ළඟට දෙමව්පියෝ දරුවෝ එකතු කර ගන්න ප්‍රවණතාවය වැඩි වුණා. ඒකට හේතුවක් හැටියට මම දක්වන්නම්. මීගමුව බහුතර කතෝලික ජනතාවක් ජීවත් වන පරිසරයක් තුළ කතෝලික පාසල් බහුතරයක් තිබෙන නිසා බෞද්ධ දරුවන් එම පාසල්වලට යැමේදී යම් ප්‍රතිශතයක් ලබා දෙනවා. ඒ වාගේම බෞද්ධ ජනප්‍රිය පාසල් මීගමුව තුළ තිබෙන නිසා බෞද්ධ ජනප්‍රිය පාසල්වලට කතෝලික දරුවෝ යැමට අවශ්‍ය පහසුකම් නැති නිසා එහෙම නැත්නම් ඒ අවශ්‍ය ප්‍රතිශතය බලපාන නිසා ඒ දරුවෝත් අපි ළඟට එනවා. ඒ වාගේම මුස්ලිම් දරුවෝ. අද නැගෙනහිර ඇරුණාම මේ රටේ අනෙකුත් පළාත්වල බහුතරයක් මුස්ලිම් ජනතාව ජීවත් වෙන්නේ සිංහල ජනතාවත් එක්ක. ඒ නිසා අද මුස්ලිම් දරුවන්ගේ වැඩි ප්‍රවණතාවයක් තිබෙනවා සිංහල මාධ්‍ය ඉගෙන ගන්න. ඒ නිසා මේකට සට්ටනයක් තිබෙනවා. මොකද, දෙමළ, මුස්ලිම් දරුවෝ කතෝලික එහෙම නැත්නම් බෞද්ධ පාසල්වලට යනකොට මේ ප්‍රතිශතය බලපානවා. මට මතකයි ගරු සභාපතිතුමනි, පසුගිය රජය කාලයේ මේ රටේ සංහිඳියාව ඇති කරන්න උත්සාහයක් කළා. නමුත් මම ඒක දැක්කේ නැහැ. සංහිඳියාව වචනයට සීමා වුණා. නමුත් ඒක යථාර්ථයක් බවට පත් කර ගන්න පුළුවන් හැකියාවක් ලැබුණේ නැහැ. ඒකට හේතුව තමයි මේ පාසල් ක්‍රමය. මොකද, අද බලන්න දෙමළ මාධ්‍ය පාසලකට සිංහල මාධ්‍ය විදුහල්පතිවරයෙක් ලබා ගන්න පුළුවන් හැකියාවක් නැහැ. ඒ වාගේම මුස්ලිම් පාසලක දෙමළ ආගමික විදුහල්පතිවරයෙක් ලබා ගන්න පුළුවන් හැකියාවක් නැහැ. ඒ වාගේම කතෝලික පාසල්වලටත් ඒ හා සමානව අද ඒ ප්‍රශ්නය ගොඩනැඟිලා තිබෙනවා. ඒ වාගේම පාසල් දරුවොත් පාසල්වලට යැමේදීත් ඒ ගැටළුව ඇති වෙනවා. ඒ නිසා මම හිතනවා මේක අනාගතයේදී - මම දන්නේ නැහැ මේ යෝජනා කොපමණ දුරට සාධාරණද වෙයිද කියලා. අනාගතයේදී මේ ක්‍රමවේදය වෙනස් වුණොත් තමයි රට තුළ සංහිඳියාවක් ගොඩනඟා ගන්න පුළුවන් හැකියාවක් ලැබෙන්නේ.

ඒ වාගේම ළඟම පාසල හොඳම පාසල කියලා පසුගිය කාලය තුළ පටන් ගත්තා. මම දන්නේ නැහැ. මීගමුවේ අපිත් ව්‍යූහ කමිටුවල සාකච්ඡා කෙරුවා. ඒ සැලසුම් ගෙනැල්ලා අනුමත කළා. නමුත් එක පාසලක්වත් ඒ වාගේ ක්‍රියාත්මක තත්ත්වයට පත් වුණේ නැහැ. ඒ නිසා ඒ වැඩ

[ ගරු එස්.එම්. සකාවුල්ලා ]

පිළිවෙළ ක්‍රියාත්මක වුණා නම් මම හිතනවා ගමේ දරුවා නගරයේ ජනප්‍රිය පාසලකට යන්න දරන ඒ උත්සාහය අතහැරලා තමයි ගමේ පාසලකට යන්නේ. ඒ නිසා මම විශේෂයෙන්ම ඔබතුමා මඟින් ගරු අධ්‍යාපන ඇමැතිතුමාට මම මේක යොමු කරනවා. මොකද, අනාගතයේදී මේ ජනප්‍රිය පාසල්වලට යොදවන මුදල් ප්‍රමාණය පොඩි පාසල්වලට ලබා දුන්නොත් වඩාත් යෝග්‍යයයි. මොකද, එහෙම වුණොත් තමයි දේශපාලඥයාට නිදහසේ ඉන්න පුළුවන් වන්නේ. මේ ක්‍රමය තුළ දරුවා හරියාකාරව පාසලට ලබා දුන්නා නම්, එහෙම නැත්නම් විදුහල්පතිවරයා ලබා ගත්තා නම් කවදාවත් ඒ දරුවා හෝ දෙමව්පියෝ දේශපාලඥයා පස්සෙන් එන්නේ නැහැ. මට වැඩි වෙලාවක් නැහැ. විශේෂයෙන්ම මම මතක් කරනවා. ගම්පහ දිස්ත්‍රික්කයේ මුස්ලිම් පාසල් ගණනාවක් තිබෙනවා. ඒ නිසා මම ප්‍රධාන අමාත්‍යවරයාට සහ විෂයය භාර ඇමැතිතුමාගේ අවධානයට යොමු කරනවා. සිංහල පාසල් ගණනාවක් තිබෙන නිසා බහුතර මන්ත්‍රීවරු සිංහල පාසල් වෙනුවෙන් කථා කරන නිසා, ප්‍රධාන පක්ෂයක් නියෝජනය කරන ගම්පහ දිස්ත්‍රික්කයේ එකම මුස්ලිම් මන්ත්‍රීවරයා හැටියට දෙමළ සහ මුස්ලිම් පාසල් වෙනුවෙන් විශේෂ ව්‍යාපෘතියක් ආරම්භ කරලා ඒවායේ අඩුපාඩු, ගොඩනැගිලි අඩුපාඩු, ගුරුවරුන්ගේ අඩුපාඩු, අනෙකුත් අඩුපාඩු තිබෙනවා නම් ඒවා යම්කිසි ක්‍රමවේදයකට ගෙනැල්ලා සිංහල මාධ්‍ය පාසල් වාගේම දෙමළ මාධ්‍ය පාසලුත් ශක්තිමත් කරලා මේ බස්නාහිර පළාතේ අධ්‍යාපනය තවත් ඉහළට ගෙන යන්න පුළුවන් වැඩ සටහනකට ඔබතුමා යොමු වෙන්න කියලා මම විශේෂයෙන්ම ඉල්ලීමක් කරනවා.

ඒ වාගේම මම නියෝජනය කරන ගමේ පාසලක් හැටියට මීගමුව පෝරුතොටැල්ල මහ විද්‍යාලයේ පසුගිය කාලයේ මුස්ලිම් පාසලක් හැටියට, ඒ පාසලේ උසස් පෙළ විද්‍යා පන්ති ආරම්භ කරන්න පුළුවන්කම ලැබුණා. විද්‍යාගාර උපකරණ ලබා ගැනීමේ අපහසුතාවලට අපි පත් වුණා. ඒ නිසා මම මගේ පළාත් සභා ප්‍රතිපාදන හරහා ඒ විද්‍යා උපකරණ ලබා දෙන්න කටයුතු කරලා, ඒ පාසල ආරම්භ කළා. ඒ වාගේම තලාහේන මහ විද්‍යාලය කතෝලික පාසලක් වුණත්, එහි කලා විෂයය පටන් ගන්න අවශ්‍ය ශක්තිය, ධෛර්ය අපි ලබා දුන්නා. ඒ වාගේම විශේෂයෙන්ම මම ස්තුතිවන්ත වෙනවා මීගමුව කලාප අධ්‍යක්ෂ අපේ ඇන්ටනී මහත්මයාට. මීගමුව කලාපය තුළ ඒ පාසල්වලට අවශ්‍ය සියලු පහසුකම් අපත් සමග සම්බන්ධ වෙමින් කටයුතු කිරීම පිළිබඳව එතුමාටත් ස්තුතිවන්ත වෙමින් අධ්‍යාපන ඇමැතිවරයා ලබන අවුරුද්දේ අපි ගැන විශේෂ අවධානයක් යොමු කරනවාට වඩා පාසල් දරුවන් වෙනුවෙන් සහ පාසල් වෙනුවෙන් විශේෂ අවධානය යොමු කරලා එතුමාට ඒ කාර්ය භය ඉෂ්ට කරන්න ශක්තිය, ධෛර්ය ලැබේවා කියා ප්‍රාර්ථනා කරමින් නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[අ.භා.02.20]

**ගරු කීර්ති කාරියවසම්**
Hon. Keerthi Kariyawasam

ගරු සභාපතිතුමනි, මම මුලින්ම ස්තුතිවන්ත වෙනවා. අද අධ්‍යාපන අමාත්‍යාංශය මුල් කරගෙන මෙම අයවැය විවාදයේදී කරුණු කිහිපයක් කියන්න අවස්ථාව ලබා දීම පිළිබඳව. ගරු සභාපතිතුමනි, මුලින්ම අපේ රංජිත් සෝමවංශ ගරු අමාත්‍යතුමා මගේ ගම් ප්‍රදේශයේම මන්ත්‍රීවරයෙක්. මම අද විපක්ෂයේ වාඩි වෙලා හිටියත්, එතුමා එක්ක දීර්ඝ කාලයක් එකට සහෝදරයත්වයෙන් පසුගිය කාලය පුරාවටම, අධ්‍යාපන කටයුතුවලදී විතරක් නොවෙයි, විවිධ අවස්ථාවල කටයුතු කරලා තිබෙනවා. අපි සහයෝගයෙන් කටයුතු කළා. එතුමාගේ කටයුතුවලට අපට ලබා දෙන්න පුළුවන් උපරිම සහයෝගය හැම අවස්ථාවකදීම අපි ලබා දීලා තිබෙනවා. එතුමාත් ඒ වාගේම පෙරළා අපට කටයුතු කරලා තිබෙනවා කියන එක විශේෂයෙන්ම මේ අවස්ථාවේ සිහිපත් කරන්න බලාපොරොත්තු වෙනවා. ඒ වාගේම එතුමාගේ අමාත්‍යාංශයේ ලේකම්තුමා, අපේ පළාත් අධ්‍යක්ෂතුමා, අපේ කලාපයේ අධ්‍යක්ෂතුමා ඇතුළු ඒ නිලධාරී මහත්ම මහත්මීනුත් මට නම් කවදාවත් අසාධාරණයක් සිද්ධ කරලා නැහැ. එතුමාගේ පෞද්ගලික කාර්ය මණ්ඩලයටත් කිසියම් කාරණයක් ඉදිරිපත් කළාම ඒ වෙනුවෙන් ලබා දෙන්න පුළුවන් සාධාරණ විසඳුමක් ලබා දෙන්න කටයුතු කරලා තිබෙනවා. අපි ඒකත් මේ අවස්ථාවේදී විශේෂයෙන්ම සිහිපත් කරනවා. විශේෂයෙන්ම මම පසුගිය අයවැය ලේඛනය අවස්ථාවේදීත් එතුමාට යෝජනා කළා පළාත් සභාව පැත්තෙන් අපට අලුත් විශ්ව විද්‍යාලයක් ආරම්භ කරන්න බැරිද කියලා. තාක්ෂණය පිළිබඳව අලුත් අවස්ථාවක් ඇති වන විධියට. මම හිතන්නේ නැහැ, ඒකට යමක් සිද්ධ වුණාය කියලා. දැන් නැවත වාතවක් ඒක කිව්වා කියලා ලොකු ප්‍රයෝජනයක් වෙන්නේ නැහැ. තවත්

මාස 04 ක වැනි කොටි කාලයක් තිබෙන්නේ. මේ පළාත් සභාවට, හයවැනි පළාත් සභාවට. ඒ කෙටි කාලය තුළ ඒ සඳහා නිශ්චිත වැඩ පිළිවෙළක් ඇති කරන්න පුළුවන් වෙයි කියලාත් විශ්වාස කරන්නේ නැහැ.

ඒ වාගේම අපේ ප්‍රදේශයේ තිබෙන පාසල්වල අඩුපාඩුකම් ගැන මීට කලින් සඳහන් කළා අපේ ප්‍රදේශයේ මන්ත්‍රීවරු. මම ඒ සඳහා කාලයක් ගන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. නමුත් අපේ ඇමතිතුමා හැටියට රංජිත් සෝමවංශ ගරු ඇමතිතුමා පත් වුණාට පස්සේ අපි දැක්කා. අපේ පාසල්වලට නම් එතුමා විශේෂ සැලකිල්ලක් යොමු කරලා අපේ ප්‍රදේශයේ පාසල්වල අඩුපාඩු හදන්න බොහෝ උත්සාහයන් ගත්තාය කියලා විශේෂයෙන් මතක් කරන්න ඕනෑ. නමුත් අධ්‍යාපන ප්‍රතිඵලත් එක්ක ගන්න කොට, ඒ වාගේම අපේ ගමේ මිනිසුන්ට තිබෙන විශේෂ බරක් හැටියට අපට පේන්නේ හැම දෙමාපියෙකුටම වාගේ තමන්ගේ පවුලේ ආදායමෙන් විශාල මුදලක් අනෙකුත් අමතර පන්ති වලට විශාල මුදලක්, දරන්න වෙලා තිබෙනවා. ළමයි දෙන්නෙක් හෝ තුන්දෙනෙක් ඉන්න පවුලක් තිබෙනවා නම් අඩුම තරමේ රුපියල් 5000/- කට වැඩිය මුදලක් ඒ වෙනුවෙන් විතරක් පන්තිවලට යොදවන්න වෙලා තිබෙනවා. ඒක දෙකේ පන්තිය, තුනේ පන්තියේ ඉඳලා A ලෙවල් පන්තිය වනතුරුම ඒ විධියටයි. ඉහළට යන්න යන්න ඒ මම කියපු මුදල තවත් වැඩි වෙනවා. ඒක නිසා, මේක එක පැත්තකින් දරාගන්න අමාරුයි. අඩු ආදායම් අඩු අය බොහෝ වෙලාවට ඉන්නේ. කෘෂිකර්මයෙන් ජීවත් වෙන මිනිස්සු ඉන්නේ. ඔබතුමාට වැඩ පිළිවෙළක් ඇති කරන්න පුළුවන් නම්, මේ අඩු අධ්‍යාපන මට්ටමේ ඉන්න දරුවන්ට පාසල්වලම හවස්වරුවේ හෝ වෙනත් වෙලාවක් යොදවලා, එවැනි පන්ති ආරම්භ කරලා, ඒ දරුවන්ට ඒ පාසල්වලින්ම අමතර පන්තිවලින් ලබා දෙන දැනුම ලබා දෙන්න වැඩ පිළිවෙළක් ඇති කරනවා නම් මම හිතනවා, ඒක විශාල සෙතක් බවට පත් වෙයි කියලා. මොකද ඒක ගුරුවරුන්ට වුණත් නිකන් කරන්න බැහැ. එවැනි කටයුතු සඳහා තොරා ගත්ත ගුරුවරුන් වෙනුවෙන් අතිරේක දීමනාවක් ලබා දීලා, ඒ කටයුත්ත ගුරුවරුන් මාර්ගයෙන්ම කරනවා නම් අපි හිතනවා ඒක ළමයින්ට හොඳ අධ්‍යාපන තත්ත්වයක් ලබන්න වාගේම දරුවන්ගේ දෙමව්පියන්ටත් ඒක ලොකු සහනයක් වේවිය කියලා.

අනික් කාරණාව හැටියට මම දකින්නේ අද අපේ සමාජයේ විශාල කඩා වැටීමකට ලක් වෙලා තිබෙන කාලපරිච්ඡේදයක්. අපි දැක්කා පාසල් දරුවෝ අපිත් ඉස්කෝලේ යන කාලයේ ළමයින් එක්ක රණ්ඩු කරනවා. එක එක දේවල් වෙනවා. ඒක ඒ වෙලාවේ වුණා. ඒක එතැනින් ඉවරයි. නමුත් ඒක සංවිධානාත්මකව, චේතනාන්විතව පාසල් දරුවන් ඇවිල්ලා එකිනෙකා මරා ගන්නා තැනට පත් වෙලා තිබෙනවා. මේ තත්ත්වය පාසල්වල විතරක් නොවෙයි. අද සමාජය පුරාම දකින්න තිබෙන තත්ත්වය හැටියට පේන්නේ. මේක අපේ රටේ පුරවැසියන්ගේ ශිෂ්ටාචාරය පිළිබඳව ප්‍රශ්නයක්ව තිබෙනවා කියන එකයි අපි විශ්වාස කරන්නේ. අපි බොහොම හොඳ ශිෂ්ටාචාරයක් ඇතිව කටයුතු කරපු රටක්. බොහෝ වෙලාවට කල්පනා කරනවා. මැනීමකට ගන්නවා. ශිෂ්ටාචාරය කියන්නේ ගොඩනැගිලි තිබුණාද? ඇළවේලි තිබුණාද? වැව් හැදුවාද කියන එක විතරක්ද? මම හිතනවා අතීතයේදී එවැනි දේට පමණක් නොවෙයි. ශිෂ්ටාචාරය ගොඩනැගෙන්න මිනිසුන්ගේ ගති පැවතුම්, සිරිත් විරිත්, හැසිරීම, විනය මේ සියල්ල එකට එකතු වෙලා තමයි අපට දියුණු ජාතියක් හැටියට, අද මේ තැනට එන්න පුළුවන් විධියට ඇති වෙලා තිබෙන්නේ. ඒ නිසා මේ ශිෂ්ට සම්පන්න සමාජයක් ගොඩනැඟීම වෙනුවෙන් අධ්‍යාපනය පැත්තෙන් යම් කාර්යභාරයක් කරන්න පුළුවන් වෙනවා කියන එකයි මම විශ්වාස කරන්නේ.

මොකද ඔබතුමාගේ අමාත්‍යාංශයට අධ්‍යාපනය පමණක් නොවෙයි. ක්‍රීඩාව ඇතුල් වෙනවා. සංස්කෘතිය ඇතුල් වෙනවා. කලාව ඇතුල් වෙනවා. මේ සියලු දේ ඔබතුමාගේ අමාත්‍යාංශය යටතේ තිබෙන නිසා මේ සියල්ල එකට එකතු කරලා කටයුතු කළොත් මම හිතනවා එවැනි වැඩ පිළිවෙළක් රටට ඇති කරගන්න පුළුවන් වේවිය කියලා. අපි උදාහරණ ගත්තොත් වැඩිදුර යන්න ඕනෑ නැහැ. මේ සභාව තුළම ගත්තොත් අඩුපාඩු තමයි අපට පෙනෙන්න තිබෙන්නේ. මම ආණ්ඩු පක්ෂයේ ඉඳලා විරුද්ධ පක්ෂයට එනකොට මම වරප්‍රසාද ප්‍රශ්නයක් හැටියට මතු කළේ නැහැ. නමුත් මන්ත්‍රීවරයෙක් මාව අතනින් තල්ලු කරලා දැම්මා. මාව තව පොඩ්ඩෙන් වැටෙනවා. අතන හිටපු සුනේත්‍රලාල් මන්ත්‍රීතුමා. අපේ අනෙක් මන්ත්‍රීතුමාට නම් තම්බියා අරගේ මෙහේ බැන්නා කියලා වරප්‍රසාද ප්‍රශ්නයක් හැටියට මතු කළා. නමුත් මම හිතුවා මේ ශිෂ්ටාචාරයේ, මේ හැසිරීමේ පුරුද්ද - එක මන්ත්‍රීවරයෙකුගේ අධ්‍යාපනය ගැන තව කෙනෙක් කිව්වා නේ.

**ගරු නීල් සුනේත්‍ර ලාල් ප්‍රනාන්දු**
Hon. Neel Sunethra Lal Fernando

ගරු සභාපතිතුමනි,

**ගරු කීර්ති කාරියවසම්**
Hon. Keerthi Kariyawasam

පොඩ්ඩක් ඉන්න. මගේ වෙලාව ගන්න එපා. මගේ කථාවෙන් පස්සේ කථා කරන්න.

**ගරු නීල් සුනේත්‍ර ලාල් ප්‍රනාන්දු**
Hon. Neel Sunethra Lal Fernando

මගේ නම කිව්වා නේ? වරප්‍රසාද යටතේ කථා කරන්නේ. මම ඔබතුමාගේ පසුපසින් ආවා විතරයි. මම ඔබතුමාව තල්ලු කළේ නැහැ.

**ගරු කීර්ති කාරියවසම්**
Hon. Keerthi Kariyawasam

නැහැ. නැහැ. හරි.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

තල්ලු කළා.

**ගරු නීල් සුනේත්‍ර ලාල් ප්‍රනාන්දු**
Hon. Neel Sunethra Lal Fernando

නැහැ, එහෙම කළේ නැහැ.

**ගරු කීර්ති කාරියවසම්**
Hon. Keerthi Kariyawasam

බොරු කියන්න එපා, ගරු මන්ත්‍රීතුමා. ඒකත් ඔබතුමාගේ ශිෂ්ටාචාරය නැතිකම. අඩුම තරමේ කරපු දේ පිළිගන්න කෝ.

**ගරු නීල් සුනේත්‍ර ලාල් ප්‍රනාන්දු**
Hon. Neel Sunethra Lal Fernando

ශිෂ්ටාචාරය තිබෙනවා ගරු මන්ත්‍රීතුමා. ඔබතුමාට වැඩිය.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

අර මිරිස් කුඩු ගැහුව අයත් කිව්වේ නැහැයි කියලා නේ.

**ගරු කීර්ති කාරියවසම්**
Hon. Keerthi Kariyawasam

ඒක නිසා අනික් මිනිස්සුන්ගේ අදහසකට ඇහුම්කන දෙන්න, අනික් මිනිස්සුන්ට කරුණක් ඉදිරිපත් කරන්න බැහැ. ඒ මිනිස්සුන්ට ස්වාධීනව කටයුතු කරන්න තිබෙන ඉකඩ තියන්නේ නැහැ. ඒක තමයි අද අපි සාමාන්‍ය ජනතාව ගාවට යන්න ඉස්සෙල්ලා, පාසල් දරුවන් ගාවට යන්න ඉස්සෙල්ලා, අඩුම ගණනේ මේ සභාවක් තුළ ඉන්න මහජන නියෝජිතයින්ටවත් එහෙම හැසිරෙන්න බැරි ශිෂ්ටාචාරයක් තමයි අපේ රටේ පවතින්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙනවා. තව විනාඩියයි.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ඉස්කෝලේ වෙලාවට කැළෑ පැනපු කට්ටිය.

**ගරු ලලිත් වර්ණකුමාර**
Hon. Lalith Warna Kumara

ඉස්සෙල්ලා බලන්න තාත්තා මැරුවේ කවුද කියලා.

**ගරු කීර්ති කාරියවසම්**
Hon. Keerthi Kariyawasam

ඊයේ කථා කරලා කිව්වා, දැන් යහපාලනයක් නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතුමාට බාධා කිරීම් කරන්න එපා.

**ගරු කීර්ති කාරියවසම්**
Hon. Keerthi Kariyawasam

යහපාලනයෙන් නොවෙයි මේ ඇමතිවරු පත් වුණේ කියලා.

**ගරු නීල් සුනේත්‍ර ලාල් ප්‍රනාන්දු**
Hon. Neel Sunethra Lal Fernando

ශිෂ්ටාචාරයක් කොහේද? තාත්තා මරපු යූ.ඇන්.පී යට නේ ගියේ.

**ගරු කීර්ති කාරියවසම්**
Hon. Keerthi Kariyawasam

මම දන්නවා, රංජිත් සෝමවංශ ගරු ඇමතිතුමා යහපාලනයෙන් නොවෙයි පත් වුණේ. නමුත් අනික් ඔක්කොම ඇමතිවරු මහින්ද රාජපක්ෂ මැතිතුමා පත් කළා නොවෙයි. එතුමාගේ කාලයේ. මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා ජනාධිපති වුණු නිසා තමයි ඒ සියලුදෙනාට ඇමතිකම් ලබා ගන්න පුළුවන් වුණේ. ඒක යහපාලනය නිසා තමයි ලැබුණේ.

**ගරු ලලිත් වර්ණකුමාර**
Hon. Lalith Warna Kumara

ඔබතුමා 49 ට අත්සන් කළේ. ඔබතුමාටයි හිමි. ඔබතුමාට ගන්න තිබුණා.

**ගරු කීර්ති කාරියවසම්**
Hon. Keerthi Kariyawasam

ශිෂ්ට සම්පන්න කමක් නැහැ. ඒක පිළිගන්නවත් ආත්ම ශක්තියක් නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ කාලය අවසන්. කථාව අවසන් කරන්න.

**ගරු කීර්ති කාරියවසම්**
Hon. Keerthi Kariyawasam

මෙන්න මේ ශිෂ්ටාචාරය වෙනස් කරන්න, මේ සමාජ ක්‍රමය වෙනස් කරන්න -

**ගරු නීල් සුනේත්‍ර ලාල් ප්‍රනාන්දු**
Hon. Neel Sunethra Lal Fernando

ශිෂ්ටාචාරය වෙනස් කරන්න තමන් ඉගෙන ගන්න.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

අපි ඔය ගඳ සංස්කෘතිය අයින් කරනවා. භය වෙන්න එපා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, කථාව අවසන් කරන්න. සමාවෙන්න. කාලය අවසන්.

**ගරු කීර්ති කාරියවසම්**
Hon. Keerthi Kariyawasam

ඔබතුමා කටයුතු කරනු ඇතැයි කියලා විශ්වාස කරනවා. අඩුම ගණනේ මේ කෙටි කාලය තුළ එවැනි පියවරක්වත් ගත්තොත් ඒක සමාජයට වැදගත් දෙයක් කළා කියලා ඔබතුමාට -

**ගරු නීල් සුනේත්‍ර ලාල් ප්‍රනාන්දු**
Hon. Neel Sunethra Lal Fernando

ඊට ඉස්සෙල්ලා තමන්ගේ තාත්තාව සිහිපත් කරගන්න. තමන්ගේ තාත්තාව මැරුවේ එක්සත් ජාතික පක්ෂයෙන්.

**ගරු කීර්ති කාරියවසම්**
Hon. Keerthi Kariyawasam

විශ්වාස කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

**ගරු නීල් සුනේත්‍ර ලාල් ප්‍රනාන්දු**
Hon. Neel Sunethra Lal Fernando

ශිෂ්ටාචාරය එතැනින් පටන් ගන්න.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ගරු සභාපතිතුමනි, මම මේ ප්‍රශ්නය මීට ඉස්සෙල්ලත් මතු කළා. දැන් අපි මේ අලුත් සභා ශාලාවකට ඇවිල්ලා, අපි මේ උපකරණ පාවිච්චි කරනවා. මම කලිනුත් මතු කළා. මේ මයික්‍රෆෝන ඕනෑ ඕනෑ වෙලාවට මන්ත්‍රීවරුන්ට පාවිච්චි කරන්න ඉඩ දෙන්න එපා. ඔබතුමාට පුළුවන් මේ මයික්‍රෆෝන පාලනය කරගන්න. නැත්නම් මහජනතාවගේ සල්ලි කෝටි ගණන් වියදම් කරලා මේ උපකරණ ගත්තාට වැඩක් නැහැ. ඒකෙන් විනයක් හදන්න බැහැ. ඒ නිසා මයික්‍රෆෝනය අවශ්‍ය මන්ත්‍රීවරයාට ඉල්ලුවාට පස්සේ දෙන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා මම ඒ දේ කරනවා. නමුත් ඒක තත්ත්පර ගණනයි විසන්ධි වෙන්නේ. ආපසු ක්‍රියාත්මක වෙනවා. ඉදිරියේදී මේ අඩුපාඩු හඳුනාගෙන -

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

එහෙමනම් ඒක තාක්ෂණික ප්‍රශ්නයක්. ඒක හදන්න පුළුවන්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අපි ඒක නිවැරැදි කරනවා.

**ගරු ලලිත් වර්ණකුමාර**
Hon. Lalith Warna Kumara

පුටුව වාගේ ඒකත් එපැයි කියන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ජගත් අංගගේ ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි 08 ක කාලයක් තිබෙනවා.

**ගරු ජගත් අංගගේ**
Hon. Jagath Angage

ගරු සභාපතිතුමනි, විනාඩි 12 ක් විනාඩි 08 කට අඩු කරලා තිබෙන්නේ. මට කාලය විනාඩි 12 ක් වෙන් කරලා තිබුණා. කථාවට ලැහැස්ති වෙන්නේ ඒ විධියට.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, සමාවෙන්න. මම දන්නේ නැහැ කවුද කියලා. මම මූලාසනයේ සිටියේ නැහැ. ඇමතිතුමාත් වෙන වෙන අයගේ නම් දාලා තිබෙනවා. මුලින් ඒ නම් ටික තිබුණේ නැහැ. ඇමතිතුමාටත් විනාඩි පහයි තිබෙන්නේ.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

ඕක සාකච්ඡා කරලා ගරු සංවිධායකතුමා සකස් කරන්නේ. මම නොවෙයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම කිව්වා, වෙනස් කරන්න එපැයි කියලා.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

ඒක -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම දෙපැත්තටම කිව්වා, කථික ලැයිස්තුව වෙනස් කරන්න එපාය කියලා. ඒක ගරු මන්ත්‍රීවරුන්ට අසාධාරණයක් වෙනවා. මම නැති වෙලාවේ මේ දේ කරලා තිබෙන්නේ.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

මම එකඟත්වය පළ කරනවා විතරයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මේ දේ කරන්න බැහැ. ඔබතුමා කථා කරන්න කෝ. වෙච්ච වැරැද්දට සමාවෙන්න. ඇමතිතුමා එහෙම කරන්න එපා. ඒක ප්‍රශ්නයක් වෙනවා. නැති අය දාලා තිබෙන්නේ.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

මගේ විනාඩි 20 න් මම දීලා තිබෙන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එහෙමවත් දෙන්න බැහැ. ඔබතුමාගේ වෙලාව ඔබතුමා ගන්න. එහෙම බෙදන්න බැහැ. ඊළඟට ඒක ප්‍රශ්නයක් වෙනවා. ඔබතුමා එහෙමනම් අර ගරු මන්ත්‍රීතුමාට කාලය දෙන්න. ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා කථා කරන්න.

[අ.භා.02.32]

**ගරු ජගත් අංගගේ**
Hon. Jagath Angage

ගරු සභාපතිතුමනි, මගේ ගෞරවණීය ස්තුතිය ඔබතුමාට පුද කර සිටිනවා, මගේ කාලය වෙන් කරදීම පිළිබඳව. ගරු සභාපතිතුමනි, අධ්‍යාපන අමාත්‍යාංශය පිළිබඳව 2019 වර්ෂය සඳහා වූ අයවැය විවාදය පවතින මොහොතේ මගේ අදහස් ප්‍රකාශ කරන්න ලැබීම ගැන මම සතුටක් සේ සළකනවා. පළමුව මම ඔබතුමාගේ අවධානය යොමු කරන්න කැමැතියි. අපේ ගරු සභාවේ තෙබුවන පියනන්ද නායක ස්වාමීන් වහන්සේ මන්ත්‍රීවරයෙක් හැටියට වැඩ සිටිනවා. පාර්ලිමේන්තු සම්ප්‍රදාය තුළත් පූජකතුමෙක් වැඩ සිටින අසුනට සුදු පිරුවටයක් දාන්න බැරි නම් සුදුපාට කවරයක් දාලා ඒ ආසනය සුවිශේෂී ආසනයක් බවට පත්

කරන්න ගරු සභාපතිතුමාගේ අවධානය යොමු කරනවා. එය මේ සභාව පමණක් ආවේණික දෙයක් නොවෙයි. එය පාර්ලිමේන්තුවෙන් සිදු කෙරෙන ආවේණික සම්ප්‍රදායක්. ඒ නිසා ඉදිරියේදී ඔබතුමා එය නිවැරැදි කරයි කියලා මා විශ්වාස කරනවා.

ඒ වාගේම විශේෂයෙන්ම මේ සංස්කෘතික කටයුතු පිළිබඳව කථා කරන කොට බස්නාහිර පළාත් සභාවේ ගරු සභාපතිතුමනි, ගියවර මිලියන 54 ක් මේ සඳහා වෙන් කරලා තිබුණා. මෙවර 10% ක වර්ධනයක් දකිනවා. මිලියන 64 ක්. මේ මිලියන 64 ක් එක්ක ඉදිරි වර්ෂයේ කරන්න බලාපොරොත්තු වන වැඩ පිළිවෙළ සඳහන් කරලා තිබෙනවා. පෙරහැරවල්වලට, ඒ වාගේම වෙනත් එවැනි උත්සවවලට වෙන් කරනවාට අමතරව මේ විෂයය සම්බන්ධව සංස්කෘතික හා කලා කටයුතු පිළිබඳව මේ සමාජයේ මේ තරම් දැවැන්ත නායයෑමක් සිදු වන වෙලාවේ මහා සමාජ ව්‍යසනයක් සිදුවන වෙලාවේ, කලාකරුවාගේ වටිනාකම සහ ඔහු විසින් සමාජයට ඉටු කළ යුතු යුතුකම ඉෂ්ට කරන්න පෙළඹවීමක් මේ සංස්කෘතික අමාත්‍යාංශයේ වැඩ පිළිවෙළේ කොතැනකවත් නැහැ. මේ ගරු සභාවේත් කලාකරුවන් කිහිප දෙනෙක් ඉන්නවා, ආණ්ඩු පක්ෂය හා විපක්ෂය කියලා භේදයකින් තොරව. ගරු සභාපතිතුමනි, රොජර් සෙනෙවිරත්න අපේ සහෝදර ගරු මන්ත්‍රීතුමා. රොඩ්නි ෆ්‍රේසර් ගරු මන්ත්‍රීතුමා. ඒ වාගේම රවින්ද්‍ර යසස් ගරු මන්ත්‍රීතුමා. අරුණ දීපාල් ගරු මන්ත්‍රීතුමා. මේ වාගේ තවත් කලාකරුවන් කිහිප දෙනෙක් මේ සභා ගර්භය තුළ මන්ත්‍රීවරුන් ලෙස අසුන්ගෙන සිටිනවා. විවිධ අවස්ථාවල අපි දකිනවා. මේ අයගෙන් ප්‍රයෝජනයක් අරගෙන මේ සමාජ ශෝධනය සඳහා ඔවුන්ගේ ශක්තීන් උපයෝගී කරගෙන යමක් කරන්න කිසිම පෙළඹවීමක් හෝ ඒ පිළිබඳ වැඩ පිළිවෙළක් මට මේ 2019 වර්ෂයේ අයවැය ප්‍රකාශය දිහා බලන කොටත් පෙනෙන්න නැහැ. මම හිතන විධියට ඒක අවාසනාවන්ත කාරණාවක්.

ඒ වාගේම ගරු සභාපතිතුමනි, බස්නාහිර පළාත් සභාවේ මෙවර අයවැයෙන් හැමදාම වාගේ අතිවිශාල මුදල් ප්‍රමාණයක් අධ්‍යාපන අමාත්‍යාංශයට වෙන් කරලා තිබෙනවා. අපි හැමදාම මැසිවිලි නඟනවා, අපට මුදල් නැහැයි කියන කාරණාව ප්‍රකාශයට පත් කරලා. බලාගෙන ගියාම 2017 වර්ෂයේ සිටම, 2017 වර්ෂයේ පරිපූරක ඇස්තමේන්තුවත් ඇතුළත්ව මිලියන 23070 ක මුදල් අධ්‍යාපන කටයුතුවල සංවර්ධනය සඳහා මේ අමාත්‍යාංශයට වෙන් කරලා තිබෙනවා. ඒ වාගේම 2018 වර්ෂයේ මිලියන 24286 ක් මේ සඳහා ආයෝජනය කරලා තිබෙනවා. ඊට පෙර වර්ෂයට වඩා මිලියන 1216 ක් වැඩි කරලා තිබෙනවා. ඒ වාගේම 2019 වර්ෂයේ මිලියන 31033 ක්. පරිපූරක ඇස්තමේන්තුව තවම එකතු වෙලා නැහැ. ඒවත් එකතු වුණොත් මම හිතනවා මිලියන 35,000 කට, 36,000 කට කිට්ටු වේවි. මුදල් වෙන් කිරීමේදී මේකත් පෙර වර්ෂවලට වඩා 11% ක වර්ධනයක් සිදු වී තිබෙනවා. ගරු ප්‍රධාන අමාත්‍යතුමාට ස්තුතිවන්ත වෙනවා, මේ අමාත්‍යාංශය සඳහා මේ ආකාරයෙන් මුදල් වෙන් කරදීම පිළිබඳව. මිලියන 7748 ක් මේ වර්ෂයේත් අපි මේ අමාත්‍යාංශය සඳහා ආයෝජනය කරලා තිබෙනවා. මෙය ඉතාමත් ධනාත්මක මට්ටමකින් අපි දකිනවා. අධ්‍යාපනය කියන විෂයය පද්ධතිය තුළ තිබෙන අති දැවැන්ත වටිනාම විෂයයක්. මොකද, මේ රට අනාගතයේ භාර ගන්න ඉන්න දරුවන් මේ තාක්ෂණයට අනුව සකස් කිරීම ඉතාමත් අවශ්‍ය කාරණයක් බවට පත් වී තිබෙනවා.

ගරු සභාපතිතුමනි, ගරු අධ්‍යාපන අමාත්‍යතුමා ඉතාම දැන උගත්, විශ්ව විද්‍යාල අධ්‍යාපනය ලැබූ උගත් උපාධිධාරියෙකු හැටියට අපි හඳුනාගෙන තිබෙන කෙනෙක්. එතුමා දක්ෂයෙක්. මේ විෂයය සඳහා කැප වෙලා ඉන්නවා. නමුත් මම පෞද්ගලිකව කල්පනා කළා, එතුමාට මේ අමාත්‍යාංශයේ යම් යම් දේවල් ඉෂ්ට සිද්ධ කරගන්න බැරි වුණු කාරණාව මොකක්ද කියන එක. ගරු සභාපතිතුමනි, මේ සභා ගර්භය සකස් කරලා තිබෙන්නේ, ප්‍රජාතන්ත්‍රවාදය සඳහා. ප්‍රජාතන්තවාදයේ ස්වභාවය තමයි ආණ්ඩු පක්ෂයක් සහ විපක්ෂයක් එකට එකතු වෙලා, ආණ්ඩු පක්ෂය පාලක පක්ෂය හැටියටත්, විපක්ෂය විවේචනාත්මක පක්ෂය හැටියටත් විවේචනාත්මකව ආණ්ඩු පක්ෂය නිවැරැදි කරන කණ්ඩායම හැටියට පෙනී සිටිමින් ක්‍රියාත්මක වීම. පසුගිය කාලවකවානුව තුළ අපට විවිධ අවස්ථාවලදී අධ්‍යාපන අමාත්‍යාංශයේ විවිධ පැතිකඩ දිහා බලමින් අපේ ගරු අමාත්‍යාවරයා නිවැරැදි කරගෙන මේ ගමන ඉස්සරහාට යන්න අපි විවිධ උත්සාහ දැරුවා. මෙහිදී සිදු වුණේ ඉතාමත් අවාසනාවන්ත සිද්ධියක්.

ගරු සභාපතිතුමනි, මේ සභා ගර්භයේ සිටින කිසිම අමාත්‍යවරයෙක් හෝ මන්ත්‍රීවරයෙක් 100% ක් නිවැරැදි පුද්ගලයන් වන්නේ නැහැ. මේ සභා ගර්භයේ කවුරුත්

[ ගරු ජගත් අංගගේ ]

100% ක් නිවැරැදි වන්නේ නැහැ. යම් විධියකට මේ විවේචනාත්මක ස්වභාවය දැඩි වන තරමටම ගරු අමාත්‍යවරයෙක් හෝ මන්ත්‍රීවරයෙක් ඔහුගේ ජීවිතයේ අඩුපාඩු සකස් කරගෙන ඉදිරියට යන ගමන තීවුර වෙනවා. මම මේ වෙලාවේ විපක්ෂයට චෝදනා කරනවා. එවලේ විපක්ෂය කළ කාර්යභාරය වුණේ, මේ විවේචනය වෙනුවට ආණ්ඩු පක්ෂය දියකර හැරීම සඳහා ගත යුතු ක්‍රියා මාර්ගය පිළිබඳව සොයා බලමින් කටයුතු කිරීමයි. මා සමහ පෞද්ගලික අමනාපයක් ඇති කරගන්න එකක් නැහැ, මේ කාරණාව සම්බන්ධව. මොකද ගරු අමාත්‍යතුමාට ආණ්ඩු පක්ෂයේ විවේචනවලට මුහුණ දෙන්න ඔවුන් ඉඩ හැරියේ නැහැ. ඔවුන් කළේ ආණ්ඩු පක්ෂයේ විවේචනවලට ලක් වෙන කොට, ඒ විවේචනවලින් තම අමාත්‍යාංශය නිවැරැදිව ඉදිරියට අරගෙන යන්න පෙළඹවීම වෙනුවට, ඔබ භය වෙන්න එපා. අපේ ඡන්දයෙන් ඔබව මේ අමාත්‍යාංශය දිනවනවා කියන විශ්වාසය ඇති කරලා, ඒ විවේචනවලින් ඈත් කොට නිදැල්ලේ යන්න ඉඩ හැරීමයි. ගරු අමාත්‍යතුමාට ආණ්ඩු පක්ෂයේ ප්‍රසාදය අඩු වෙන්න මූලික කාරණාවක් හැටියට, එදා ඒ කාරණාව හේතු පාදක වුණා.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

නැහැ. නැහැ. එතුමා හොඳ නිසා එහෙම කළේ.

**ගරු ජගත් අංගගේ**
Hon. Jagath Angage

මම මේ කථා කරන්නේ, ස්වාධීනව. මට ඔබතුමියගේ විවේචනය වැඩක් නැහැ. මගේ කාලය තුළ -

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

අපි කාටවත් එහෙම -

**ගරු ජගත් අංගගේ**
Hon. Jagath Angage

කරුණාකර ඔබතුමිය මට බාධා කරන්න එපා. ඔබතුමියගෙන් ඉල්ලන්නේ. ඔබතුමියගේ කථාව වෙලාවේදී ඕනෑතරම් විවේචනය කරන්න ඔබතුමියට අවස්ථාව තිබෙනවා. එතුමියට වෙලාව දීලා මට ඉතුරු ටික දෙන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නැහැ. නැහැ. එහෙම වෙලාවක් නැහැ. ඔබතුමා කථා කරන්න.

**ගරු ජගත් අංගගේ**
Hon. Jagath Angage

ඔබතුමිය නීතිඥවරියක්. වැදගත් කාන්තාවක්. මේ ගරු සභාවේ රීතිවලට අනුකූලව හැසිරෙන්න. ඒක තමයි කරන්න තිබෙන කාරණාව. වෙන දෙයක් නොවෙයි කරන්න තිබෙන්නේ. ඔච්චර පහත් වෙන්නන එපා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා ගැටුම්වලට යන්න එපා. ඔබතුමා කථා කරන්න. ගරු මන්ත්‍රීතුමිය කරුණාකර නිශ්ශබ්ද වන්න.

**ගරු ජගත් අංගගේ**
Hon. Jagath Angage

ගරු සභාපතිතුමනි, මගේ සාධාරණ විවේචනය, මගේ ඇහැට දකින දේ මම කථා කරන්නේ. මම දන්නවා රංජිත් සෝමවංශ ගරු අමාත්‍යවරයා වැඩ කරන්න දන්න අමාත්‍යවරයෙක් පමණක් නොවෙයි. වැඩවලට කැප වෙන අමාත්‍යවරයෙක්. ඇයි ඔහුට තමන්ගේ අරමුණ ඉෂ්ට සිද්ධ කරගන්න බැරි වුණේ? ගරු සභාපතිතුමනි, මා අර පෙර කිව්ව සංස්කෘතික අමාත්‍යාංශය වාගේම අධ්‍යාපන අමාත්‍යාංශය ගරු මන්ත්‍රීවරුන්ගේ නිර්මාණශීලී හැකියාවන්වලින් විශාල වැඩ කොටසක් කරගන්න ගරු අමාත්‍යතුමාට ඉඩ පහසුකම් තිබුණා. නමුත් පසුගිය කාල වකවානුව තුළ ගරු මන්ත්‍රීවරුන්ට එතුමාගේ අමාත්‍යාංශය තුළ ඒ තමන්ගේ හැකියාවන්ට, දක්ෂතාවයන් තුළ දායක වෙන්න ඉඩක් ලැබුණේ නැහැ. මම ඉතාමත්ම පැහැදිලිව මේ කාරණාව කියන්නේ. සමහර නිලධාරීන් - මම මේ සමස්තයටම දෝෂාරෝපණය කරනවා නොවෙයි. අමාත්‍යාංශ ලේකම්තුමාට, අධ්‍යක්ෂවරුන්ට නොවෙයි. මම මේ තනතුරකට හිතලා කියනවා නොවෙයි. අපි ඉතිහාසය පුරා අධ්‍යාපන විෂයයත් එක්ක බද්ධ වෙලා ගොඩක් දේවල් කරපු අය. මම පමණක් නෙවෙයි. මේ විශාල මන්ත්‍රීවරු පිරිසක් ප්‍රසන්න රණතුංග ගරු ප්‍රධාන අමාත්‍යතුමා අධ්‍යාපන විෂයය ක්‍රියාත්මක කළ වකවානුවේ -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, මම ඔබතුමාට තව විනාඩියක කාලයක් දෙන්නම්.

**ගරු ජගත් අංගගේ**
Hon. Jagath Angage

ඇයි අර ගරු මන්ත්‍රීතුමිය විනාඩියක් ගත්තා නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒකත් මම දුන්නා.

**ගරු ජගත් අංගගේ**
Hon. Jagath Angage

ගරු සභාපතිතුමනි, මම සටහන් කරගත්තු කාරණා ගොඩක් තිබෙනවා. මේ සභා ගර්භය තුළ ඒවා කථා කරන්න මට වෙලාවක් නැහැ,. ගරු සභාපතිතුමනි, අපට එවැනි කිසිම අවස්ථාවක් සඳහා පාසල් පද්ධතියට ඇතුල් වෙලා ක්‍රියාත්මක කරන්න ඉඩකඩ ඒ නිලධාරීන් අපට සැලසුවේ නැහැ. මේක පැහැදිලිව දකින්න තිබෙන කාරණාවක්. යම් යම් අදහස් ඉදිරිපත් කළාම වෛරක්කාරයෝ හැසිරෙන ආකාරයෙන් අපි දිහා බලලා අපට වෛර කරන ආකාරයක් පසුබිමේ දැක්කා. නමුත් මම පුද්ගලික යෝජනාවක් කරන්නේ නැහැ. කිසිම නිලධාරීයෙකුට පෞද්ගලිකව චෝදනා කරන්නේ නැහැ. මේක උඩ සිට පල්ලෙහාට ගමන් කරන්න ඕනෑ කාරණාවක්. ඒ නිසා සිද්ධ වුණේ, මෙච්චර දක්ෂතාවයන්, හැකියාවන්, කුසලතාවයන් තිබෙන අමාත්‍යවරයෙකුට තමන්ගේ අමාත්‍යාංශයේ තමන්ගේ අරමුණු ප්‍රාර්ථනා කරපු විධියට සාක්ෂාත් කරගන්න අපොහොසත් වුණේ, මෙන්න මේ ප්‍රජාතන්ත්‍රවාදී මූලික ගති ලක්ෂණ නොමැති පිරිසක් එක්ක මේ අධ්‍යාපන අමාත්‍යාංශය මෙහෙයවන්න ගිය නිසා කියන එකයි මම විශ්වාස කරන්නේ. ඒ නිසා මම බලාපොරොත්තු වෙනවා, එතුමා අනාගතයේදී මේ අඩුපාඩු නිවැරැදි කරගෙන ඉතාමත් සාර්ථකව බස්නාහිර පළාතේ දරුවන්ගේ අනාගතය නිර්මාණශීලීව ගොඩනගන්න කටයුතු කරයි කියන විශ්වාසයෙන් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මහින්ද ජයසිංහ ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි 10 ක කාලයක් තිබෙනවා.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ගරු සභාපතිතුමනි, විනාඩි 13 ක් දාලා තිබුණා. 13 ත් ප්‍රමාණවත් නැහැ, ගරු සභාපතිතුමනි.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ගරු සභාපතිතුමනි, අපේ කාලයෙන් අඩු කරන්න එපා. විනාඩි 13 දෙන්න. ඔබතුමා දන්නවා, මේ විවාදයට අපේ කාලය ගන්න අපි කොයිතරම් උත්සාහ කළාද කියලා. ඒ නිසා කරුණාකර අපේ කාලය අපට ලබා දෙන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි. හරි. මම ඒක කරන්නම්.

[අ.භා.02.44]

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ගරු සභාපතිතුමනි, විශේෂයෙන්ම මේ පළාත් සභාවේ මේ වාරයේ අවසන් අයවැයට එක් වෙමින්, පසුගිය කාලය පුරාම අධ්‍යාපන අමාත්‍යාංශයේ වැය ශීර්ෂයත් එක්ක කරුණු දක්වමින් අපි බස්නාහිර පළාතේ අධ්‍යාපනය කොයි වාගේ තැනක ද තිබෙන්නේ කියන කාරණය සම්බන්ධයෙන් දිගින් දිගටම කරුණු ඉදිරිපත් කළා. විශේෂයෙන් පාසල් 1359 ක්, එයින් 1287 ක් පළාත් පාසල් විධියටත්, 72 ක් ජාතික පාසල් විධියටත් අපේ රටේ අධ්‍යාපනයේ ප්‍රධානම පළාතක් ලෙස කටයුතු කරන මේ පළාත් සභාව අපට කැමැති වුණත්, අකැමැති වුණත් අපි දන්නවා අධ්‍යාපනයේ වැඩි පංගුවක් අද වන විට පළාත් සභාවලට තමයි යොමු වෙලා තිබෙන්නේ. නමුත් බස්නාහිර පළාත තුළ අධ්‍යාපනය තිබෙන්නේ කොයි තැනකද කියලා අපි කල්පනා කළොත් අපි දකිනවා, මේ ගෙවුණු කාලසීමාව තුළ අධ්‍යාපනය තුළ කිසිදු ප්‍රගතියක් අත්පත් කරගන්න සමත් වෙලා නැහැ. විශේෂයෙන්ම අපේ පළාතේ දරුවන් 50 ට අඩු පාසල් 73 ක් තිබෙන බවට මේ අයවැය වාර්තාවල සඳහන් වෙනවා. ඒ වාගේම දරුවන් 2000 ට වැඩි පාසල් 119 ක් තිබෙන බවට සඳහන් වෙනවා. මම මීට කලිනුත් අයවැය විවාදවලදී පෙන්වා දීලා තිබෙනවා. ලෝකයේ පිළිගත්ත ක්‍රමය තමයි වඩා අඩු සංඛ්‍යාවක ළමයින්. ඒ වාගේම වැඩි ළමුන්ට ඉඩ හදන විශ්ව විද්‍යාල. නමුත් අපේ පළාතේ සිදු වෙමින් තිබෙන්නේ කුමක්ද? ළමුන් 50 ට වඩා

[ ගරු මහින්ද ජයසිංහ ]

අඩු පාසල් 73 ක්. මම අහන්න කැමැතියි, මොකක්ද? බස්නාහිර පළාත් සභා අධ්‍යාපන අමාත්‍යාංශය විසින් මේ පාසල් සම්බන්ධයෙන් යොමු කරලා තිබෙන අවධානය. මේ පාසල් ගොඩනගන්න උවමනා කරන, මේ පාසල්වල ළමුන් සංඛ්‍යාව වැඩි කරගන්න උවමනා කරන වැඩ පිළිවෙළ මොකක්ද? මේ පාසල්වලට ළමුන් ඇතුළත් කරන්න ඕනෑ විධියට, දෙමව්පියන් පොළඹන්න ඕනෑ විධියට හදලා තිබෙන වැඩ පිළිවෙළ මොකක්ද? එවැනි කිසිදු වැඩ පිළිවෙළක් අපි දකින්නේ නැහැ. නමුත් අපි දකිනවා. මේ අයවැය කථාව තුළ කියනවා, 2019 අයවැයට විශේෂ යෝජනා වශයෙන්, දිස්ත්‍රික්ක තුනේ පාසල් තුනක් තෝරාගෙන ඒවා උසස් මට්ටමකට පත් කිරීමට මා බලාපොරොත්තු වෙනවා කියලා ගරු මහ ඇමතිතුමාගේ අධ්‍යාපන අයවැය කථාවේදී කියනවා. දිස්ත්‍රික්කයක පාසල් තුනක් තෝරාගෙන, ඒ පාසල් තුන විතරක් සංවර්ධනය කිරීම තුළ - අපි ඒකට විරුද්ධ නැහැ. ඒක බොහොම හොඳයි. ඒක විතරක් සංවර්ධනය කිරීම ඇතුළේ මේ කියන අර්බුදයට විසඳුම් සොයන්න බැහැ. ඒ නිසා අපි හැමදාම පෙන්නලා දුන්නා. අපට තියෙන්න ඕනෑ කෙටි කාලීන, මධ්‍ය කාලීන, දීර්ඝ කාලීන වැඩ පිළිවෙළක්. අපේ පාසල් 1287, පළාතට අයිති පාසැල් 1287 වත් ක්‍රමානුකූලව වර්ධනය කරන්න පියවර ගන්න ඕනෑ කරන වැඩ පිළිවෙළක් තිබෙනවා කියලා අපි දකින්නේ නැහැ. කිසිදු අයවැයක් තුළ එවැනි වැඩ සටහනක් තිබෙනවා කියලා අපට දකින්න නැහැ.

ඒ විතරක් නොවෙයි. අපේ පළාතේ ප්‍රශ්න ගණනාවක් තිබෙනවා. ගුරු හිඟය. දැන් මේ අයවැය කථාවේදීම කියනවා, අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කරලා තිබෙන මේ ප්‍රකාශයේ කියනවා, ගුරු සිසු අනුපාතය අපේ පළාතේ එකට විසි එකක්. රටේ එකට දහ අටක් වෙන කොට, අපේ පළාතේ එකට විසි එකක්. හැබැයි ඇත්ත ප්‍රශ්නයක් තිබෙනවා. ගුරු සිසු අනුපාතය එකට විසි එකක් වුණාට, ඇත්ත ගුරුවරු පාසල්වලට ඉන්නවාද? අවශ්‍ය ප්‍රමාණයට ගුරුවරු පාසල්වල නැහැ. අපේ පළාතේ කලාප ගණනාවක, විශේෂයෙන් මතුගම කලාපයේ, මතුගම කොට්ඨාශයේ, පිළියන්දල, මොරටුව කොට්ඨාශයේ, ජයවර්ධනපුර, කොළොන්නාව කොට්ඨාශයේ, කොළඹ, කොටහේන ආදී මේ ප්‍රදේශ ගණනාවක අති විශාල ගුරු හිඟයක් තිබෙනවා. පිළියන්දල කලාපය තුළ පමණක් ගුරුවරු 170 ක් හිඟයි. මේ විධියට හැම කලාපයකම ගුරු හිඟයක් තිබෙනවා. හැබැයි අපට අයවැයේදී කියනවා, ළමයින් විසි එකකට එක ගුරුවරයෙක් ඉන්නවා කියලා. ඇත්ත තත්ත්වය ඒක නොවෙයි. ඇත්ත තත්ත්වය තමයි නගර ආශ්‍රිත ගුරු අතිරික්තයක් තිබීම. ඒ වාගේම දුෂ්කර පාසල්වල බරපතළ ගුරු හිඟයක් තිබෙනවා. අපට ඕනෑ තරම් පාසල් නම් වශයෙන් අරගෙන උදාහරණ දක්වන්න පුළුවන්. ඒ ඒ පාසල්වල මොන ආකාරයට ගුරු හිඟයන් තිබෙනවාද කියන කාරණය සම්බන්ධයෙන් උදාහරණ දක්වන්න පුළුවන්. ඒ විතරක් නොවෙයි. මෙහෙම ගුරු හිඟයක් තිබෙද්දී, විශේෂයෙන්ම අධ්‍යාපන අමාත්‍යාංශයත්, රාජ්‍ය සේවා කොමිෂන් සභාවත් මේකට වග කියන්න ඕනෑ. පළාතට පිටින් ගුරුවරු එන්න ඉන්නවා. සමහර වෙලාවට මම අධ්‍යාපන නිලධාරීන් එක්ක කථා කරද්දී, අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් එක්ක කථා කරද්දී ඔවුන්ගෙත් තිබෙන පිළිගැනීම තමයි පිට පළාත්වලින් එන්නෙත් ඉතාමත් අත්දැකීම් බහුල ගුරුවරු. වයඹින් 8 ක්. ඌවෙන් 67 ක්. සබරගමුවෙන් 127 ක්. උතුරු මැදින් 77 ක්. දකුණින් 50 ක්. මධ්‍යමින් 50 ක්. බස්නාහිර පළාතට එන්න 450 කට වැඩිය ගුරු සංඛ්‍යාවක් ඉල්ලුම් කරලා තිබෙනවා. නමුත් ඒ ගුරුවරු බස්නාහිර පළාතෙන් බඳවා ගන්නේ නැහැ. අපි අහනවා, මොකක්ද ප්‍රශ්නය? විශේෂයෙන් දුෂ්කර පළාත්වල සේවය කරලා, මේ ගුරුවරු බලාගෙන ඉන්නවා තමන්ගේ ගම් පළාත්වලට එන්න. අද ඒ ගුරුවරුන්ට ඉඩ හදන්නේ නැහැ. හැබැයි අපේ කලාපවල බරපතළ ගුරු හිඟයක් අද වන විට නිර්මාණය වෙලා තිබෙනවා.

ඒ විතරක් නොවෙයි. පාසල් අතර බරපතළ ලෙස සම්පත් බෙදී යාමේ අසමාන තාවයක් තිබෙනවා. ඒ වාගේම පාසල්වල පහසුකම් විවිධයි. විෂමයි. විශේෂයෙන්ම දරුවන්ගේ සමාජ පසුබිම අනුව, ඔවුන්ගේ බුද්ධිමට්ටම අනුව අධ්‍යාපන පසුබිම වෙනස් වෙනවා. ඔබතුමා දන්නවා. ඒ නිසා මේ පාසල්වල පහසුකම් අඩුයි. ප්‍රතිඵල සමලෝචන රැස්වීම්වලදී A, B ප්‍රතිශත ලෙස බලනවා. නිලධාරීන් ප්‍රතිඵල සමාලෝචනය කරනවා. A කොහොමද? B කොහොමද? ඒ විධියට ප්‍රතිඵල සමාලෝචනය කරනවා. හැබැයි මේ පාසල්වලට සම්පත් බෙදී යාමේ විෂමතාවය පිළිබඳව සැලකිලිමත් වන්නේ නැහැ. ඒ විතරක් නොවෙයි. උසස් පෙළ උගන්වනු ලබන අඩු පහසුකම් සහිත පාසල්වල දරුවන් කෙරෙහි සහ පහ වසර ශිෂ්‍යත්වය හදාරන දරුවන් කෙරෙහි සමහර පාසල්වල සැලකිල්ලක් නැහැ. විශේෂයෙන් ගුරු හිඟය, සම්පත් අඩුකම, බහුලව සමහර

පාසල්වල තිබෙනවා. ඒවාට විසඳුම් සොයන්න මේ පළාත අසමත් වෙලා තිබෙනවා.

ඒ විතරක් නොවෙයි. දැන් ළඟම පාසල - හොඳම පාසල කියලා මධ්‍යම ආණ්ඩුවෙන් සංකල්පයක් ගෙනාවා. අපි දැක්කා ගරු මහ ඇමතිතුමාගේ කථාවේදී කියනවා, 2018 අවුරුද්ද සඳහා මිලියන 4000 ක් වෙන් කළා. ලබන අවුරුද්දට මිලියන 3500 ක් වෙන් කරනවා කියනවා. ළඟම පාසල - හොඳම පාසල කියලා වෙන් කළාට වැඩක් නැහැ, ළඟම ඉන්න දරුවාට ළඟම පාසල අහිමි වෙනවා නම්. ළඟම ඉන්න දරුවාට තමන්ගෙ ළඟම පාසල අහිමි වෙනවා නම් සංකල්ප ගෙනාවාට වැඩක් නැහැ. අපි දැක්කා ලබන අවුරුද්දට 1 වසරට ළමුන් බඳවා ගැනීමේදී බරපතළ ප්‍රශ්නයක් තිබෙනවා. 1 ශ්‍රේණියට දරුවන් ඇතුළත් කිරීමේ චක්‍රලේඛය හරහා දරුවන් විශාල ප්‍රමාණයකට තමන්ගේ අල්ලපු වැටේ පාසල අහිමි වන තත්ත්වයක් නිර්මාණය වෙලා තිබෙනවා. ඒ සඳහා බස්නාහිර පළාත ගත්තේ වැරදි ක්‍රියාමාර්ගයක්. කරපු වැඩේ හොඳයි. අපි ඒක අනුමත කරනවා. හැබැයි කරපු විධිය වැරදියි. මේක ශ්‍රේෂ්ඨාධිකරණය හරහා ආපු චක්‍රලේඛයක්. ඕනෑ නම් කියන්න තිබුණා. ශ්‍රේෂ්ඨාධිකරණයට කරුණු වාර්තා කරන්න තිබුණා. මෝසම් එකක් දාලා, ශ්‍රේෂ්ඨාධිකරණයට කරුණු වාර්තා කරලා කියන්න තිබුණා. අපේ පළාතේ බොහෝ දරුවන්ට මේ පාසල් අහිමි වෙනවා. ඒක කියනවා වෙනුවට බස්නාහිර පළාත තුළ තීන්දුවක් අරගෙන ඒක ක්‍රියාත්මක කරන්න යද්දී මධ්‍යම ආණ්ඩුවේ චක්‍රලේඛයත් එක්ක මේක ගැටුණා. ඒ නිසා බරපතළ ගැටලුවක් නිර්මාණය වුණා. ඒ විතරක් නොවෙයි. දැන් ළඟම පාසල - හොඳම පාසල කියනවා. මා ළඟ උදාහරණයක් තිබෙනවා.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ගරු මන්ත්‍රීතුමා, ඉතුරු ටිකත් කියන්න. අර ගැටලුව මතු වුණු තැනින් තව ඉස්සරහාට ඔබතුමා කැමති යෝජනාවක් කරන්න.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

මේක ඉවර වෙලා ඉතුරු ටික කියන්නම්.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

තරහකට නොවෙයි. අර ගැටලුවත් එක්ක තව යෝජනාවක් තිබෙනවා නම් කරන්න.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

යෝජනාව තමයි මම කිව්වේ. ඔබතුමන්ලාගේ පැත්තෙන් කළ යුතුව තිබුණේ, මධ්‍යම රජයේ තීන්දුවත් එක්ක ගැටෙන තීන්දුවක් පළාතෙන් ගන්නේ නැතුව මේ ප්‍රශ්නය ශ්‍රේෂ්ඨාධිකරණයට කියන එකයි. මේ ප්‍රශ්නය ශ්‍රේෂ්ඨාධිකරණයට කියලා, මේ චක්‍රලේඛය නිසා අපේ බොහෝ දරුවන්ට පාසල් අහිමි වෙනවා. පාසල් වශයෙන් කියන්න පුළුවන්. විශාල ප්‍රමාණයක දරුවන්ට තමන්ගේ නිවස ආසන්නයේ පාසල අහිමි වෙලා තිබෙනවා.

දැන් මේ මා ළඟ තිබෙන්නේ, ක්‍රිස්තුරාජ පාසල සුරැකීමේ සංවිධානය විසින් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත යොමු කරන ලද ලිපියක්. මේ පාසලේ ප්‍රශ්නය පිළිබඳව දිගින් දිගටම මම කථා කළා. ඒ පාසලේ ඇස් රෝහලක් දාලා තිබෙනවා. මේ ඇස් රෝහල ක්‍රමානුකූලව පාසල ආක්‍රමණය කරමින් තිබෙනවා. ඇස් රෝහල තිබෙන්නේ, මේ ක්‍රිස්තුරාජ පාසල ආසන්නයේ. මේ ප්‍රාථමික පන්තියේ පස් වැනි පන්තිය දැන් යොමු කරලා තිබෙනවා, මේ පාසලේ මහ විද්‍යාලය තිබෙන ඒ ප්‍රදේශයට. යොමු කරලා මොකක්ද කරලා තිබෙන්නේ? මේ පාසලේ වානිජ අංශය - ගරු සභාපතිතුමනි මේ පාසල කියලා කියන්නේ, ඉතාමත් අඩු ආදායම්ලාභී ජනතාවක් ජීවත්වන ප්‍රදේශයක්. ඒ පාසලේ මෙතෙක් වානිජ විෂයය ධාරාව ක්‍රියාත්මක වුණා. දැන් නියෝගයක් දීලා තිබෙනවා. විශේෂයෙන් මම කනගාටු වෙනවා. අපේ පළාත් සභාවේ මන්ත්‍රීවරු සම්බන්ධ වුණු කැලණිය කලාපයේ ව්‍යූහ කමිටුවේදී තීරණය කරනවා, ඒ පාසලේ ළමුන් අඩුයි කියලා වානිජ අංශය වහලා දාන්න. වානිජ අංශය වැහුවාට පස්සේ මොකද වෙන්නේ? මේ පාසලේ ප්‍රතිඵල ලේඛන මා සතුව තිබෙනවා. 2017 වර්ෂයේ වානිජ අංශයේ ප්‍රතිඵලය 64% ක් වෙනවා. ළමුන් 14 දෙනෙක් ඉදිරිපත් වෙනවා. 09 දෙනෙක් සමත් වෙනවා. මේ වාගේ ප්‍රතිඵල පෙන්නපු පාසලක්. ඉතින් මේ පාසලේ වානිජ අංශය වහනවද? දැන් ළඟම පාසල - හොඳම පාසල කියනවා. ඒ ප්‍රදේශයේ හිටපු දරුවෝ ටික වෙන කොහෙට හරි තල්ලු කරලා, වෙන කොහෙට හරි ගාල් කරලා ඒ පාසලේ වානිජ අංශය වහලා

[ ගරු මහින්ද ජයසිංහ ]

දැම්මාට පස්සේ, ළඟම පාසල - හොඳම පාසල වෙන්නේ කොහොමද? ඒ දරුවාට තිබුණු ළඟම පාසල ඒ දරුවාගෙන් අහිමි කරලා තිබෙනවා. එවැනි තීන්දු තීරණ ගන්න, පළාත් නිලධාරීන් ඉන්න පළාත් සභාවක් බවට අපේ පළාත පත් වෙලා තිබෙනවා. ඒ නිසා ඒවාත් එක්ක අපට කිසිසේත්ම එකඟ වෙන්න බැහැ. අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයාට මේ ලිපිය යොමු කරලා තිබෙන්නේ දහ වැනි මාසයේ නව වැනිදා. මා දන්නේ නැහැ, මේ වන කොට මේ සම්බන්ධයෙන් අරගෙන තිබෙන තීන්දුව මොකක්ද කියලා. ව්‍යූහ කමිටුවේ කුමන තීන්දුවක් ගත්තත්, මම හිතනවා මෙම ඉල්ලීම, ඒ දරුවන්ගේ ඉල්ලීම, ඒ විදුහල්පතිවරයාගේ ඉල්ලීම, ඒ දෙමව්පියන්ගේ ඉල්ලීම ඉටු කළ යුතුව තිබෙනවා කියලා. එහෙම නැතුව ළඟම පාසල - හොඳම පාසල කියන සංකල්පය අපට යථාර්ථයක් කරගන්න හම්බ වෙන්නේ නැහැ.

ඒ විතරක් නොවෙයි. කලාප කාර්යාල මට්ටමින් ගත්තොත් ගොඩනැගිලි සඳහා ප්‍රතිපාදන වෙන් කිරීමේදී පාසල්වල අවශ්‍යතා බලලා නොවෙයි ඒවා වෙන් කරන්නේ කියලා විදුහල්පතිවරු අතර, ගුරුවරු අතර ලොකු චෝදනාවක් තිබෙනවා. විශේෂයෙන්ම ළමයින් සංඛ්‍යාව වැඩි වුණාට ගොඩනැගිලි මදිකම නිසා ගැටලුවලට මුහුණ දීපු පාසල් විශාල ප්‍රමාණයක් තිබෙනවා. ඒ විතරක් නොවෙයි. අවදානම් සහගත පරණ ගොඩනැගිලි කඩා ඉවත් කරන්න ඕනෑ තැන්වල ඒවා ඉවත් කරලා නැහැ. උදාහරණ ලෙස අපට කියන්න පුළුවන් පාසල් තිබෙනවා. ඒ නිසා මෙවැනි ගැටලු ගණනාවක් නිර්මාණය වෙලා තිබෙනවා. මේ ගැටලු සම්බන්ධයෙන් හොඳම අවධානය යොමු කරන්න අසමත් වෙලා තිබෙනවා.

ඒ විතරක් නොවෙයි. අපේ පළාතේ ස්වාස්ථ සැසි ගත්තාට පස්සේ දැන් ස්වාස්ථ සැසි 2017 වසර ගත්තොත් එහෙම, එක් දහස් දෙසිය ගණනක් ස්වාස්ථ සැසි තියන්න ඕනෑ. හැබැයි ස්වාස්ථ සැසි ඒකෙන් හරි අඩක්වත් තියන්න අසමත් වෙලා තිබෙනවා. ස්වාස්ථ සැසි තියන්න අසමත් වෙලා තිබෙනවා විතරක් නොවෙයි. විශේෂයෙන්ම ස්වාස්ථ සැසි ගත්තාට පස්සේ ඒ ස්වාස්ථ සැසි පාඩම් සටහන් සැදීම සඳහා ඒක ප්‍රායෝගික භූමි දැක්මකින් ඔබ්බට ගියපු ස්වාස්ථ සැසි බවට පත් කරන්නට අසමත් වෙලා තිබෙනවා. ඒ ස්වාස්ථ සැසිය ගුරුවරයාගේ දැනුම යාවත්කාලීන කරන, ගුරුවරයා අර සාම්ප්‍රදායිකවම පාඩම් සටහන් හදන එකෙන් ඔබ්බට යන්න, ඒ භූමි දැක්වීමෙන් ඔබ්බට යන්න ඒ ස්වාස්ථ සැසි අසමත් වෙලා තිබෙනවා. ඒවා නවීකරණය කරන්න අසමත් වෙලා තිබෙනවා. අවශ්‍ය ස්වාස්ථ සැසි පවත්වාගන්න අසමත් වුණා විතරක් නොවෙයි. ඒ ස්වාස්ථ සැසි අවශ්‍ය ප්‍රමිතියෙන් යුතුව පවත්වාගෙන යන්නත් අසමත් වෙලා තිබෙනවා. ඒ නිසාම ගුරුවරු මේ ස්වාස්ථ සැසිවලට යන්නේ නැතිව, ඒවා හැර යන වටපිටාවක් නිර්මාණය වෙලා තිබෙනවා. නොගිහින් සමහරු සල්ලිත් ගන්නවා. මම මේ සභාවෙන්ම පෙන්නලා දුන්නා. සමහර නිලධාරීනුත් ඒවාට යනවා කියලා බොරුවට සල්ලි අරගෙන තිබෙනවා. ඒ නිසාම අධ්‍යාපනයේ ගුණාත්මක භාවය මේ නිසාම පහත වැටිලා තිබෙනවා. අධ්‍යාපනයේ ගුණාත්මක භාවය ඉහළ නංවන්න නම්, මේ ස්වාස්ථ සැසි ඉහළ ප්‍රමිතියකින් යුතුව පවත්වාගෙන යන්න අවශ්‍ය කරන පියවර නිර්මාණය කරන්න ඕනෑ. ඒ විතරක් නොවෙයි. සමහර කලාප කාර්යාලවල විශේෂයෙන්ම පහ ශ්‍රේණියේ සිසුන් සඳහා සවස් වරුවේ සම්මන්ත්‍රණ පවත්වන වැඩ ආරම්භ කරලා තිබෙනවා. බොහොම හොඳයි. බොහොම හොඳ වැඩක්. හැබැයි ප්‍රශ්නය තිබෙන්නේ මොකක්ද? මේ සම්මන්ත්‍රණ සඳහා සහභාගිවන දරුවන්ගෙන් ප්‍රශ්න පත්‍ර කට්ටල සඳහා විශාල ලෙස මුදල් අය කරගන්න පටන් අරගෙන තිබෙනවා. ඒක බරපතළ ප්‍රශ්නයක්. විශේෂයෙන්ම මට තොරතුරු ලැබිලා තිබෙනවා. හොරණ කලාපයේ, ඒ වාගේම තවත් විවිධ කලාපවල මෙවැනි සම්මන්ත්‍රණ සඳහා අධික ලෙස මිල ගණන් යටතේ ප්‍රශ්න පත්‍ර කට්ටල ලබා දෙන්න කටයුතු කරලා තිබෙනවා කියලා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙනවා.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

අපි දන්නවා විභාග - අපේ ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමා මේ සභාවේම මේ ප්‍රශ්නය මතු කළා. පසුගිය වසරේ විවිධ වංචා දූෂණවලට ලක් වුණු කණ්ඩායම්වලට මේ වතාවේත් විභාග ප්‍රශ්න පත්‍ර මුද්‍රණය කරන්න දීලා තිබෙනවා. විශේෂයෙන්ම අධ්‍යාපන ඇමතිවරයා මේ සම්බන්ධයෙන් දුන්නේ කිසිසේත්ම මේ සභාවට පිළිගන්න පුළුවන් පිළිතුරක් නොවෙයි. එතුමා

මේ ගැන දන්නේ නැහැයි කියලා කිව්වා. නිලධාරීන් මේවා කරලා තිබෙන්නේ කියලා කිව්වා. පසුගිය හතරවැනිදා ගම්පහ කලාපයේ මාරු මණ්ඩල නියෝජිතයෝ කැඳවලා, ගම්පහ කලාප අධ්‍යක්ෂතුමිය දැනුම් දීලා තිබෙනවා, පළාත් සභාවේ තීරණයක් අරගෙන තිබෙනවාලු මාරු අභියාචනා මණ්ඩල සඳහා ගුරු සංගම්වල නියෝජිතයෝ සහභාගි කරවා ගන්නේ නැහැයි කියලා. අපි අහනවා, කොහෙන්ද ඒ තීරණ ගත්තේ? මම ඊයේ භෝජනාගාරයේදී ඇමතිතුමාගෙන් අහද්දී මෙහෙම තීන්දුවක් ගත්තාද කියලා, එතුමා දන්නේ නැහැ. එතකොට මේ තීන්දු ගන්නේ කොහෙන්ද? ප්‍රශ්න පත්‍ර ගහන එක -

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ගරු සභාපතිතුමනි, බාධා කිරීමක් නොවෙයි. මම උත්තර දෙන්නම්.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

බාධා කරන්න එපා. මගේ වෙලාව. ඊළඟට මෙවැනි වටපිටාවක තමයි අපේ පළාතේ අධ්‍යාපනය තිබෙන්නේ. මේ තත්ත්වයත් එක්ක බරපතළ ගැටලු ගණනාවකට මේ රටේ දරුවන් මුහුණ දීලා තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා ඔබතුමාගේ කාලය අවසන්.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

තත්පයරක් දෙන්න. තව විනාඩියක් දෙන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

විනාඩි 13 ම දුන්නා.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

අනේ, ගරු සභාපතිතුමනි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ටක් ගාලා ඉවර කරන්න.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ඇමතිතුමා මගෙන් විනාඩි දෙක තුනක් ගත්තා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

විපක්ෂයේ කාලය මම සීමා කළේ නැහැ. විපක්ෂයට කාලය දුන්නා. ඔබතුමාට විනාඩි 13 ම දුන්නා.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

කොහොම වුණත් අපි විශේෂයෙන්ම ජනතා විමුක්ති පෙරමුණ විධියට පසුගිය 26 වැනිදා අටවාගත්ත මේ කුමන්ත්‍රණකාරී ආණ්ඩුව නිසා මේ වනකොට අපේ රටේ හතළිස් ලක්ෂයක් දරුවන්ට, බස්නාහිර පළාතේද දරුවන් ඇතුළු හතළිස් ලක්ෂයක් දරුවන්ට නිල ඇඳුම් අහිමි වෙලා තිබෙනවා. ඒ වාගේම සමහර දරුවන්ට පාසල් පෙළ පොත් අහිමි වෙලා තිබෙනවා. ඒ සම්බන්ධයෙනුත් අපේ විරෝධය පළ කරනවා. ඒ වාගේම ක්‍රීඩා ක්ෂේත්‍රය පිළිබඳවත් - මම තත්ත්පරයෙන් අවසන් කරනවා. ක්‍රීඩා එකේ බරපතළ ප්‍රශ්න ගණනාවක් තිබෙනවා. විශ්‍රාම ගියපු නිලධාරියෙක් ක්‍රීඩා පුහුණු තනතුරකට පත් කරලා තිබෙනවා. දිගින් දිගටම මේ ක්‍රීඩා නිලධාරීන්ගේ විරෝධය නොතකා පත් කරලා තිබෙනවා. ඒ වාගේම මුදල් බෙදා හැරීම්වල කිසිඳු ප්‍රමිතියක් නොමැතිව ක්‍රීඩා ක්ෂේත්‍රයේ මුදල් බෙදා හරිමින් තිබෙනවා. ඒ වාගේම වෘත්තීය සමිති විසින් දිගින් දිගටම ක්‍රීඩා නිලධාරීන් -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නිරෝෂන් පාදුක්ක ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ කාලය. ඔබතුමාගේ කාලය ගන්න. ඔබතුමාට විනාඩි 18 ක් දෙනවා. ඔබතුමා කථාව අවසන් කරන්න.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

බොහොම ස්තුතියි.

[අ.භා.02.58]

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ගරු සභාපතිතුමනි, ගුණදාස කපුගේ මහත්මයා පෙම්වතියක් සම්බන්ධයෙන් ගීතයක් කියනවා.

අප හමු වූයේ මන්දැයි නොදනිමි
පාර ඇසුවේ ඇයි දැයි නොකියමි
අපේ ගමන අද නවතනු හැකි නම්
අපි යන ගමනද අද මෙතැනින් නිමි

කියලා. මේ අධ්‍යාපන ඇමතිතුමාත් එක්ක තවදුරටත් යන්න බැහැ. ඒ නිසා අපි හමු වූයේ මන්දැයි නොදනිමි. ඔබතුමාව කවුරු පත් කළාද කියලා මම නම් දන්නේ නැහැ. මම දන්න විධියට නම් ජනාධිපතිතුමා තමයි පත් කළේ. පාර ඇසුවේ ඇයි දැයි - අපව උපදේශක කාරක සභාවේ ව්‍යූහ කමිටුවලට දාලා අපි අනන්තවත් පෙන්නුවා පාරේ යන හැටි. යන්නේ නැහැ. අපි කියපුවා උරා ගන්නෙත් නැහැ. දරා ගන්නෙත් නැහැ. ඒ නිසා අපි යන ගමන අද මෙතැනින් නිමි. මෙතැනින් එහාට අපට ඔයාට Love කරන්න බැහැ. මේක තමයි ඇත්ත කථාව. කියන කිසිම දෙයක් අහගෙන ඉන්නේ නැහැ. අහනවා, අයියා කොහෙද මල්ලි රට කියනවා. මේක කරන්න බැහැ. අවුරුදු 3 ½ ක් ලංකාවේ ලොකුම පළාතේ දරුවන්ගේ අනාගතයත් එක්ක ඔබතුමා සෙල්ලම් කළා.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

වරදක් කළත් සිතකින් නොවේ.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

පළි ගන්නේ, රිදවන්නේ ළමයින්ගෙන්. ඒකයි ප්‍රශ්නය. වරදක් කළත් සිතකින් නොවෙයි නම් පළි ගන්නේ ළමයින්ගෙන්. රිදවන්නේ ළමයි. ඕක තමයි ප්‍රශ්නය, ගරු ඇමතිතුමනි. ඔබතුමාට තේරුණු නැති එක, ඔබතුමාට තේරෙයි. කල් යයි. නමුත් කාලය ඉවර වෙයි. මම මේ අවුරුදු 16 ක පළාත් සභා ජීවිතයේ අධ්‍යාපන උපදේශක කාරක සභා තුනේ 16 අවුරුද්දක් හිටපු මන්ත්‍රීවරයෙක් විධියට හැමදාම - මගේ ඉදිරියේ අපේ හිතවත් මන්ත්‍රීතුමාත් ඉන්නවා. මෙරිල් ගරු මන්ත්‍රීතුමන්ලා දන්නවා. අපි හැමදාම කථා කළේ, අධ්‍යාපනයේ අඩුපාඩු සහ මෙය ඉස්සරහාට ගෙනි යන්නේ කොහොමද කියලා. ඒ ඇමිම තුළ රෙජිනෝල්ඩ් කුරේ, ප්‍රසන්න රණතුංග ඇමතිවරුත් එක්කත් අපි වැඩ කළා. හැබැයි තමුන්නාන්සේත් එක්ක වැඩ කරන කොට - තමුන්නාන්සේ හරිම සුන්දර මිනිහෙක්. වැඩක් නැහැ කියලා. හරිම සුන්දරයි. සුන්දර වුණාට ඉතිරි කොටස හරි ගියේ නැහැ. අපි හැමදාම ඔබතුමාව බේරා ගත්තා. මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා කුමන්ත්‍රණ එකයි කළේ. ඔබතුමන්ලාගේ කට්ටිය ඔබතුමාට විරුද්ධව කුමන්ත්‍රණ ගොඩක් කළා. ඒ හැම කුමන්ත්‍රණයෙන්ම ඔබතුමාව අපි ආරක්ෂා කළා. අපි ඔබට ඔක්සිජන් දුන්නා. පිටිපස්සෙන් ඇරියා, ඇරියා. ඇන්නා, ඇන්නා. අනන්තයි. අප්‍රමාණයි. අපි හැම අවස්ථාවකම බේරා ගත්තා. නමුත් මට පේනවා මේ පාර බේරගන්න බැහැ වගේ. ගරු සභාපතිතුමනි,

**ගරු සුමිත් විජයමුණි ද සොයිසා**
Hon. Sumith Wijayamuni De Soysa

නැහැ. එහෙම ප්‍රශ්නයක් වෙන්නේ නැහැ.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ඒ නිසා ඔබතුමාට මම කියන්නේ, මම මේ අධ්‍යාපනයේ ගුණාංග ගැන කථා කරන්නේ නැහැ. මේ මන්ත්‍රීවරු සාක්ෂි දරයි, පිළියන්දල කලාපයේ අපි කොහොමද අධ්‍යාපනයට කැප වෙන්නේ කියලා. නමුත් ඔබතුමන්ලාගේ පක්ෂයේ මොරටුවේ නාගරික මන්ත්‍රීවරු සොයිසා එකේ ප්‍රින්සිපල්ව එළවලා දැම්මා ඔබතුමාගේ කාමරයට ඇවිල්ලා. ඒකව ගෙනැල්ලා පිළියන්දල ධර්මරාජ විද්‍යාලයට දැම්මා. මම එපා කිව්වා. ලේකම්ට කිව්වා. විජේතුංගට කිව්වා. ඔබතුමාට කිව්වා. ශත දොයිතුවකට ගණන් ගත්තේ නැහැ. ඌ ඉස්කෝලෙට එහා පැත්තේ ගෙදර අරක්කු බි බී ඉන්නවා. පාසලට එහා පැත්තේ ගෙදර අරක්කු බොනවා. මම තමුන්නාන්සේගේ උපදේශක කාරක සභාවෙන් අස් වෙනවා කියලා කිව්වා. ඔබතුමාට ඒක හදාගන්න බැහැ. පළමුවැනි ශ්‍රේණියේ කියලා ඌට ඉස්කෝලේ එහා පැත්තේ ගෙදර බොන්න පුළුවන්. වරදක් නැහැ. පළමු වැනි ශ්‍රේණියේ ප්‍රින්සිපල්. මොකක්ද මේ පහත් දෙකයි පනහේ ළඳ බොළඳ වැඩ? කශේරුවක් තියාගෙන ඇමතිවරයෙක් විධියට ක්‍රියා කරන්න ඕනෑ. හැබැයි තමුන්නාන්සේලාගේ පක්ෂයේ අයට සොයිසා එකෙන් ගහලා එලවන්න පුළුවන්. ගෙනැල්ලා අහක යන කුණු ගොඩක් දානවා අපේ කලාපයේ පාසලකට. කිව්වාට අහන්නේ නැහැ. දැනෙන්නේ නැහැ.

නිලධාරීන් ඔබතුමාට උඩින් ගිහිල්ලා. මම බොන ගෙදරත් කිව්වා. පාසලට ගෙවල් දෙකක් එහායින් බොනවා කියලා. හොඳයි. Drink එකක් ගහන්න ඕනෑ. අද තමුන්නාන්සේගේ පාසල්වල තත්ත්වය මේකද? ගරු ඇමතිතුමනි, ඔබතුමා යටතේ අධ්‍යාපනය කඩා වැටුණා. ඒක ඔබතුමා පිළිගන්න. අපේ අමාත්‍ය මණ්ඩලයේ ඉන්න එකම උපාධිධාරියා. උපාධිධාරියා වැඩ කරනවා, අට පාස් වාගේ. අට පාස් උන් වැඩ කරනවා, උපාධිධාරීන් වාගේ. ඕක තමයි වෙනස. තමුන්නාන්සේ ගැන බොහෝ බලාපොරොත්තු අපේ හිත්වල තිබුණා. අද මුදලට හෙට ණයට වාගේ අපි හිතුවා හෙට හැදෙයි කියලා. හෙට හැදෙන්නෙත් නැහැ. බාලගිරි දෝෂය අහන්නෙත් නැහැ. නිලධාරී -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

හෙට හැදෙනවා.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

එතකොට බබා හම්බ වෙනවා. ගරු සභාපතිතුමනි, මෙතුමාගේ අමාත්‍යාංශය ගැන කථා කරන්න ගොඩක් දේවල් තිබෙනවා. නමුත් මම කථා කරන්නේ නැහැ. කථාවක් තිබෙනවා, කරපන්. කරලා දැන ගනින්. දැනගෙන කරපන් කියලා. තමුන්නාන්සේට කරලා දැනගන්න තේරෙන්නෙත් නැත්නම්, Experience, exposure දෙකම දන්නේ නැත්නම් අපි මොනවා කරන්නද? ඒක අපේ නොවෙයි. පළාතේ දරුවන්ගේ කරුමේ. මම තමුන්නාන්සේගේ සංස්කෘතිය ගැන නම් කියන්නේ නැහැ. ඒ ගැන කථා කරලා වැඩක් නැහැ. ක්‍රීඩා. ක්‍රීඩාවට මොකක්ද වුණේ? ගරු මහ ඇමතිතුමා එහා පැත්තේ පුටුවේ ඉන්නවා. ඔබතුමාට දෙන අයවැයත්, සොච්චම් අයවැයක්. ඕක අධ්‍යාපන ඇමති කෙනෙක්ට දෙන අයවැයක් නොවෙයි. හැබැයි ඉතින් අන්න හැදෙනවා නම් හැදෙන්න වම් අත පැත්ත බලලා. එහා පැත්තේ ඉන්නවා, වැඩ්ඩා. එයා Budget එකෙන් වැඩියෙන්ම සල්ලි තියාගෙන, ඔබතුමාව බාල්දු කරලා, ඔබතුමාගේ සල්ලි අරගෙන, ඒ අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වෙනවා. අධ්‍යාපන ඇමති උඩ බලාගෙන ඉන්නවා. පාසල් ගොඩනැගිලි ඔක්කොම හැදෙනවා, ප්‍රධාන අමාත්‍යවරයාගේ අමාත්‍යාංශය යටතේ.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ගරු සභාපතිතුමනි, හැම ඇමතිවරයෙක්ටම මේ අමාත්‍යාංශයෙන් දෙන්න පුළුවන් උපරිම මුදල් දීලා තිබෙනවා. මම තියාගෙන නැහැ.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

නැහැ. නැහැ. තියා ගත්තේ නැහැ. ඒක හරි.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

හිතේ අමාරුවට කෑ ගැහුවට මට කරන්න දෙයක් නැහැ. හරිද?

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ඒ නිසා අපේ අධ්‍යාපන අමාත්‍යවරයා විධියට ඔබතුමා ශක්තිමත්ව ක්‍රියාත්මක නොකරන තාක් කල් පළාතේ ජනතාවගේ දරුවන් වැටෙනවා. හැබැයි එහෙම වුණා කියලා ඔබතුමාව ඔය පුටුවෙන් එළවන්න දෙන්නෙත් නැහැ. දෙපාරක් බලනවා. එහෙම කරන්නෙත් නැහැ. අපිත් දේශපාලන ක්‍රීඩාවක ඉන්නේ. ඒ නිසා ඔබතුමා මේ කුමන්ත්‍රණ පිළිබඳ කරීකාවේදී -

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

සල්ලි කීයක් හරි ඉල්ල ගන්නද? මොනවා හරි ව්‍යාපෘතියක් ඕනෑද? මෙහෙන් කැරට් අල දෙන්නේ නැහැ.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

අපි බොහොම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා. මේ පළාත් සභාව තුළ පළාතේ ජනතාව - ගරු ප්‍රධාන අමාත්‍යවරයා එතුමාගේ කාර්යභාරය කරනවා. කෘෂිකර්ම අමාත්‍යතුමා තමන්ගේ යුතුකම තමන්ගේ අමාත්‍යාංශයේ කරනවා. බලන්න ලලිත් වනිගරත්න ගරු අමාත්‍යතුමා. ඉන්නේ කොහොමද? Cat වවුලා කියනවා වාගේ. කොහොමද දෙන ඔපරේෂන් ටෙන්ඩර් බෝඩ්. කවුරුත් දන්නේ නැහැ. Audit දන්නෙත් නැහැ. Auditor General දන්නෙත් නැහැ. ගේම ගහනවා, ලස්සනට. එහෙම ගත්තාම, අපේ උපාධිධාරී එකම ඇමතිවරයා ගැන මට දුකයි. ගත්ත දෙයකුත් නැහැ.

[ ගරු නිරෝෂන් පාදුක්ක ]

යන කොට ලොව්තුරු පූජා දෙක. මොකුත් නැහැ. ඒක නිසා තමුන්නාන්සේ -

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

හැදිච්ච මන්ත්‍රීවරයෙක් නේ. වැදගත් මන්ත්‍රීවරයෙක්.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ඔබතුමාට ගෙදර යන කොට සතුටෙන් ගෙදර යන්න පුළුවන්. මතුගම තමයි නිදහස් අධ්‍යාපනයේ පියා සිටියේ. එතුමාත් රබර් මුදලාලි කෙනෙකුට පැරදුණා. ඔබතුමා දන්නවා. ඒ නිසා ඔබතුමාත් පරිදින්නේ කාටද කියලා මම දන්නේ නැහැ. නමුත් ඔබතුමා අධ්‍යාපන අමාත්‍යවරයා විධියට පරාදයි. ඔබතුමා අසමත්. ඒක නිසා ඔබතුමා දැන ගන්න. ඔබතුමාට හැදෙන්න අපි අවුරුද්දක් දුන්නා. දෙකක් දුන්නා. තුනක් දුන්නා. තව මාස හතරෙන් ඔබතුමා Pension යනවා. ලබන අප්‍රේල් මාසයේ. ඊට පස්සේ එන කෙනා ඔබතුමාද? අපි කවුරුත් දන්නේ නැහැ. ඒක ජනතාව තීන්දු කරයි. ඔබතුමා ඉතාමත්ම හොඳ මහත්මයෙක්. වචනයේ පරිසමාප්තයෙන්ම මහත්මයෙක්. සහෝදරකම, අපේකම හොඳට දන්නවා. දන්නවා වුණාට, අධ්‍යාපන ඇමතිකම දන්නේ නැහැ. එතැනයි ප්‍රශ්නය තිබෙන්නේ. ඒ ගැන ඔබතුමාත් එක්ක අපි දිගින් දිගටම තර්ක කළා. දිගින් දිගටම ඔබතුමාට මේවා ගැන කරුණු පැහැදිලි කළා. සහෝදරයෙක්ට වාගේ කිව්වා. ඇමතිවරයෙක්ට වාගේ කිව්වා. ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරයෙක්ට වාගේ ඔබතුමාට මේවා දැනුවත් වෙන්න කිව්වා. නමුත් ඔබතුමා බීරි අලියෙක්ට වීණා වයනවා වාගේ කිසි දෙයක් ඇහට ගත්තේ නැහැ. ශරීරගත කර ගත්තෙත් නැහැ. එන්නත් කර ගත්තෙත් නැහැ. ඒ නිසා අද අවසානයේදී මේ දුක ඇවිල්ලා තිබෙන්නේ අපේ ප්‍රදේශවල අහිංසක දරුවන්ට. බොහෝදුරට අපි මන්ත්‍රීවරු විධියට සහභාගි වන අධ්‍යාපන අමාත්‍යාංශයේ අයවැයක මේ පළාත් සභාවේ තිබෙන අවසාන අයවැය. මේකේදී ඔබතුමාට සිහින මාළිගා හදන්න බැහැ. දවස් 120 ක් තමයි වැඩ කරන්න තිබෙන්නේ. ඒ දවස් 120 න් නිවාඩු දවසුත් 20 ක් විතර තිබෙනවා. එතකොට ඉතිරි වන්නේ දින 100 ක් විතර. ඒ 100 න් බදාදා දවස් ටිකක් තිබෙනවා. කියන තැනකට වඳින්නම් ලොක්කා, බදාදා උදේම ඇවිල්ලා - එන එක හරි. එන මිනිස්සුන්ට ටක් ගාලා කථා කරන්න. එක්කෙනෙක්ට පැයක් දෙන්න එපා. මිනිස්සු රස්තියාදු වෙනවා. දුක් විඳිනවා. බණිනවා. අව්වේ ඉන්න එක, රන්මඟ පායේ - ඕක හැදුවේ උපාලි කොඩිකාර ගරු මන්ත්‍රීතුමා. කෝ ඉන්නවාද? එයා ඒක රන්මඟ පාය කියලා දැම්මේ ඒක රනින් නිම කරන හින්දා නොවෙයි. දරුවන්ටත් ඒ නම ගැලපෙනවා කියලා ඔබතුමාගේ ලේකම්තුමා කිව්වා. රන්මඟපාය. හැබැයි රන්මඟපාය බස්නාහිර පළාතේ දරුවන්ගේ අනාගතය පිළිබඳව තීන්දු තීරණ ගන්න වැදගත් තැනක් කරනවා මිස ඒක අපායක් කරන්න එපා. රන්මඟපාය අපායක් කරන්න එපා. ඒක තමයි අපේ එකම ඉල්ලීම. ඒක නිසා ගරු සභාපතිතුමනි, අපි බස්නාහිර පළාතක් විධියට මේ අයවැයේදී විවිධ කණ්ඩායම්වල මතබේදවලට තුඩු දුන්නත්, ප්‍රතිපත්ති තීන්දු මොනවා වුණත් අපි පවතින පළාත් සභාවේ හැම අමාත්‍යවරයෙක්ටම, මන්ත්‍රීවරුන්ට උදව් කරනවා. හැබැයි මෙතැන තිබෙන ප්‍රශ්නය තමයි, අධ්‍යාපන අමාත්‍යාංශයේ උපදේශක කාරක සභාවේ අපි සිටියේ කළකිරීමෙන්. උපදේශක කාරක සභා ක්‍රියාත්මක වෙන්නේ නැහැ. මගේ මිත්‍ර මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමා යනවා. මෙරිල් ගරු මන්ත්‍රීතුමා කියයි, අපි සිටියේ දැඩි කළකිරීමෙන්. අපි උපදේශක කාරක සභාවල කියපු කිසි දෙයක් ක්‍රියාත්මක වුණේ නැහැ. සමහර අය ඉල්ලලා අස් වුණා. ඒවායේ පසුවිපරම් තිබුණේ නැහැ.

ඒ නිසා මේ සියලු කාරණා සම්බන්ධයෙන් ගරු අමාත්‍යතුමාට, අඩුම ගණනේ ලලිත් වනිගරත්න ගරු අමාත්‍යතුමා වාගේ හොඳ ලේකම්වරු දෙන්නෙක් තියා ගත්තෙත් නැහැ. ලලිත් වනිගරත්න අමාත්‍යතුමාට සැරියුත් මුගලන් වාගේ දෙපළක් දෙපැත්තේ සිටියා. සියලු දේවල් Balance කරගෙන ගෙනි යනවා. ඇමතිතුමා දන්නෙත් නැහැ. ගේම ගහලා ගෝල් එකක් ගැහුවාට පස්සේ තමයි දන්නේ, ගැහුවා කියලා. ඔබතුමාට එහෙම කාර්ය මණ්ඩලයක් සිටියේ නැහැ. ඒ නිසා හැම පැත්තෙන්ම ඔබතුමා අසාර්ථක වුණා. නමුත් ඔබතුමා හොරෙක් නොවෙයි කියන එක නම් මම කියනවා. ඔබතුමා හොරකම් කළේ නැහැ. ඒ චරිත සහතිකේ විතරක් අපි දෙනවා. නමුත් අමාත්‍යවරයෙක් විධියට ඔබතුමා අසාර්ථකයි. අසාර්ථකයි. අසාර්ථකයි. ඒ නිසා මේ කාරණයේදී අපි ඔබතුමාට කියන්නේ, ඒත් පරක්කු නැහැ. මිනිහෙක්ට හැදෙනවා නම් හැදෙන්න ඕනෑ තරම් මේ එක කථාවක් ඇති. අපේ රටේ නිදහස් අධ්‍යාපනයේ පියා බිහි කරපු මතුගමෙන් අපි බිහි කරපු අධ්‍යාපන ඇමතිතුමා බස්නාහිර පළාතේ දරුවන්ගේ

අධ්‍යාපනය සුන් කළා. කඩ කළා. ඒ නිසා මේ මාස හතරටවත් colors පෙන්වන්න. වැඩ පෙන්වන්න. ඔබතුමාට යෝධ බල යෝධ ශක්තිය උට්ඨාන වීර්යය ඔය තිබෙන ඔක්කොම ලැබේවා. ඒ විතරක් නොවෙයි. තව මොනවා හරි ඉතුරු වෙලා තිබෙනවා නම් ගිය ආත්මෙන් මේ ආත්මෙට carry forward කරපු පිං එහෙම තිබෙනවා නම් ඒ ටිකත් අරගෙන, ඉතුරු ටිකත් අරගෙන මේ ආත්මේදී මේ මාස හතරේදී මේ පළාතේ දරුවන්ගේ දෙනෙත් පාදන්න තීන්දු ගන්න ධෛර්යය ලැබේවා කියලා ප්‍රාර්ථනය කරමින් ඔබතුමාට චිරාත් කාලයක් ආයු වින්දනය කරන්න වාසනාව ලැබේවා කියා ප්‍රාර්ථනය කරමින් නිහඬ වෙනවා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

සාධු. සාධු.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට බෙහෙවින් ස්තූතිවන්ත වෙනවා. මොකද, අපි කාලයත් ඉතුරු කර ගත්තා. සහන් ප්‍රදීප් ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි 07 ක කාලයක් තිබෙනවා.

[අ.භා.03.10]

**ගරු සහන් ප්‍රදීප් විතාන**
Hon. Sahan Pradeep Vithana

ගරු සභාපතිතුමනි, 108 වැය ශීර්ෂය අධ්‍යාපන, සංස්කෘතික, ක්‍රීඩා හා යෞවන කටයුතු, තොරතුරු තාක්ෂණ අමාත්‍යාංශය සහ 108 සහ 126 වැය ශීර්ෂය පිළිබඳව අදහස් ප්‍රකාශ කරන්න අවස්ථාවක් ලබා දීම පිළිබඳව සතුටු වෙනවා. විශේෂයෙන්ම අද ගරු අධ්‍යාපන ඇමතිතුමාගේ අමාත්‍යාංශය පිළිබඳව කථා කරන කොට ගොඩක් වෙලාවට විපක්ෂයේ දොස් නැගීමක් තමයි සිද්ධ වෙන්නේ. ඒ පිළිබඳව උත්තර දෙන්න ඉස්සෙල්ලා ඇත්තටම මේ මුදල් ප්‍රකාශයේ මේ වසරේ ඇමතිතුමාට මුදල් වෙන් වෙලා තිබෙන ආකාරය පිළිබඳවත් මුලින්ම පුංචි අදහසක් ඉදිරිපත් කරලා කරුණු දක්වමු.

විශේෂයෙන්ම මුළු අයවැයෙන් 3.64% ක් වෙන් වෙලා තිබෙන්නේ අපේ අධ්‍යාපන අමාත්‍යාංශයට. ඒ වාගේම සාපේක්ෂව බැලුවොත් පුනරාවර්ථන වියදම්වලට 2017 දී මිලියන 208 යි. 2018 දී මිලියන 246 යි. ඒ වාගේම 2019 දී මිලියන 298 ක් වෙන් වෙලා තිබෙනවා. ඒ වාගේම ප්‍රාග්ධන වියදම්වලට නැත්නම් මූලධන වියදම්වලට 2018 දී මිලියන 632 යි. 2018 දී මිලියන 735 යි. ඒ වුණාට 2019 යේ අපි සතුටු වෙනවා. මිලියන 2491 ක් වෙන් වෙලා තිබෙනවා. අපි සාපේක්ෂව පොඩ්ඩක් හිතලා බැලුවොත් 2017 සත්‍ය වියදමට වඩා 2019 ඇස්තමේන්තුව මිලියන 1948 කින් වැඩි වෙලා තිබෙනවා. ඒක 232% ක වැඩි වීමක්. ඒ වාගේම 2018 ඇස්තමේන්තුවට වඩා 2019 ඇස්තමේන්තුව මිලියන 1808 කින් වැඩි වෙලා තිබෙනවා. ඒක 184% ක වැඩි වීමක්. ඒ වාගේම පුනරාවර්තන වියදම්. 2017 සත්‍ය වියදමට වඩා 2019 ඇස්තමේන්තුව මිලියන 90 කින් වැඩි වෙලා තිබෙනවා. ඒක 43% ක වැඩි වීමක්. 2018 ඇස්තමේන්තුවට වඩා 2019 ඇස්තමේන්තුව මිලියන 52 කින් වැඩි වෙලා තිබෙනවා. ඒක 21% ක වැඩි වීමක්. ඒ වාගේම තමයි ප්‍රාග්ධන. 2017 සත්‍ය වියදමට වඩා 2019 ඇස්තමේන්තුව මිලියන 1858 කින් වැඩි වෙලා තිබෙනවා. ඒක 294% ක වැඩි වීමක්. 2018 ඇස්තමේන්තුවට වඩා 2019 ඇස්තමේන්තුව මිලියන 1755 කින් වැඩි වෙලා තිබෙනවා. ඒක 239% ක වැඩි වීමක්. මේ විධියට අපි අපේ වියදම් කරන මූලාශ්‍ර දිහා බලන කොට සහ ආදායම් ප්‍රාග්ධන යෙදුම්වලට මිලියන 6.7 යි. ඒ වාගේම පළාත් ආදායම් සංවර්ධන කාර්යයන් සඳහා PDG වලට 2025 යි. ඒ වාගේම පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන PSDG වලට මිලියන 310 යි. ඒ වාගේම විශේෂ ව්‍යාපෘතිවලට, ලෝක බැංකුවෙන් ලබා දෙන ආධාරවලට මිලියන 150 යි. මේ විධියට බලන කොට ගරු සභාපතිතුමනි, විශේෂයෙන්ම කියන්න ඕනෑ. පළාත් සභාව රැස් කරන ආදායම්වලින් වැඩි ප්‍රමාණයක් මෙවර අපේ අධ්‍යාපන අමාත්‍යාංශයට වෙන් වෙලා තිබෙනවා. ඒ වාගේම තව කියන්න ඕනෑ. නිලධාරීන්ටත් මේක මතක් කරන්න ඕනෑ. තොරතුරු තාක්ෂණය කියන විෂයයට මුදල් වෙන් වෙලා නැහැ. PSDG වෙන් වෙලාත් නැහැ. PDG වෙන් වෙලාත් නැහැ. ඒ නිසා අපි ඉල්ලීමක් කරනවා. PDG වලින් හරි මේ මුදල් ලබා දෙන්න කියලා. ඒ වාගේම world bank එකෙන් ලබා දුන්නු මුදල් ගිය වසරට වඩා - ගිය වසරේ දුන්නේ මිලියන 83 යි. මේ වසරේ මිලියන 150 ක් දීලා තිබෙනවා. ඒ වාගේම අපි රටක් හැටියට බලන කොට පළාත හතරවැනි ස්ථානයේ ඉන්නේ. ඒ පිළිබඳව මම කථා කරන්නේ නැහැ.

ඒ වාගේම ක්‍රීඩා හා යෞවන කටයුතු විෂයයට PSDG වලින් මුදල් වෙන් වෙලා තිබෙනවා. හැබැයි, PDG වලින් මුදල් වෙන් වෙලා නැහැ. ඒ වාගේම තමයි සංස්කෘතික හා

[ ගරු සහන් ප්‍රදීප් විතාන ]

කලා කටයුතු විෂයයන්වලට PDG වලින් මුදල් වෙන් වෙලා නැහැ. PSDG වලින් මුදල් වෙන් වෙලා තිබෙනවා. ඒ නිසා මේ පිළිබඳවත් මේවා හදන කොට අවධානය යොමු කරන්න. නැත්නම් PDG වලින් මුදල් වෙන් කරන්න කටයුතු කරන්නය කියන ඉල්ලීමත් කරනවා. ඒ වාගේම විශේෂයෙන් මතක් කරන්න ඕනෑ. ගරු ඇමතිතුමාට නිතරම තමුන්නාන්සේලා දෝෂාරෝපණය කරනවා. අපි කැලණි කලාප කාර්යාලයට මුදල් ඉල්ලලා උපදේශක කාරක සභාවේදී සටන් කරද්දී, කැලණි කලාපය අද හොඳ තැනකට ගෙනහිල්ලා එතැන ස්ථාපිත කරන්න පුළුවන්කම ලැබුණේ එදා ගරු ඇමතිතුමා මිලියන 27 ක් කැලණි කලාප කාර්යාලයට ලබා දුන්න නිසයි. අපට නොවෙයි. කලාප කාර්යාලය ස්ථාපිත කළා. ඒ නිසා මම ඒ අවස්ථාවේදී ඒ නිර්භීත තීන්දුව ගද්දී, ප්‍රධාන ලේකම්තුමාත්, අමාත්‍යාංශ ලේකම්තුමාත්, ඇමතිතුමාත් එක්ක ඉඳගෙන කටයුතු කළා. ඒකට අපේ ස්තුතිය පුද කරනවා.

ඒ වාගේම තමයි පාසල්වලට දරුවන් ඇතුළත් කිරීම පිළිබඳව ගරු ඇමතිතුමාට බණිනවා. හැබැයි අධ්‍යාපන අමාත්‍යාංශයෙන් එවන චක්‍රලේඛවල පන්ති කාමරයේ දරුවන් එන්න එන්න අඩු කරන්න කියනවා. ජනප්‍රිය පාසල්වල දරුවන් අඩු කරන කොට හැබැයි ගමේ පාසල දියුණු වෙලා නැහැ. ගමේ පාසල එකපාර දියුණු කරන්න පුළුවන්කමක් නැහැ. ඒ නිසා ගරු ඇමතිතුමා බැණුම් අහනවා. ඒ නිසා මේ එවන චක්‍රලේඛ ජාතික පාසල් උල්ලංඝනය කරනවා. ජාතික පාසල්වල ළමයින් 45 ට වඩා දානවා. 37 ට වඩා දානවා. හැබැයි අපේ ජනප්‍රිය පාසලක ළමයෙක් දාන්න ගියාම දෙන්නේ නැහැ. එතකොට ගරු ඇමතිතුමා බැණුම් අහනවා. අපේ නිලධාරීන් දරුවෝ ඇතුළත් කරලා තිබෙනවා. අද බැණුම් අහන්නේ වැරදි විධියට හරි, නැත්නම් අපේ උවමනාවට හරි දරුවෝ දාලා දෙන්නේ නැති නිසා. ඒක හැබැයි ජාතික පාසල්වල ඉන්න, අධ්‍යාපන අමාත්‍යාංශයේ මහ ආණ්ඩුවේ ඉන්න අය කරනවා. හැබැයි අපට කරන්න දෙන්නේ නැහැ. ඒ නිසා ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා. අපේ පළාතේ ජනප්‍රිය පාසල් 67 ක් තිබෙනවා. මේ චක්‍රලේඛවලට එහා ගිහිල්ලා මේ වසරේ එම පාසල්වලට දරුවන් ඇතුළත් කරන්න කටයුතු කරන්නය කියන ඉල්ලීම කරනවා. ඒ වාගේම තමයි අපි දන්නවා, ඔබතුමා මිලියන 3500 කට සැලසුම් හැදුවා. තමුන්නාන්සේ මේ නිලධාරීන් එක්ක එකතු වෙලා කලාප කාර්යාලවලින් අරගෙන මිලියන 3500 කට හැදුවා. හැබැයි ඒවා ක්‍රියාත්මක කරන්න ලැබුණේ නැහැ. අද තමුන්නාන්සේ බැණුම් ඇහුවත්, අපි සත්‍ය ඇති සැටියෙන් දන්නවා, ඔබතුමා බැණුම් අහන්නේ ඇයි කියලා. ඒ නිසා ඔබතුමාට වෙන් වුණු මුදල, තමුන්නාන්සේලාට මම ඉස්සෙල්ලා කිව්වා. 2017 දී, 2018 දී මෙපමණ මුදල් වෙන් වුණේ නැහැ. අඩුවෙන් මුදල් වෙන් වුණේ. මේ වසරේ තමයි මිලියන 2491 ක් ලැබුණේ. ඒ නිසා මන්ත්‍රීවරුන්ට උදව් කරන්න. අපට ලක්ෂ 05 යි දුන්නේ. අපි හැමෝටම ලක්ෂ 05 යි දුන්නේ. ලක්ෂ 05 න් පුළුවන් ද වැඩ කරන්න. එතුමාට ඒවා ලබා දෙන්න පුළුවන්කමක් තිබුණේ නැහැ. ඒ නිසා අපි අධ්‍යාපන ඇමතිතුමාට බණින කොට අපි ආපස්සට හැරිලා පසු විපරම් කරන්න ඕනෑ. ඇයි අපි බණින්නේ? මොකක්ද හේතුව කියලා. එතුමාට හොඳ කියනවා. එතුමා හොරකම් කළේ නැහැයි කියනවා. එහෙමනම් එතුමා කරපු වරද මොකක්ද? එතුමාට මුදල් තිබුණා නම් මුදල් දෙනවා. ළමයි ඇතුළත් කරන්න චක්‍රලේඛ ගැටලුවක් නොවුණා නම් ළමයි ඇතුළත් කරන්න දෙනවා. ඒ නිසා අපි ඔබතුමාගෙන් ඉල්ලීමක් කරන්නේ. ඒ සියලු අභියෝග, ඒ සියලු කාරණා මේ වසරේදී මේ කෙටි කාලය තුළ අපි සියලුම ගරු මන්ත්‍රීවරුන්ගේ ගෞරවය රැකෙන විධියට ඔබතුමා කටයුතු කරලා අපි සියලුදෙනා හෙට දවසේ ජයග්‍රහණය කරන්න අවශ්‍ය පසුබිම මේ අධ්‍යාපන අමාත්‍යාංශය තුළ ගොඩනඟන්න ඔබතුමා කටයුතු කරන්නය කියලා අපි කියනවා.

ඒ වාගේම ගුරුවරුන් බඳවා ගන්න කියනවා. ගුරුවරුන් අඩුයි කියනවා. මට කියන්න මේ පුනරාවර්තන වියදම්වල ගුරුවරුන් බඳවා ගන්න ශත පහක් වෙන් වෙලා නැහැ. ගුරුවරුන් බඳවා ගන්න මුදල් වෙන් කරන්නේ නැතිව අධ්‍යාපන ඇමතිතුමාට කියනවා, ගුරු පුරප්පාඩු තිබෙනවා. බඳවා ගන්න කියලා. බඳවා ගන්න මුදල් කෝ? මුදල් නැතිව බඳවා ගන්න පුළුවන්කමක් නැහැ. ඒ නිසා මේ ඇමතිතුමාට බණින සෑම වෙලාවකම, දොස් කියන සෑම වෙලාවකම අපි මේ මුදල් ප්‍රකාශයත් එක්ක අපි ගනුදෙනුව කරන්නට ඕනෑ. මුදල් ප්‍රකාශයෙන් එතුමාට ප්‍රතිපාදන නැත්නම්, චක්‍රලේඛවලින් එතුමාව හිර කරලා තිබෙනවා නම්, නිලධාරීන් හිර කරලා තිබෙනවා නම් එතුමාට බැන්නාය කියලා හරියන්නේ නැහැ. අපි 104 දෙනාම එකතු වෙලා මේ සියල්ල ජයග්‍රහණය කරන්න, ඒවා විසඳා ගැනීම සඳහා කටයුතු කරන්න ඕනෑ. ඒ සඳහා අපි සියලු දෙනා පෙළගැහෙන්න ඕනෑය කියන එක කියමින් -

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

මුදල් ප්‍රකාශය හැදුවේ අපි නොවෙයි.

**ගරු සහන් ප්‍රදීප් විතාන**
Hon. Sahan Pradeep Vithana

කවුරු කොහොම විපක්ෂය දෝෂාරෝපණය කළත් ආණ්ඩු පක්ෂයේ ඉන්න මන්ත්‍රීවරු 56 දෙනාම එතුමාව මේ වැය ශීර්ෂයෙන් ජයග්‍රහණය කරන්න කටයුතු කරනවාය කියන එක මතක් කරමින්, ජයග්‍රහණය ලැබේවායි කියලා ප්‍රාර්ථනා කරනවා.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ඒක තමයි අපටත් ඕනෑ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මීළඟට රංජිත් සෝමවංශ ගරු අමාත්‍යතුමාට අවස්ථාව.

[අ.භා.03.19]

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ගරු සභාපතිතුමනි, බස්නාහිර පළාත් සභාවේ ඉතාම වැදගත්, ඒ වාගේම පුළුල් විෂයක් හැටියට සැලකෙන අධ්‍යාපන අමාත්‍යාංශය, ඒ වාගේම සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය, ඒ වාගේම ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය සහ දරුවන්ගේ හෙට දවසට ආමන්ත්‍රණය කළ හැකි තාක්ෂණ කටයුතු විෂය භාරව තමයි මම ඇමතිවරයා හැටියට කටයුතු කරන්නේ. මට මතක් වෙනවා. දීර්ඝ කාලයක් මේ අමාත්‍යාංශයේ ගත කරපු කෙනෙක් හැටියට වසර තුනක් විතර අද දවසේ වාගේම පසුගිය පළාත් සභා අයවැය විවාදයේදීත් නිරෝෂන් පාදුක්ක ගරු මන්ත්‍රීතුමා වෙන්නට පුළුවන්. මහින්ද ජයසිංහ ගරු මන්ත්‍රීතුමා වෙන්නට පුළුවන්. අද අදහස් ප්‍රකාශ නොකළත් සුසිල් කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමා වෙන්නට පුළුවන්. මේ පැත්තෙන් සහන් ප්‍රදීප් ගරු මන්ත්‍රීතුමා වෙන්නට පුළුවන්. මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමා වෙන්නට පුළුවන්. මේ සියලු දෙනා අදහස් ප්‍රකාශ කළා. ඒ සියලු අදහස්, යෝජනා ඒ වාගේම මගේ අමාත්‍යාංශයට ලැබුණු විවිධ චෝදනා පවා ඉතාම හෘදයාංගමව භාර ගෙන, ඒ සියල්ල ක්‍රියාත්මක කිරීම පිළිබඳව මගේ මනස ප්‍රඥාවෙන් පිරුණු බවක් මම මතක් කරන්නට ඕනෑ. අද දවසෙත් තිබෙන කාරණාව, ඒ කාරණාවම තමයි. ඒ නිසා සහන් ප්‍රදීප් ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කළා වාගේ අධ්‍යාපනයේ භෞතික සංවර්ධනය සඳහා විධිමත් සැලසුමක් සකස් කරන්න මට පුළුවන්කම ලැබුණා. ඒ වාගේම අධ්‍යාපනයේ ගුණාත්මක පැත්ත සංවර්ධනය කිරීම සඳහා විධිමත් සැලැස්මක් සකස් කරන්න මට පුළුවන්කම ලැබුණා. විශේෂයෙන් ගුරුවරු බඳවා ගැනීම, ගුරු පුහුණුවීම්, ඒ වාගේම අපේ අධ්‍යාපනය තුළ අපි අත්දකින විෂයන්වල තිබෙන පසුබෑම. විෂය ප්‍රවර්ධන කටයුතු සඳහා විශේෂ ව්‍යාපෘති ගණනාවක් මට ගොඩනගන්න පුළුවන්කම ලැබුණා. මේ කාරණා සියල්ල තුළ ඇත්තටම සංස්කෘතික සහ කලා කටයුතු අමාත්‍යාංශය අද දවසේ වෙනදාටත් වැඩිය - මම මතක් කරන්න ඕනෑ. පන්ති කාමරයට බර තැබිය හැකි විශේෂ විෂයක්. අපේ කෝකිලා ගුණවර්ධන ගරු මන්ත්‍රීතුමිය මේ සඳහා විශේෂ යෝජනාවක් ඉදිරිපත් කළා. ඒ නිසාවෙන් අපි මධ්‍යම රජයෙන් ලැබෙන විවිධ චක්‍රලේඛ තුළ හිර වුණාය කියන එක නිදහසට කාරණාවක්ම නොවුවත්, සිසුන් ඇතුළත් කිරීමේ කාරණාව සම්බන්ධව අපි ලොකු ගැටළුවකට මුහුණ දීලා තිබෙනවා. පසුගිය අවුරුද්දෙත් එහෙමයි. ඊට පෙර අවුරුද්දෙත් එහෙමයි. පන්ති කාමරයට දරුවන් සීමා කිරීම නිසාවෙන් දරුවන් පත් වන අපහසුතාවය පිළිබඳව ගරු නියෝජ්‍ය සභාපතිතුමා වරින් වර මා සමඟ වාද විවාදවලට කටයුතු කරලා තිබෙනවා. හැබැයි, මේ සියල්ලත් එක්ක, පවතින නීතිරීතිත් එක්ක, ඒ වාගේම දරුවන් වෙනුවෙන් අපෙන් විය යුතු වගකීමත් ඉටු කිරීමේදී අපි අපහසුතාවයන් කිහිපයකට මුහුණ දීලා තිබෙනවා. ඒ නිසා තමයි මේ වසරෙත් පළමු වසරට දරුවන් ඇතුළත් කිරීමේ කාරණාව තුළ අපි සෑහෙන ගැටළු ප්‍රමාණයකට මුහුණ දීලා තිබෙන්නේ. මම දන්නේ නැහැ මේ චක්‍රලේඛ කවුද හදන්නේ මේ චක්‍රලේඛ කොහෙන් එනවාද කියලා. ඔප්පුව සම්බන්ධව ලකුණු දීමේ ප්‍රතිපත්තිය වෙනස් කිරීම නිසාවෙන් තමන්ගේ අභියස තිබෙන පාසලට ඇතුළත් වීමේ අයිතිය පවා මේ දරුවන්ට අහිමි වෙලා තිබෙනවා.

ඒ සම්බන්ධව මගේ අමාත්‍යාංශයේ ලේකම්තුමා, නියෝජ්‍ය ලේකම්තුමා, පළාත් අධ්‍යක්ෂතුමා මේ සියලු දෙනා ඉතාම නිවැරදි අදහස් දැක්වීමක් ආණ්ඩුකාරතුමා එක්ක සාකච්ඡා කරලා අපි ඉසුරුපායටත් ගිහිල්ලා මේ ගැන කථා කළා. ඔවුන් ඒ වරද පිළිගන්නවා. හැබැයි, වරද වාචිකව ඒ මොහොතේ දී පිළිගත්තත් ඔවුන් ලිඛිතව

[ ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා]

ඒ වරද පිළිගන්න සූදානම් නැහැ. මම හිතන්නේ, ශ්‍රේෂ්ඨාධිකරණයට යා යුතුයි කියන තැනට මහින්ද ජයසිංහ ගරු මන්ත්‍රීතුමා යෝජනා කළේ ඒකයි. ඒ නිසාවෙන් මේ රටේ අධ්‍යාපනය ගොඩ නගන්නට නම් ඇත්තටම ප්‍රාථමික අධ්‍යාපනය ගොඩ නැඟිය යුතුයි කියන කාරණාව කුමන දේශපාලන මතයක ඉන්න මන්ත්‍රීවරයෙකු ප්‍රකාශ කළත් ඒක මම අවංකව පිළිගන්න කෙනෙක්. මේ රටේ ප්‍රාථමික අධ්‍යාපනය ගොඩ නැගෙන තාක්කල් ද්විතියික අධ්‍යාපනය පෝෂණය වෙන්නේ නැහැ. අද අපි මේ තිබෙන අධ්‍යාපන කොමිෂන් සභාවත් එක්ක මම නිරන්තරයෙන්ම කථා කරලා තිබෙනවා. අද අපි විශ්ව විද්‍යාලවලින් ඇත්තටම බැහැර වන විවිධ විෂයයන් සම්බන්ධ උපාධිධාරීන්ව තමයි අපි ප්‍රාථමික අධ්‍යාපනයට යොමු කරන්නේ. ප්‍රාථමික අධ්‍යාපනයට සුදුසු අධ්‍යාපනවේදී උපාධිය ලත් අය පසුගිය අවුරුද්දේම අපට ලැබිලා තිබෙන්නේ 32 ක් වැනි සුළු ගණනක්. විශේෂයෙන්ම විද්‍යා පීඨවලින් තමයි ඒ ගුරුවරුන් අපට ලැබෙන්නේ. අපි යළි යළිත් කොළඹ විශ්ව විද්‍යාලයත් එක්ක ගිවිසුම්ගත වෙන්න, මේ දවස්වල සාකච්ඡා කරනවා. පන්ති කාරමයේ ප්‍රාථමික දරුවන්ගේ අධ්‍යාපනයට සුදුසු ගුරු භවතුන් විශ්ව විද්‍යාල අධ්‍යාපනය තුළින් ගොඩ නගා ගන්න. ඒ කාරණාව මම මේ අමාත්‍යාංශයේ සිටියත්, නොසිටියත් ඉදිරියේදී අනිවාර්යයෙන් කළ යුතු වෙනවා, ප්‍රාථමික අධ්‍යාපනය ගොඩ නගා ගන්න. ප්‍රාථමික අධ්‍යාපනය තුළ සෞන්දර්යය විෂය සම්බන්ධව ගුරුවරු පත් කිරීමේ ක්‍රමවේදයට අපට යන්නට වෙනවා. ඒක විශේෂයෙන් කළ යුතු දෙයක්.

ඒ වාගේම ප්‍රාථමික අධ්‍යාපනය පවතින ග්‍රාමීය දුෂ්කර ප්‍රදේශ පාසල් සංවර්ධනය කිරීම සඳහා විශේෂ ව්‍යාපෘතියක් ගොඩ නගන්න වෙනවා. මේ කාරණා නොකෙරෙන තාක්කල් ප්‍රාථමික අධ්‍යාපනය කිසියම් තැනක ලඝු වෙනවාය කියන කාරණාව මතක් කරන්නට ඕනෑ. ඒ වාගේම පහ වසර ශිෂ්‍යත්වය පිළිබඳව මගේ මනසේ නම් එතරම් ප්‍රසාදයක් නැහැ. පහ වසරේ ශිෂ්‍යත්වයෙන් බැට කන දරුවෝ, පහ වසර ශිෂ්‍යත්වය නිසාවෙන් අසරණ වන දරුවෝ, පහ වසර ශිෂ්‍යත්වයෙන් අසමත් වන දරුවෝ ජීවිතයම අසමත් වෙනවාද කියන කාරණාව වෙලාවකට අපේ මනසට දැනෙනවා. මම මතක් කරන්නට ඕනෑ. පහ වසර ශිෂ්‍යත්ව විභාගය අඩුම වශයෙන් දරුවන්ගේ ද්විතියික අවදියේවත්, ඒ කියන්නේ හත හෝ අට වැනි වසරටවත් මේ විභාගය ඉස්සරහාට රැගෙන යා යුතුයි කියන කාරණාව මතක් කරන්නට ඕනෑ. ඒ නිසාවෙන් අද විශේෂයෙන් මම මතක් කරන්න ඕනෑ. අපේ සකාවුල්ලා ගරු මන්ත්‍රීතුමාත්, ඒ වාගේම ෆයිරෝස් ගරු මන්ත්‍රීතුමාත් කතා කළා. දමිල දරුවන් වෙනුවෙන් මම විශේෂ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කළා. මම මතක් කරන්න ඕනෑ. පාසල් කිහිපයකට ඒ භෞතික සම්පත් ලබා දීම මම ඉතාම කැප වෙලා වැඩ කරපු කෙනෙක්. ඒ වාගේම දීර්ඝ කාලයක් දමිළ මාධ්‍ය ගුරු භවතුන්ගේ හිඟය අවසන් කරන්න මම ගුරු භවතුන් බඳවා ගැනීම සඳහා විභාග දෙකක් පැවැත්වුවා. ගරු සභාපතිතුමනි, 2014 දී පවත්වපු ගුරු විභාගය - ගුරු හිඟයක් පවතින බව ඇත්ත. ඒ ගුරු හිඟය පවතින්නේ ඇත්තටම විදේශ ගතවීම් හා ප්‍රසූත නිවාඩු නිසාවෙන්. අපි මේ මොහොත වන විටත් දෙසැම්බර් මාසයේ 31 ට කලින් සැලසුම් 516 ක් ගුරු පත්වීම් දීම සඳහා කරලා තිබෙනවා. 205 ක් පමණයි ඉතිරි වෙන්නේ. ඒ 205 ජනවාරි මාසයේ බඳවා ගෙන යළි විභාගයක්, ගුරුවරු බඳවා ගැනීමේ විභාගයක් යළිත් පවත්වන්නට මම තීන්දු කරලා තිබෙනවාය කියන එක මේ වෙලාවේ සන්තෝෂයෙන් මතක් කරන්න ඕනෑ. ඒ නිසා අද වෙලාව පිළිබඳව ගරු සභාපතිතුමාගේ උපදෙස් පරිදි කටයුතු කරන්න වෙනවා.

ගරු සභාපතිතුමනි, ඔබතුමාට මම බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා. මගේ අමාත්‍යාංශයේ කටයුතුවලට ඔබතුමාගේ උපදේශකත්වය, සභාපතිත්වය ලැබීම පිළිබඳව. ඒ වාගේම ගරු ප්‍රධාන අමාත්‍යතුමාගෙන් ලැබුණු මග පෙන්වීම ඉතාම කාරුණිකව සිහිපත් කරනවා. ඒ වාගේම අපේ සහෝදර අමාත්‍ය මණ්ඩලයෙන් ලැබුණු ඉතාම සහයෝගය කාරුණිකත්වය මේ වෙලාවේ සිහිපත් කරනවා. එමෙන්ම ගරු මන්ත්‍රීතුමන්ලා, මන්ත්‍රීතුමියන්ලා සියලු දෙනා, ප්‍රධාන ලේකම්තුමා, ඒ වාගේම මගේ අමාත්‍යාංශයේ ලේකම්තුමා, පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂතුමා, කලාප අධ්‍යාපන අධ්‍යක්ෂතුමන්ලා, විදුහල්පතිතුමන්ලා හා දයාබර ගුරු භවතුන්, දෙමව්පියන් ඒ වාගේම මාධ්‍යවේදී හිතවතුන්ගෙන් ලැබුණු සහයෝගය ඉත සිතින්ම මේ වෙලාවේ සිහිපත් කරනවා. මම මේ වෙලාවේ එක දෙයක් මතක් කරන්න ඕනෑ.

**ගරු ඉෆ්තිකාර් ජෙමීල් මරික්කාර්**
Hon. Ifthikar Jemil Marikkar

ගරු ඇමතිතුමා, උසස් පෙළ දෙමළ පන්තිත් දෙන්න.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ගරු සභාතිතුමනි, අධ්‍යාපනයේ බොහෝ දේවල් කරන්න මගේ මනස පොහොසත්. යළිත් කියන්නට ඕනෑ. මම

පසුගාමී මනුෂ්‍යයෙක් නොවෙයි. හැබැයි, නිවැරදි සත්‍ය, මට මගේ පිටිපස්සේ ඉන්න සහන් ප්‍රදීප් ගරු මන්ත්‍රීතුමා මතක් කළා. මේ සියලු සැලසුම්, සියලු දේ මගෙන් වියැකී යන්නට හේතු වූයේ, මට මගේ අමාත්‍යාංශය කර ගෙන යන්නට ලැබුණු මූල්‍ය ප්‍රතිපාදන ශක්තිමත් වුණේ නැති නිසයි. ගරු සභාපතිතුමනි, මට මූල්‍ය ප්‍රතිපාදන ලැබෙනවා නම් මේ ඉදිරි මාස හතර තුළත් මේ අමාත්‍යාංශය යම් තරමකට ඔසවා ගෙන යන්න මට පුළුවන් යෝධ ශක්තියක් තිබෙන කෙනෙක්. හැබැයි, මම ස්තුතිවන්ත වෙනවා. මගේ සහෝදර ගරු මන්ත්‍රීතුමන්ලා මට යෝජනා කිහිපයක් ඉදිරිපත් කළා. ඒ යෝජනා කිහිපයකට ඉත සිතින්ම මේ සුරතින් අත්සන් කරලා ඔවුන්ගේ අදහස් වගකීමෙන් යුතුව භාර ගන්නවාය කියන එක මේ වෙලාවේ මතක් කරමින්, ගරු සභාපතිතුමනි, හෙට දවසේ වඩාත් සාර්ථක දවසක් කරන්නට, බස්නාහිර පළාතේ දරුවන්ගේ අධ්‍යාපනයේ වගකීම, වගවීම මවිසින් දරන බව සිහිපත් කරනවා.

***ප.භා. 03.29 ට, අංක 108 හා 126 යන ශීර්ෂ පිළිබඳ සාකච්ඡාව අවසාන විය.***

*Discussion on the Expenditure Head Nos 108 and 126 concluded at 03.29 p.m.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යාංශයේ වැය ශීර්ෂ 108 හා 126 පිළිබඳ විවාදය මේ මොහොතේ අවසන් වෙනවා. ඒ පිළිබඳව සභාවේ බෙදීමක් තිබෙනවාද?

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ගරු සභාපතිතුමනි, ඒ පිළිබඳව බෙදීමක් තිබෙනවා. ඡන්දයක් ඉල්ලා සිටිනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර සීනුව නාද කරන්න.

***ශීර්ෂ අංක 108 හි සඳහන් මුදල අනුමත කළ යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, පූර්ණ කාරක සභාව පක්ෂව 52 යි, විපක්ෂව 34 යි, වැළකුණු 00 යි යනුවෙන් බෙදුණේය.***

*The question that the amount indicated in the Head No. 108 should be approved was put and the Committee of the Whole Council was divided as 52 for, 34 against and 00 decliners.*

***ශීර්ෂ අංක 126 හි සඳහන් මුදල අනුමත කළ යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, පූර්ණ කාරක සභාව පක්ෂව 52 යි, විපක්ෂව 34 යි, වැළකුණු 00 යි යනුවෙන් බෙදුණේය.***

*The question that the amount indicated in the Head No. 126 should be approved was put and the Committee of the Whole Council was divided as 52 for, 34 against and 00 decliners.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මීළගට තිබෙන්නේ මාර්ග, ප්‍රවාහන, සමූපකාර සංවර්ධන හා වෙළඳ, නිවාස හා ඉදි කිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රාම සංවර්ධන අමාත්‍යාංශයේ වැය ශීර්ෂ ආරම්භ කිරීම.

| | | |
|---|---|---|
| **ශීර්ෂ අංක 107** | **-** | **මාර්ග, ප්‍රවාහන, සමූපකාර සංවර්ධන හා වෙළඳ, නිවාස හා ඉදි කිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රාම සංවර්ධන අමාත්‍යාංශය** |
| **ශීර්ෂ අංක 121** | **-** | **මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව** |
| **ශීර්ෂ අංක 122** | **-** | **සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව** |
| **ශීර්ෂ අංක 123** | **-** | **ව්‍යාපාර නාම රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව** |
| **ශීර්ෂ අංක 124** | **-** | **නිවාස කොමසාරිස් දෙපාර්තමේන්තුව** |
| **ශීර්ෂ අංක 125** | **-** | **කර්මාන්ත දෙපාර්තමේන්තුව** |
| **ශීර්ෂ අංක 103** | **-** | **සමූපකාර සේවක කොමිෂන් සභාව** |

| | |
|---|---|
| Head No 107 | Ministry of Roads, Transport, Cooperative Development and Trade, Housing and Construction,Estate Infrastructure facilities, Industries and Rural Development |
| Head No 121 | Department of Motor Transport |
| Head No 122 | Department of Co-operative Development |
| Head No 123 | Department of Registration of Business Names |
| Head No 124 | Department of Housing Commissioner |
| Head No 125 | Department of Industries |
| Head No 103 | Co-operative Employee's Commission |

*[සංකේත කපා හැරීම ]*
*[Symbolic write-off]*

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

ගරු සභාපතිතුමනි, ශීර්ෂ අංක 107, 122, 123, 124, 125 හා 103 මාර්ග, ප්‍රවාහන, සමූපකාර සංවර්ධන, වෙළඳ, නිවාස හාඉදි කිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රාම සංවර්ධන අමාත්‍යාංශයේ වැය ශීර්ෂයන්ගෙන් සංකේත වශයෙන් රු. 10/- ක මුදලක් අඩු කළ යුතු යැයි යෝජනා කරනවා.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*Question proposed*

[අ.භා.03.36]

**ගරු ජගත් පින්නගොඩ විතාන**
Hon. Jagath Pinnagoda Withana

ගරු සභාපතිතුමනි, මම මේ අමාත්‍යාංශයේ උපදේශක කාරක සභාවේ සාමාජිකයෙකු වශයෙන් මේ හතර වැනි අයවැයට අදහස් ඉදිරිපත් කරන අවස්ථාවේ මම ඉතාම කනගාටු වෙනවා. ඔබතුමාගේ මේ පොත් පිංචේ අපි යෝජනා කළා, මේ අවුරුදු හතර තිස්සේම මම වැදගත් යෝජනා දෙක තුනක් ඉදිරිපත් කළා. එක යෝජනාවක්වත් මේකේ සටහන් වෙලා නැහැ. පළමුවැනි යෝජනාව මම කළේ, හැමදාම කරන විධියට අපේ ඉන්න රියදුරුවරු, කොන්දොස්තරවරු සංචිතයකට ඇතුළත් කරලා ඒගොල්ලන්ට මේ රටේ පවතින නීතිය අනුව, ඒගොල්ලන්ට EPF, ETF ගෙවලා, ඒ සංචිතය මාර්ගයෙන් අපට අපේ බස් රථවලට කොන්දොස්තරවරු, රියදුරු මහත්වරු ලබා දෙන්නය කියලා. ඒක ක්‍රියාත්මක කරන්න අමාරු කාර්යයක් නොවෙයි. මම පහුගිය ඇමතිවරයා ඉන්න කොටත් කථා කළා. හැබැයි, මම ඔබතුමාට එක කැමැත්තක් තිබෙනවා. අපට හුඟාක් දුරට ඔබතුමාත් එක්ක කථා කරන්න පුළුවන්. අපට අදහස් දක්වන්න පුළුවන්. ක්‍රියාත්මක කිරීමේදී ඔබතුමා දක්වන අදහස්, ස්වරූපය පිළිබඳව මගේ එපමණ කැමැත්තක් නැහැ. මොකද, අපි මේ කෙටි කාල සීමාවක් තුළ, මොනවා හරි වෙනසක් කරන්න ඕනෑ. උපදේශක කාරක සභාවේ මම කථා කරපු කරුණු කාරණා ඔබතුමා දන්නවා. ඔබතුමා දන්නවා ඒවා ඉතා සාධාරණයි කියලා. මේ රටේ බස් කර්මාන්තයේ බස්නාහිර පළාතේ වැඩියෙන්ම ප්‍රායෝගිකව යෙදිලා ඉන්න පුද්ගලයා මමයි. ඒ නිසා මට මේ ප්‍රායෝගික තත්ත්වය පිළිබඳව ලොකු අත්දැකීම් සම්භාරයක් තිබෙනවා. ගරු සභාපතිතුමනි, අද බස් රථ පාලනය කරන්නේ බස් හිමියෝ නොවෙයි. අද බස් රථවල සියලුම දේවල් පාලනය කරන්නේ කොන්දොස්තරවරු, රියදුරු. එහෙම නැත්නම් ස්ටෑන්ඩ්වල ඉන්න රනර්ලා. කප්පම් ගැනීමේ සීමාවක් නැහැ. මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියෙන් මුන්ට පඩිත් ගෙවනවා. බස් රථයකින් රු. 100 ක් අය කරනවා. ගමන් වාර හතරක් යන බස් එකකින් - අපේ කොළඹ - මතුගම බස් 46 ක් තිබෙනවා. ගණන් හදලා බලන්න ගරු ඇමතිතුමා. ඇයි මේවා නවත්වන්න කටයුතු කරන්නේ නැත්තේ? ඇයි මේ මිනිස්සු එකම තැන අවුරුදු 25, 30 තියලා තිබෙන්නේ. ගමෙන් ගමට මාරු කළත් ඇති. මතුගම එක්කෙනා කළුතරට. අලුත්ගම එක්කෙනා කළුතරට. මේ මිනිස්සු බස්වල යන්නේ නිකම්ම නේ? Bus-stand වල Overseer. ඒගොල්ලන්ව මාරු කරන්නේ නැහැ. රනර්ලාව මාරු කරන්නේ නැහැ. ඔහේ තියාගෙන ඉන්නවා. මේ තුළින් මම දැක්ක දේ තමයි මේ මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ ඔය කොයි තරම් උගත්, අර ටයි දාගෙන මහත්වරු හිටියත් ඔයගොල්ලෝ මේ රටේ නීතිය තඹ දොයිතුවකට ගණන් ගන්නේ නැහැ. ඇයි ඕගොල්ලන්ට මේක කරන්න බැරි? ඇයි මේක කාර්යක්ෂම කරන්න, මේ දේ කරන්න බැරි.

මම දන්න තරමින් මේ පොත ගත්තායින් පස්සේ ඕගොල්ලන්ට කිසිම අලාභයක් නැතිව දුවන කර්මාන්තය තමයි මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය. ඔයගොල්ලන්ගේ ඉලක්ක ඔක්කොම සපුරා ගෙන තිබෙන්නේ, මේක අනුව. මේ මාස හය විතරයි ඉදිරිපත් කරලා තිබෙන්නේ. මේ මාස හයට තමන්ගේ ආදායම ඔක්කොම සපුරාගෙන තිබෙන්නේ. ඊට අමතරව මම කියන්න ඕනෑ. ඕගොල්ලෝ හැදුවා බස් ස්ටෑන්ඩ් එකක්. මිලියන 54 ක් ලක්ෂ 540 ක් වියදම් කරලා හැදුවා බස් ස්ටෑන්ඩ් එකක්. මතුගම. අපට බස් දෙකයි ගහන්න දෙන්නේ. මම දන්නවා. මේකේ වෙන් කරලා තිබෙනවා. ආපහු සැරයක් මතුගම - දැනට ක්‍රියාත්මක වන වැඩ සටහන්වලට අමතරව ඒගොල්ලන්ට 2019 වර්ෂයේදී ලැබෙන ප්‍රතිපාදන ප්‍රමාණය අනුව ආයිත් මේක පහත ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කෙරේ. ආපහු සැරයක් මේක සංවර්ධනය කරන්න. අපට බස් නවත්වන්න දෙන්නේ නැත්නම්, CTB බස් මේක 95% ක් පාවිච්චි කරනවා නම්, මොකටද අපේ මුදල් වෙන් කරන්නේ? එතැන තිබුණු බෝඩ් එක ගලවාගෙන ගියා. කොඩිකාර ඇමතිතුමන්ලා ගිහිල්ලා මහා ලොකුවට බෝඩ් එකක් දාලා මේක විවෘත කළා, දැන් ඒ බෝඩ් එක නැහැ. මිලියන 56 ක්

වියදම් කරලා මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියෙන් කියලා. ඒ බෝඩ් එක ගලවලා කවුරු හරි අරගෙන ගියා. අත්තනෝමතික විධියට CTB එක මේක පාවිච්චි කරනවා. මම කියනවා, මේ රටේ වෙන්නේ නැති වුණාට මේ CTB එකයි, මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියයි ඒකාබද්ධ වෙන්න ඕනෑ. එහෙම නැත්නම් මේ දෙකම එකක් වෙන්න ඕනෑ. මොකද, මේ රටේ මේ එකම කර්මාන්තයට නීති දෙක තුනක් තිබෙන්න බැහැ. දැන් අපේ බස් රථයකට root permit එකක් තිබෙනවා. අදාළ මාර්ග තිබෙනවා. ඉන් පිට යන්න බැහැ. CTB එකට ඒවා නැහැ. ඕනෑ තැනකින් හරවලා යන්න පුළුවන්. තනි දොර යන්න පුළුවන්. දොර දෙක යන්න පුළුවන්. කිසිම ප්‍රශ්නයක් නැහැ. මගීන් ඉන්නවා.

දැන් බලන්න. ඔබතුමාගේ කාර්යාලයෙන් අතුරු මාර්ගවල සෙල්ලමක් පටන් අරගෙන තිබෙනවා. සහතික ඇත්ත. අපේ පැත්තේ ඉන්නවා පුද්ගලික බස් රථ හිමියෙක්. මිනිහාගේ වැඩේම කාර්යාලයේ තමයි ඉන්නේ. මහත්වරු ඉන්නවා නේ? කාර්යාලට දොළ පිදේනි අරෙහෙන් මෙහෙන් හම්බ වෙනවා. වගකීමෙන් කියන්නේ. නැහැයි කියනවා නම්, ටක් ගාලා තොරතුරු කැඳවන්න. මම ඉදිරිපත් කරනවා. ඒ මනුස්සයා බස් රථ පර්මිට් පහක් හැදුවා. ගන්නේ මොකක්ද? අතුරු මාර්ගවලට කියලා ගන්නවා. මිනිස්සුන්ගේ අත්සන් ටිකක් දා ගන්නවා. අතුරු මාර්ගවලට කියලා අරගෙන මාස තුන හතරක් දුවලා මිනිහා මේක ලක්ෂ ගාණකට විකුණනවා. එසේ මෙසේ ගණන්වලට නොවෙයි. ලක්ෂ 50 ට 60 ට පර්මිට් එකක් විකුණන්නේ. ඔබතුමා දන්නවාද දැන් පර්මිට් එකක ගණන කීයද කියලා. පර්මිට් එක අවම ගණන ලක්ෂ 100 යි. මොනම ආදායම් බද්දකටවත් අහු වෙන්නේ නැහැ. මොනම තැනකින්වත් අහු කර ගන්න බැහැ. ඔබතුමන්ලා ලක්ෂයක් අරගෙන මාරු කරලා දෙනවා. එතකොට ඒ මිනිහා බස් රථ 05 ක් දැනට විකුණලා ඉවරයි. AC බස්. ඔහුට ආයෙත් එකක් දීලා. දැන් ස්ට්‍රයික් එක ඔන්න මෙන්න. දැන් අපි ගියා. මිනිහා මොන තරම් උපක්‍රමශීලී වෙලාද? ඔම්බුඩ්ස්මන්වරයා ළඟට පවා ගිහිල්ලා, පාර්ලිමේන්තුව පවා නොමග ඇරලා. අපි ඒකට කටයුතු කරලා තිබෙන්නේ. අපි වර්ජනය කරන්නේ අන්තිමට. මම තමයි බස් සංගමයේ සභාපති. හැබැයි, ඔබතුමාගේ එකක් තිබෙනවා. ඔබතුමා එක්ක ඕනෑ වෙලාවක කථා කරන්න පුළුවන්. හැබැයි, ඔබතුමා ක්‍රියාත්මක වෙන්නේ නැහැ. ඒ නිසාවෙන් අපට ඕනෑ නියෝගයක්. මේක නවත්වන්න කියලා. දැන් මේකේ අලුත්ම තත්ත්වය තමයි මේකේ පර්මිට් එකක් ගන්න කොට තාවකාලික පර්මිට් එකක් තමයි දෙන්නේ. මාස දෙක තුනකට. මාස දෙක තුනකට තාවකාලික පර්මිට් එක දීලා ඉවර වෙලා මේක අපි දන්නේම නැතිව ස්ථිර කරලා. මේ වාගේ අසාධාරණ වෙන්න දෙන්න බැහැ ඇමතිතුමා. අපි වියදම් කරපු සල්ලිවලට අපට සේවයක් කරන්න. අපට කොච්චර ලැබෙනවාද ආදායම්. මේ බලන්න. ඕගොල්ලන්ගේ ආදායම් ඉලක්ක ඔක්කොම සපුරලා තිබෙනවා අපේ බස් රථ හිමියෝ. ඉතින් අපව තරහාකාරයෝ විධියට සලකන්න එපා.

දැන් රන්මග පායට එන්න ඕනෑ, බස්නාහිර පළාතේම බස් හිමියෝ ටික. ඕගොල්ලන්ගේ අමාත්‍යාංශයෙන් බස් එකක පර්මිට් එකක් හරවන්න ගියාම ලක්ෂයක් ගන්නවා. මේ ලක්ෂය ගත්තාට පස්සේ අඩු ගණනේ මාසයකින් දෙකකින් බැරිද අර මෝටර් රථ දෙපාර්තමේන්තුවෙන් තහවුරු කර ගන්න මේ බස් එකේ අයිතිකාරයා මෙයයි කියලා. ඒක ගන්න යනවා අවුරුදු දෙකක්. මාස හයෙන් හයට මෙහෙට එන්න ඕනෑ බස් රථ හිමියා. හරි අපරාධයක්. මේ ප්‍රාදේශීය කාර්යාලවලින් සේවය ගන්නේ නැද්ද? මේ ප්‍රාදේශීය කාර්යාලවල ඉගෙන ගත්ත කට්ටිය නොවෙයිද ඉන්නේ? ඒගොල්ලෝ එස්.එස්.සී. පාස් නැද්ද? එස්.එස්.සී. පාස් වුණත් ඇති ඕක කරන්න. ඒ නිසා තමුන්නාන්සේලා මේ මිනිස්සුන්ව හරියට රස්තියාදු කරනවා. මේ මිනිස්සුන්ට මේ කර්මාන්තය එපා කරනවා. CTB එකයි අපියි අතර ගත්තොත් එහෙම ¾ ක් අපි. හතරෙන් එකයි ඒගොල්ලෝ. එතකොට ඒගොල්ලෝ අසීමිත වරප්‍රසාද භුක්ති විඳිද්දී අපේ මිනිස්සුන්ට ඇයි මේ කුඩම්මාගේ සැලකිලි. ඔබතුමාට ටික කාලයයි තිබෙන්නේ. ඒ ටිකේදී හරි ඔබතුමා මේක වෙනස් කරන්න. ගණන්කාරයෝ ටික පළවා හරින්න. කප්පම්කාරයෝ ටික අයින් කරලා දාන්න. අපි නම් කියලා උපදේශක කාරක සභාවේ කියන ඒවා මේවා කරන්නේ නැහැ. දැන් බලන්න. මතුගම. අවුරුදු හතරක්, පහක් තිස්සේ මම මේක කියනවා. පාන්දර තුනහ මාරට බස් රථයක් නුවරට පිටත් වෙනවා. ඊට පස්සේ දවල් 11 ට ඒ බස් රථය එනවා නුවරින් මතුගමට. ගරු සභාපතිතුමනි, කිසිම පර්මිට් එකක් නැහැ. කහ පාට ස්ටිකර් ද මොනවාද දෙනවා නේ? ඒ මොක්වත්ම හත්ඉලව්වක් නැහැ. ෂෝක් එකට ගිහිල්ලා ගෙදර එනවා. අවුරුදු ගණනක් තිස්සේ. හයද? කාටවත් හය වෙන්න එපා. ඇමතිකමක් ගත්තායින් පස්සේ හොඳට කොන්ද පණ තියාගෙන වැඩ කරන එකයි තිබෙන්නේ. මේ කාල සීමාවේ

[ ගරු ජගත් පින්නගොඩ විතාන ]

තමුන්නාන්සේ මේ වාර්තා පොතට එකතු වුණේ නැත්නම් තමුන්නාන්සේ නිකම් බණ්ඩක්කා, පතෝල වාගේ වෙනවා. එහෙම වෙන්න ඕනෑ නැහැ. නවත්වනවා නම් නවත්වපන්. ඇයි නිලධාරීන් ඉන්නේ. බස් ස්ටෑන්ඩ් එකෙන් නේ පිටත් වෙන්නේ. එතකොට අනික් මිනිස්සු කොහොමද නීතිගරුක වෙන්නේ? අනික් මිනිස්සුන්ට නේ පර්මිට් ඔක්කොම තිබෙන්න ඕනෑ. දණ්ඩ නීති සංග්‍රහයේ - දැන් අපේ පරීක්ෂක මහත්වරු ඉන්නවා. අලුත් බයිසිකල් දීලා තිබෙනවා. ඇමතිතුමා මේ කියන්නේ සහතික ඇත්ත. ගිය මාසේ මට එනවා. හැම මාසවලම එනවා. රුපියල් හත් දහස් ගණන් ගෙවන්නය කියලා. හේතුව මොකක්ද? නොනවත්වා ධාවනය. නොනවත්වා ධාවනය නම් බයිසිකල් එකක් දීලා තිබෙන්නේ. ගිහිල්ලා අල්ලගන්න බැරියැ බස් එක. එහෙම නැත්නම් මේ බස් ස්ටෑන්ඩ් එකෙන් අනික් බස් ස්ටෑන්ඩ් එකට කෝල් එකක් දුන්නාම එතැනින් නවත්වලා ගන්න බැරියැ ඒ මිනිහාගේ ලයිෂන් එක හරි මොකක් හරි තිබෙන බලපත්‍රයක්. පොලීසියේ වාගේ. ඒ මොකක්වත් නැහැ. ගැහුවා. ඒ නොනවත්වා ධාවනය නොවෙයි. රුපියල් සියය, දෙසීය දීලා නැහැ. ඒකයි ඒක ගහන්නේ. ඒ අතින් මේ මාර්ගස්ථ මගී ප්‍රවාහනය තරම් අවිනීත වැඩවලට උදව් කරන නිලධාරීන් පිරිසක් මේ කිසිම අමාත්‍යාංශයක නැහැ. මේක සහතික ඇත්ත. වගකීමෙන් මම මේ දේ කියන්නේ. මොකද, මම ප්‍රායෝගිකව බස්කාරයෙක් හින්දා. ඉතින් එතකොට තමුන්නාන්සේ බලන්න තිනියාවල - කොළඹ බස් රථය. උදේට තිනියාවල ඉඳලා කොළඹට එනවා, ගාලුපාරේ. හවසට මහරගමින් දාලා අත්තිඩියෙන් දාලා ආයිත් ගෙදර යනවා. බස් එකේ ඉස්සරහායි පස්සෙයි බෝඩ් දෙකයි. ලිඛිතව දුන්නා. කළුතර කාර්යාලයට පැමිණිලි කළා. කොළඹ කාර්යාලයට කිව්වා. නිරුපද්‍රිතව බස් රථය ධාවනය වෙනවා. මේවා නවත්වන්න. මේවා හොඳ ආදර්ශ නොවෙයි. වැරදි ආදර්ශ ඇමතිතුමා.

පරීක්ෂක මහත්වරු ගැන නම් තමුන්නාන්සේලාට මේක කියන්නම වෙනවා. මේගොල්ලන්ට එක්කෝ කියන්න බස් ස්ටෑන්ඩ් එකේ ඉඳලා බස් රථය පරීක්ෂා කරන්න කියලා. බස් ස්ටෑන්ඩ් එකෙන් නැගලා ඉවර වෙලා බස් රථයේ ඔක්කොම තිබෙනවාද? කොන්දොස්තරවරු දෙන්නාම යුනිෆෝම් ඇඳලාද? බලපත්‍ර තිබෙනවාද කියලා. අනික් ඒවා පොලීසියෙන් බලා ගනීවි. මාර්ග නීති උල්ලංඝනය කළොත් පොලීසියෙන් බලා ගනීවි. වේගය වැඩියෙන් ගියොත් පොලීසිය බලා ගනියි. මොකක්ද මේගොල්ලන්ට මේ දීලා තිබෙන අක්‍රමවත් ක්‍රියාවලිය. මේ ක්‍රියාවලීන් තමයි ඒගොල්ලෝ අසීමිතව ප්‍රයෝජනයට ගන්නේ. අනික් එක NTS බස්. NTS බස් කඩාගෙන එනවා. අනික් පැත්තේ ඉඳලා, ගාල්ලේ මාතර ඉඳලා එල්ලාගෙන එල්ලාගෙන එනවා. මාර්ග නීති ඔක්කොම උල්ලංඝනය කරනවා. මේ අපේ පරීක්ෂක මහත්වරු එක්කෙනෙකුටවත් ඒ බස් එකක් නවත්වන්න තහනම්. ඒගොල්ලන්ට පුළුවන් බස්නාහිර පළාතේ ඒවා විතරයි නවත්වන්න. ඇත්ත නේද ඇමතිතුමා? මේ දෙකම එකම නීතියක් වෙන්න එපැයි. එතකොට ඒගොල්ලෝ ඔක්කොම ටික උල්ලංඝනය කර ගෙන යනවා. අපේ මිනිස්සුන්ට දණ්ඩ නීති සංග්‍රහය දානවා. එහෙම කරන්න එපා ඇමතිතුමා. මොකද හේතුව? තමුන්නාන්සේගේ අමාත්‍යාංශයට කරදරයක් නැති මිනිස්සු ටික තමයි මේ ඉන්නේ. බස් රථ 6000 ක්. සේවකයෝ 12,000 ක්. 12,000 ම අයාලේ යනවා. 12,000 ටම නියාමනයක් නැහැ. 12,000 ම අත පය හතර වලංගු වුණේ නැති ගමන් උන්ට කිසිම දෙයක් කර ගන්න බැහැ. ඉතින් මේ තත්ත්වය හරිද? මේවා සද්භාවයෙන් කියන ඒවා. මේවා අපට ආයිත් කියන්න හම්බ වෙන එකක් නැහැ මම හිතන්නේ. තමුන්නාන්සේ හිටියත් නැතත්, අපි හිටියත් නැතත්, මේවා තමයි ඇත්ත මේ කර්මාන්තයේ.

සමූපකාරය ගැනත් කියන්න ඕනෑ. කාලය වේගයෙන් යන නිසා සමූපකාරය ගැන මට කියන්න තිබෙන්නේ, ඔබතුමා දන්නවා. මම උපදේශක කාරක සභාවේ ඉඳලා සමූපකාරයේ තිබෙන අක්‍රමවත්, ඒකේ වංචාවල් පෙන්වලා දුන්නා. ඊට පස්සේ කොමසාරිස්වරයෙක් පත් කළා. කොමසාරිස්තුමා ඇති. කොමසාරිස්තුමා පත් කළාට පස්සේ ඉතා හොඳයි. මතුගම තිබෙනවා කඩ 36 ක්. මේ 36 ම පාලනය කරන්නේ හිටපු අධ්‍යක්ෂ මණ්ඩලය. වගකීමෙන් කියන්නේ. ඒගොල්ලෝ ගෙවන්නේ රුපියල් 5000 යි, 6000 යි, 7000 යි සමූපකාරයට ගෙවන්නේ. ඒගොල්ලෝ ඒවා කුලියට දීලා තිබෙන්නේ 60,000 යි. 75,000 යි. මම කියන්නේ නැහැ ඒගොල්ලන්ගෙන් ගන්න කියලා. මම කිව්වේ වැඩි ගණනක්, 50% ක් වත් සමූපකාරයට දුන්නා නම්. මේ පාඩු ලබන සමූපකාරය. ඊට පස්සේ පත්තරේ දැන්වීමක් දැම්මා. මිනිස්සු ටෙන්ඩර් ෆෝම් අරගෙන බොහොම කැමැත්තෙන් ටෙන්ඩර් ෆෝම් ටික භාර දීලා බලාගෙන හිටියා. කිසිම දෙයක් නැහැ. මම අහනවා. ඒ මුදල් වියදම් කරපුවා දැන් කොහොමද අය කර ගන්නේ? පත්තරේ දාපු එක. ටෙන්ඩර්පත් ටික ආපහු ගන්න කිව්වා

මිනිස්සුන්ට. ඒ කියන්නේ, කිසිම නීතියක් නැතිව ගරු සභාපතිතුමනි. පුදුමාකාර රටක් මේක.

අපි මේ ඉන්නේ වැඩවසම් යුගයේද? මේක මෙහෙම වෙන්න පුළුවන්ද? හොර සණසක් තිබෙනවා. මම මොකද කළේ? මගේ වාහනය දීලා ඔබතුමාගේ නිලධාරීන් ආවාට පස්සේ සාක්ෂි ඇතිව ඔප්පු කළා මෙන්න හොර සණස. ලක්ෂ ගණන් අදත් ටිකට් කඩලා. ඒ කියන්නේ, පොඩි වෙළෙන්දන්ගෙන් ටිකට් කඩලා සණස සල්ලි එකතු කරනවා. මතුගම. ඒ සණස ලියාපදිංචි නැහැ. අනේ ඊට පස්සේ විමර්ශනයක් නැහැ. එහෙම්ම නැවතුනා. මම කිව්වා, ඒගොල්ලන්ව පොලීසියට දාන්න. පැමිණිලි කරන්න. නම් එක්ක දුන්නා. ඒක කළේ නැහැ. ඒක නවත්වලා දැම්මා. අදටත් ඒ හොර සණස ක්‍රියාත්මකයි. එතකොට අපි හොරුන්ට ඉඩකඩ දෙනවා. මම ඔබතුමාගෙන් ඉල්ලුවා. අපට දෙන්න ලියුම් කැල්ලක් හදලා. අපි උපදේශක කාරක සභාවේ මන්ත්‍රීවරු. මම කිව්වා, අපට නිකම් ලියුම් කැල්ලක් අත්සන් කරලා දෙන්න. සමූපකාරයට ගිහිල්ලා, එහෙම නැත්නම් මොකක් හරි අක්‍රමිකතාවයක් තිබෙනවා නම් සභාපතිව හරි කවුරු හරි හම්බ වෙලා - මේ උදව්වක් කරන්නේ. පඩි නැතිව. වාහන එපා. පඩි එපා. මොකුත් එපා. නොමිලයේ. ගරු සේවය. ගරු මන්ත්‍රී කියන්නේ ඒක නේ? කෝ දුන්නාද? නැහැ. කවුරුවත් යනවාද ඒ පැත්තට. නැහැ. නිලධාරීන්ට ඕනෑ විදියට, හරිම අක්‍රමවත් විදියට පවත්වාගෙන යනවා. අද සමූපකාරය පාඩුයි. දැන් කොමසාරිස් පාලනය අවුරුද්දක් ඉවරයි. මම දන්න තරමින් නම් නීතිය අවුරුද්දක් ඉවර වුණාට පස්සේ පළාතේ මන්ත්‍රීවරයාට පුළුවන් රජයේ සේවය කරන තුන් දෙනෙකුව නම් කරන්න මේකට. පුළුවන් ඇමතිතුමා. ඒක තිබෙනවා, ඔබතුමාගේ නීතිරීතිවල. නමුත් එහෙම නම් කිරීමක් සිද්ධ වුණාද? අපි ආසයි ව්‍යාපාර දියුණුව දකින්න. ඒ ව්‍යාපාර දියුණු කරන්න බැහැ හොර රංචුවත් එක්ක. ඇයි මේවාට ඔබතුමා නිශ්ශබ්දව ඉන්නේ. අපට මේ ටික කරගන්න දෙන්න ඇමතිතුමා. මොන තරම් දේවල් අපට සද්භාවයෙන් කරන්න පුළුවන්ද? ඉතින් අපි ඉන්නේ ඔබතුමාට උදව් කරන්න. ඔබතුමා මම ගරු කරන ඇමතිවරයෙක්. ඒක මම කියන්නම ඕනෑ. දැන් බලන්නකෝ මේ ජයසූරිය කියන පුද්ගලයා තමයි 35 දෙනෙකු එක්ක එකතු වෙලා ඔබතුමාට භාර දුන්නේ, මෙතන වංචාවක් සිද්ධ වෙනවාය කියලා. ඔබතුමාගේ විමර්ශනයෙන් ඇවිල්ලා වංචාව හෙළි කර ගත්තා. ලක්ෂ 100 කට වැඩියි වංචාව. ඊට පස්සේ මොකද වුණේ? ඊට පස්සේ මෙහෙම වුණාම, සමාලෝචන මණ්ඩලය කියලා එකක් මේ මණ්ඩලයේ එවුන් අහුවුණොත් අම්මපා - අහුවෙන්නේ නැහැ නේ අපට. අර මණ්ඩලේ දකින්න නැහැ නේ? සමාලෝචන මණ්ඩලයෙන් ඇවිල්ලා මොකද දන්නවාද කළේ? ලක්ෂ 100 ගරු සභාපතිතුමනි, ලක්ෂයට බැස්සුවා. මුළු වංචාවම ලක්ෂයට බැස්සුවා. ලක්ෂ 100 එක. 99 ක් කපා හැරියා. ඔබතුමා දන්නවාද? ඔබතුමා දන්නේ නැතිව ඇති වැඩ හන්දා. ඔබතුමාගේ ලේකම්වරයා හරි කාට හරි කියන්න මේ වාගේ බලු වැඩ කරන්න එපාය කියලා. හොරුන්ව ආරක්ෂා කරන්න එපාය කියන්න. දැන් අපේ රටේ මේ යූ.එන්.පී., ශ්‍රී ලංකා, ජේ.වී.පී. ප්‍රශ්නයක් නොවෙයි නේ තිබෙන්නේ. හොරුන්ට දඬුවම් නොකරපු ප්‍රශ්නය මේ තිබෙන්නේ. ඒ යූ.එන්.පී. හොරුද? ශ්‍රී ලංකා හොරුද? අරයාගේ හොරුද? හොරුන්ට දඬුවම් කරන්න. කිසි ප්‍රශ්නයක් ඇති වෙන්නේ නැහැ. ඒ නිසා මම තමුන්නාන්සේට කියන්නේ. මේ දේවල් අපට කරන්න පුළුවන් දේවල්. අපට උදව් කරන්න පුළුවන් දේවල්. අපි මේ සභාවට ඇවිල්ලා තිබෙන්නේ, මොනවා හරි දේවල් කරන්න. ඔබතුමා දන්නවා මම එක පර්මිට් එකක්වත් ගත්තේ නැහැ. මට ඔය පර්මිට් ඔක්කොම ගන්න තිබුණා. ඔබතුමා ඉන්න කාලේ. අද ලක්ෂ 15 ට ගත්තේ. ගුණසේකරලා ගත්තේ පර්මිට්. අද ලක්ෂ 100 ට විකුණන්න සොයනවා. ඔබතුමා ගුණසේකරට එක එල්ලේම පර්මිට් පහක් ද, හයක් ද දුන්නා. අද 100 ට විකුණන්න සොයනවා. සමහර විට මම ගනියිද නැද්ද දන්නේ නැහැ. මට එක පාරට හිතුනොත් ගනීවි. නමුත් මම කියන්නේ, මෙන්න මේ වාගේ වංචාවල් වෙනවා.

එතකොට මේ අවුරුද්දේ ග්‍රාමීය මාර්ගවලට දෙනවා නම් මේ පොතේ තිබෙනවා. ග්‍රාමීය මාර්ගවලට ගිය අවුරුද්දේ දීලා තිබෙන්නේ 12 යි. මේ අවුරුද්දේ 19 ක් දෙන්න යනවා. එතකොට 19 ක් දෙන කොට කරුණාකරලා දාන්න නීතියක් කිසිම දවසක මේ ග්‍රාමීය මාර්ගයට දෙන බලපත්‍රය ආයිත් වෙන මාර්ගයකට හරවන්න කථා කරන්නවත් එපාය කියන්න. එහෙම කොන්දේසියක් මේකට ඇතුළත් කරන්න. මේගොල්ලෝ ග්‍රාමීය මාර්ගයකට අරගෙන ප්‍රධාන පාරට දානවා. උදාහරණ තිබෙනවා. කොළඹ මතුගම බස් දැම්මා. ඒකට නෑබඩ සිට කොළඹ කියලා හැදුවා. බුලත්සිංහල - කොළඹ හැදුවා. කෙළින්ම ඇවිල්ලා වැටුණා මතුගම බස් 46 ක් තිබෙන ටර්න් එකට. පර්මිට් එක ලක්ෂ 150 යි. ඉතින් මේ කුඨ උපක්‍රමවලට අපි රැවටෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු ජගත් පින්නගොඩ විතාන**
Hon. Jagath Pinnagoda Withana

කාලය ඉවරයි. මට තව ගොඩක් දේවල් කියන්න තිබෙනවා. ගරු සභාපතිතුමනි, එකම දේ මම කියන්නේ. මට කියන්න තිබෙන කරුණු කාරණා අනුව ගරු සභාපතිතුමනි, අද බැස්ටියන් මාවතට ගිහිල්ලා බලන්න. ඒවායේ කාල සටහන කොහොමද ක්‍රියාත්මක වෙන්නේ කියලා. මේ නිලධාරීන් නොවෙයි. එක්කෙනෙක් දෙන්නෙක් තමයි පාලනය කරන්නේ. එහෙට මෙහෙට හසුරුවන්නේ. හැම නීතියකටම රිංගන්න පුළුවන් ක්‍රමවේදයක් මෙතැන තිබෙනවා. ඔක්කොම කොන්දොස්තරවරු, ඔක්කොම ටයිම් කීපර්වරු රට හවසට එකතු වුණාට පස්සේ කලෙක්ෂන් එක බලනවා බස් ස්ටෑන්ඩ් එකේ. බලලා රෙස්ට් හවුස් එකට යනවා කට්ටියත් එක්ක. ගිහිල්ලා ඉවර වෙලා හොඳට සප්පායම් වෙලා එනවා. කාගේද සල්ලි. මේ අසරණ බස් හිමියන්ගේ සල්ලි. අද බස් හිමියන්ට වාරිකය ගෙවා ගන්න බැහැ. උදව් කරන්නය කියලා මේ මිනිස්සුන්ට මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියෙන් මොනවාද කරන්නේ? මොකක් හරි උදව්වක් ඒ මිනිස්සුන්ට කරන්න. මට නම් අවශ්‍ය නැහැ. බස් හිමියා කියන්නේ සම්පතක්. අද රන් මග පායට බස් හිමියෙකු ඇතුළු වෙන කොට පපුව ගැහි ගැහී ඇතුළු වෙන්නේ. කී දෙනෙකුගෙන් බැණුම් අහන්න වෙයිද? කොපමණ දවසක් ඉන්න වෙයිද?

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

කීයක් දෙන්න වෙයිද?

**ගරු ජගත් පින්නගොඩ විතාන**
Hon. Jagath Pinnagoda Withana

කීයක් දෙන්න වෙයිද? පුදුමාකාර විධියේ රටාවක්. මේක මාළු කඩේ වාගේ. හරියට කොළඹ මැනිං මාකට් එක වාගේ. මේ වාගේ කරන්න එපා. ගරු ඇමතිතුමනි, මේ මාස හතර ඇති මේක හදන්න. ඔබතුමා මාව ගෙන්වන්න ඕනෑ වෙලාවක. මම ඕනෑ වෙලාවක එන්නම්. මොකද, මේ සම්බන්ධයෙන් ප්‍රායෝගිකව විශේෂඥ දැනුම තිබෙන කෙනෙක් මම. බස්නාහිර පළාතේ වැඩිම බස් සංඛ්‍යාව දුවන්නේ මේ මමයි. අදටත්. මේ කථා කරන මොහොතෙත්. ඒ නිසයි ඒවා මම දකින්නේ. මම කිසිම කරදරයක් ඔබතුමාට කරලා නැහැ. නමුත් අපට ඕනෑ මේ ක්ෂේත්‍රය විධිමත් කරන්න. මේ ක්ෂේත්‍රය නැති වෙන්න දෙන්න බැහැ. දැන් අපි ලැහැස්තියි. රට බස් දුවන්න ඕනෑ නම් ඔබතුමා අපට රට බස් දුවන්න දෙන්න. නමුත් පාඩු ලබනවා නම් ඔබතුමන්ලා ගණනේ මොකක් හරි දීමනාවක් දෙන්න. සල්ලි තිබෙනවා නේ අමාත්‍යාංශයේ. එතකොට CTB එකට යට වෙන්න ඕනෑ නැහැ. හරි. මේ මාර්ගයේ දුවනවා නම් අපි ඕගොල්ලන්ට රු. 2000 ක් දෙනවා. නැත්නම් දවසකට 1500 ක් දෙනවා. බලන්න කෝ? හැම තැනම බස් දුවයි ෂෝක් එකට. එහෙම නැතිව නිකම් කාල සටහන් හැදුවාට මිනිස්සු නැතිව බස් දුවන්න සූදානම් නැහැ නේ? පෞද්ගලික අංශය. ඉතින් CTB එකට දෙනවා නේ මහා භාණ්ඩාගාරයෙන් 50% ක්. එතකොට 10% ක් දෙන්න කෝ ඔබතුමා. එතකෙට අපි මේක කාර්යක්ෂම කරලා පෙන්වන්නම් කෝ. මෙන්න මේවා තමයි ඇමතිතුමා අපට කර ගන්න ඕනෑ. ඔබතුමාට මම පූර්ණ සහයෝගය දෙනවා. මේ යල් පැන ගිය නිලධාරීන් එක්ක මේ වැඩේ කරන්න බැහැ. ඒ නිසා අපට මෙන්න මේ දෙවල් කර ගන්න උදව් කළොත් අපි උදව් කරන්නම්. බොහොම ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය සභාපතිතුමා මූලාසනාරූඪ වනවා ඇත.

***ඊට අනුකූලව ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු නියෝජ්‍ය සභාපතිතුමා [යසපාල කෝරලගේ මහතා] මූලාසනාරූඪ විය.***

*Accordingly Hon. Chairman [Mr. Sunil Wijeratne] left the Chair and Hon. Deputy Chairman [Mr. Yasapala Koralage] took the Chair.*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මීළඟට ජානක සූරියබණ්ඩාර ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව.

[අ.භා.03.54]

**ගරු ජානක සූරියබණ්ඩාර**
Hon. Janaka Sooriyabandara

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ප්‍රථමයෙන්ම මම ස්තුතිවන්ත වෙනවා මට අවස්ථාව ලබා දීම ගැන. අද අපේ

පළාත් සභාවේ හය වැනි සැසිවාරයේ අවසාන අවුරුද්දේ අයවැයටයි අපි අද මේ කථා කරන්නේ. මේ අයවැය ඉදිරිපත් කරන වෙලාවේ මට භාර දීලා තිබෙනවා. මගේ උපදේශක කාරක සභාව වන, ලලිත් වනිගරත්න ගරු අමාත්‍යතුමාගේ අමාත්‍යාංශය වන මාර්ග, ප්‍රවාහන, සමූපකාර සංවර්ධන, වෙළඳ, නිවාස හා ඉදිකිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රාම සංවර්ධන අමාත්‍යාංශයේ වැය ශීර්ෂය යටතේ කථා කිරීමට.

මම මුලින්ම මතක් කරන්න ඕනෑ. ලලිත් වනිගරත්න ගරු අමාත්‍යතුමා මා නියෝජනය කරන ගම්පහ දිස්ත්‍රික්කය නියෝජනය කරන බස්නාහිර පළාතේ එකම ඇමතිවරයා. ඒ වාගේම අද මම හිතන්නේ, මුළු ගම්පහ දිස්ත්‍රික්කයේම ඉන්න එකම ඇමතිවරයා. මහ ආණ්ඩුවෙත් නැහැ. පළාත් සභාවේ ඉන්නෙත් ඔබතුමා විතරයි, ගම්පහ දිස්ත්‍රික්කය නියෝජනය කරමින් අපට. ඉතින් අපි එතුමාට මුලින්ම ස්තුතිවන්ත වෙන්න ඕනෑ. ගම්පහ දිස්ත්‍රික්කය දිහා බැලුවාම 95% කම පාරවල් ඒ කියන්නේ, C සහ D පාරවල් කාපට් කරලා, එහෙම නැත්නම් අංග සම්පූර්ණ ලෙස හදලා දීලා තිබෙනවා. වත්තල ආසනය දිහා, මම නියෝජනය කරන ආසනය දිහා බලපුවාම එක පාරක්වත් නැහැ. සියලු පාරවල් කාපට් කරලා අංග සම්පූර්ණ පාරවල් බවට පත් කරලා තිබෙනවා. ඒ නිසා මම ප්‍රථමයෙන්ම ස්තුතිවන්ත වෙන්න ඕනෑ. කවුරු මොනවා කිව්වත්, මට ඉස්සෙල්ලා කථා කරපු, අපේ මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය සම්බන්ධව දෝෂාරෝපණයෙන් කථා කළ ගරු මන්ත්‍රීතුමා කියපු බොහෝ දේවල් ඇත්ත. එතුමා මොනවා කිව්වත්, මාර්ග පිළිබඳව නම් අපට සෑහීමට පත් වෙන්න පුළුවන්. මම හිතනවා, ඒ ඇමතිතුමා මේ විෂය භාර ගන්න කොට එතුමාගේ අමාත්‍යාංශයේ එපමණ මුදල් තිබුණේ නැහැ. නමුත් ඊට ඉස්සෙල්ලා හිටපු ඇමතිතුමන්ලා වන නිමල් ලාන්සා ඇමතිතුමා, උපාලි කොඩිකාර ඇමතිතුමා මේ ක්ෂේත්‍රයේ ඉන්න කොට ආර්ථික කටයුතු අමාත්‍යාංශය හරහා, එහෙම නැත්නම් වෙනත් රේඛීය අමාත්‍යාංශ හරහා විශාල මුදල් කන්දරාවක් ආවා ඒ අමාත්‍යාංශය හරහා වැඩ කරන්න. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ වකවානුව තුළ අපේ පළාත් සභාවට අයිති පාරවල් විතරක් නොවෙයි. අපේ ප්‍රදේශයේ තිබෙන කිලෝමීටර් දෙක, තුන දුර ප්‍රාදේශීය සභාවේ පාරවල් පවා කාපට් කළා. කාපට් කරලා, සුදු ඉරි ඇඳලා, ඒවා ක්‍රමානුකූලව හැදුවා. මම හිතන්නේ, එතකොට බැසිල් රාජපක්ෂ ගරු ඇමතිතුමා තමයි හිටියේ. එතුමාගේ මග පෙන්වීම යටතේ තමයි මේවා කෙරුණේ. ඉතින් ඒ පාරවල් ඔක්කොම දැන් කාපට් කරලා ඉවරයි. නමුත් දැන් ගැටළුවක් මතු වෙලා තිබෙනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම ගරු ඇමතිතුමාට ඉදිරිපත් කරන්න ඕනෑ. මේ ප්‍රාදේශීය සභාවට අයිති පාරවල් සමහර බස් දුවන පාරවල් තිබෙනවා කිලෝ මීටර් හතරක් විතර දුර ඒවා. මේවා පළාත් සභාවෙන් දැන් අවුරුදු පහකට විතර ඉස්සෙල්ලා හදලා දුන්නාට, මේ පාරවල් ප්‍රාදේශීය සභාවට නඩත්තු කරන්න බැහැ. ප්‍රාදේශීය සභාවට එපමණ ආදායමක් නැහැ, මේ පාරවල් කාපට් කරන්න. ඒ නිසා මම යෝජනා කළා, එතුමා කිව්වා වාගේ. උපදේශක කාරක සභා කිහිපයකදීම. අපි හැමදාම හැම දෙයක්ම කරන්න ඕනෑ නැහැ. ඒ කියන්නේ, හැමදාම PRDA එකෙන් කරන්නේ පාරවල් හදන එක. ඒක පළාත් පාලන ආයතනවල අවුරුදු තුනක් විතර නායකයෝ නැති කොට, සභාපතිවරු නැති කොට කොමසාරිස්තුමියන්ලා මාර්ගයෙන් ලේකම්තුමියන්ලා අපූරුවට වැඩ කළා. ඇමතිවරයෙක් ඉන්න ඕනෑ නැහැ අපි කරන්න ඕනෑ දේ කරන්න. නිලධාරියෙකුට දුන්නාම ඒ ප්‍රාදේශීය සභා පාරවල් ටික හදාගෙන යනවා. නමුත් අපි අලුත් දේවල් පටන් ගන්න ඕනෑ. අපි බදු ගෙවන ජනතාවට වැඩි සේවයක් මේ පළාත් සභාවෙන් සිද්ධ වෙන්න ඕනෑ. එහෙම සිද්ධ වෙන්න ඕනෑ නිසා තමයි අපි යෝජනා කළේ. එක ආසනයකින් - ගම්පහ දිස්ත්‍රික්කය දිහා බැලුවාම උදාහරණයක් වශයෙන් ආසන 13 ක් තිබෙනවා. එක පාරක් තෝරා ගෙන අවුරුද්දකට සැරයක් හරි, අවුරුදු දෙකකට සැරයක් හරි තෝරා ගෙන ඒක නීත්‍යානුකූලව ප්‍රාදේශීය සභාවෙන් පළාත් සභාවට පවරා ගෙන ඒ පාරවල් නඩත්තු කරන්නේ පළාත් සභාවෙන්.

දැන් උදාහරණයක් විධියට දළුපිටිය පල්ලිය හරහා රාගමට යන බස් පාර. බස් තුනක් වැඩ කරනවා. කිලෝ මීටර් 4 ක් විතර දුර තිබෙනවා. ඒ කියන්නේ අපේ කොටස. දෙපැත්තේම වෙල. බස් දෙකක් මාරු වෙන්න බැහැ. මෙවැනි පාරවල්, අලුත් අත්දැකීම් අපි ලබා ගෙන, අලුත් දේවල් කරන්න ඕනෑ. අපි මේ කරන දේවල් කරන්න නම්, අපට අනික් ඇමතිවරු ඕනෑ නැහැ. මේ නිලධාරීන් හොඳටම ඇති. ඒ නිසා අලුත් දේවල් පටන් ගන්න. මම ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. අපි නොසිටියත් ලබන අවුරුද්දේ හරි, ඊළඟ අවුරුද්දේ හරි මෙවැනි දේවල් කරන්න. බදු ගෙවන මහජනතාවට විශාල සේවයක් සිද්ධ

[ ගරු ජානක සූරියබණ්ඩාර ]

වෙනවා, එවැනි පාරවල් පළල් කරලා, බස් මාර්ග බවට ඒවා පත් කරලා දුන්නාම. බස් මගීන්ටත් ඉන් විශාල සහනයක් සැලසෙනවා. ඒ නිසා බස් ප්‍රවාහනය කරන පාරවල්වත් අඩුම තරමින් බස්නාහිර පළාත් සභාවේ PRDA එක මුල් වෙලා සංවර්ධනය කරලා දෙන්නය කියලා ඉල්ලා සිටිනවා.

ඒ එක්කම ගරු ඇමතිතුමනි, දැන් අපි කාපට් කරපු පාරවල් බොහෝ ඒවා අපේ PRDA එකෙන්, එහෙම නැත්නම් පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරියෙන් හදනවා. නඩත්තු කරනවා. නමුත් මම කිහිප දවසක් කියලා තිබෙනවා. ඒ දවස්වල ඕනෑතරම් පාරවල් කාපට් කළා. ඔබතුමාගේ කාලයේත් කළා. ඒ කෙරුවාට, දැන් මේවා නඩත්තු කරන්න අමාරුයි. මේවායේ Edge එක දෙපැත්තෙන් කැඩී කැඩී එනවා. තව අවුරුදු දෙක තුනක් මෙහෙම කැඩී කැඩී ගියොත් ලක්ෂ 50 කින් රෙපෙයාර් කරන්න පුළුවන් පාර, කෝටි 10 ක් වත් යනවා ආපහු මුළු පාරම කාපට් කරන්න. ඒ නිසා මම අදාළ නිලධාරීන්ගෙන් ඉල්ලා සිටිනවා. එම පාරවල්වල දෙපැත්ත, විශේෂයෙන්ම පාරවල්වල දෙපැත්ත කාණු බඳින්න හරි, එහෙම නැත්නම් කාපට් කරන්න හරි ඒ දේවල් කරලා, පාරේ Edge එක හදලා දෙන්නය කියලා පාරේ පළල් කරන විධියට.

ඒ වාගේම ගරු ඇමතිතුමනි, අපි කථා කරන්න ඕනෑ සමුපකාරය ගැන. සමුපකාරය ගැන මට ඉස්සෙල්ලා කථා කරපු ගරු මන්ත්‍රීතුමා ඉතාමත් දෝෂාරෝපණ ලෙස කථා කළා. සමුපකාර ක්ෂේත්‍රයේ සිල්ලර කඩ, ඒ කියන්නේ සමුපකාර අපේ කඩ තිබුණා නේ? ඒ කඩ තිබෙන සමුපකාර ඔක්කොම අද වැහිලා. හේතුව, සමුපකාරයට හැප්පෙන්න බැහැ. විශේෂයෙන් කාගිල්ස් වාගේ මහා පරිමාණයෙන් කෙරෙන ආයතන වාගේ දේවල් එක්ක හැප්පෙන්න විධියක් නැහැ. සුපර් මාර්කට් එක්ක. අද මිනිස්සුත් පුරුදු වෙලා තිබෙන්නේ සුපර් මාකට් එකට යන්න. නමුත් අද සමුපකාරවලට පුළුවන් ඒ සුපර් මාකට් එකේ තත්ත්වයට අඩුම තරමේ ආසනයක, කොට්ඨාශයක කඩ දෙක තුනක් හදන්න. සුපර් මාකට් දෙක තුනක් හරි දාන්න. උදාහරණයක් වශයෙන් කිව්වොත් වත්තල ආසනයේ එහෙම එකක්වත් නැහැ. වත්තල ආසනයේ වටිනාකමින් යුත්, ඒ කියන්නේ වාණිජ වටිනාකමින් යුත් ඉඩම තිබෙන්නේ සමුපකාරය සතුව. අක්කරයකට කිට්ටු ඉඩමක් තිබෙනවා. මේ ඉඩමේ අපි යෝජනා කරලා තිබෙනවා, අපේ උපදේශක කාරක සභාව හරහා වාණිජමය වටිනාකමක් තිබෙන ආයෝජනයක් කරන්නය කියලා. සල්ලි ණයට අරගෙන හරි කමක් නැහැ. නමුත් කිසිම දවසක ඒක වුණේ නැහැ. කථා කරනවා විතරයි. ඒකේ එපාර්ට්මන්ට් ගහන්න පුළුවන්. ෂොපින් මෝල් එකක් අරින්න පුළුවන්. සුපර් මාකට් එකක් අරින්න පුළුවන්. එහෙම නැත්නම් උත්සව ශාලා, සිනමා හෝල් එකක් හදන්න පුළුවන්. මේවා එකක්වත් ගණනකට ගන්නේ නැහැ. ගරු ඇමතිතුමනි, අපි දැන් ආපු දා ඉඳලා මේවා කියනවා. මේවා සැලකිල්ලට ගත්තා නම් අඩු තරමේ අපට ඒකේ මුල්ගල තියලා වැඩ පටන් ගන්න තිබුණා. කෝටි ගණනක් වටින ඉඩමක්. පාළු අම්බලමක් බවට පත් වෙලා තිබෙනවා. වත්තල ආසනයේ හැඳල හන්දිය කියන්නේ, පර්චස් එකක් ලක්ෂ 40 ක් 50 ක් වටිනවා. අද ඒකේ කිසිම ප්‍රයෝජනයක් නැතිව ඔෆිස් එකක් ඇරගෙන, ප්‍රධාන කාර්යාලය ඇරගෙන ඒක පවත්වාගෙන යනවා. එපමණයි කරන්නේ. ඒ නිසා මෙවැනි දේවල් ගැන සැලකිලිමත් වෙලා ලේකම්තුමියන්ලා, ඒ වාගේම අධ්‍යක්ෂ මණ්ඩලය ඉන්න අය කථා කරලා මේවා සංවර්ධනය කරලා ගන්න.

මේ සමුපකාර අද නඩත්තු වෙන්නේ බැංකු මත. සමුපකාරවල බැංකු නොතිබෙන්න මෙලහකට සමුපකාර කියන නමත් ඉවරයි. අද බැංකුවල තිබෙන පොලිය මත තමයි සමුපකාරවලත්, ඒවායේ පඩි නඩිත් ගෙවන්නේ. ඒ නිසා එකම දෙයක් විතරක් නොවෙයි. දැන් මම යෝජනා කළා අපේ සමුපකාරවල ඉන්න සභාපතිතුමන්ලාට. අඩු තරමේ මිනී පෙට්ටි කඩයක් හරි දාන්න. අද මිනී පෙට්ටි කඩයක් දැම්මාම ඒ මිනී පෙට්ටිය විකුණන්න පුළුවන්. නමුත් එහෙම දෙයකටවත් උනන්දු වෙන්නේ නැහැ. මේගොල්ලෝ හදන්නේ නිකම් ඉඳගෙන, නිකම් පඩි අරගෙන, එහෙම නැත්නම් වෙන වෙන උපක්‍රමශීලීව වැඩ කරලා කීයක් හරි සොයා ගන්න. ඒ නිසා ගරු ඇමතිතුමනි, අපි මේ කියන දේවල් හොඳට අහන්න. අපි හැමදාම කරන දේවල් කරන්න මෙතැනට එන්න ඕනෑ නැහැ. සමුපකාර ඔහේ කරනවා. ග්‍රාමීය බැංකු ඔහේ කරනවා. අපි ග්‍රාමීය බැංකුවලින් සල්ලි හම්බ කරන එක ඇත්ත. ගරු සභාපතිතුමනි,දැන් ග්‍රාමීය බැංකුවල නිලධාරීන්ව සිංගප්පූරු හිටන් අරිනවා. සමුපකාර සංගම්වලින් අරිනවා. ඒගොල්ලන්ට සන්තෝෂම් වශයෙන් ඒගොල්ලෝ බිස්නස් වැඩියෙන් කරන කොට සිංගප්පූරු පවා අරිනවා. නමුත් පළාත් සභා මන්ත්‍රීවරු වන අපට මේ කාල සීමාවේ

සිංගප්පූරු තියා ඉන්දියාවටවත් යන්න ලැබුණේ නැහැ. නමුත් අපි එපමණ වරප්‍රසාද ඒගොල්ලන්ට දෙනවා. සමූපකාරවල ඉන්න සේවකයන්ට. ඒ නිසා අපි මේ සේවකයන්ව ප්‍රයෝජනයට අරගෙන සමූපකාර ක්ෂේත්‍රය නගා සිටුවන්න කටයුතු කරන්න ඕනෑ. එහෙම නැතිව ගියොත් සමූපකාර ක්ෂේත්‍රය වැහිලා යනවා. සමූපකාර කියලා කියන්නේ ගරු ඇමතිතුමනි, මිනිස්සුන්ට බඩු අඩුවට දෙන තැනක්. ගිනි ගණන්වලට බඩු ගන්න තැනක් නොවෙයි. ඒ නිසා අපි සියලු දෙනාම එකතු වෙලා බස්නාහිර පළාතේ තියෙන මේ සමූපකාර සියල්ලම ලබන අවුරුද්දේවත් අලුත් මුහුණුවරකින් නගා සිටුවන්න අපි කටයුතු කරමුයි කියලා මම ඉල්ලා සිටිනවා.

ඊළඟට මම කථා කරන්න ඕනෑ, කර්මාන්ත පිළිබඳව. ගරු අමාත්‍යතුමා යටතේ තිබෙන කර්මාන්ත ආයතනය විසින් කරන විශේෂයෙන් "බිඳුනු පුටුවට දැතේ සවිය" කියන ව්‍යාපෘතිය ඉතාම සාර්ථක ව්‍යාපෘතියක්. අපේ ඉස්කෝලවල තිබෙන කැඩුණු ඩෙස් පුටු ටික හදා ගන්න ඉතාම සුළු මුදලක් වියදම් කරලා ඒවා අලුත් වැඩියා කරලා දෙනවා. ඒක වැඩි කරන්න. මේ අවුරුද්දේ 100 ක් කළා නම් ලබන අවුරුද්දේ 200 ක් කරන්න සලස්වන්න. ඒ ව්‍යාපෘති තුළින් අපට මිනිස්සු ළඟට යන්න පුළුවන්. ඒ අලුත් ව්‍යාපෘතිය බොහොම හොඳයි. ඒ වාගේම ග්‍රාම සංවර්ධනය ගත්තාම ග්‍රාම සංවර්ධනය කර ගෙන ගියේ අපේ හිටපු අධ්‍යක්ෂ ගුණපාල මහත්මයා. එතුමා විශ්‍රාම ගියා. එතුමා වෙනුවට වෙන කෙනෙක් තවම පත් වුණාද දන්නේ නැහැ. නමුත් අපි එයාවත් මූලික කර ගෙන මේ ග්‍රාම සංවර්ධනය කියන එක දියුණු කරමු. අපි සෑම ගමකම ග්‍රාම සංවර්ධන සමිතියක් පිහිටවමු. පිහිටුවලා ඒ ග්‍රාම සංවර්ධන සමිතිය අපි ක්‍රියාකාරී කරමු. ක්‍රියාත්මක කරමු. කරලා ඒකේ හම්බ වන මුදල්වලින් ඒ ආසනයේ තිබෙන යටිතල පහසුකම්, ඒ වාගේම පූජනීය ස්ථාන, ඒ වාගේම අපි කරන සංවර්ධන වැඩවලට අපි ඒවා හවුල් කර ගනිමු. ඒ නිසා අපි අලුත් ව්‍යාපෘති අරගෙන අපේ ආසන දියුණු කරමු.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි කෝටි 650 ක් වියදම් කරලා මේ බිල්ඩින් එක හැදුවාට අපට මේ පාර මාරු වෙන්න විධියක් නැහැ. මේ පාරෙන් එහා පැත්තට යන්න විධියක් නැහැ. තවම කහ ඉරක් ගහලා නැහැ. මේකට එන අයට නතර වෙන්න බස් හෝල්ට් එකක් නැහැ. ඒ නිසා මම ඉල්ලා සිටිනවා, ලබන මාසයේම, මුලින්ම අපේ ප්‍රවාහන ඇමතිතුමාගේ නම ඉදිරියට ගෙනියන්න ඕනෑ නිසා මෙම ස්ථානයේ අංග සම්පූර්ණ බස් නැවතුම් පොලක් හදලා පාර මාරු වෙන්න කහ ඉරක් ගහලා දෙන්න කියලා. බොහොම ස්තුතියි.

[අ.භා.04.07]

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sri Warnasinghe

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපේ ගරු ලලිත් වනිගරත්න අමාත්‍යතුමාගේ වැය ශීර්ෂය සම්බන්ධයෙන් අදහස් කිහිපයක් පළ කරන්න අවස්ථාව ලැබීම පිළිබඳව මම පළමුවෙන්ම ස්තුතිවන්ත වෙනවා. මේ කාල වේලාව ලබා දීම පිළිබඳව අපේ විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමාටත් ස්තුතිවන්ත වෙනවා. පළමුවෙන්ම මම දේශපාලන වශයෙන් කරුණු කිහිපයක් කියන්න ඕනෑ. ලලිත් වනිගරත්න අමාත්‍යතුමාට මේ අමාත්‍ය ධූරය සඳහා අවස්ථාව ලැබීමට 2015 ජනවාරි 08 වැනිදා එම වෙනසට විශාල දායකත්වයක් ලබා දීපු, ඒ වෙනස වෙනුවෙන් සුවිශාල භූමිකාවක් ඉෂ්ට කරපු හිටපු ජනාධිපතිනි චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනියගේ මැදිහත් වීමත්, එතුමියගේ කාර්යභාරයත් කිසියම් ආකාරයකට පිටුවහලක් වුණාය කියලයි මම කල්පනා කරන්නේ. කෙසේ නමුත් අපේ ලලිත් වනිගරත්න මැතිතුමා ඒ ජනවරමට ගරු කරමින් එතුමා විපක්ෂයේ මන්ත්‍රීවරු සමඟත්, ආණ්ඩු පක්ෂයේ සියලුම මන්ත්‍රීවරු සහ දේශපාලන වශයෙන් වෙනස් මත දරපු සියලු දෙනා සමඟ සහයෝගයෙන් කටයුතු කරන්න හැකි සෑම ආකාරයෙන්ම එතුමා උත්සාහ කළා. ඒ විතරක් නොවෙයි. එතුමාගේ අමාත්‍යාංශය යටතේ කිසියම් ආකාරයකට මන්ත්‍රීවරුන්ට ලබා දිය හැකි සෑම ආකාරයකම ප්‍රතිපාදන සහ සංවර්ධන කටයුතු සඳහාත්, ඒ වාගේම අනෙකුත් කටයුතු සඳහාත් එතුමාගේ සහයෝගය ලබා දුන්නා. ප්‍රතිපාදන ලබා දුන්නා. ඒවා පිළිබඳව සොයා බැලුවා. ඒ පිළිබඳව අපි එතුමාට ස්තුතිවන්ත වෙනවා. නමුත් දැන් මේ මොහොතේ අපි කථා කරන්නේ රටේ ඇති වෙලා තිබෙන දේශපාලන තත්ත්වයත් එක්ක. අද අපට දේශපාලනික වශයෙන් අරගලයක් කරන්න සිදු වෙලා තිබෙනවා. ඒ අරගලය කරන්නේ මේ පුද්ගලානුබද්ධව නොවෙයි. මේ ආණ්ඩු පක්ෂයේ ඉන්න මහ ඇමතිතුමාවත්, ඇමතිවරුවත්, ධූරධාරීන්වත්, ඒ පාර්ශවයේ ඉන්න මන්ත්‍රීවරුන් එක්කවත් පුද්ගලික තරහක්, මරහක් නිසා නොවෙයි. අපි සියලු දෙනාම කැමැතියි මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය, මේ රටේ නිදහස, ඒ වාගේම මේ රටේ

[ ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ ]

නීතිය, මේ රටේ ව්‍යවස්ථාව, සම්ප්‍රදාය, සදාචාරය, ආචාර ධර්ම ආරක්ෂා කර ගනිමින් මේ රට ශීලාචාර, ශිෂ්ට සම්පන්න රටක් විධියට ඉදිරියට යනවා දකින්න. ඒ නිසා තමයි අපේ විවේචනය අපි ගෙන එන්නේ. ඒ නිසා තමයි අපේ අදහස් අපි ඉදිරිපත් කරන්නේ. ඒ නිසා මේකේ කවුරුවත් පුද්ගලිකව හිත් අමනාපකම් ඇති කර ගන්න අවශ්‍ය නැහැ. අද අපි මෙතැන බස්නාහිර පළාත් සභාවේ වැය ශීර්ෂයන් පිළිබඳව වාද විවාද කළත් ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, රටට අයවැයක් නැහැ. සාමාන්‍යයෙන් අපි දන්නවා. නොවැම්බර් මාසයේ පාර්ලිමේන්තුවේ අයවැය ඉදිරිපත් කරලා, සියලුම අමාත්‍යාංශවලට මුදල් වෙන් කරනවා. ඒ අනුව පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය සඳහාත් ප්‍රතිපාදන වෙන් කරනවා. මේ මොහොත වන කොට රටේ කිසිම අමාත්‍යාංශයකට 2019 වර්ෂය සඳහා ප්‍රතිපාදන වෙන් වෙලා නැහැ. පාර්ලිමේන්තුව නිශ්ක්‍රීය වෙලා. අගමැතිවරයෙක් නැහැ. කැබිනට් මණ්ඩලය නැහැ. අද පාර්ලිමේන්තුවත් විධායකයත් අතර තිබුණු ගැටුම මේ වන කොට අධිකරණයත්, විධායකයත් අතර ප්‍රශ්නයක් බවට පත් වෙමින් තිබෙනවා. ඒ නිසා ඒක ඉදිරි දින කිහිපය ඇතුළත සාමකාමීව විසඳෙයි කියලා අපි කල්පනා කරනවා. මොකද, මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය ගරු කරන සෑම කෙනෙක්ම කල්පනා කරන්නේ මේ ප්‍රශ්නය ඉතාම සාමකාමීව, සංහිඳියාවෙන් විසඳෙයි කියලයි අපි විශ්වාස කරන්නේ. මොකද, මම එහෙම කියන්නේ. මේකේ තිබෙන බරපතළකම පිළිබඳව බොහෝ දෙනෙකුට අවබෝධයක් නැහැ. අපි වාසනාවන්තයි, අපේ රටේ හමුදාව මෙවැනි ප්‍රශ්නවලදී මැදිහත් නොවී සාමකාමීව, ඒ වාගේම ප්‍රජාතන්ත්‍රවාදීව කටයුතු කිරීම සම්බන්ධයෙන්.

මෙවැනි ප්‍රශ්න ඇති වුණු අනික් රටවල්වල ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, හමුදාව බොහෝ විට රට අරාජික වෙන කොට, රට අස්ථාවර වෙන කොට, රටේ ව්‍යවස්ථාවට නීතියට විරුද්ධව කටයුතු කරන අවස්ථාවලදී හමුදාව තීරණාත්මක විධියට මැදිහත් වෙලා ඒ අවස්ථාවලදී ඒ රටවල්වල පාලන බලය ඔවුන් අතට අරගෙන තිබෙනවා. එහෙම නැත්නම් ඒ රටවල ජනාධිපතිවරු, අගමැතිවරු සිරභාරයට අරගෙන තිබෙනවා. එහෙමයි ඒ ප්‍රශ්න විසඳිලා තිබෙන්නේ. සමහර තැන්වල ජනාධිපතිවරු ඝාතනය වෙලා තිබෙනවා. අගමැතිවරු ඝාතනය වෙලා හමුදා පාලන බලයන් ස්ථාපිත වෙලා තිබෙනවා. මේ වෙලාවේදී අපි ඇත්ත වශයෙන්ම සතුටු වෙන්න ඕනෑ. හමුදාපති මේජර් ජනරාල් මහේෂ් සේනානායක මැතිතුමා මේ අර්බුදය ඇති වුණු අවස්ථාවේදී ඔහු ප්‍රකාශ කර සිටියා. කිසිසේත් හමුදාව මෙම දේශපාලන අර්බුදයට, ව්‍යවස්ථා අර්බුදයට මැදිහත් නොවන බව. නමුත් හමුදාවටත් ප්‍රශ්නයක් තිබෙනවා. ඉදිරි කාලයේදී හමුදාවේ වැටුප් ගෙවන්නේ කොහොමද? ඒ වාගේම හමුදාව එදිනෙදා නඩත්තු කටයුතු කර ගෙන යන්නේ කොහොමද කියන එක පිළිබඳව. දෙසැම්බර් 31 වැනිදායින් පස්සේ මේ රටේ 14 ලක්ෂයක් රාජ්‍ය සේවකයින් පිළිබඳ ගැටළුව මතු වෙනවා. ඒ නිසා මම පැහැදිලිව කියන්න ඕනෑ. මෙහිදී අපි මේ අර්බුදය සාමකාමීව විසඳා ගන්න කටයුතු කළේ නැත්නම් රට සිවිල් යුද්ධයකට ගමන් කරන්න පුළුවන්. හමුදාව මැදිහත් වෙන්න පුළුවන්. පොලීසිය මොන ආකාරයට කටයුතු කරයිද කියලා අපට මේ පිළිබඳව පුරෝකථනයක් කරන්න බැහැ.

ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ආසන්න වශයෙන් ලෝකයේ මෙවැනි ව්‍යවස්ථා අර්බුද ඇති වුණු අවස්ථාවලදී - මේ අපේ කලාපයේම රටවල් කිහිපයක ඇති වුණු තත්ත්වයන් කිහිපයක් මම සිහිපත් කරන්න කැමැතියි. 1997 පකිස්ථානයේ ශ්‍රේෂ්ඨාධිකරණයේ අගවිනිසුරුතුමා සහ අගමැති නවාෂ් ෂෙරිෆ් අතර ගැටුමක් ඇති වුණා. ශ්‍රේෂ්ඨාධිකරණය දීපු තීරණය පිළිගන්න අගමැති නවාෂ් ෂෙරිෆ් කැමැති වුණේ නැහැ. ඒ අවස්ථාවේදී අවසානයේදී සිදු වුණේ අග විනිසුරුවරයා තමන්ගේ තනතුර අතහැරලා යෑමයි. හමුදාව මැදිහත් වෙලා හමුදාව රටේ පාලන බලය අත්පත් කර ගෙන නවාෂ් ෂෙරිෆ් අගමැතිතුමාට සිරභාරයට පත් වෙන්න සිදු වුණා. 2006 වසරේ තායිලන්තයේ මෙවැනිම තත්ත්වයක් ඇති වුණා. අගමැති තක්ෂින් සිනවත්‍රා. ඔහුට ධුරයෙන් ඉවත් වෙන්න කියලා ශ්‍රේෂ්ඨාධිකරණය දැනුම් දුන්නාම, ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය ඔහු ප්‍රතික්ෂේප කළා. තක්ෂින් සිනවත්‍රා. අවසානයේ හමුදාව මැදිහත් වෙලා ඒ රටේ හමුදාව පාලන බලය තමන් අතට ගත්තා. තක්ෂින් සිනවත්‍රා. රට අතහැරලා රටින් පලාගියා. අද දක්වාම ඒ රටේ හමුදා පාලනයක් තමයි පවතින්නේ. මේ වාගේ තව ටිකක් ඉතිහාසයට අදාළ එකක් තමයි 1961 දී කොංගෝ ජනරජයේ ඉතාම සුප්‍රසිද්ධ අගමැතිවරයා. Patrice Lumumba ඔහුත් ජනාධිපතිවරයාත් අතර ගැටුමක් ඇති වුණා. ඒ ගැටුම

අවසානයේදී කොංගෝ ජනරජයේ හිටපු අගමැතිවරයා වුණු Patrice Lumumba ඝාතනය වෙලා හමුදාව ඒ රටේ පාලන බලය අත්පත් කර ගනු ලැබුවා. මේ වාගේ අපට ඕනෑ තරම් අරගෙන පෙන්වන්න පුළුවන් ලෝකයේ ඇති වුණු සිදුවීම්. ඉතින් මම කිසිසේත් ප්‍රාර්ථනා කරන්නේ නැහැ, අපේ රට තුළ එවැනි දෙයක් සිදු විය යුතුයි කියලා. සාමකාමීව විධායකයත්, ව්‍යවස්ථාදායකයත්, අධිකරණයත් මේ සැම එකතු වෙලා මේ ප්‍රශ්නය සාකච්ඡාවෙන්, සම්මුතියෙන් විසඳා ගත යුතුයි කියන තැනකයි අපි ඉන්නේ. එහෙම නැතිව මේවා අභියෝග කරන්න ගියොත්, මේවාට තර්ජනය කරන්න ගියොත්, මේවා එකිනෙකාට ගරු කරන්නේ නැති තත්ත්වයට පත් කෙරුවොත් රට විශාල අරාජිකත්වයකට යන්න පුළුවන්.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපේ ඇමතිතුමාගේ මේ වැය ශීර්ෂයේදී ඉතාම වැදගත් ක්ෂේත්‍රයක් තමයි ප්‍රවාහනය කියලා කියන්නේ. ප්‍රවාහන ක්ෂේත්‍රය රටේ දැවෙන ජාතික ප්‍රශ්නයක්. විශේෂයෙන්ම බස්නාහිර පළාත තුළ ප්‍රවාහන ක්ෂේත්‍රයේ ඇති වෙලා තිබෙන ගැටළු අති විශාලයි. විශේෂයෙන්ම අපේ පොදු ප්‍රවාහන සේවය නවීකරණය වෙන්න ඕනෑ. බණ්ඩාරනායක මැතිතුමා 1956 මේ රටේ ඇති කරපු ඒ පොදු ප්‍රවාහන සේවය, එහෙම නම් බස් ජනසතු කරලා ඇති කරලා ඒ කරපු පොදු ප්‍රවාහන සේවය අද වන කොට කොතැනද තිබෙන්නේ. ඒක දියුණු වෙලාද? ඒක නවීකරණය වෙලාද? ඒ බස්වල අපේ මිනිස්සුන්ට යන්න පුළුවන්ද? බස්වල තිබෙන ගුණාත්මක තත්ත්වය පිළිබඳව අපට කිසිසේත් සෑහීමකට පත් වෙන්න පුළුවන්කමක් නැහැ. ඒ නිසා තමයි අද මේ රටේ විශාල මධ්‍යම පන්තියක් ඉන්න, මේ බස්නාහිර පළාතේ ඉන්න ජනතාව අපේ පොදු ප්‍රවාහන සේවය වුණු CTB වල යන්න සූදානමක් නැහැ. ඒ නිසා හැම කෙනෙකුම බලනවා, තමන්ගේම වූ පුද්ගලික වාහනයක් මිලදී ගන්න. ඒ වාගේම මම කියන්න ඕනෑ. මේ පිළිබඳව අපි අවධානය යොමු කරලා, අලුත් නවීකරණය කරපු බස් රථ අනිවාර්යයෙන්ම අපි ගෙන්වන්න කටයුතු කරන්න ඕනෑ. ලෝකයේ වෙනත් රටවලට ගියාම මම හිතන්නේ, අපේ මන්ත්‍රීතුමන්ලා විදේශ සංචාරවලට ගියාම - මට නම් අවස්ථාව ලැබුණේ නැහැ, මේ බස්නාහිර පළාත් සභාවෙන්. නමුත් මේ සංචාරවලට සහභාගී වුණු අය බොහෝ දෙනෙකු දන්නවා. ඒ රටවල්වල, විශේෂයෙන්ම මෙට්‍රොපොලිටන් එකේ ප්‍රධාන නගරයේ කොහොමද ප්‍රවාහන සේවය විධිමත් කරලා තිබෙන්නේ කියලා. මොනෝ රේල් ඇති වෙලා තිබෙනවා. ඒ වාගේම දුම්රිය සේවය විධිමත් වෙලා තිබෙනවා. නවීකරණය වෙලා තිබෙනවා. ඒ වාගේම බස්. අද ගත්තාම, එක් දහස් නවසිය පනස් ගණන්වල තිබුණු බස් රථම තමයි අදත් තිබෙන්නේ. ඒ නිසා මේවායේ යම්කිසි වෙනසක් සිදු විය යුතුයි කියන එකයි අපේ අදහස.

ඒ වාගේම මම කියන්න කැමැතියි. අද පුද්ගලික අංශය වේගයෙන් ප්‍රවර්ධනය වෙමින් තිබෙනවා. ඒකත් එක්ක තරඟ කරන්න නම් ඊට අවශ්‍ය විධියට අපේ රාජ්‍ය සේවයත් ශක්තිමත් වෙන්න ඕනෑ. රාජ්‍ය ප්‍රවාහන සේවය ශක්තිමත් වෙන්න ඕනෑ. අද අපට පුළුවන් වෙලා තිබෙනවා, සෞඛ්‍ය ක්ෂේත්‍රය කිසියම් ප්‍රමාණයකට පුද්ගලික අංශයත් එක්ක තරඟකාරීව ඉස්සරහාට යන්න. ඒ නිසා මේ තත්ත්වයට අපේ ප්‍රවාහනය විධිමත් කර ගන්න, නවීකරණය කර ගන්න නවීකරණය කර ගන්න නම්, මධ්‍යම ආණ්ඩුවත්, පළාත් ආණ්ඩුත් මේ සියල්ල එකතු කරලා සාකච්ඡා වෙලා විධිමත් සැලැස්මක් ඔස්සේ ක්‍රියාත්මක වීමෙන් පමණයි අපට මේක අත්පත් කර ගන්න පුළුවන් වෙන්නේ. එහෙම නැත්නම් අපට පොඩි පොඩි පැච් දදා හැමදාම ඉන්න පුළුවන්කම තිබෙනවා. එපමණයි. මම හිතන්නේ, ගොඩාක් එතුමාගේ අමාත්‍යාංශයේ තිබෙනවා. නමුත් ඒ අමාත්‍යාංශවලදී වැඩි අවධානයක් යොමු කරන්න ඕනෑ, මේ ප්‍රවාහන ප්‍රශ්නය විසඳන්නය කියන එක කියමින්, එතුමාට අපේ සුභ පැතුම් ඉදිරිපත් කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[අ.භා.04.18]

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මාර්ග, ප්‍රවාහන, සමූපකාර සංවර්ධන, වෙළඳ, නිවාස හා ඉදි කිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රාම සංවර්ධන පිළිබඳ අමාත්‍යාංශයේ වැය ශීර්ෂය වෙනුවෙන් කථා කරන්න අවස්ථාව ලබා දීම පිළිබඳව ගරු අමාත්‍යතුමාට අපේ ගෞරවය පිරිනමනවා. ඒ වාගේම ඒ වැය ශීර්ෂය ගැන කථා කරන්න කලින් මට හිතුණා, අපේ නිශාන්ත ශ්‍රී වර්ණසිංහ ගරු මන්ත්‍රීතුමාගේ කථාවේදී ජාතික දේශපාලනයේ කාරණා ගණනාවක් කියලා, මේ රටේ සිවිල් යුද්ධයක් ඇති වෙන්න තිබුණා වාගේ අදහසක් ගැබ්ව තිබුණා. නමුත් හමුදාපතිවරයාගේ තත්ත්වයන් මත එවැනි තත්ත්වයක් නැහැයි කියන කාරණාව ඉදිරිපත්ව වුණා. මම හිතන්නේ

[ ගරු ජගත් කුමාර ]

නැහැ. මේ රටේ ඉතිහාසය ගත්තාම එවැනි සිවිල් යුද්ධයක් ඇති වෙලා, එවැනි හමුදා කුමන්ත්‍රණ ඇති වෙලා නැහැ, මේ ආකාරයේ. අද වාගේ තත්ත්වයක. විශේෂයෙන්ම මේ රට තුළ අද යම් ව්‍යවස්ථාමය අර්බුදයක් තිබෙනවා. ඒ අර්බුදය නිර්මාණය වෙලා තිබෙන්නේ, විශේෂයෙන්ම වර්තමානයේ පවතින විපක්ෂය, එහෙම නැත්නම් එක්සත් ජාතික පක්ෂය ප්‍රමුඛ කණ්ඩායම මේ රටේ කථානායක ධූරයත් තමන්ට අවනත විධියට, අවශ්‍ය විධියට හසුරුවමින් කටයුතු කරලා, මේ රටේ ජනාධිපතිවරයාට ව්‍යවස්ථාවෙන් පැවරිලා තිබෙන යම් බලයන් අනවශ්‍ය විධියට හැල්ලුවට ලක් කරගෙන කටයුතු කරමින් යැමත්, කථානායකවරයාට නැති සුවිශාල බලයක් ආරෝපණය කර ගෙන කථා නායකවරයා හැසිරෙන්න උත්සාහ කරන තත්ත්වයන් යටතේ තමයි අද රටේ යම් අර්බුදයක් මතු වෙලා තිබෙන්නේ. විශේෂයෙන්ම මට දැනෙන්නේ. මේ හෙට අනිද්දා වන කොට මේ රටේ කථානායකවරයා පාර්ලිමේන්තුව ඒකපාර්ශව රැස් කරලා හෙට අනිද්දා මම ම අගමැති ධූරයටත් පත් වෙනවා. මම ම ජනාධිපති ධූරයටත් පත් වෙනවාය කියන තැනට කටයුතු කරයිද කියලා සැකයක් තිබෙනවා.

මම දැක්කා ඊයේ අනුර කුමාර දිසානායක ජනතා විමුක්ති පෙරමුණේ ගරු මන්ත්‍රීතුමා මතක් කරනවා. මේ ඕනෑ ඕනෑ විධියට මන්ත්‍රීවරු නැගිටලා එක එක යෝජනා කරනවා. මේ සභාව යනවාද කියලා. ඒ පැත්තේ කණ්ඩායමේ ඉඳිමින් වුණත්, එතුමා ඒ අදහස අහලා තිබුණා. එහෙම අහන කොට අපට දැනුනේ ඒකපාර්ශවිකව යන පාර්ලිමේන්තුව සම්පූර්ණයෙන්ම විකාරයක් බවට පත් වෙලා තියෙන්නේ. ඒ පාර්ලිමේන්තුව තුළ ඒ මන්ත්‍රීවරුන්ට ඕනෑ ඕනෑ ප්‍රශ්න අහන්න, ඕනෑ ඕනෑ වෙලාවට නැගිටලා කථා කරන්න, දැන් අදම ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීවරු අපේ මයික්‍රොෆෝන Off කරන්න කියන අතරේ, අරෙහේ පාර්ලිමේන්තුව, අපි ගුරු කොට ගන්න පාර්ලිමේන්තුව තුළ ඕනෑම ජවුසමක් නටන්න පුළුවන් තැනට පත් වෙලා තියෙනවා. අරලියගහ මන්දිරයෙත් ජවුසන් නටනවා. දැන් පාර්ලිමේන්තුවත් ජවුසන් නටන තැනක් බවට පත් වෙලා තිබෙනවාය කියන කාරණය තමයි ඊයේ පාර්ලිමේන්තුවේ හැසිරීමත් එක්ක පේන්නේ. ඒ නිසා ඒ සමහර තර්ක, සමහර කරුණු මේ ආයතනවල කටයුතු පාලනය කරන්න කියලා. කොයි රටේද කථානායකවරයාද අමාත්‍යාංශ පාලනය කළේ කියලා අපට ප්‍රශ්නයක් මතු වෙනවා. අමාත්‍යාංශවල නිලධාරීන් පාලනය කරන්නය කියලා මන්ත්‍රීවරුන් ඉල්ලනවා. හිතේ ටිකිරි වූන් එකක් ගන්න පුළුවන්. හැබැයි, කථානායකවරයෙක් කවදාවත් මැදිහත් වෙලා නැහැ, ආයතන, අමාත්‍යාංශ, දෙපාර්තමේන්තුවල කටයුතුවලට. යම් මන්ත්‍රීවරයෙකුගේ වරප්‍රසාද කඩ වුණොත්, ආයතන ගෙනැල්ලා යම් කථා බහක් ඇති කරන්න ප්‍රධානීන් ගෙන්වලා කරන්න පුළුවන් වුණත්, ඒ ආයතන සම්පූර්ණයෙන්ම වගකියන්නේ විෂය භාර අමාත්‍යවරයාට. එහෙම නැත්නම් එවකට අවශ්‍ය විෂය භාර ධූරයන් දරමින් මේ වන විට කටයුතු කරන්නේ, එකම රෝල් එක ගෙනියන්නේ අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා. අමාත්‍යාංශ ලේකම්වරු පත් කරන්න එතුමාට ව්‍යවස්ථාවෙන් බලය ලැබිලා තිබෙනවා. එවැනි තත්ත්වයක් තුළ තමයි කටයුතු කරමින් තිබෙන්නේ. එතකොට ඒ ව්‍යවස්ථානුකූල භාවය හැල්ලුවට ලක් කරලා, එය ප්‍රශ්නගත කරලා, අද රටේ යම් අර්බුදයක් නිර්මාණය කරමින් තිබෙන්නේ.

අද විපක්ෂය හරි, ආණ්ඩුව පක්ෂය හරි කියාගෙන ඉන්න එක්සත් ජාතික පක්ෂය ප්‍රමුඛ ඒ කණ්ඩායම නිසා තමයි අද රටේ යම් විශාල අර්බුදයක් මතු වෙලා තිබෙන්නේ. එතකොට අනික් පැත්තෙන් ජනාධිපතිවරයා මේ රටේ ව්‍යවස්ථානුකූලව කටයුතු කරන කොට අගමැතිවරයා වෙනස් කිරීමට ඇති බලය පිළිබඳව ඊයේ මේ රටේ නීතිපතිවරයා ශ්‍රේෂ්ඨාධිකරණයේදී කරුණු පැහැදිලි කරනවා. ඒ පැහැදිලි කරන කොට එතුමා පැහැදිලිවම දක්වනවා, යම් විධියකට ජනාධිපතිවරයා ඉවත් කරන්න, ජනාධිපතිවරයාගේ ව්‍යවස්ථානුකූල කාර්යභාරයන් ඉවත් කරනවා නම් ඒ ඉවත් කරන්න තිබෙන්නේ, ගත්ත තීන්දු වෙනස් කරන්න තිබෙන්නේ දෝෂාභියෝගයක් ගෙනැල්ලා. එවැනි වටපිටාවක් තුළ අධිකරණයටවත් ජනාධිපතිතුමා නීත්‍යානුකූලව ගත් තීන්දු සහ රටේ ව්‍යවස්ථාවට අනුව ගත්ත තීන්දු ආපස්සට හරවන්න බැහැයි කියන කාරණාව පැහැදිලියි. මේ කරුණු හොඳටම දැනගෙන වුණත්, අද රටේ අර්බුදයක් මතු කරලා තිබෙන්නේ මේ රටේ එක්සත් ජාතික පක්ෂය ප්‍රමුඛ විපක්ෂයේ වර්තමාන කණ්ඩායම. ඒ වාගේම ආණ්ඩුවක් නැහැයි කිව්වත් අපි දන්නවා. ඊයේ පෙරෙයිදාත් විපක්ෂයේ මන්ත්‍රීවරු මතු කරලා තිබුණා. මහින්ද රාජපක්ෂ මැතිතුමා වැඩ තහනම් කරලා. හොඳයි. වැඩ තහනම් කළාම මොකක්ද රීතිය. වැඩ තහනම් කළාම ඒ තනතුරට

වෙන කෙනක් පත් වෙන්නේ නැහැ. වැඩ තහනම් කරලා පරීක්ෂණයක් සිද්ධ වෙලා හරි, එහෙම නැත්නම් නැවත සේවයේ පිහිටුවනවාද, නැවත වැඩ කරනවාද කියලා තීන්දු කරන්නේ, සම්පූර්ණයෙන් සේවයෙන් ඉවත් කරනවාද කියන තීන්දුව ගන්න කල්. ඒ තනතුරුවලට, තනතුරු අලුතින් ඇති වෙන්නේ නැහැ. ඒ වාගේ මේ රටේ අග්‍රාමාත්‍ය ධුරය තාවකාලිකව ක්‍රියාත්මක වීම - තනතුරු ඉවත් කරලා නැහැ. ක්‍රියාත්මක වීම විතරක් යම් මට්ටමකට තාවකාලිකව අධිකරණය නවත්වලා තිබෙන්නේ. මේ රටේ අධිකරණයට අපි හැමෝම ගරු කරනවා. විශේෂයෙන් මහින්ද රාජපක්ෂ මැතිතුමා - නිශාන්ත ශ්‍රී වර්ණසිංහ ගරු මන්ත්‍රීතුමා ගෙනාවා යම් යම් ප්‍රකාශයන් හරහා මේ රටට අමතරව තායිලන්තය හා වෙනත් රටවල් කිහිපයක උදාහරණ. ඒ රටවල්වල අධිකරණයෙන් දුන්න තීන්දු ඒ හිටපු අගමැතිවරු, ජනාධිපතිවරු වෙනස් කර ගන්න උත්සාහ කළා. ඒවාට ඇහුම්කන් දුන්නේ නැහැ. හැබැයි, හොඳට මතක තියා ගන්න. මහින්ද රාජපක්ෂ මැතිතුමාවත්, ජනාධිපතිතුමාවත් අධිකරණයේ තීන්දුවක් දීලා ඒක වෙනස් කරන්න, ඒකට අභියෝග කරන්න ගිහින් නැහැ. අධිකරණ ක්‍රියාදාමයෙන් පහළ අධිකරණයක් දුන්න තීන්දුවක් ඉහළ අධිකරණයට යනවා හැර ජනාධිපතිවරයා හෝ අගමැතිවරයා හෝ තමන්ගේ බලය පාවිච්චි කරලා ඒ තීන්දුවලට එරෙහිව යන්න උත්සාහ කරලා නැහැ. ඒ නිසා එවැනි ප්‍රකාශනයන් හරහා මේ රටේ අර්බුදයක් තිබෙනවා. අර්බුදයක් ඇති කරන්න -

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

අර ශිරානි බණ්ඩාරනායක මහත්මියව පන්නලා දාපු එකට මොකද දන්නේ නැහැ කියන්නේ.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

මොකක්ද?

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

අර ශිරානි බණ්ඩාරනායක මහත්මියව පන්නලා දාපු එක.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

කරුණාකරලා බාධා කරන්න එපා.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

මට තව කොපමණ වෙලා තිබෙනවාද දන්නේ නැහැ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

තව විනාඩි දෙකක් තිබෙනවා.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

මම මේ ගැන මීට වඩා දීර්ඝව කියන්නේ නැහැ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඇමතිතුමා කියනවා, ඔබතුමාට වෙන කෙනෙකුගෙන් විනාඩි 02 ක් දෙන්නලු.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

මම අවශ්‍ය කාරණා ටික කිව්වා. රටේ ව්‍යවස්ථානුකූල අර්බුදයක් තිබෙනවා. නමුත් ඒක අධිකරණය විසින් විසඳෙයි. ඒ අනුව මහින්ද රාජපක්ෂ මැතිතුමාත්, මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාත් ඇතුළු අපි රජයක් විධියට ව්‍යවස්ථානුකූලව අධිකරණ තීන්දුව අනුව කටයුතු කරන්න අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්න සූදානමින් ඉන්නවාය කියන කාරණාව මතක් කරනවා.

විශේෂයෙන් අපේ ලලිත් වනිගරත්න ගරු අමාත්‍යතුමාගේ වැය ශීර්ෂය වෙලාවේ අදහසක් කියනවා නම්, එතුමා උත්සාහ කරනවා එතුමාත් හැදෙමින්, දැනුවත් වෙමින්, යම් දෙයක් ඉගෙන ගනිමින් මේ අමාත්‍යාංශය හරහා සමාජයට, රටට, ජාතියට යමක් කරන්න. විශේෂයෙන් එවැනි අමාත්‍යවරයෙක් නිසයි මම මේ වෙලාව ඉල්ලා ගත්තේ. මොකද, මේ සුදු හුණු ගෑමක් නොවෙයි. එතුමා එක්ක සමහර අවස්ථාවල අපිත් ගැටුම්වලට ගියා. යම් අභියෝග කළා. හැබැයි, එතුමා ඒ යම් යම් අඩුපාඩු පෙන්වලා දුන්නාම, ඒවා නිවැරදි කර ගෙන මේ අමාත්‍යාංශයෙන් ජනතාවට විය යුතු සේවාවන් ඉෂ්ට කරන්න කටයුතු කරනවා. නමුත් මම හැමදාමත් මේ අයවැය කථාවේදී කියනවා. නිවාස කියන්නේ, මිනිස්සුන්ගේ මූලික අවශ්‍යතාවයක්. හැබැයි, මේ නිවාස දෙපාර්තමේන්තුවේ,

නිවාස අමාත්‍යාංශයේ තිබෙන මුදල් ගරු ඇමතිතුමනි, හැමදාම කියනවා හරිම ප්‍රමාණවත් වෙන්නේ නැහැ. අපි සමහර විට රු. 10,000 ක්, 20,000 ක් දීලා මේ මිනිස්සුන්ගේ ගෙවල් හදා ගන්නෙ කියන කොට, අද සිමෙන්ති කොට්ට 10 ක් ගත්තාම ඒ රු. 10,000 ඉවරයි. මිනිහෙකුට වැසිකිළි උපකරණ කට්ටලය ගන්නවත් ඒ 10,000 මදි වෙනවා. 20,000 ක් දුන්නත් මදි වෙනවා. ඒ නිසා මේ අමාත්‍යාංශයට, විශේෂයෙන්ම මේක මාර්ග, ප්‍රවාහන, ඒ අංශවල යම් දියුණුවක් තිබුණා වුණත්, නිවාස අංශයේ නම් ඉතාම අඩු දියුණුවක් තිබෙන්නේ. ඒ නිසා ඒකේ අද වර්තමාන ඉන්න නිලධාරීන්ගේ ගැටළුවක්වත්, වෙනත් ගැටළුවක්වත් නොවෙයි තිබෙන්නේ. මේ ආයතනයට තිබෙන අරමුදල් පිළිබඳ ප්‍රශ්නයක්. ඒ නිසා ඒ අරමුදල් වැඩියෙන් ලබා ගන්න ක්‍රමවේදයක් සකස් කර ගන්න. එහෙම නැත්නම් ඒකට වෙනත් විකල්ප ක්‍රියාමාර්ග සොයලා හරි අපේ රටේ මේ කොළඹ නගරයේත් අපි නියෝජනය කරන කොළඹ නගරයේත් ග්‍රාමීය ප්‍රදේශවලත් විශාල වශයෙන් නිවාස ප්‍රශ්න තිබෙන ජනතාවක් ඉන්නවා. මේ අයට යම් සහනයක් දෙන්න නම්, අපට තිබෙන එකම දෙපාර්තමේන්තුව නිවාස දෙපාර්තමේන්තුව. ඒ නිසා ඒ සඳහා ඔබතුමාගේ අවධානය විශේෂයෙන් යොමු කරනවා.

ඒ වාගේම ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මෙතුමාගේ අමාත්‍යාංශය හරහා මහා මාර්ග සංවර්ධන කටයුතුවලදී, C සහ D ශ්‍රේණියේ මාර්ග සංවර්ධන කටයුතුවලදී අපට පේනවා, තවමත් විශාල වැඩ කොටසක් කරන්න අපේ ප්‍රදේශවලත් යම් මාර්ග තිබෙනවා. ඒ වාගේම අතුරු මාර්ග සංවර්ධනය. ප්‍රාදේශීය සභා, නගර සභා මාර්ගත්. බොහෝ අය ඉල්ලනවා - අපි පළාත් සභාව නියෝජනය කරන කොට, සමහර විට පළාත් සභා මාර්ග පසුගිය වසරවල කරලා තිබෙන්නේ ඒවාවල යම් ප්‍රති සංවර්ධන කටයුතු කරන්න කියලා ඉල්ලනවා. එහෙම නැත්නම් අලුත්වැඩියා කටයුතු. නමුත් ඇත්ත වශයෙන්ම අතුරු මාර්ග සංවර්ධනය සඳහා යම් කාර්යභාරයක් කළ යුතුව තිබෙනවා. මොකද, පළාත් සභාව ඇතුළේ තිබෙන මාර්ග පද්ධතිය තුළ ඒ පළාත් සභා මාර්ගවලට ප්‍රවේශ වන අතුරු මාර්ග තිබෙනවා. ඒ මාර්ග සංවර්ධනය සඳහාත් ඔබතුමාගේ අමාත්‍යාංශයේ යම් දායකත්වයක්, වැඩ පිළිවෙළක් යෙදිය යුතුයි කියන විශ්වාසය තිබෙනවා.

ඒ වාගේම විශේෂයෙන් සමූපකාර දෙපාර්තමේන්තුව ගැන කථා කරන්න ඕනෑ. සමූපකාර දෙපාර්තමේන්තුවේ කටයුතු පිළිබඳව මට පසුගිය කාලයේත් විවේචනයක් තිබුණා. ඒ විවේචනය මම අදත් මතක් කරනවා. පසුගිය දිනක තොරතුරු දෙන්නය කිව්වාම තොරතුරු දුන්නේ නැහැ. සති දෙකෙන් නොවෙයි. මාස හයක් විතර ගියා. කොළඹ දිස්ත්‍රික් සහකාර කොමසාරිස් මෙතැන කවුරු හරි ඇති. ඒ ඉන්න අයගේ විශාල දුර්වලතාවයක් තිබුණා. පස්සේ ඔබතුමාට කිව්වාට පස්සේ තමයි ගරු ඇමතිතුමනි, ඒ තොරතුරු ලැබෙන්නේ. දැන් ඔබතුමාට කිව්වාට පස්සේ සතියකින් හමාරකින් දෙන්න පුළුවන් නම්, ෆැක්ස් එකකින් සහ ඊට පස්සේ වෙනම තැපැලෙනුත් එන්න පුළුවන් නම් ඇයි? ඒක ඊට ඉස්සෙල්ලා දෙන්න බැරි. එතකොට ඒ නිලධාරීන් මේවාට සැලකිල්ලක් නැහැ ඒ කියන්නේ. මහජන නියෝජිතයින් විධියට අපි කියන දෙයට සැලකිල්ලක් නැත්නම් සාමාන්‍ය ජනතාව කියන දෙයට සලකනවාද කියන ප්‍රශ්නයක් තිබෙනවා. ඒ නිසා එක් පැත්තකින් සමූපකාර ව්‍යාපාරය අර එකා සැමටත්, සැම එකාටත් කියන පරිදි දායක වෙලා උදව් කරන්න ඕනෑ ව්‍යාපාරයක්. නමුත් අද මේ ව්‍යාපාරය කඩා වැටිලා බැංකු පද්ධතිය අඩාල වෙලා. ඒ වාගේම වෙළඳ සැල් අඩාල වෙලා. සමස්ථයක් විධියට සමූපකාර ව්‍යාපාරය. ඒ නිසා ඒ සංවර්ධන කටයුතුත් කරන්නය කියලා ඉල්ලමින් විශාල කාරණා ගණනාවක් කථා කරන්න තිබුණත් මේ කාලය පිළිබඳව ප්‍රශ්නය නිසා මගේ කථාව අවසාන කරනවා. අවසාන වශයෙන් ඔබතුමා කර ගෙන යන මේ යහපත් කටයුතු, හොඳ කටයුතු සඳහා අපේ සියලු දෙනාගේ සහාය, ශක්තිය එක් කරනවා. ඒ වාගේම වඩා විධිමත් සහ නිර්මාණශීලීව මේ කටයුත්ත තවදුරටත් කර ගෙන යන්න ඔබතුමාට ශක්තිය, ධෛර්යය ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා.

[අ.භා.04.30]

**ගරු රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අවස්ථාව ලබා දීම ගැන සතුටු වෙනවා. විශේෂයේම පොඩි වෙලාවක් හරි රැඳිලා ඉවර වෙලා මේකට සහභාගී විය යුතුමයි කියන චේතනාවෙන් රැඳුනේ. ජගත් කුමාර ගරු මන්ත්‍රීතුමා කියපු ආකාරයට මේ අමාත්‍යතුමා නිසාම තමයි. එහෙම කථා

කරන්න හේතුව ඇත්තටම විපක්ෂය නියෝජනය කරන මන්ත්‍රීවරු හැටියට ගම්වල අපට වැඩක් කරන්න, සාමාන්‍ය ජනතාවත් එක්ක ගැටෙන්න අපට සහයෝගයක් දක්වපු අවංකවම උදව් කරපු අමාත්‍යවරයෙක්. ඒක නිසාම තමයි කොහොම හරි වෙලාවක් ඉල්ලලා මේ කටයුත්ත කර ගත්තේ. ඒ නිසා ප්‍රථමයෙන්ම එතුමාට ස්තුතිය පුද කරනවා. අප වෙනුවෙන් යම් ආකාරයක දායකත්වයක් ලබා දුන්නා නම් ඒ දායකත්වය සඳහාත් මගේ ස්තුතිය ප්‍රකාශ කරනවා. මම හිතන්නේ ජගත් කුමාර මන්ත්‍රීතුමාගේ කාලය නිකම් අපරාදේ තමයි. මට හිතෙන්නේ ඒ කාලයත් අපට තිබුණා නම් වඩාත් හොඳයි කියලා. විස්තර ගොඩක් තිබෙනවා. එතුමා කිව්වා, කොහේවත් නැති දෙයක් තමයි ඇති වුණේ. අපි හිතපු නැති දෙයක් වුණේ. කුරුණෑගල හිටපු මන්ත්‍රීතුමාව ගෙන්වලා ඉවර වෙලා, අරලියගහ මන්දිරයට එන්න කියලා ඉවර වෙලා -

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

ඔයත් ඒකටනේ යන්න හදන්නේ. මැක්කගේ කථාවට.

**ගරු රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

ප්‍රවේශයක් විතරයි. ඔබතුමා කියපු එකට.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

මම කිව්වේ, නිශාන්ත මන්ත්‍රීතුමා කියපු නිසා. ජාතික දේශපාලනය.

**ගරු රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

එතුමාට ඔබ අගමැති කිව්වා. මම ජනපති කිව්වා. දැන් ඔක්කොම අතරමං වෙලා. මුළු ලංකාවම අතරමං වුණු තත්ත්වයකට පත් වෙලා තිබෙනවා. ඒක තමයි කියන්න තිබෙන්නේ. මේ හැම දෙයක්ම සිද්ධ වුණේ අපි නොහිතපු ආකාරයට. මෙලෙස සිද්ධ වුණේ මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ කටයුතු නිසා. නැත්නම් නිකම් අපරාදේ. ඔබතුමාත් එක්ක එල්ලෙන්න අවශ්‍යතාවයක් නැහැ. දැන් අපි දෙන්නාම කාලය නිකම් කා දැමීමක් වෙන්නේ. විනාඩි 10 ක් වාගේ කෙටි කාලයක් තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මෙතුමාට තමයි මම හිතන්නේ වැඩිම කාර්යභාරයක් තිබෙන්නේ. ඒ කියන්නේ මාර්ග, ප්‍රවාහන, සමූපකාර සංවර්ධන හා වෙළඳ, නිවාස ඉදි කිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත සහ ග්‍රාම සංවර්ධන පිළිබඳ අමාත්‍යාංශය. මම හිතන්නේ, ප්‍රධාන අමාත්‍යතුමාට වඩා වැඩි කාර්යභාරයක් කරන්න මහා විශාල කටයුතු ප්‍රමාණයක් තිබෙන්නේ එතුමාට. ජගත් කුමාර ගරු මන්ත්‍රීතුමා කියපු ආකාරයටම මෙතුමා ඇත්තටම තමන්ගේ කාර්ය භාරය පිළිබඳව නිසි - එතුමාට ඉන්නවා හොඳ ගෝලයේ ටිකක්. එතුමා යම් කට්ටියක් එක්ක යම් කටයුත්තක් කරන්න, සාර්ථකව කර ගෙන යන්න පසුබිම නිර්මාණය කර ගෙන තිබෙනවා. ඒකෙන් අඩුපාඩු නැහැයි කියලා කියනවා නොවෙයි. අඩුපාඩු රාශියක් තිබෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මාර්ග ගත්තොත් එහෙම, විශේෂයෙන්ම මේ මාර්ගවල අපි නගර සභා හා ප්‍රාදේශීය සභාවලින් ආපු මන්ත්‍රීවරු හැටියටත් ඒ වාගේම දීර්ඝ කාලයක් හිටපු විපක්ෂ නායකවරයෙක් හැටියටත් මීට පෙර කිව්වා වාගේ ප්‍රධාන පාරවල්වලට අමතරව මේ අතුරු පාරවල් පිළිබඳව ඔබතුමා විශේෂ සැලකිල්ලක් යොමු කරන්න ඕනෑ. මේක මහ ඇමතිතුමාගේ කාර්යභාරයක් වෙන්න පුළුවන්, පළාත් පාලන ආයතන. මේ පළාත් පාලන ආයතනවල මාර්ග පිළියෙල වෙන්නේ, එහෙම නැත්නම් සංවර්ධනය වෙන්නේ කොහොමද කියලා සොයා බැලීමක් කරන්න ඕනෑ. මම දන්නවා. සමහර විට ඒ පාරවල් සෑදීමේදී අඟල් 4 ක් වාගේ ප්‍රමාණයක් කොන්ක්‍රීට් දාන්න තිබෙනවාය කියලා කිව්වත් බොහෝ දුරට අඟල් 4 ක් දමන්නේ නැහැ. අපේ අත්දැකීම හැටියට. අඟල් 1 ½ ක් 2 ක්. එහෙම නැත්නම් කොන්ක්‍රීට් එකට උඩින් කොන්ක්‍රීට් එක දාන පිරිසුත් ඉන්නවා. අර තිබුණු කොන්ක්‍රීට් එකට උඩින් කොන්ක්‍රීට් එක අඟල් 1 ½ ක් විතර දාලා අරකත් එක්ක කපලා පෙන්වනවා. අඟල් 4 ක් තිබෙනවාය කියලා. කිසිම ප්‍රමිතියකින් යුක්ත නැහැ. අනික් එක තමයි මේවා කොන්ත්‍රාත් ගන්නේ බොහෝ දුරට ඒ කොන්ත්‍රාත්කරුවෝ. ග්‍රාම සංවර්ධන සමිති ඔබතුමාට අයිතියි. මේ ග්‍රාම සංවර්ධන සමිති තිබෙනවා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, සභාපතිවරයා, ලේකම්වරයා සහ භාණ්ඩාගාරික පමණයි ඉන්නේ. ඉන් එහා කට්ටිය නැහැ. ප්‍රදේශයේ ග්‍රාම සංවර්ධන සමිතියක් නියෝජනය වෙන්නේ නැහැ. ඒගොල්ලෝ 5% ක් ගන්නවා. ඊට පස්සේ වැඩ කටයුත්ත ඕනෑ විධියට තව කාට හරි දීලා කර ගෙන යන්න දෙනවා. ඇත්තටම ඔබතුමන්ලා සහ අපි දෙන සල්ලි නිසියාකාරව උප කොන්ත්‍රාත්කරුවන් හරහා කාර්යභාරයක් සිදු වෙනවාද

[ ගරු රොෂාන් රුඩොල්ෆ් ෆ්‍රේසර් ]

කියලා පෙර සොයා බැලීමක් නිසි ලෙස සිදු වෙන්නේ නැහැ. ඒකට විශේෂයෙන්ම පළාත් පාලන ආයතනවල ඉන්නා වූ තාක්ෂණික නිලධාරීනුත්, අර ඉස්සර තරම් සොයා බැලීමක් කරන්නෙත් නැහැ. ඒ නිසා ඔබතුමාට සෘජුව සම්බන්ධ නැතත්, ඔබතුමා විශේෂයෙන්ම මේ පිළිබඳව සොයා බැලීමක් කරන්න. මුදල් ආයෝජනය කළාට පස්සේ ඒ මුදල්වලින් නිසි ප්‍රතිඵලයක් ලබා ගන්න පුළුවන්ද කියලා. අනිවාර්යයෙන්ම ඒ පිළිබඳව සැලකිල්ලක් දක්වන්න. ප්‍රමිතියෙන් අතිශයින්ම දුර්වලයි, ඒ පාරවල්. මට නම් නැහැ ඒක. මහරගම ප්‍රදේශයේ බහුතරයක් පාරවල් කාපට් කරලා තිබෙන්නේ. අනික් එක තමයි පාරක් හදන කොට අර අඩුම ගණනේ සපත්තු කාණු කියලා කියන්නේ. ඒවාවත් දාන්න ඕනෑ. එහෙම නැත්නම් පාර හදලා මාස දෙකක් යන කොට කැඩිලා යනවා. තාර දාන්නේ නැහැ. මම අර පෙර කිව්වා වාගේ තාර දාන්නේ හරියට අර ආස්මිවලට පැණි දානවා වාගේ. තාර නිකම් අර මොකක්දෝ එකෙන් එහාට දැම්මා, මෙහාට දැම්මා, එපමණයි. ගල් ටික විතරයි මතු වෙලා තිබෙන්නේ. වැලි ටික ගැහුවා. ආපහු සෙකසන්ඩ් කෝඩ් එකත් එදාම ගැහුවා. ඒකෙන් ඉවර කරනවා. ඒ නිසා ඒවා නැවත සොයා බැලීමක් කරන්න වෙනවා ගරු අමාත්‍යතුමනි. ඔබතුමාට සෘජුව පළාත් පාලන ආයතන සම්බන්ධ නැති වුණත්, මේ මාර්ග ඔබතුමාට ඇතුළත් වන නිසා ඒ පිළිබඳව සැලකිල්ලක් කරන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ප්‍රවාහනය කියලා කිව්වාම ජල පරිවහනයත් විශේෂයෙන්ම වැදගත් වෙනවා. ඔබතුමාට පුළුවන් අලුත් සංකල්පයක් ලබා දෙන්න. මේ දියවන්නා ඔය දක්වා. මේ දියවන්නා ඔයට මාළඹේ දක්වා යන්න පුළුවන්. ඊටත් එහා යනවා. මේ වැල්ලවත්තෙන් පටන් ගන්නේ. මේක පාවිච්චි කරපු එකක්. කැලණි ගඟ තිබෙනවා. කළු ගඟ තිබෙනවා. ඒවා පාවිච්චි කරන්න පුළුවන්. ප්‍රවාහන කටයුතු සඳහා. ජල පරිවහනය සඳහා. සංචාරක ව්‍යාපාරය දියුණු කරන්න හොඳ තෝතැන්නක් බවට පත් වෙනවා ඒක. ඒ වාගේම තමයි ලන්දේසි ඇළ ගත්තොත්. ඒ වාගේම පුත්තලම දක්වා යනවා. මේක මීගමුව ඔබතුමාගේ ප්‍රදේශය. මේවා සංවර්ධනය කරන්න පුළුවන් පසුබිම නිර්මාණය කර ගත්තොත් එහෙම මාර්ග තදබදය වාගේ දේවල් අඩු කර ගන්න පුළුවන්. කොළඹට එන වාහන ඉතාම විශාල ප්‍රමාණයක් තිබෙන්නේ. ඉතින් ඒ නිසා මේ කොළඹට එන්නා වූ විශාල වාහන ප්‍රමාණය අඩු කරන්න මොකක් හරි දෙයක් කරන්න ඕනෑ. දවල් වරුව ගත්තාම පාසල් ඇරෙන වෙලාවක එහෙම පැය ගාණක් තිස්සේ පාරට වෙලා ඉන්න සිද්ධ වෙනවා. ඒ නිසා අඩුම තරමින් ගුවන් පාලම් දාලා යන්න පුළුවන් ආකාරයට මධ්‍යම රජයත් එක්ක එකතු වෙලයි මේ කටයුත්ත කරන්න ඕනෑ. නමුත් අපට දායකත්වයක් ලබා දෙන්න පුළුවන්. අපට ප්‍රඥප්තියක් ගෙනැල්ලා - අපි වෙනමම හදලා තිබෙනවා, අපේ පාරවල් පිළිබඳව විශේෂ සැලකිල්ලක් යොමු කරන්න. මොකද, පළාත් සභාවට අයිති පාරවල් බොහෝ දුරට මධ්‍යම රජයේ තිබෙන ප්‍රධාන පාරවල් එක්ක සම්බන්ධ වෙනවා, අතුරු පාරවල් හැටියට. ඒ අතුරු පාරවල්වලට එහෙම තිබුණා නම්, මාර්ග තදබදය බහුල වශයෙන් අඩු කර ගැනීමක් කර ගන්න පුළුවන්කමක් තිබෙනවා.

ඒ වාගේම ගරු අමාත්‍යතුමා යටතේ තමයි බස් පිළිබඳව තිබෙන්නේ. මේ බස්වල ඉන්නා වූ සේවකයින් පිළිබඳව. වැඩමුළු පවත්වන්න. ඒගොල්ලොන්ව ගෙනැල්ලා ඉවර වෙලා දවස පුරාම අඩු ගණනේ සතියක් හරි දාලා එක තැනකදී හික්මීමට, කථා කරන්න. දරුවෝ එක්ක බස් එකක යන්න මිනිස්සු භයයි. මොකද, කථා කරන්න දන්නේ නැහැ. රියැදුරන් දන්නේ නැහැ. ඒ වාගේම තමයි කොන්දොස්තරවරු දන්නේත් නැහැ. මේ පිළිබඳව වැඩමුළුවක්, යම්කිසි ස්ථානයක ගිහිල්ලා එක්කෝ හමුදා තැනකට ගිහිල්ලා හරි, A/L කරන ළමයින්ට, විශ්ව විද්‍යාලයට තේරුණු ළමයින්ට දෙන්නේ. හමුදා ආයතනයක දෙන්නේ, පෙර පුහුණුවක් හික්මීමක් ඇති කරන්න. අන්න ඒ වාගේ පසුබිමක් හරි නිර්මාණය කරලා දෙනවා නම්, ඒක වඩා හොඳයි. මොකද, දන්නේ නැහැ. 18 පිරුණු ගමන්ම ළමයෙක් දානවා. මේ ළඟදී මගේ වාහනය හැප්පුවා. මම ඇහුවා කෝ දෙන්න බලන්න ඔයාගේ ලයිසන් එක කියලා. ලයිසන් නැහැ. ප්‍රධාන පාරේ බස් එකක් දුවන්නේ. ඒ නිසා ඒක අපට අදාළ වන පාරක් නිසා මම මොකුත් කියන්න ගියේ නැහැ. මොකද, ඒක නැවැත්වුවොත් ඒ පාරේ බස් එක නතර වන නිසා.

ඒ වාගේම ගරු අමාත්‍යතුමා යටතේ තමයි තිබෙන්නේ,සමූපකාර ව්‍යාපාරය. සමූපකාර ව්‍යාපාරය ආරම්භ වුණේ එංගලන්තයේ. එංගලන්තයේ Launcher ප්‍රාන්තයේ. Roudlus නගරයේ. ඒකේ හිටියේ Robert Orven කියලා පූජකවරයෙක්. එතුමා තමයි සාධාරණ පුරෝගාමීන්ගේ සමූපකාර සමිතිය කියලා

ලෝකයේ මුලින්ම ආරම්භ කළේ. ඒ 18 දෙනා ආරම්භ කළේ, නිර්මල චේතනාවෙන්. අද සමූපාකාර ව්‍යාපාරය දියුණු කරන්න පුළුවන් හොඳ මාර්ගයක්. පෞද්ගලික අංශයත් එක්ක සටන් කරන්න, තරඟ කරන්න බැහැ. ඒ තත්ත්වයට පත් වෙලා තිබෙනවා. එක්තරා කාලයක් තිබුණා. 1977 ට ඉස්සෙල්ලා මේ රටේ දෛනිකව අවශ්‍ය කරන දේවල් මිලදී ගැනීම් කළේ ඒකෙන්. නමුත් අද හොර ගුහාවක් බවට පත් වෙලා. දේශපාලනීකරණය වීමක් වෙලා තිබෙනවා. අපිරිසිදුයි. ඒවාට යන්න පුළුවන්කමක් ලැබෙන්නේ නැහැ. දේශපාලනික ආයතන බවට පත් වෙලා. එතැනින් තමයි - ප්‍රාදේශීය සභාව, පළාත් සභාව, එතැනට පෙර එන්නේ. අනික් එක තමයි ගරු අමාත්‍යතුමා යටතේ තිබෙන සණස ව්‍යාපාරය. ඇත්තටම ගරු ඇමතිතුමා විශාල වැඩ කොටසක් කරපු පුද්ගලයෙක්. මේ සණස ව්‍යාපාරය නිසා විශේෂයෙන්ම මගේ ප්‍රදේශය නියෝජනය වන වත්තෙගෙදර සණස ව්‍යාපාරය. සමහර අය මගෙත් එක්ක ගෙදරට ඇවිල්ලා කථා කරනවා. ඒ අයට ඇත්තටම සහනයක් ලබා දුන්නේ නැහැ. මම දන්නවා. ඔබතුමා හිර වෙලා තිබෙන්නේ යම් යම් කරුණුවලදී. සමහර කට්ටිය මේක ඉදිරියට ගේන්න දෙන්නේ නැහැ. ඒ නිසා ඒ තැන්පත්කරුවෝ, ඒ අදාළ සභාපතිවරයාගේ පුතා මිලියන 180 ක් අරන් තිබෙනවා. එයා තවම ඉන්නවා නිකම් වත්තෙගෙදර හන්දියට වෙලා කිසිම ගැටළුවක් නැතිව. ඒ නිසා ගරු ඇමතිතුමනි, මේ පිළිබඳව සොයා බැලීමක් කරන්න. මම ඔබතුමාට සුභාශිංසන පුද කරනවා. ඔබතුමා ඇත්තටම හික්මීමෙන් - ඔබතුමා සවන් දෙනවා ඕනෑ වෙලාවක. ඔබතුමා අපට ඕනෑම අවස්ථාවක උදව් කිරීමක් කරනවා. ඒකට මගේ කෘතවේදීත්වය මේ අවස්ථාවේ පුද කරනවා. බොහොම ස්තුතියි.

[අ.භා.04.40]

**ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ**
Hon. Upul Mahendra Rajapaksa

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, විශේෂයෙන් අපේ ගරු ඇමතිතුමා. ගම්පහ දිස්ත්‍රික්කයට ඉන්න අපේ එකම ඇමතිතුමාගේ වැය ශීර්ෂය වෙනුවෙන් කථා කරන්න ලැබීම පිළිබඳව සතුටුයි. විශේෂයෙන් මම පෞද්ගලිකව විශ්වාස කරන්නේ අපේ මන්ත්‍රීතුමා කිව්වා වාගේ, අපේ මේ ඇමතිතුමාට ලැබුණු අමාත්‍යාංශය තමයි පුද්ගලයෙක් වශයෙන් බලන කොට ඉතාමත් හොඳ අමාත්‍යාංශය. ගෙදර ගැන ගත්තත්, මහා මාර්ග ගැන ගත්තත්, එහෙම නැත්නම් ජීවනෝපාය ගැන ගත්තත් එන ඕනෑම කාරණයක් දිහා බලපුවාම එක අතකට මේක පින් කර ගන්න පුළුවන් ආයතනයක්. ඒ ආයතනයේ ඒ අවශ්‍ය කාරණාව ඒ විධියට සිද්ධ වුණාද කියන එක තමයි මට තිබෙන කාරණාව. ඇමතිතුමා බොහොම හොඳ කෙනෙක්. එතුමාගේ ලේකම්තුමිය, එතුමාගේ සංවර්ධන සැලසුම් අධ්‍යක්ෂ මණ්ඩලය, ඒ කාර්ය මණ්ඩලය, පෞද්ගලික නිලධාරීන් ඉතාමත් හොඳ අය. ඒ අයගේ කාර්යභාරය ඉටු කරන්න ඇති. නමුත් අමාත්‍යාංශ ගණනාවකින් මෙය සැදුම් අරගෙන තිබෙනවා. විවිධ දෙපාර්තමේන්තු ගණනාවකින් යුක්තයි. ඉතින් මහා මාර්ග දෙපාර්තමේන්තුවට අපි කවුරුත් කැමැතියි. පාරවල් ටික හැදෙනවා. පාර කාපට් වෙනවා. ඒකේ ගිහිල්ලා අඩුපාඩුවක් වුණා නම් පළාත් බඳ මාර්ග සංවර්ධන අධිකාරියේ අපි සභාපතිතුමාට කිව්වත්, GM මහත්තයාට කිව්වත්, අපේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීතුමාට කිව්වත් අපට ඒ සහයෝගය ලැබෙනවා, ඇමතිතුමාගේ උපදෙස් මත. ඉතින් මේ කාලයක් ගත වෙලා තිබෙනවා. මම උපදේශක කාරක සභාවටත් ඇවිල්ලා කිව්වා මේ පාරවල් අත්පත් කර ගැනීමක් කරන්න ඕනෑ. මේ පාරවල්වලට නියමිත ගැසට් එකක් තිබෙන්න ඕනෑ. අද එහෙම නැති එක හරි ගැටළුවක්. අද බස්නාහිර පළාත් සභාව පිහිටුවලා විශාල කාලයක් ගත වුණත්, තව අත්පත් කර ගැනීමක් - පාරට නියමිත ප්‍රමාණයක් සඳහන් වෙලා නැහැ. ඒ නිසා මිනිස්සුන්ගේ ඉදිකිරීම් නිරන්තරයෙන් සිද්ධ වෙනවා. ඒ අතර පාරවල්වල විවිධ බාධක ඇති වෙනවා. එයින් සමහර විට වතුර බැස යාමේ ප්‍රශ්න තිබෙනවා. එහෙම නැත්නම් පාර පටු වීම් ප්‍රශ්න තිබෙනවා. ඉතින් මේවා ලිහාගන්න ගියාම, ඒ පල්ලෙහා විධායක ඉංජිනේරු කාර්යාලවල ඉන්න නිලධාරීන් අපහසුතාවයට පත් වෙනවා.

ඒ නිසා මම ඔබතුමාට මතක් කරනවා. පුළුවන් නම් මේවා අත්පත් කර ගන්න. මෙන්න මේ ප්‍රමාණය අපට අයිති ප්‍රමාණයයි. මේ තුළ ඉදිකිරීම තහනම්. මේ තුළ ගොඩ නගන්න තහනම්. මේ තුළට ඉස්සරහාට එන්න බැහැයි කියලා ජනතාව දැනුවත් වුණාම, ඒ කාරණය ඉටු කරන්න පුළුවන්. ඒක මහා මාර්ග පැත්තෙන් ගන්න කොට තිබෙන කාරණාවක්. මම මේ බස්නාහිර පළාත් සභාව දැන් අවුරුදු 4 ½ ක කාලයක් නියෝජනය කළත්, මම කවදාවත් සමූපකාර ක්ෂේත්‍රය ගැන කථා කළේ නැහැ. අත්තනගල්ල විවිධ සේවා සමූපකාරය පිළිබඳව ඇමතිතුමාගේ හෘදය

[ ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ ]

සාක්ෂිය දන්නවා. හොඳම සමූපකාර සේවයක් ලබා දුන්නේ. රෝහල් සේවයත්, පාරිභෝගික අංශයත්, බැංකු අංශයත් ඉතාමත් ඉහළ තැනට තිබුණු තැනක්. අද අනිච්චාවත සංඛාරා, අත්තනගල්ල සමූපකාර සේවයට. කඩ අටයි ඇරලා තිබෙන්නේ. ග්‍රාම සේවා වසම් 151 ක කඩ 110 ක් 120 ක් තිබුණා. අද කඩ 09 යි ඇරලා තිබෙන්නේ. එතකොට සමූපකාර රෝහල් අංශය ඉතා වේගයෙන් බිඳ වැටිලා තිබෙනවා. මම හිතන්නේ මෙහෙම කාලයක් යන කොට බැංකු අංශයත් ඉතා ඉක්මණින් බිඳ වැටෙයි. මේ සියල්ල අද පරිපාලන වශයෙන් බිඳ වැටිලා තිබෙනවා. මේවා කවදා ආපහු ගොඩ ගන්නද? වැඩිහිටි අයගේ හදවත වාගේ. මේ සමූපකාර සේවය කියලා කියන්නේ, මිනිස්සු ආදරය කරපු තැන. මිනිස්සුන්ගේ ජන ජීවිතය ගොඩ නගපු තැන. ඒකට මොන තරම් දෙයක් සමාජයේ කරන්න පුළුවන්ද? මේවා සියල්ල බිඳ වැටිලා තිබෙනවා. මේවා කොතැනින් නැවත ආරම්භ වෙයිද කියලා කියන්න පුළුවන්කමක් නැහැ.

අපට හිටියා හොඳ නිලධාරියෙක්. ග්‍රාම සංවර්ධන අංශයේ ගුණපාල කියලා මහත්මයෙක්. එතුමාව මම හඳුනන්නේ මේ පළාත් සභාවට එන්න පෙර. ප්‍රජා ජල ව්‍යාපෘති කරන කොට. මා එතුමා එක්ක බොහොම ළබැඳියාවෙන් වැඩ කරපු කෙනෙක්. එතුමා හොඳ රාජ්‍ය නිලධාරියෙක්. ගරු ඇමතිතුමා උත්සාහ කරන්න ඇති එතුමාව තවදුරටත් මේ රාජ්‍ය සේවයේ රඳවා ගන්න. නමුත් රාජ්‍ය සේවයේ තිබෙන යම් යම් ක්‍රම නිසා ඉවත් වෙන්න සිදු වුණත්, ග්‍රාම සේවා නිලධාරීන්ට එතුමා එතුමාගේ නිලධාරීන් එක්ක හොඳ හයියක් දුන්නා. ගමට ගිහිල්ලා ග්‍රාම සංවර්ධනය කියලා වචනයෙන්, හොඳ පරිසමාප්තියෙන් හොඳ වැඩ සටහන් කළා. ඒ හරහා අපේ අත්තනගල්ල ආසනයේ ග්‍රාම සංවර්ධන සමිති අඛණ්ඩව මේ බස්නාහිර පළාතේ ප්‍රථම ස්ථානය දිනා ගත්තා. ව්‍යාපෘති අංශයෙන් ගත්තත්, ඒවා පවත්වාගෙන යෑම ගත්තත් ඉතා හොඳ ග්‍රාම සංවර්ධන ව්‍යාපාර. පුංචි මුදල්වලට මිනිස්සුන්ගේ ශ්‍රම සහභාගීත්වය ඇති කර ගෙන වැඩ සටහන් කළා. ශ්‍රම සහභාගීත්වයෙන් විවිධ දේවල් සංවිධානය කළා. ඉතින් මේ අමාත්‍යාංශය සමූපකාර කොමිෂන් සභාවේ ලේකම්තුමිය හරහා පවත්වාගෙන යනවා. අපි ඒ අමාත්‍යාංශයෙන් වුණු කාර්යභාරයත් අගය කරන්නට ඕනෑ. ඒකයි මම ඉස්සෙල්ලාත් කිව්වේ. නිවාස ප්‍රශ්නය ගත්තත්, ඉස්සෙල්ලා කොමසාරිස්තුමියත්, වැඩ බලන කොමසාරිස්. ඒ හරහා විශාල කාර්යභාරයක් ප්‍රදේශයේ ජනතාවට වෙනවා. වැහි පොදක් වැටෙන හැම තිස්සේම ඇමතිතුමාව මතක් වෙනවා. අනේ අපේ ඇමතිතුමා නේද තහඩුව දුන්නේ. මේ නිවාසය ගොඩ නගා ගන්න. ඊයේ උදේ එන්නට පෙර මම මළ ගෙදරකට ගියා. දුවගෙන ඇවිල්ලා ළමයෙක් කියනවා, අනේ මන්ත්‍රීතුමා, ඔබතුමා දුන්න සල්ලිවලින්, ග්‍රාම සංවර්ධන අමාත්‍යාංශයෙන් දුන්න සල්ලිවලින් මේ ගේ හදා ගත්තේ. අපට සතුටක් ගෙන දෙන කාරණා. ඒ හින්දා අපි හැම දෙයක්ම හෘදය සාක්ෂියට එකඟ වෙන්ට ඕනෑ. අපට මේ තිබෙන්නේ යමක් කිරීමෙන් ලබන සතුට. මේක ජනතාවට ප්‍රකාශ කරනවා නම්, ඒ හරහා විශාල වැඩ කොටසක් කරන්න අපි සැලසුම් කරන්නට ඕනෑ. ඒ සඳහා මුදල් වැඩිපුර වෙන් කරන්නට ඕනෑ. ඒ හරහා ජනතාවට සේවය කරන්න අපි කටයුතු කරන්නට ඕනෑ.

මම විශේෂයෙන් කර්මාන්ත පැත්ත ගන්න කොට, කර්මාන්ත අමාත්‍යාංශය ගන්න කොට කර්මාන්ත අමාත්‍යාංශයේ බිඳුනු පුටුව කියන වැඩ සටහන හොඳ වැඩ සටහනක්. ඒ හරහා ලොකු වැඩ කොටසක් වුණා. මම නිරන්තරයෙන් කියන දේ, හිතන දේ තමයි මේ බස්නාහිර පළාත ඒකාබද්ධ වන්නට ඕනෑ. ඇමතිවරු වෙන වෙන වැඩ කරන්න ගියොත් ඒ වැඩවල ප්‍රගතිය දකින්න අමාරුයි. අධ්‍යාපන අමාත්‍යාංශය, කර්මාන්ත අමාත්‍යාංශය එක්ක බද්ද වුණොත් ඒ හරහා අපට ලොකු වැඩ කොටසක් කරන්න පුළුවන්. සෞඛ්‍ය අමාත්‍යාංශය තව අමාත්‍යාංශයක් එක්ක බද්ද වුණාම බද්ධ වැඩ සටහන් කළොත් හොඳ වැඩ සටහන් ගණනාවක් මේ පළාත් සභාවට හඳුන්වා දෙන්න පුළුවන්. ඒ අතර බිඳුනු පුටුව හොඳ වැඩ සටහනක් වුණත් මම මේ බස්නාහිර පළාතට, මම ජීවත් වන අත්තනගල්ල ආශ්‍රිත ප්‍රදේශයට - මේ රටට නිදහස ගේන කොට වළගම්බා රජ්ජුරුවෝ වසර 18 ක් සැඟවිලා හිටියේ මගේ ගම ආශ්‍රිත ලෙනේ. වාරණ කියන ලෙනේ. එතැන හිටපු නිසා වෙන්න පුළුවන් අපේ ප්‍රදේශ යම් ප්‍රමාණයක පාරම්පරික ගම්මානවලින් සැදුම්ලත් ගම්මාන වී තිබෙන්නේ. ඒවායේ මැටි කර්මාන්තය. ඒ වාගේම රත්තරන් කර්මාන්තය. කම්මල් කර්මාන්තය, හම් කර්මාන්තය. වේවැල් කර්මාන්තය. මේ වාගේ කර්මාන්ත ගණනාවක් තිබෙනවා. මම මේ අමාත්‍යාංශයට ඇවිල්ලා කටේ කෙළ හිඳෙනකල් කිව්වා, මෙන්න මේ පාරම්පරික මිනිස්සුන්ට ජීවත් වෙන්න අයිතියක් ලබා දෙන්න. මේ මිනිස්සුන්ගේ ජන ජීවිතය

ගොඩ නගන්න, තමන්ගේ වෘත්තීය අයිතීන් රැකලා දෙන්න. ඒ මිනිස්සු තමන්ගේ දණහිස් ගෙව්ලා. කොණ්ඩේ සුදු වෙලා නොවෙයි, අර පැලිලා වාගේ වුණු මිනිස්සු, බොහොම දුක් විඳින මිනිස්සු ඉන්නවා මැටි කර්මාන්තයේ. මේ අයගේ ජන ජීවිතය ගොඩ නගන්න. හම් කර්මාන්තය කරන අයට දෙන්න. සංගීත භාණ්ඩ හදන ගම්මානයට ඇවිල්ලා උදව් කරන්න. නිලධාරීන් ඇවිල්ලා බැලුවා. ගෙයින් ගෙට ගියා. කිසිම උදව්වක් කරන්න පුළුවන්කමක් ලැබුණේ නැහැ. අද ප්‍රධාන ලේකම්තුමාත් එතැනට ගියා. එතුමාත් ලිපියක් එව්වා. මේ කර්මාන්තකරුවන්ට උදව් කරන්න ඕනෑ. කිසිම කෙනෙක් - රැකියාවක් ඉල්ලා ගෙන එන්නේ නැහැ. අහිංසක මිනිස්සු. ඒ මිනිස්සුන්ගේ බලාපොරොත්තු බිඳ වැටුණා. මම මේ වසර පහේම උත්සාහ කළා. මොනවා හරි දෙයක් මේ මිනිස්සුන්ට කරලා දෙන්න. කරන්න පුළුවන්කමක් ලැබුණේ නැහැ. මේ අහිංසක මිනිස්සු වේලක් කනවා නම් මිනිස්සුන්ට මැටි ටික ඇද ගන්න විධියක් නැහැ. හම් ටික වේලා ගන්න බැරි වුණු දාට, ජීවත් වෙන්න බැරි මිනිස්සු ඒ ප්‍රදේශවල ජීවත් වෙනවා. අපට දුකයි. මම ඊයේ දවසෙත් කිව්වේ, මම මෙතැනට ඇවිල්ලා තිබෙන්නේ ව්‍යාපාරිකයෝ පොහොසත් කරන්නවත්, එහෙම නැත්නම් තවත් කොන්ත්‍රාත්කරුවෝ පොහොසත් කරන්න නොවෙයි. අහිංසක මිනිස්සුන්ගේ හඬ වෙනුවෙන්. ඒ මිනිස්සු අපට ඡන්දය දීලා පත් කළේ, උඹලා ගිහිල්ලා අපි වෙනුවෙන් මොනවා හරි දෙයක් කථා කරපල්ලා. අපි වෙනුවෙන් යමක් ගමට ගෙනෙල්ලා කියලා. නමුත් අපට ඒකට පුළුවන්කමක් ලැබුණේ නැහැ. කනගාටුයි කියන්න මේ කාරණාව සම්බන්ධයෙන්.

ඒ වාගේම මට තව පුංචි කාරණාවක් තිබෙනවා. කනගාටුවක්. අත්තනගල්ල ආසනයේ සියනෑ සළු කියලා ආයතනයක් තිබෙනවා. ගරු ඇමතිතුමනි, එහි නිලධාරී මණ්ඩලය පත් කරන්න. වසර තුනක් ගත වුණා. නිලධාරීන් ගෙනැල්ලා සාකච්ඡාවක් තියා ගන්න. රෙදි පාසල් තැනින් තැන වැහිලා ගිහිල්ලා. ඒවා ගමේ ප්‍රජා ශාලාව බවට පත් කරන්න මම ලොකු හඬක් ගෙනාවා. උපදේශක කාරක සභාවට ගෙනාවා. එක රෙදි ඉස්කෝලයක්වත් මේ වන කල් ගන්න පුළුවන්කමක් ලැබුණේ නැහැ. ඒ නිසා අපට පාලනය කරන්න පුළුවන් නිලධාරීන් - ඒ ආයතන සම්බන්ධයෙන් අපි කටයුතු කරලා, සම්පත් විනාශ වෙන්න දෙන්නේ නැතිව කටයුතු කරන්න ඕනෑ. විශේෂයෙන් මට දෙයක් කියන්න තිබෙනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම කනගාටුවෙන් මේ කාරණාව කියන්නේ. මම අපේ ඇමතිතුමාටවත්, කාටවත් දොස් කියන්නේ නැහැ. මේවා නීති ගැටළු. නමුත් දැන ගන්න කියන්න ඕනෑ. මගේ පාරක් පවරා ගන්න මම 2011 දී මේ බස්නාහිර පළාතට දැම්මා ලියුමක්. බස්නාහිර පළාතට ඒ පාර පවරා ගන්න කියලා. පුළුවන්කමක් ලැබුණේ නැහැ. මේ ඉන්න ලේකම්තුමිය ප්‍රධාන හැමෝම උත්සාහ කළා. ඇමතිතුමාත් උත්සාහ කළා. තවම පුළුවන්කමක් ලැබුණේ නැහැ. බලන්න අවුරුදු නවයක් ගත වුණා පාරක් බස්නාහිර පළාතට පවරලා දෙන්න. ඇයි එහෙම වෙන්නේ? ප්‍රඥප්තියක් හදන්න තව වසර කීයක් ගත වෙයිද? ඇයි අපට එහෙම දේවල් කඩිනමින් ඉටු කර ගන්න බැරි. ඇයි අපි නිල කාලය තුළ යමක් ඉලක්ක කරලා නොකරන්නේ? ඒ කාරණාව ඉටු කරන්න. ඒ නිසා යම් යම් කනගාටු තිබුණත්, මේ බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයේ ඉන්න අපේ ඇමතිතුමා. අපට විශාල වැඩ කොටසක් කරලා දීලා තිබෙනවා. එතුමා බොහොම නිහතමානී කෙනෙක්. යම් යම් වැඩ කොටස් නිලධාරී අකාර්යක්ෂමතාවය - තව එකම එක කාරණයක් කියන්න අවසර දෙන්න. මේ කාරණාව මම කිවයුතුමයි.

මම මගී ප්‍රවාහන සේවය ගැන කියන්න හිටියා. මම එන්නේ ඉතාමත් දුෂ්කර ප්‍රදේශයක ඉඳලා. අත්තනගල්ල ආසනයේ කෙළවරක. තවම මිනිස්සු ගමේ බස් එක ගැන විශ්වාසය තියලා තිබෙන්නේ. මම උපදේශක කාරක සභාවට ඇවිල්ලා ගරු ඇමතිතුමාට වැඳලා කිව්වා. මගේ වචනය ගැන අහන්න එපා. හැම බස් හෝල්ට් එකකම තහඩු ගැලව්ලා ගිහිල්ලා තිබෙනවා. වතුපිටිවල ඉස්පිරිතාලේ ළඟ බස් හෝල්ට් එකේ තහඩු ගැලව්ලා. අහිංසක මිනිස්සු ළමයින්ට බෙහෙත් ගන්න ඇවිල්ලා ළමයා වඩා ගෙන බස් හෝල්ට් එකේ ඉන්නේ. හාමුදුරුවෝ හිටගෙන ඉන්නේ. අවුරුදු 60, 70 අහිංසක අම්මලා වැස්සට තෙමෙනවා. අව්වට වේලෙනවා. මේ බස් හෝල්ට් එකේ තහඩු ටික දාලා දෙන්න. පන්සල ළඟ තිබෙන බස් හෝල්ට් එකේ තහඩු ටික දාලා දෙන්න. මේවා කනකට ගත්තේ නැහැ. ඇමතිතුමා කිව්වා මේවා ඉක්මණින් කරලා දෙන්න. ඉංජිනේරු කාර්යාලයට කිව්වා. කරලා දුන්නේ නැහැ. ඒ නිසා තමන්ගේ හෘදය සාක්ෂිය, මේ බදු මුදල්වලින් පඩි ගන්න රජයේ නිලධාරීන් තේරුම් ගන්නට ඕනෑ. මේවා මේ අහිංසක මිනිස්සුන්ගේ බදු මුදල්වලින් ගන්න සල්ලි. අපි මේවා කළොත් තමයි මිනිස්සු සතුටින් කථා කරන්නේ. එහෙම නැති වුණොත් මේවා අපට සාප වෙනවා. ඒ නිසා මේවා ඉටු නොවීම සම්බන්ධයෙන් මම මගේ කනගාටුව මේ සභාවට ප්‍රකාශ කරමින් නිහඬ වෙනවා.

[අ.භා.04.50]

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, බෙහෙවින්ම ස්තුතිවන්ත වෙනවා කාලය ලබා දීම පිළිබඳව. මම විශ්වාස කරනවා මීට කලිනුත් වසර හතරක් තිස්සේ ඔබතුමාගේ අමාත්‍යාංශය සම්බන්ධයෙන් මේ වාගේම අයවැය විවාදවලදී අපි අදහස් දැක්වූවා. බොහෝ වෙලාවට අපි ඔබතුමාගේ අමාත්‍යාංශයේ ගුණ දොස් දැක්කා. අඩුපාඩු කිව්වා. හොඳ නම් හොඳයි කිව්වා. නරක නම් නරකයි කිව්වා. ගරු අමාත්‍යතුමනි, අපේ මේ අමාත්‍යාංශ අතුරින් මම දකිනවා, ඔබතුමාගේ අමාත්‍යාංශයට ලාභ උපයනවා නම්, ඉතාම කදිම ලෙස ලාභ උපයන්න පුළුවන්, හම්බ කරන්න පුළුවන් ආයතනයක්. ඔබතුමාගේ මේ විෂය ක්ෂේත්‍රය, මේ පොත් පිංච දිහා බැලුවාම මම ඔබතුමා නම්, මම ඉස්සෙල්ලාම මේ දැක්මයි, මෙහෙවරයි වෙනස් කරනවා. මේ ආයතනයේ, මේ අමාත්‍යාංශයේ Vision එකයි Mission එකයි ඉස්සෙල්ලා වෙනස් කරන්න ඕනෑ. මම විශ්වාස කරනවා. අපේ අමාත්‍යවරුන්ට මම මේ අධ්‍යාපනය ගැන කථා කරනවා නොවෙයි. නමුත් Strategic Management වාගේ විෂයයක් අපේ මේ පරිපාලනය කරන අයට උගන්වන්න ඕනෑ. එහෙම නැත්නම් මේවා කළමනාකරණය කරන්න බැරි වෙනවා.

දැන් ඔබතුමාගේ අමාත්‍යාංශ මොනවාද? මාර්ග, ප්‍රවාහන, සමූපකාර සංවර්ධන. එතකොට මෙතැන තිබෙනවා, ජනතාවට සෘජුව බලපාන අංශ ගණනාවක්. එක පැත්තකින් යටිතල පහසුකම්. ඔබතුමාගේ අමාත්‍යාංශයේ කටයුතුවලදී. හැබැයි, ඔබතුමාගේ දැක්ම දිහා බැලුවොත් මේ විෂයන් අතර නියම සම්බන්ධීකරණයක් ගොඩ නගා ගෙන නැහැ. අනික් එක සමූපකාර සංවර්ධන. ඊළඟට වෙළඳ. ඊළඟට නිවාස හා ඉදිකිරීම්. වතු යටිතල පහසුකම්. කර්මාන්ත හා ග්‍රාම සංවර්ධන. මට ඔබතුමාගේ මේ පොත් පිංච පෙරළගෙන පෙරළගෙන යන කොට - මම මැලේෂියාවේ ගිය වෙලාවක කුඩා නගරයක සංචාරය කළා. ඒකට කියන්නේ පුත්‍රජයා කියලා. මේක planed city එකක්. සකස් කරපු නගරයක්. මේ නගරයේ ඔක්කොම නූතනයට ගැලපෙන විධියට සියලු පහසුකම් ඇතිව තමයි මේ පුත්‍රජයා නගරය හදලා තිබෙන්නේ. මම විශ්වාස කරනවා, ඔබතුමා පුත්‍රජයා නගරයට ගිහිල්ලා ඇතැයි කියලා. ඒ නගරයට ගියා නම් අපට පේනවා. ඔබතුමාට දැක්මක් හදා ගන්න පුළුවන්. ඒ වාගේ නගරයක්, ඒ වාගේ දිස්ත්‍රික්කයක්, ඒ වාගේ පළාතක් හදන්න අවශ්‍ය සම්පත් සියල්ල ඔබතුමාගේ විෂය ක්ෂේත්‍රය ඇතුළේ තිබෙනවා. මම මේක කියන්නේ, මට රාජ්‍ය පරිපාලනය හා ව්‍යාපාර පරිපාලනය පිළිබඳව න්‍යායාත්මක දැනුමක් තිබෙන නිසා. මම ඒ පිළිබඳව පශ්චාත් උපාධි මට්ටමට, ඒ විෂයන් ගණනාවම හදාරලා තිබෙන නිසා. නැත්නම් ඔබතුමා හිතයි ඇයි මම මෙහෙම කියන්නේ කියලා.

ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ අමාත්‍යාංශයේ අපි පසුගිය කාලයේ අඩුපාඩු ගණනාවක් දැක්කා. ඒ අඩුපාඩු ගැන අපි කථා කළා. හැබැයි, වැදගත්ම දේ තමයි අපි දැක්කේ. ඔබතුමාගේ අමාත්‍යාංශයේ අඩුපාඩු හදා ගන්න ඕනෑ. පසුගිය කාලයේ වැඩියෙන්ම කථා බහට ලක් වෙලා ඇති. ඔබතුමාට කවුරුවත් කියන්නේ නැතිව ඇති. හැබැයි, ඔබතුමාගේ මුහුණට මම වැරදි නම් වැරදියි කියලා තිබෙනවා. අදත් කියනවා. මම දන්නවා, ඔබතුමා ඒවාට කළබල වෙන්නේ නැහැ. ඔබතුමාගේ වැරදි කියපු වෙලාවටත්, ඔබතුමා අමාත්‍යාංශයෙන් කෙරෙන්න ඕනෑ නම් කරන්න කියලා තියනවා. ඒ නිසා ඒ ගැන මම සතුටු වෙනවා.

ගරු සභාපතිතුමනි, පසුගිය කාලයේ කථාවක් තිබෙනවා, අලුත් බස් පර්මිට් පැටව් ගැහුවාය කියලා. දෙහිවල, රත්මලාන, මොරටුව, ගල්කිස්ස, පිළිකා රෝහල දක්වාත් අලුතෙන් බස් පර්මිට් දීලා තිබෙනවාය කියලා චෝදනාවක් තිබෙනවා. ඔක්කෝටම වැඩිය මේකේ ලොකුම චෝදනාව තමයි - මේ පර්මිට් ගත්ත අය මට පෞද්ගලිකව කථා කරලා තිබෙනවා. කථා කරලා කියලා තිබෙනවා, මේ පර්මිට් එක ගන්න අපි මෙපමණ මුදලක් අත යට දුන්නාය කියලා. මම දන්නේ නැහැ ඔබතුමන්ලා ගත්තාද? එහෙම නැත්නම් මේ අරන් දීපු වෙන කෙනෙක් සල්ලි ටික ගත්තාද කියලා. හැබැයි, මේක සත්‍ය වශයෙන්ම සිද්ධ වෙලා තිබෙනවා. ඊළඟට සල්ලිවලට Route Permit. මම දන්නේ නැහැ. අපේ ජගත් විතාන ගරු මන්ත්‍රීතුමා මට කිව්වා, එහෙම Route Permit මාරු කරන්න බැහැයි කියලා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ගම්පහ දිස්ත්‍රික්කය.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගම්පහ දිස්ත්‍රික්කය ගැන මට දැන් තොරතුරක් නැහැ. මට කවුරුවත් එහෙම කථා කරලා නැහැ. නමුත් ගරු මන්ත්‍රීතුමා, විස්තර නැතිව. මට ඒ ගැන මොකුත් කියන්න බැහැ. (බාධා කිරීමක්) ඒ නිසා දැන් බලන්න. මට කෙනෙක් කිව්වා. දැන් බස්වලට කොපමණ Route Permit දීලා තිබෙනවාද කියනවා නම්, බස් වලවල්වල වැටෙන්නෙත් ලලිත් නුවන්, ලලිත් නුවන් කියලාලු. ඒ නිසා ගරු ඇමතිතුමනි, මෙහෙම කථා අහන්න වෙන්නේ ඔබතුමාගේ අධීක්ෂණයේ ප්‍රශ්නයක් නිසා. කියමනක් තිබෙනවා. මිනිහෙක් වුණාම පොතක් ලියන්න ඕනෑ. ගහක් හිටවන්න ඕනෑ. පුතෙක් හදන්න ඕනෑ කියලා. ඔබතුමාට පුතෙක් ඉන්නවා.

**ගරු සුමිත් විජයමුණි ද සොයිසා**
Hon. Sumith Wijayamuni De Soysa

පුතෙක් නොවෙයි. දරුවෙක් හදන්න ඕනෑ.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ඔව්. දරුවෙක් හදන්න. දරුවෙක් හදලා තිබෙනවා. හරිද? පුතෙක්. පුතෙක් හදන්න කියලා කියන්නේ, පුතා මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ සභාපති කළා. අපි ආශිර්වාද කළා ඒකට. කළාද නැද්ද? මම පෞද්ගලිකව ඔබතුමාට කිව්වා, ඔබතුමාගේ පුතා මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ සභාපති - සමාජ විද්‍යාවේදී ඒක හොඳට පැහැදිලි කරනවා ගරු ඇමතිතුමනි. ඒකේදී කියන්නේ, ඕනෑම කෙනෙක් තමන්ට විශ්වාසවන්තම පුද්ගලයා තමයි ළඟ තියා ගන්නේ. ඒක හරි. ඒක ලෝකයේ ඕනෑ තැනක වෙන දෙයක්. ඒකේ සමාජ විද්‍යාත්මක කාරණයක් තිබෙනවා. ලංකාවේ විශේෂයෙන්. එහෙමද ඔබතුමා කියන්නේ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ලංකාවේ වැඩියි.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ලංකාවේ වැඩියි. ගරු ඇමතිතුමනි, ඒ නිසා ඕනෑම කෙනෙක් තමන්ගේ නෝනාව, දරුවාව තමන්ගේ ලේකම් කර ගැනීමේ වරදක් මම නම් දකින්නේ නැහැ. ඒකට හේතුවක් තිබෙනවා. විශ්වාසවන්තම කෙනාව ළඟම තියා ගන්න ඕනෑ. හැබැයි, ප්‍රශ්නය තිබෙන්නේ ඒක නොවෙයි. මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියෙන් ඔබතුමාගේ පුතාව අයින් කරන්නේ ජනාධිපතිතුමා. හැබැයි, අයින් කළාට පස්සේ ඔබතුමා මොකක්ද කරන්නේ? ඔබතුමාට තිබුණා පුතාව පොඩ්ඩක් පැත්තක තියන්න. හැබැයි, ඔබතුමා කළේ එතුමාව පෞද්ගලික ලේකම් කර ගත්තා. හැබැයි නිලධාරීනුත් කියනවා. අවශේෂ, අපේ මේ සම්බන්ධ සමහර දේශපාලඥයොත් කියනවා, පුතා නිලධාරීන්වත් පාලනය කර ගෙන ඊට ඉහළින් බොහොම බරපතළ විධියට කටයුතු කරනවාය කියලා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ නිසා මේක ඉතාම බරපතළ තත්ත්වයක්. වෙන්නේ මොකක්ද දන්නවාද? අන්තිමට කෘන්තක, රදනක, චාර්වක, පුරස්චාර්වක සියල්ලම හිරි වට්ටන්නේ නැතිව ගලවනවා. හිරි වට්ටන්නේ නැතිව ගැලවෙමින් තිබෙනවා. ඒ නිසා මේක බරපතළ තත්ත්වයක් විධියට තමයි අපි දකින්නේ. ඊළඟට බස් නැවතුම් පොළවල් හැදුවා. මේක දූෂිතයි. පැහැදිලිව කියනවා, දූෂිතයි. මම ඔබතුමාගෙන් මේ සභාවේදී ප්‍රශ්න මාලාවක් ඇහුවා. ඒ අහපු වෙලාවේ ඔබතුමා මට දුන්න උත්තරය මොකක්ද දන්නවාද? ඔබතුමාගේ බස් නැවතුම්පොල හැදුනේ නැති නිසා මේ ප්‍රශ්නය ඇහුවා කිව්වා. මගේ බස් නැවතුම්පොලට මම ලියුම් හතරක් දුන්නා, ඇමතිතුමා. ලියුම් හතරක් දුන්නා බස් නැවතුම්පොලවල් හදලා දෙන්න. අද වනකල් එකක්වත් හැදුනේ නැහැ. ඔබතුමා දන්නවා මේක හැදුනේ නැහැයි කියලා. ඒ නිසා මේක බරපතළ තත්ත්වයක්. සමහර මන්ත්‍රීවරුන්ගේ දෙකක් හැදිලා තිබෙනවා. (බාධා කිරීමක්) තුනක් හැදිලා තිබෙනවා කියලා අපේ සිරිකමල් මන්ත්‍රීතුමා කියනවා. ඒ නිසා මගේ නොහැදුනු නිසා කියනවා නොවෙයි. හැබැයි, මේ ගනුදෙනුව ඇතුළේ දූෂණයක් තිබෙනවා. ඒකයි මම කියන්නේ. මේවා වෙන්න දෙන්න එපා. ඊළඟට මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ තනතුරු රැසක් නීති විරෝධීව දුන්නා. මම ඔබතුමාට මේ සභාවේදීම මතු කළා. ඒත් ඔබතුමා දෙන්නේ නැහැ, දෙන්නේ නැහැ, දෙන්නේ නැහැ කියලා මේ තනතුරු ටික දුන්නා. සුදුසුකම් සපුරා නැති අයට. කනගාටුවක් තිබෙනවා. මොකද, මේ රටේ සුදුසුකම් තිබෙන ඕනෑ තරම් කොල්ලෝ කෙල්ලෝ ඉන්නවා. අද උපාධිධාරීන් ඕනෑතරම් ඉන්නවා.

[ ගරු සුසිල් කිඳෙල්පිටිය ]

දහස් ගණනක් පොර කනවා. අර ආණ්ඩුවෙන් උපාධිධාරීන්ට 50,000 කට ද කොහේද දෙනවාය කියලා අපට Call කරන්න ඇති එක දෙතුන් දාහක්. අනේ අපට රස්සාව අරගෙන දෙන්න කියලා. අපේ නීති විශාරද ජගත් කුමාර මහත්තයා මොකක්ද කිව්වා, ආණ්ඩුකරණයයි නීතියයි ගැන හෙණ ජාතකයක් ඇද බෑවා. හැබැයි, එතුමා කිව්වේ නැහැ 7000 ක සමෘද්ධි පත්වීම් දීම කොයි තරම් නීත්‍යානුකූලද නැද්ද කියලා. මම කියන්නේ, මෙපමණ රැකියා ප්‍රශ්නයක් රටේ තිබෙනවා. එහෙම තියෙද්දී ඔබතුමන්ලා නුසුදුසු අයට රැකියා දුන්නා.

සණස සමිතිවල ප්‍රශ්නය. විශේෂයෙන්ම එකක් අපේ රොඩ්නි ෆ්‍රේසර් ගරු මන්ත්‍රීතුමා මතු කළා. වත්තෙගෙදර. අනික් එක තමයි කොටිකාවත්තේ මම මතු කරපු ප්‍රශ්නය. අද වන තෙක් පරීක්ෂණවල ප්‍රතිඵල නැහැ. සීතාවක. ඒ වාගේ සණස සමිති ගණනාවක මුදල් පිළිබඳ ප්‍රශ්න තිබෙනවා. සීතාවක සමූපකාරයේ ප්‍රශ්නයක් තිබෙනවා. කෝටි 54 ක්. කෝ? දැන් සමූපකාරවලට ආපු චෝදනා, මම පෞද්ගලිකව කථා කරලා යැව්වා සමුපකාර කොමසාරිස්ට. අද වන කල් ප්‍රතිඵල නැහැ. අඩුම ගණනේ මේවාට මොනවාද වුණේ? මම දුරකථනයෙන් කථා කරලා, දෙසැරයක් අහලා, හම්බ වුණාමත් ඇහුවා. කොමසාරිස්තුමා, අර ප්‍රශ්නයට මොකද වෙන්නේ? හරි. මම ලබන සඳුදා බලලා එවන්නම්. ඒ සඳුදා කවදාවත් ආවේ නැහැ. ඒ සඳුදා දවස් හතෙන් කපලා දාලා වාගේ තමයි එතුමා වැඩ කරන්නේ. මෙහෙම වෙන්න බැහැ. මගේ ළඟ හිටියා නම්, මම ඇමති නම් මේ කොමසාරිස්ව ගෙදර යවලා ගොඩක් කල්. ඒ නිසා මෙහෙම කටයුතු කරන්න දෙන්න එපා. සමූපකාර සම්බන්ධයෙන් ආපු චෝදනා යැව්වාම මම දන්නවා. කොළොන්නාවේ සමූපකාරයේ සභාපතිතුමා මගෙත් හිතවතා තමයි. එතුමා අපේ පවුලේ හිතවතෙක්. හැබැයි, මම එතුමාට කථා කරලා කිව්වා. සභාපතිතුමා, ඔබතුමා සම්බන්ධයෙන් තිබෙන චෝදනාව මම යවනවා කොමසාරිස්ට. මේකට පරීක්ෂණයක් ඕනෑ. ඔබතුමා පරීක්ෂණයෙන් නිවැරදි වෙන්න. උදේ හවස හම්බ වෙන හිතවත් කෙනෙක් වුණත් එහෙම කළා. එතුමා මට කිව්වා. නැහැ, මන්ත්‍රීතුමා. පරීක්ෂණයක් කරලා මම නිවැරදිද නැද්ද කියලා ඔප්පු කරන්නම් කියලා. සමහරු සිය දිවි නසා ගන්නවා. කෝටි ගණන් සල්ලි. මොකක්ද මේ වෙලා තිබෙන්නේ? මේවා කාගේද? ඊළඟට ඔය පැත්තේම මන්ත්‍රීවරු කොපමණ සටන් කළාද සමූපකාර ඡන්ද ටික තියන්න කියලා. ඔබතුමා මේ සභාවේදී පොරොන්දු වුණා. මාස තුනක්ද කොහේද ඇතුළත ඡන්දය තියනවා. එහෙම කිව්වා නේ? එහෙම කිව්වාට තවම ඒවා සිද්ධ වුණේ නැහැ. ඒ නිසා ඒ ටික සිද්ධ වෙන්න ඕනෑ.

ඊළඟට PRDA එකේ පත්වීම් ගණනාවක් නීති විරෝධීයි. හැබැයි, පත්වීම් ගණනාවක් නිලධාරීන් මැදිහත් වෙලා නවත්වපු බව මම දන්නවා. සුදුසුකම් තිබෙන අය ඉන්දැද්දී තමන්ගේ අය දාන්න උත්සාහ කළා. නමුත් මට අද තොරතුරක් ලැබුණා. එහෙම නැවැත්වුවත් ඇමතිතුමා මේ සුදුසුකම්වලින් පිට පත්වීම් කිහිපයක් දීලා තිබෙනවා. ඊළඟට මේකේ ඉන්න මානව සම්පත් කළමනාකරු සම්බන්ධයෙන් මම චෝදනාවක් ගෙනාවා. මානව සම්පත් කළමනාකරුට සුදුසුකම් නැහැයි කියලා කිව්වා. මෙතැන තියන්න එපා කියලා කිව්වා. දැන් පරිපාලන නිලධාරියයි, මානව සම්පත් කළමනාකරු කියන්නේ, මානව සම්පත කළමනාකරණය කරනවා. හැබැයි, PRDA එකේ මානව සම්පත ලිංගික සූරා කෑම දක්වා වර්ධනය වෙලා කියලා කියනවා, මේවා වෙන්න දෙන්න එපා. මේවා බරපතළ ප්‍රශ්න.

ඊළඟට මම ඔබතුමාට කාරණයක් මතක් කරන්න කැමැතියි. දැන් වාහන ආදායම් බලපත්‍ර ගන්න මිනිස්සු මම හිතන්නේ, මිලියන 5000 කට වැඩිය අවුරුද්දකට අපට දෙනවා. එතකොට අපේ ආදායම් බලපත්‍ර ගන්න අයට හොඳ මාර්ග තිබෙන්න ඕනෑ. මම විශ්වාස කරනවා. අපි මාර්ග සංවර්ධනයට ප්‍රමාණවත් තරම් වැය කරලා - මම හිතන්නේ, මිලියන 500 යි මේ සැරෙත් දීලා තිබෙන්නේ. හරි නේද ඇමතිතුමා. මිලියන 500 ප්‍රමාණවත් නැහැ. ආදායම් බලපත්‍ර ගන්න අයට අඩුම ගණනේ අපි සාධාරණ සේවයක් සලසන්න ඕනෑ. . මේ පාරවල් ටික මීට වැඩිය සකස් කරන්න ඕනෑ. අනෙක් එක පළාත් සභාවට, අපට තව පාරවල් පවරා ගන්න ඕනෑ. අපට තව පාරවල් පවරා ගන්න නම්, අපි ඒ පාරවල් සම්බන්ධයෙන් මීට වඩා එහා ගිහිල්ලා කටයුතු කරන්න ඕනෑ. නඩත්තු කරන්න ඕනෑ. ඒ නිසා මේ සම්බන්ධයෙන් මීට වඩා අවධානය යොමු කරන්න ඕනෑය කියලා මම විශ්වාස කරනවා. ඒ වාගේම අපට මේ මාර්ග පවරා ගැනීම සම්බන්ධයෙන් ප්‍රතිපත්තිමය තීරණයක් ගන්න වෙනවා. මම හිතන්නේ, ඔබතුමා ඒ සම්බන්ධයෙන් කටයුතු කරනවා. ඒ සඳහා ප්‍රඥප්තියට සංශෝධනයක් අවශ්‍ය වෙනවා ඇති.

ඊළඟට මම අගය කළ යුතු කාරණයක්. මම මීට කලිනුත් මේ ගැන කිව්වා. PRDA එකෙන් මේ ගොඩනැගිල්ල ඉදි කිරීම. අපි මේ ගොඩනැගිල්ලට බිලියන 6.5 ක් වියදම් කළා. ඇත්ත වශයෙන්ම ඔබගේ ආයතනය නොවන්නට මීට වඩා පරිපාලන වියදමක් අපට අනිවාර්යයෙන්ම මේ ගොඩනැගිල්ල ඉදි කරන්න වැය කරන්න වෙනවා. මම හිතන්නේ ඇත්ත වශයෙන්ම මේක විශාල ජයග්‍රහණයක්. ඔබතුමාගේ ආයතනයේ සිවිල් ඉංජිනේරුවෝ 23 දෙනෙකු ඉන්නවා. මෙවැනි ගොඩනැගිලි ඉදි කිරීම පිළිබඳව අද ඔබතුමාගේ PRDA ආයතනයට තිබෙනවා, දැන් පළපුරුද්දක්. ඒ නිසා රජයේ ආයතන. දැන් මේ වාගේ ඉදිකිරීම් කරන්න කොන්ත්‍රාත් ලබා ගන්න පුළුවන්කම තිබෙනවා. ඔබතුමාට මේකෙන් ආදායම් උපයන්න පුළුවන්. විශාල ආදායමක් උපයන්න පුළුවන්. රාජ්‍ය ආයතනයක් විධියට. හොඳ සේවයක් දෙන්න පුළුවන්. (බාධා කිරීම්) අපි ඒකට මාර්ගය හදා ගන්න ඕනෑ. අපි ඒ බාධා ඉවත් කර ගන්න ඕනෑ. ඔබතුමාට බාධාවක් තිබෙනවා නම් ඒ බාධා ටික ඉවත් කර ගෙන අපි ඉස්සරහාට යන්න ඕනෑ. ඊට අවශ්‍ය ප්‍රඥප්ති සංශෝධනය කර ගන්න ඕනෑ. ඒ නිසා අපි ඒක අගය කරන ගමන් මේ ආයතනවලින් මුදල් උපයන්න පුළුවන් මාර්ග මේ.

මම කලින් කිව්වා වාගේ ඔබතුමාට පුළුවන්, ඔබතුමාගේ ආයතන හරහා සුවිශාල ඉපයීමක් කරන්න. මුදල් ඉපයීම සඳහා කදිම මාර්ග ගණනාවක් තිබෙනවා. ඒක මනාව කළමනාකරණය කර ගත්තොත් ගරු ඇමතිතුමනි, මම දන්නේ නැහැ තව මාස හතරයි තිබෙන්නේ. ඔබතුමා නම් එන්න පුළුවන්. මම නම් මේ සභාවට එයිද දන්නේ නැහැ. හැබැයි, මම විශ්වාස කරනවා. ගෙවී ගිය අවුරුදු පහක කාලය තුළ මට තිබුණේ හඬ විතරයි. මගේ හඬ ඇතුලේ මම විශ්වාස කරනවා, මට කළ හැකි සේවයක් මේ පළාතේ සංවර්ධනය සඳහා, අඩුම ගණනේ මගේ අදහස් ටිකවත් මේ සභාවේදී කියන්න පුළුවන් වුණා. ඔබතුමා ආයිත් ඇමතිවරයා බවට පත් වුණොත් - අපි දන්නේ නැහැ. පත් වුණොත්, ඔබතුමාට පුළුවන් නම් මීට වඩා ලාභ ලබා ගන්න පුළුවන් ආයතනයක් බවට මේ අමාත්‍යාංශය පරිවර්තනය කරන්නැයි ඉල්ලා සිටිමින්, ඔබතුමාට සුභ පතමින්, කාලය ලබා දීම පිළිබඳව ගරු නියෝජ්‍ය සභාපතිතුමාට ස්තුතිය පුද කරනවා.

[අ.භා.05.05]

**ගරු පී. ආර්. පී. අබේගුණවර්ධන**
Hon. P. R. P. Abegunawardana

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ලලිත් වනිගරත්න ගරු ඇමතිතුමාගේ අමාත්‍යාංශයේ වැය ශීර්ෂ 107, 121, 122, 123, 124, 125 හා 103 යටතේ වචන ස්වල්පයක් කථා කරන්න අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් මම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. මම විශේෂයෙන්ම ලලිත් වනිගරත්න ගරු ඇමතිතුමාගේ වැය ශීර්ෂයට පෙර මේ බස්නාහිර පළාත් සභාව ලංකාවේ තිබෙන උත්තරීතර පාර්ලිමේන්තුව ඇරුණාම තිබෙන දෙවැනි ආයතනය තමයි බස්නාහිර පළාත් සභාව කියන්නේ. ඒ කියන්නේ ලංකාවේම තිබෙන පළමුවැනි පළාත් සභාව. පාර්ලිමේන්තුව ඇරුණාට පස්සේ මේක තිබෙන්නේ. බස්නාහිර පළාත් සභාව. නමුත්, අපි මන්ත්‍රීවරු හැටියට මේ හය වැනි පළාත් සභාවේ අවසාන අයවැයට අද සෑම කෙනෙකුම මෙතැනට පිවිසිලා තිබෙන්නේ.

නමුත් ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, සමහර වෙලාවට අපට කියනවා ඇහෙනවා, අපි උදේ ඉඳන් හවස් වෙනකල් මෙතැන කාලය ගත කරනවා. සමහර වෙලාවට මෙතැන කියනවා. මුන්ට වැඩ නැතිවට මුන් හිටියාට, අපට වැඩ තිබෙනවා කියලා. නමුත් අපි මහජන නියෝජිතයෝ හැටියට අපි අපේ කාලය කළමනාකරණය කර ගන්නවා. අපට වැඩ නැතිව නොවෙයි. අපිත් මහජන නියෝජිතයෝ. ඒ හැම කෙනෙකුටම ඒ මහජන නියෝජිතයන්ට වැඩ තිබෙනවා. ඒ වැඩත් එක්ක අපේ කාලය අපි කළමනාකරණය කර ගෙන, අපට තිබෙන අර දින පොතේ ඒ වැටෙන දිනය කොපමණ වැඩ තිබුණත් අපි ඒ දිනය සඳහන් කර ගෙන අපි එදාට අපේ මුළු කාලයම මේකට වැය කරනවා. මම කනගාටු වෙනවා. මේ බස්නාහිර පළාත් සභාව මේ ලංකාවේ ආර්ථික මර්මස්ථාන සියල්ල ආවරණය වන, බස්නාහිර පළාත් සභාවේ ජනතාවගෙන් තේරී පත් වෙලා මහජන නියෝජිතයෝ හැටියට අපි මෙතැනට ඇවිල්ලා වැඩ කටයුතු කරන කොට, මන්ත්‍රීවරු හැටියට හැම කෙනෙක්ම ඒ තමන් ලබා ගත්ත මන්ත්‍රී ධූරයෙන් ජනතාවට වැඩ කරනවා වාගේම, මේ බස්නාහිර පළාත තුළ ඇවිල්ලා මේ පළාත් සභාවේ ඉන්න මන්ත්‍රීවරුත් එක්ක, ඇමතිවරුත් එක්ක මේ වාද විවාදවලට සම්බන්ධ වෙලා ඒ තිබෙන හොඳ නරක බෙදා ගන්න සියලු දෙනාම මෙතැනට පැමිණෙනවා නම් හොඳයි කියන එක මම මේ වෙලාවේදී ප්‍රකාශ කරනවා.

එසේ ප්‍රකාශ කරමින් ඔබතුමාගේ වැය ශීර්ෂය යටතේ විශේෂයෙන්ම මම පළාත් බද මාර්ග සංවර්ධන අධිකාරිය ගැන තමයි විශේෂයෙන්ම කථා කරන්න බලාපොරොත්තු වෙන්නේ.

ඒ පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරිය ගැන කථා කරන කොට ගරු ඇමතිතුමනි, මම කළුතර දිස්ත්‍රික්කය, කළුතර ආසනය නියෝජනය කරන මන්ත්‍රීවරයෙකු හැටියට අපේ ආසනයේත් මන්ත්‍රීවරු දෙන්නෙක් ඉන්නවා. ඔබතුමාගේ අමාත්‍යාංශයෙන් හැමදාම මේ පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරියට හැම වර්ෂයේම යම් මුදලක් වෙන් වෙලා, ඒ පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරියේ ප්‍රධාන ඉංජිනේරුතුමා සහ අනෙකුත් අය අපත් එක්ක සාකච්ඡා කරලා ඒ හඳුනාගත්ත වැඩ කොටස ඔබතුමාගේ ප්‍රධාන ආයතනයට යොමු කරනවා 1, 2, 3 කියලා. ඒ සඳහා වෙන් වෙන මුදල ඒ අසානයට ගිහිල්ලා, ඒ ආසනයේ යම්කිසි සංවර්ධනයක් කළාට පසු - අපි දන්නවා. හැම කෙනෙකුම දේශපාලන අධිකාරිය හැටියට නාම පුවරුවක් සකස් කරලා සවි කරනවා. අපේ ආසනය තුළ නම නොකිව්වාට ඇමතිවරයෙක් එතුමා දුවලා ගිහිල්ලා නාම පුවරුවක් ගහගන්නවා. එතුමාගේ පින්තූරය සහ අපි නොදැකපු අයව දාලා. තව මන්ත්‍රීවරයෙක් ඉන්නවාය කියන එක අමතක වෙලා ඇති. පසුගිය කාලයේ අපි දේශපාලනික වශයෙන් යම්කිසි මතවාදයක හිටියා. අපි හිටියත් මේ පළාත් සභාවේ ඔබතුමාගේ වැය ශීර්ෂය වෙනුවෙන්, පළාත් සභාවේ අයවැය වෙනුවෙන් අපි හැම කෙනෙක්ම අත උස්සලා, ඒ අයවැය ජයග්‍රහණය කරලා දුන්නා. එක්සත් ජාතික පක්ෂයත්, අනෙකුත් අයත් සහයෝගය දෙන ගමන් අපිත් අත පල්ලෙහා දැම්මේ නැහැ. ජයග්‍රහණය කරන්න සහයෝගය දුන්නා. ඒ වාගේම ඔබතුමාගේ උපදේශක කාරක සභාවේ නියෝජනය කරන මන්ත්‍රීවරයෙක් මමත්. හැමදාම ඒකට එනවා. කලාතුරකින් තමයි දවසක් එන්න බැරි වෙන්නේ. ඒකත් කථා කරලා දැනුම් දීමක් කරනවා. නමුත් කනගාටුවට කරුණක්. අපේ ඉන්න ඒ ඇමතිවරයා ඒ නාම පුවරුව සකස් කරලා, තමන්ගේ පින්තූරය දාලා ඒකේ සඳහන් කරනවා, හරියට අම්මාගේ තාත්තාගේ බූදලෙන් ගෙනැල්ලා පාර හැදුවා වාගේ. ඒ නිසා ගරු අමාත්‍යතුමනි, ගරු නියෝජ්‍ය සභාපතිතුමා හරහා ඔබතුමාව මම දැනුවත් කරනවා. මේ ඉදිරි මාස හතරක කාලයේදීවත් ඔබතුමා දැනුවත් කරන්න මේ වාගේ වැරදි වැඩ කරන්න එපාය කියලා. අපි යම්කිසි කාලයක් කට වහගෙන හිටියා. නමුත් අවුරුදු හතරක් කට වහගෙන ඉඳලා දැන් මේ පහ ඉවර වෙන්න තිබෙද්දී මතක් වුණා, මේක වැරදි වැඩක්. මේකට කථා කරන්න ඕනෑ. ඔබතුමාගේ විෂය විතරක් නම් කමක් නැහැ. අධ්‍යාපන ඇමතිතුමාගෙන් ව්‍යූහ කමිටුව ගන්නා තීන්දු කලාප අධ්‍යක්ෂතුමිය ඇතුළු ඒ සියලු දෙනාගේ මතය අනුව වෙන් වන මුදල්වලටත් ගිහිල්ලා ඉස්කෝලේ බෝඩ් එකක් ගහනවා, මම මේ සල්ලි වෙන් කළේ කියලා. ඒ නිසා ඔබතුමා ඒක නිවැරදි කරයි කියලා මම විශේෂයෙන්ම හිතනවා.

ඒ වාගේම ගරු ප්‍රධාන අමාත්‍යතුමා එතුමාගේ අයවැය කථාවේ, මේ පොතේ ලියලා තිබෙනවා, පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ මේ දිස්ත්‍රික්ක තුනේ මාර්ග සියයට කොපමණ ප්‍රමාණයක් සංවර්ධනය වෙලා තිබෙනවාද කියලා. විශේෂයෙන්ම ගත්තාම ගම්පහ, කොළඹ, කළුතර. ඒකේදී ගරු අමාත්‍යතුමනි, අපි කළුතර 59% යි. ඒ වාගේම කොළඹ ගම්පහ දිස්ත්‍රික්කයේ 91% යි. කොළඹ දිස්ත්‍රික්කයේ 67% යි. අපේ තමයි 59% ක් පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරියේ මාර්ග සංවර්ධනය වෙලා තිබෙන්නේ. මොකද, භූමි ප්‍රමාණයෙන් ගත්තත් විශාලයි. අපි කළුතර දිස්ත්‍රික්කයේ මුළු භූමි ප්‍රමාණය වර්ග කිලෝ මීටර් 1598 ක් තිබෙනවා. විශාල භූමි ප්‍රදේශයක් තිබෙන ප්‍රදේශයක්. කළුතර දිස්ත්‍රික්කයේ පළාත් බද මාර්ග සංවර්ධන අධිකාරියේ මාර්ග තිබෙනවා, බොහොමයක් අවුරුදු ගණනාවක ඉඳන් අතවත් තියලා නැහැ. හැම වෙලාවේම පැච් එකක් දාලා වහනවා. ආපහු වහින කොට ඒ වළ හැදෙනවා. ආපහු වහනවා. මේ අවුරුදු ගණන තුළදී ගණන් හැදුවොත් මුළු පාරේම කාපට් එලන්න පුළුවන් තරම් මුදලක් වැය කරලා තිබෙනවා. ඒ පාරේ පැච් ටික දාන්න. ඒ නිසා ගරු අමාත්‍යතුමනි, මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා. මේ කළුතර දිස්ත්‍රික්කයට විශේෂ අවධානයක් 2019 වර්ෂයේදී යොමු කරන්නය කියලා. එම පොතේම යට කියවෙනවා, 2019 වර්ෂයේදී ලෝක බැංකු ආධාර ලබා ගෙන අදියර දෙකක් යටතේ පළාත් මාර්ග කිලෝ මීටර් 96 ක් කාපට් කිරීමට බලාපොරොත්තු වෙමි. අන්න ඒ 96 න් අඩුම වශයෙන් 40 ක් වත් කළුතරට දාලා දුන්නා නම් -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ගම්පහට.

**ගරු පී. ආර්. පී. අබේගුණවර්ධන**
Hon. P. R. P. Abegunawardana

ගම්පහට වැඩ කරලා තිබෙනවා. මේකේ සියයට ප්‍රතිශතයත් එක්ක ගම්පහයි කොළඹයි සැතීමකට පත් වෙන්න පුළුවන් ප්‍රමාණයකට වැඩ කරලා තිබෙනවා. කළුතර දිස්ත්‍රික්කය නියෝජනය කරන මන්ත්‍රීවරු හැටියට අපි කියන්නේ, මේක සමබරව - මේක තරාදියට දැම්මාම එක පැත්තක් උඩ, එක පැත්තක් යට යන්නේ නැතිව, සමබරව මේක සාදලා දෙන්නය කියලා ඉල්ලීමක් කරනවා. ඒ වාගේම පළාත්බඳ මාර්ග සංවර්ධන අධිකාරියේ සභාපතිතුමා ඇතුළු සියලු දෙනාටමත්, විශේෂයෙන්ම කළුතර කාර්යාලයේ අපේ ප්‍රධාන ඉංජිනේරුතුමා, අපිත් එක්ක බොහොම සහයෝගයෙන් වැඩ කරන කෙනෙක්. එතුමා ඇතුළු ඒ නිලධාරීන් සියලු දෙනාටම මේ අවස්ථාවේදී අපිත් එක්ක මෙපමණ කාලයක් වැඩ කිරීම සම්බන්ධයෙන් ස්තුතිවන්ත වෙනවා.

එතුමාගේ තවත් විෂයයක් තමයි සමූපකාරය. ඒක කිහිප තැනකදී කියැවුණා. නමුත් මම බොහොම පැහැදිලිව දන්නවා පසුගිය කාලයේ - ඔබතුමාටත් දෝෂාරෝපණයක් කරන්න බැහැ. ඔබතුමාවත් බිත්තියට හේත්තු කරනවා. අපි දේශපාලනය කරන නායකයොත් එක්ක හිටපු අය හැටියට අපි දන්නවා නායකත්වය බිත්තියට හිර කරන කොට ඉන් පල්ලෙහා ඉන්න කෙනා තමන්ගේ හෘදය සාක්ෂියට එකඟව උත්තරයක් දෙන්න ලැබුණත් ඒ බිත්තියට හේතු කිරීමත් එක්ක හෘදය සාක්ෂිය එළියට පනින්නේ නැහැයි කියලා. එක පැත්තකින් ඇමැතිකම භාර ගන්න ඕනෑ. ඒක පැත්තකින් ජනතාවට ඇහුම්කන් දෙන්නත් ඕනෑ. ඒක නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඇමැතිතුමා මේ වනකොට තීන්දුවක් අරගෙන තිබෙනවා. පසුගිය කාලයේ ඡන්ද නොතියපු සමූපකාර සමිතිවල ඡන්දය තියන්න කියලා. මොකද, කළුතර විවිධ සේවා සමූපකාර සමිතිය මගේ ආසනයේ ඉන්න අනෙක් ඇමැතිතුමා පාවිච්චි කරන්නේ තමන්ගේ බූදලයක් හා සමාන දෙයක් හැටියට. බොහොම වගකීමෙන් කියන්නේ. මේ ළඟදී එතැන වැඩ කරන නිලධාරීන්ට කියලා තිබෙනවා උඹලා ගිහිල්ලා මෙතැන තිබෙන දේවල් පිටට කියලා අහුවුණොත් ඉදිරි අනාගතයේදී අපි මේක අරගෙන උඹලාට කරන දේත් දන්නවා කියලා. ඒක නිසා වැඩ කරන සේවකයන්ට තර්ජනය කරලා තිබෙනවා. ඒ සියල්ල අවසන් කිරීමට අපට හැකි වෙනවා. ඔබතුමා මැතිවරණයකට මුහුණ දෙන්න. ඒ වාගේම මට විනාඩියක් දෙන්න ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. අපේ බේරුවල සමූපකාර ස්කාගරය. ඒ ස්කාගරය සම්බන්ධයෙන් අපි අවුරුදු ගණනාවක් කථා කරනවා. දැන් වනකොට ඒකේ නඩුවක් තිබිලා, ඉවර වෙලා තිබෙනවා. කොමසාරිස්තුමාගෙන් ඇහුවාම කියනවා appeal කළා කියනවා. සමූපකාර සමිතියේ නියෝජිතයෝ ගිහිල්ලා ඇහුවාම කියනවා නැහැයි කියලා. මේක කාට කියන්නද? එතුමා කියනවා appeal කරලාලු. අරගොල්ලෝ කියනවා නැහැ. නඩුව අවසන් කරලා කියලා. මම ඉල්ලීමක් කරනවා නඩුව අවසන් කරලා නම් මේක සාමාජිකයන්ගෙන් සැදුම්ලත් ආයතනයක් හැටියට, මේක අධ්‍යක්ෂ මණ්ඩලයෙන් ඉදිරියට ගෙනියන්න, ඒ සාමාජිකයන්ට යම්කිසි වරප්‍රසාදයක් ලබා ගන්න ඉඩකඩ දෙන්න. එහෙම නැති වුණොත් වෙන්නේ, එම ස්කාගරය මේ වනකොට වෙන කණ්ඩායමක් කරනවා. ඒකට නියෝජිතයෝ පත් කරලා තිබෙනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

බොහොම ස්තුතියි. අවසන් කරන්න ගරු මන්ත්‍රීතුමා.

**ගරු පී. ආර්. පී. අබේගුණවර්ධන**
Hon. P. R. P. Abegunawardana

හම්බ කරගන්නවා විනා ඒකේ ඉන්න සාමාජිකයන්ට කිසිම ලැබීමක් ලැබෙන්නේ නැහැයි කියන එක මේ අවස්ථාවේදී ප්‍රකාශ කරමින් ඔබතුමාගේ අමාත්‍යාංශයේ ලේකම්තුමිය ඇතුළු අනෙක් සියලුම දෙනාටත්, ඔබතුමාගේ ලේකම්තුමාටත්, සියලුම අයට අපත් එක්ක මෙපමණ කාලයක් වැඩ කිරීම සම්බන්ධයෙන් ස්තුතිවන්ත වෙනවා. අපි ප්‍රකාශ කළ අන්දමට මේ මාස හතර තුළදී ඔබතුමාගෙන් ප්‍රතිචාරයක් ලැබෙයි කියලා ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා.

[අ.භා.05.16]

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඇත්ත වශයෙන්ම මෙම අමාත්‍යාංශයේ වැය ශීර්ෂය සාකච්ඡා කරද්දී, විශේෂයෙන්ම මෙම සභාවේ ජගත් කුමාර ගරු මන්ත්‍රීතුමා ජාතික දේශපාලනයේ යම්කිසි කරුණු කාරණා ප්‍රමාණයකුත් සාකච්ඡා කළා. ඒකටත් යම්කිසි ප්‍රවේශයක් දෙමින් යම්කිසි

[ ගරු සුනිල් වටගල ]

අදහස් ප්‍රමාණයක් මේ සභාවේ සාකච්ඡා කිරීමට මේ අවස්ථාවේ මම බලාපොරොත්තු වෙනවා. විශේෂයෙන්ම ජගත් කුමාර ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කළේ, පාර්ලිමේන්තුවේ කථානායකතුමා අවුලක් කරලා තිබෙනවා. මේ කථානායකගේ තමයි ප්‍රශ්නය තිබෙන්නේ කියලා. විශේෂයෙන්ම මේක සාකච්ඡා විය යුත්තේම මධ්‍යම ආණ්ඩුවේ අයවැයක් සම්මත වෙලා නැති තත්ත්වයක් ඇතුළේ තමයි අපි මේ අයවැය අද දවසේ සාකච්ඡා කරලා සම්මත කර ගන්නේ. ඇත්ත වශයෙන්ම මුදල් කොමිෂන් සභාවේ පවතින නීතිරීතිත් එක්ක සංසන්දනය කරද්දී, ඇත්ත වශයෙන්ම අපේ ප්‍රශ්න මොනවාද කියන එක හරිහමන් විධියට අපි විසඳාගෙන නොවෙයි, මෙම අයවැය අපි සම්මත කර ගන්නේ. කොහොම වෙතත් ජගත් කුමාර ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කළ ආකාරයට මේ කථානායකවරයා කරපු අවුල මොකක්ද? ඇත්ත වශයෙන්ම කථානායකවරයාට යම්කිසි හැසිරීමක් කරන්න සිද්ධ වුණා නම්, ඒ හැසිරීම සිද්ධ කළේ - ප්‍රශ්නයේ මැදින් ජගත් කුමාර ගරු මන්ත්‍රීතුමා ඇල්ලුවේ. ප්‍රශ්නයේ මුල මොකක්ද? ප්‍රශ්නයේ මුල ජනාධිපතිවරයා. ජනාධිපතිවරයා ප්‍රශ්නයක් ඇති කළා ඔක්තෝබර් මාසේ 26 වැනිදා. ඒ ප්‍රශ්නයේ දිගුවක් ලෙස තමයි මේ ප්‍රශ්නයට කථානායකවරයාට මුහුණ දෙන්න සිද්ධ වුණේ. කථානායක පුටුවේ වතුර හැලුවේ කවුද? මිරිස් කුඩු ගෙන ගියේ කවුද? ඡන්දය විමසීමට අදාළ මයික්‍රෆෝන් කඩා බිඳ දැම්මේ කවුද? ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒක සජීවී රූපවාහිනීවලින් ඕනෑවටත් වඩා මේ රටේ පුරවැසියෝ දැක්කා. ඒක නිසා ඒවා ගැන දීර්ඝ විස්තර කරන්න ඕනෑ නැහැ. ඇත්ත වශයෙන්ම මේ දේශපාලන කුමන්ත්‍රණයේ මහ මොළකරුවා රටේ ජනාධිපතිවරයා. දෙවැනි කෙනා මහින්ද රාජපක්ෂ මහත්තයා බව මුළු රටටම දන්නවා. ඒක නිසා ප්‍රශ්නය මැදින් අල්ලන්න එපා කියලා අපි මේ අවස්ථාවේ ප්‍රකාශ කර සිටිනවා.

ඊළඟට ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මෙම අමාත්‍යාංශය සම්බන්ධයෙන් සාකච්ඡා කරද්දී කරුණු කිහිපයක් සාකච්ඡාවට භාජනය කරන්න කැමැතියි. විශේෂයෙන්ම මේ ගෙවුණු අවුරුදු තුන ඇතුළේ මේ අමාත්‍යාංශය ගත්තාට පස්සේ, මේ අමාත්‍යාංශය අපට පේන්නේ පවත්වාගෙන ගියපු එක පමණයි. විශේෂයෙන්ම අමාත්‍යාංශයේ පැති ගණනාවක් තිබෙනවා. ප්‍රධාන වශයෙන් දුවන ධාරාවන් කිහිපයක් තිබෙනවා. ඒ ධාරාවන්වල පවත්වාගෙන යෑම පමණයි සිද්ධ කළේ. හැබැයි අමාත්‍යාංශයට අයත් සමහර විෂයය පථයන් තිබෙනවා. ඒවාට උනන්දු වන නිලධාරී තාන්ත්‍රයක් ඉන්නවා. ඒ නිලධාරී තාන්ත්‍රය උනන්දු වුණත්, මේ අමාත්‍යාංශය යටතේ ඒ දුවන කොටස්වලට ලැබුණේ කුඩම්මාගේ සැලකිල්ල බව මම ප්‍රකාශ කරන්න කැමැතියි.

විශේෂයෙන්ම ගරු ඇමැතිතුමනි, අපට තිබුණා කර්මාන්ත දෙපාර්තමේන්තුව, කර්මාන්ත අධිකාරිය කිසියම් තැනකට ගන්න. මම දැක්කා රෙහෙන්සිරි වරාගොඩ මහත්තයා මෙතැනට ඇවිල්ලා හිටියා. හැම අයවැයකටම එනවා. හැම උපදේශක කාරක සභාවකටම එනවා. පුද්ගලිකවත් අපට කියනවා, මන්ත්‍රීතුමා මේ අධිකාරියේ මේ මේ ගැටළු තිබෙනවා. තිබෙන ප්‍රශ්න මේවා තමයි කියලා අපට ඉදිරිපත් කරනවා. හැබැයි ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ වරාගොඩ සභාපතිතුමාගේ මැදිහත්වීමේ ප්‍රමාණයට අද කර්මාන්ත දෙපාර්තමේන්තුව නැවතිලා තිබෙන තැන මොකක්ද? කර්මාන්ත අධිකාරිය තිබෙන තැන මොකක්ද? අඩුම වශයෙන් මම උපදේශක කාරක සභාවේ යෝජනාවක් ගෙන ආවා, මේ කර්මාන්ත අධිකාරියත්, විශේෂයෙන්ම පළාත් ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවත් සම්බන්ධ කරලා මේ බස්නාහිර පළාතට අදාළව හොඳ කර්මාන්තකරුවන් ටිකක් හදාගමු කියලා. ඇත්ත වශයෙන්ම ඒකට සභාපතිතුමාගේ උනන්දුව තිබුණා. ඊට පස්සේ අධ්‍යක්ෂතුමාගේත් උනන්දුව තිබුණා. මොකද, මේ පළාත් ව්‍යාපාර දෙපාර්තමේන්තුව කියන්නේ මහ ලොකු ආයතනයක් විධියට පවත්වාගෙන යන එක විතරයි අපි කරන්නේ. හැබැයි, ඒකේ මහ ලොකු කාර්ය භාරයක් නැහැ. මේ දෙක සම්බන්ධ කරලා වැඩක් කරමු කියලා අපි උපදේශක කාරක සභාවේ කථා කළා. හැබැයි මේ ගෙවුණු අවුරුදු හතර ඇතුළේ අපට දකින්න පුළුවන්කමක් තිබුණේ නැහැ මේ දෙක සම්බන්ධ කරලා වැඩක් හදනවා. කෝ බස්නාහිර පළාත් සභාවේ ඇති කරපු කර්මාන්තකරුවා? ඔහුගේ අනාගතය කුමක්ද? මේ සම්බන්ධ කාරණා ගොඩක් තිබෙනවා. ඇත්ත වශයෙන්ම අපි දැක්ක අලුත් නිමැවුමක් මොකක්ද තිබෙන්නේ? අලුත් නිර්මාණයක් මොකක්ද තිබෙන්නේ? එතකොට මේවා ගත්තාට පස්සේ ලොකු ගැටළු ප්‍රමාණයක් නිර්මාණය වුණා. මම දැක්කා පසුගිය දවස්වල සභාපතිවරයා විදේශ සංචාරයකට ගියා. තමුන්නාන්සේත් ඒ සංචාරයට ගියා නේ? හරි යන්න හම්බ වුණේ නැහැ.

හැබැයි මම දන්න විධියට මේ අමාත්‍යාංශයේ මුදලකුත් නොවෙයි. ඒ පරීක්ෂණ ආයතනවලට ගියේ තමන්ගේ සල්ලි වියදම් කරගෙන. එතකොට අමාත්‍යාංශයක් විධියට ඇයි අපට බැරි මේ වාගේ පරීක්ෂණ කටයුත්තකටත්, අඩුම ගණනේ කර්මාන්ත අධිකාරියේ අදාළ බලධාරීන් යවලා මේකේ අලුත් දෙයක් නිර්මාණය කිරීමට අදාළ මැදිහත්වීමක් කරන්න. අපට මොකක්ද වුණේ කියන කාරණාව අපි ඉස්සරහා තිබෙනවා.

ඒ වාගේම තමයි ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි හැමදාම මේ අමාත්‍යාංශය යටතේ සම්බන්ධ වුණු ප්‍රශ්නයක් තිබුණා. මේ සමුපකාර දෙපාර්තමේන්තුව යටතේ. ඉතාම කනගාටුදායක තත්ත්වයකට අපි ආවේ. විශේෂයෙන්ම මේ සමුපකාර දෙපාර්තමේන්තුව සමානවයි වත්තෙගෙදර සමිතිය. සමුපකාර දෙපාර්තමේන්තුව සමානයි අවිස්සාවේල්ලේ ප්‍රශ්නය. ඒ වාගේම පිළියන්දල ප්‍රශ්නය. මේවා අපි දිගින් දිගටම, දිගින් දිගටම සාකච්ඡා කළා. තමුන්නාන්සේලා සොයා බැලුවාද, මේ සාකච්ඡාවල ප්‍රතිඵලයක් වශයෙන් කාටද සහනය හම්බ වුණේ කියලා. ඇත්ත වශයෙන්ම අවම සහනයක්. පුංචි හරි අස්වැසිල්ලක් වෙන්න ඇති. නමුත් ගරු ඇමැතිතුමා අපට මහ ලොකු දෙයක් කරන්න තිබුණේ නැහැ. අපි ප්‍රශ්නය අතගෑවා විතරයි. ඊට පස්සේ කොමසාරිස්වරයා ප්‍රකාශ කරන්න පටන් ගත්තා මේ තිබෙන පනත ඇතුළේ, මේ තිබෙන නීතිය යටතේ මට කරන්න දෙයක් නැහැයි කියලා. ඒ වාගේ ප්‍රකාශ පවා සමුපකාර කොමසාරිස්වරයා ප්‍රකාශ කරන්න පටන් ගත්තා. ඉතින් මේකේ ඵලදායීතාවය ගත්තොත් වත්තෙගෙදර සමිතිය නැවතිලා තිබෙන තැන මොකක්ද? ඔවුන් දැන් සතුටින් ඉන්නවාද? අවිස්සාවේල්ලේ ප්‍රශ්නයක් මම මේ සභාවට දාලා, ඒකට මම මැදිහත් වුණා. හැබැයි මේ හැම එකකදීම ගරු ඇමැතිතුමනි, අපි දැකපු දෙයක් තිබෙනවා. ඒ දේ තමයි කර ඇරීමේ න්‍යාය. ප්‍රශ්නයක් දානවා. ඔබතුමා අපි අගය කරනවා. ඔබතුමාගේ මැදිහත්වීම මත සාකච්ඡා කැඳවනවා. වැඩක් හදන්න හදනවා. හැබැයි ඒ වැඩේ අස්සේ අපි දැක්කේ සමුපකාර දෙපාර්තමේන්තුව කර ඇරීමේ න්‍යායක් තිබුණා. මේ කර ඇරීමේ න්‍යාය ඔස්සේ ගිහිල්ලා මහ ලොකු සේවයක්, මේ සමුපකාර දෙපාර්තමේන්තුවට වුණේ නැහැ. සමුපකාර දෙපාර්තමේන්තුව යටතේ ආපු ප්‍රශ්නවලට උත්තර ලැබුණේ නැහැයි කියන විවේචනය තමුන්නාන්සේ ඉස්සරහා තිබෙනවා. ඒ වාගේම තමයි ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඔබතුමාගේ මාර්ගයෙන් විශේෂයෙන්ම අමාත්‍යවරයාගේ අවධානය යොමු කරන්න කැමැතියි. කවුරු හරි ඉන්නවා ගරු ඇමැතිතුමා ඔබතුමාගේ මේ පෞරුෂය කෙලෙසා දමන - මම දැක්කා මෙන්න මේ නාම පුවරු සෙල්ලම. තමුන්නාන්සේගේ නාම පුවරු තියෙනවා, අන්න අගලවත්ත ආසනයේ. තමුන්නාන්සේගේ නාම පුවරු තිබෙනවා කළුතර දිස්ත්‍රික්කයේ එහා කෙළවරේ තැන්වල. ඒක කියන්නේ Bus Halt එකක් හදනවා. තමුන්නාන්සේගේ ලොකු නාම පුවරුව මැද්දෙන් ගහනවා. කවුද මේවාට උපදෙස් දුන්නේ? එක් තමුන්නාන්සේලාගේ අදහස් නේ? නමුත් ඒ පින්තූරය ඇතුළේ ඔබතුමාගේ පෞරුෂය කියන කාරණාව මම දකින්නේ, තමුන්නාන්සේ ඕනෑතරම් විදේශ සංචාර යනවා ඇති. ඕනෑතරම් විදේශ රටවල ගිහිල්ලා බලලා ඇති. ඒවායේ මගීන්ට නවතින්න තිබෙන ස්ථානවල කාගේ නාම පුවරුවද තියෙන්නේ කියන්න? මේක හරි විහිළුවක් ගරු ඇමැතිතුමා. දැන් මෙතැන එහා පැත්තේ තලවතුගොඩ, කළල්ගොඩ පාරේ බොක්කුවක් හැදුවා ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමාත් සම්බන්ධ වෙලා. තමුන්නාන්සේගේ අමාත්‍යාංශයෙන් ලක්ෂ පහක සල්ලි අරගෙන. මම ඒ ප්‍රදේශයේ නිසා මමත් ඒකට සම්බන්ධ වුණා. මෙන්න ගරු ඇමැතිතුමා නාම පුවරුවක් ගහලා තියෙනවා, උපාලි කොඩිකාර ගරු මන්ත්‍රීතුමාගෙත්, අපි දෙන්නගෙත් මුහුණු දෙකට. ජනතා විමුක්ති පෙරමුණේ අපි ප්‍රතිපත්තියක් හැටියට මුහුණු ගහන්න එපා කියලා තිබෙන්නේ. අපේ මුහුණු ගහන්න එපා. ඕනෑ නැහැ. අපේ මුහුණත් දාලා උපාලි කොඩිකාර ගරු මන්ත්‍රීතුමාගෙයි තව කිහිප දෙනෙකුගේ දාලා තමුන්නාන්සේගේ මුහුණත් එතැන ගහලා තියෙනවා. දැන් කළල්ගොඩ මොකටද තමුන්නාන්සේගේ මුහුණ ගහන්නේ?

එතකොට ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මොකක්ද මේකෙන් බලාපොරොත්තු වෙන්නේ? අමාත්‍යාංශයේ සල්ලි. මේවාට කිසියම් හරි වියදමක් යනවා ඇති. එතකොට අමාත්‍යාංශයේ සල්ලි වැය කරලා මේ කරන නාඩගම මොකක්ද? මෙන්න මේ කාරණා තමුන්නාන්සේගේ අවධානයට යොමු කරනවා. සරත් පතිරණ ගරු මන්ත්‍රීතුමා හොඳ යෝජනාවක් කළා. අපේ තිබෙන විවේචනය තමයි තිබෙන දේ පවත්වාගෙන යන එක නේ තමුන්නාන්සේ කරන්නේ. අපි යම්කිසි වැඩක් කරලා පෙන්නමු. අලුත් දෙයක් කරලා පෙන්නමු. තමුන්නාන්සේට මාර්ග තිබෙනවා. ප්‍රවාහන තිබෙනවා. අලුත් වැඩක් හැටියට, නියමු ව්‍යාපෘතියක් විධියට සරත්

[ ගරු සුනිල් වටගල ]

පතිරණ ගරු මන්ත්‍රීතුමා තමයි කිව්වේ ජල මාර්ගවලින් ප්‍රවාහනය. කිසියම් ප්‍රතිපාදනයක් වෙන් කරලා ආදර්ශයක් විධියට අපි එහෙම වැඩක් කරලා පෙන්නමු.

එතකොට නිවාස ව්‍යාපෘතිවල - තමුන්නාන්සේ කරන්නේ අපට නිවාස ආධාර ප්‍රමාණයක් දෙනවා. රුපියල් 20,000 රුපියල් 40,000 අරගෙන ගිහිල්ලා දෙනවා. නමුත් ගරු ඇමැතිතුමා මගේ හැමදාම තිබුණු විවේචනය තමයි නිවාස දෙපාර්තමේන්තුව යටතේ අපි කරන වැඩ ටික, මේ සල්ලි ටික බෙද බෙදා අපි හැමදාම ඉන්නවාද? ඇත්ත වශයෙන්ම අමාත්‍යාංශයක් විධියට කල්පනා කරලා මීට වඩා වෙනස් තලයකට අපි නිවාස සම්බන්ධයෙන් යනවාද කියන කාරණාව තිබෙනවා. එතකොට ඒකට අදාළ ප්‍රතිපාදන පිළිබඳ ගැටළුවක් ඇති. ප්‍රතිපාදන පිළිබඳ ගැටළුව කොහොම වුණත්, අපි පර්යේක්ෂණාත්මක විධියට මිනිස්සුන්ට මීට වඩා - මේ නිකන් සෙවිලි තහඩුවක්, සිමෙන්ති කොට්ටයක් බෙදනවා වෙනුවට, ඇත්ත වශයෙන්ම අමාත්‍යාංශයක් විධියට හිතලා නිවාස දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සම්බන්ධ කරගෙන මීට වඩා එහා තලයකට ගියපු නිවාස වැඩ පිළිවෙළක් බස්නාහිර පළාත් සභාව විධියට අපට කරන්න බැරිද? අපි දන්නවා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, කොළඹ නගර සභාවේ මීට වඩා හොඳ නිවාස ව්‍යාපෘති කරනවා. ඒ අයට සල්ලි ඇති. සල්ලි තියෙන නිසා වෙන්න ඇති. අපි බස්නාහිර පළාත් සභාව මේ. බස්නාහිර පළාත් සභාවේ නිවාස අමාත්‍යාංශයයි මේ තිබෙන්නේ. එතකොට ඊට එහා ගියපු තත්ත්වයකට අපට යා යුතු වෙනවා. ඉතාම පොහොසත් පළාත් සභාවක් කියලා ගරු මහ ඇමැතිතුමා කිව්වේ.

ඉතින් ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අවසාන වශයෙන් මම මේ දේත් කියන්න ඕනෑ. ඇත්ත වශයෙන්ම අපි ඔබතුමාගේ අමාත්‍යාංශයට යනවා එනවා. අනෙක් අමාත්‍යාංශවලටත් යනවා එනවා. හැබැයි අපි තමුන්නාන්සේගේ අමාත්‍යාංශයේ කිසියම් වෙනසක් දකින බව ඇත්ත. තමුන්නාන්සේගේ සුහදශීලීත්වය පිළිබඳව අපි අගය කරනවා. ඒ වාගේම අපි දන්නවා තමුන්නාන්සේගේ අමාත්‍යාංශය දුවන්නේ කිහිප දෙනෙකුගේ මත. ඇත්ත වශයෙන්ම තමුන්නාන්සේගේ අමාත්‍යාංශ විෂයයන් දුවන්නේ - මම හැම අයවැයකම කියනවා. තමුන්නාන්සේගේ පෞද්ගලික ලේකම්වරු දෙදෙනා. මේ හැම මන්ත්‍රීවරයෙක් එක්ම පෞද්ගලිකව කථා කරලා, ඒ අයගේ තිබෙන කිසියම් අවශ්‍යතාවයක් සම්පූර්ණ කරලා දෙන්න, අපි ළඟට ඇවිල්ලා කථා කරගෙන යන අය. අර මෙතැන ඉන්න වසන්ත මහත්තයාත්, ඒ වාගේම කීර්ති මහත්තයාත්. ඉතින් මම දන්නේ නැහැ, අමාත්‍යාංශයේ ලේකම්වරිය ඇවිල්ලා ඉන්නවාද කියලා. ඇවිල්ලා ඉන්නවා නේද? සාරි නම් කිහිපයක් පේනවා. ඉතින් අමාත්‍යාංශයේ ලේකම්වරිය වුණත්, උපදේශක කාරක සභා හොඳට මෙහෙයවනවා. මංජුලා මහත්මිය. ඉතාම කාර්යක්ෂම ලෙස ඒවාට සම්බන්ධ වෙනවා. ඒත් එක්කම මේ අමාත්‍යාංශයේ ඉන්න නිලධාරී තන්ත්‍රය, විශේෂයෙන්ම අගය කරන්න ඕනෑ. ඔවුන් ඔවුන්ගේ පෞද්ගලික ප්‍රශ්න පැත්තකට දාලා - සුසන්ත. කාර්ය මණ්ඩලයේ සියලුදෙනා ඇත්ත වශයෙන්ම ඉතාමත් හොඳ ආදර්ශවත් විධියට, වෙනත් අමාත්‍යාංශ එක්ක සාපේක්ෂව බලද්දී ඉතාම ඉහළ ගියපු ආදර්ශයක් පෙන්වනවා. ඒ ආදර්ශය ඇත්ත වශයෙන්ම තමුන්නාන්සේගේ නිහතමානීකම නිසා වෙන්න ඕනෑ. ඉතින් ඒ තත්ත්වය තිබෙනවා.

ඉතින් මම විශේෂයෙන්ම මතක් කරන්නේ මේකේදී අපට පක්ෂයක් විධියට, අයවැයේදී වැය ශීර්ෂයේදී කිසියම් තීරණයක් ගන්න වෙන්නේ - ඇත්ත වශයෙන්ම මේ තිබෙන දේවල් සළකා බැලුවාම, තමුන්නාන්සේගේ අමාත්‍යාංශය පැත්තෙන් ගත්තාම තමුන්නාන්සේ වුණත් මහ ලොකු කාර්ය භාරයක් මේක අස්සේ පෙන්නලා නැහැ. මේ තිබුණු එක පවත්වාගෙන ආපු එක ඇත්ත. එහෙම නැතුව ඊට වඩා එහා තලයකට ගිහිල්ලා බස්නාහිර පළාත් සභාව ඇතුළේ ඉන්න මිනිස්සුන්ට මහ ලොකු සේවයක් කළාය කියන කාරණය පිළිබඳව මා තුළ තිබෙන්නේ කිසියම් විවේචනයක්. ඒක නිසා අවසාන වශයෙන් මම ප්‍රකාශ කරන්නේ තමුන්නාන්සේ මෙන්න මේ ගැන හිතලා විශේෂයෙන්ම මම කියපු විධියට මේ අමාත්‍යාංශය යටතේ දුවන ක්ෂේත්‍ර කිහිපයක් තිබෙනවා. ඒවා වඩාත් වැඩිදියුණු කරලා කිසියම් සේවයක් මහජනතාවට කිරීමට අවශ්‍ය වටපිටාව නිර්මාණය කරන්න කියන ඉල්ලීම මම මේ වෙලාවේ කරනවා. නැවත වතාවක් පෞද්ගලික කාර්ය මණ්ඩලයටත්, ඒ වාගේම නිලධාරී තන්ත්‍රයටත් මම ස්තුතිවන්ත වෙනවා.

[අ.භා.05.32]

**ගරු එම්. ෂාෆි රහීම්**
Hon. M Shafi Raheem

බිස්මිල්ලා රහුමාන් රහීම්. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අද මාර්ග හා ප්‍රවාහන, සමූපකාර සංවර්ධන හා වෙළඳ, නිවාස හා ඉදි කිරීම්, වතු යටිතල පහසුකම්, ග්‍රාම සංවර්ධන අමාත්‍යාංශ වැය ශීර්ෂයට කථා කරන්න වෙලාව ලබා දීම සම්බන්ධයෙන් මම ස්තූතිය පළ කරනවා. අද දින මේ අයවැයේදී ගරු ඇමැතිතුමා ගැන වචන ස්වල්පයකුත් කථා කරන්න ඕනෑ. එතුමා කටාන ප්‍රදේශයේ ඉපදිලා මේ පළාත් සභාවට හතර පාරකට වැඩිය පත් වෙලා, දෙවැනි වතාවටත් අමාත්‍ය ධූරය ලබාගෙන ගම්පහ දිස්ත්‍රික්කයේ සහ කොළඹ, කළුතර දිස්ත්‍රික්කවලට එතුමාගේ සේවය ලබා දෙනවා.

එතුමාගේ ප්‍රවාහන අංශය සම්බන්ධයෙන් අපි කථා කරන කොට, ප්‍රවාහන ක්ෂේත්‍රය දියුණු වෙලා තිබුණත් මහජනතාවගේ තවත් අවශ්‍යතා ඉටු විය යුතුයි. ගැබිණි මව්වරුන්ට ඒ වාගේම වයසක අයට, ආබාධිත අයට බස්වලට නඟින කොට අඩි 02 කට වැඩිය උස පා පුවරුවක් තිබීම ගැටළුවක්. ඒ වාගේම වයසක අයටත් නඟින්න අපහසු බව ගිය අයවැයේදීත් කථා කළා. මම ඒ ගැන මෙවරත් කථා කරනවා. ඒ ගැන අවධානය යොමු කරන්න. ඒක ලොකු දෙයක් නොවෙයි. ඇමැතිතුමා ඒ සම්බන්ධව නීතියක් පනවලා බස්වලට රූට් පර්මිට් ගැනීමේදී පා පුවරුව හයිඩ්‍රොලික්වලින් පාත් කරන විධියට තිබිය යුතුයි කියලා යම්කිසි නීතියක් දැම්මා නම් ඒක කරන්න පුළුවන් කියන එක මම හිතනවා. බස්වල යනකොට Mobile Phone Use කරන නිසා මගීන්ට USB Charger Pin එක්ක තිබීම හුඟක් ප්‍රයෝජනවත් වෙනවා කියලා මම හිතනවා. ඒ වාගේම තමයි මම ඇමැතිතුමාට අපේ මීගමුව ආසනයේ කොච්චිකඩේ සිට පෝරතොට හරහා මීගමුව රෝහල, ඒ වාගේම උසාවිය පැත්තට යන්න මම බස් එකක් දාන්න කියලා ඉල්ලලා තිබුණා. ඒ ගැන සාකච්ඡා වුණා. නමුත් කාලයත් එක්ක ඒක පොඩ්ඩක් කරන්න බැරි වුණා. නමුත් මේ අවුරුද්දේ අයවැයේදිවත් Route Permit එක්ක දීලා වාහනයක් දාලා දුන්නා නම්, හුඟක් ප්‍රයෝජනවත් වෙයි කියලා මම හිතනවා. ඒකේදී මුස්ලිම් ගම්මාන දෙකක්, පෝරතොටයි, පෙරියමුල්ලටයි යන්න ලොකු වියදමක් දරන්න සිද්ධ වෙලා තිබෙනවා. නමුත් එතුමාට පුළුවන් ඒකත් අපට හදලා දෙන්න.

ඒ වාගේම අපේ පාසල්වල කැඩුණු පුටු සැහෙන ප්‍රමාණයක් අයින් වෙලා තිබුණු වෙලාවක, අපි ඇමැතිතුමාගෙන් ඉල්ලුවාම එතුමාගේ ලේකම් කිත්සිරි සහෝදරයා ඒ වෙලාවේම අපට ප්‍රතිපාදන වෙන් කරලා දුන්නා. ඒ ඒ පාසල්වල වාඩි වෙන්න නැති අවස්ථාවක, බිඳුණු පුටු අලුත්වැඩියා කරලා, ඒ අවශ්‍ය ද්‍රව්‍ය දීලා හදලා දුන්නා. ළමයින්ට ඒ වැඩ සටහන හොඳ වැඩ සටහනක්. ඒක තවත් පුළුල් කරලා පළාත් සභා මන්ත්‍රීවරුන්ට තවත් ප්‍රතිපාදන වෙන් කරලා දුන්නා නම්, ඒක වටිනවා. අපට තිබෙන්නේ අපතේ යන දේවල් ආරක්ෂා කරලා, නාස්තිය අඩු කරලා, පුළුවන් තරම් ඒවාට අවශ්‍ය මුදල් ලබා දෙන්න අවශ්‍ය කටයුතු කරන්න ඕනෑ කියන එකයි. ඒ වාගේම කර්මාන්ත විෂයය ඇමැතිතුමාට තමයි තිබෙන්නේ. එහිදී අද රටට අවශ්‍ය කර්මාන්තකරුවන් ඇති කරන්න ඕනෑ. ආනයනය කරන එක, ඒ කියන්නේ Import කරන එක අපි පුළුවන් තරම් නවත්වන්න පුළුවන් ආකාරයට අපි කටයුතු කරන්න ඕනෑ. රටේ නිෂ්පාදනයක් තිබුණත් දහස් ගණනක් මිනිස්සුන්ට අපේ රටේ නිෂ්පාදනයෙන් ඒක ප්‍රයෝජනවත් වෙනවා.

ඇත්ත වශයෙන්ම කියනවා නම් සාමාන්‍යයෙන් අපි සපත්තුවක් පිටරටින් ගෙනාවොත් පුද්ගලයින් දෙදෙනෙකුට තමයි ඒකෙන් ලාභ ලබන්න පුළුවන් වෙන්නේ. Import කරන මිනිහාටත්, විකුණන මිනිහාටත් තමයි ලාභ ලබන්න පුළුවන් වෙන්නේ. අපි මෙහේ සපත්තු නිෂ්පාදනය කරනවා නම් ඒකේ තිබෙන හරක් හමවත් අරගෙන ෆැක්ට්‍රියට දුන්නොත් ෆැක්ට්‍රිකාරයා ලෙදර් එක නිෂ්පාදනය කළොත් රැකියා නොමැති අයට රැකියාවල් ලැබෙනවා. එහි සෑම කෙනෙකුටම හුඟක් ප්‍රයෝජනවත් වෙනවා. ඒ වගේම සපත්තු අඩිය ගත්තොත්, ඒ Factory එක අවට ඉන්න ජනතාවට ඒකේ සේවය කරන්න පුළුවන්. ඒ විතරක් නොවෙයි. ෂොක් ලයින්, ලේස්, කැන්වසින්, ප්‍රින්ට්‍රින් බොක්ස් එක වාගේ දේවල් අපේ රටේ නිෂ්පාදනය කරන කොට අපට පුළුවන් වෙනවා අපේ රටේ ජනතාවට මුදල් හම්බ කරන්න වැඩ පිළිවෙළක් ඇති කරන්න. මම අද යෝජනා කරනවා. සපත්තු නිෂ්පාදන කරුවෙකුට ටොප් එක හදනවා නම්, උඩ කෑල්ල හදනවා නම් එයා ඩිසයිනර් කෙනෙක් වෙන්න ඕනෑ. අපි දකිනවා හැමදාම රූපවාහිනියේ සිංදු යනවා. ඒවාට තෑගි බෝග දෙනවා. ඒවා අනවශ්‍ය දේවල් කියන්න බැහැ. නමුත් නිෂ්පාදනකරුවන්ට තෑගි බෝග දෙන්න පුළුවන් නම්, ඩිසයිනර් කෙනෙක්ව

[ ගරු එම්. ෂාෆි රහීම් ]

උනන්දු කරවන්න පුළුවන් නම් රටට වැඩදායි වෙනවා. ඒ නිසා අපට පුළුවන් නම් තරගයක් ඇති කරලා විශේෂයෙන් ගම්පහ, කොළඹ, කළුතර යන දිස්ත්‍රික්ක මට්ටමෙන් Designers ලා - නිර්මාණකරුවන්ව වැඩිපුර උන්නදු කරන්න. ඒ අය අතර තරගයක් තියලා කවුද හොඳට Design කරන්නේ, ඒ වාගේම ඉක්මණින් කරන්නේ කවුද කියලා නිෂ්පාදනකරුවන්ව අපි පුළුවන් තරම් උනන්දු කරන්න ඕනෑ. ඒ වාගේම එයාලාව අගය කරන්න මොකක් හරි දීමනාවක් දෙන්න පුළුවන් නම් වටිනවා. අද තාක්ෂණ අංශයෙන් හුඟක් දියුණු වෙලා තිබෙනවා. පුළුවන් නම් අපේ කර්මාන්තකරුවන්ව විදේශ රටවල්වල තිබෙන කර්මාන්තශාලාවලට ගෙනිහිල්ලා ඒ වාගේම Canton Fairs වාගේ ගෙනිහිල්ලා ඒවා පෙන්නලා ඒවාට ඒ අයව සම්බන්ධ කරන්න. ඒ අයගෙන් යම්කිසි මුදලක් අය කරගෙන, අපේ අමාත්‍යාංශයෙන් හරි භාගයක්වත් මුදලක් දාලා Canton Fairs වල ඒවා පෙන්නුවොත්, ඒ අය ඒවා දැක්කොත් ඒ Machineries දැක්කාම ඒ අයට පුළුවන් වෙනවා අද අතින් කපන එකට වඩා සේවයින් අඩු කරලා, Machineries දැම්මොත් ඒ අයගේ ආදායම් මාර්ග වැඩියෙන් ගන්න පුළුවන්. හොඳ Finishing එකක් ගන්න පුළුවන් තත්ත්වයට වැඩ පිළිවෙළවල් හදලා දෙනවා.

මම අමාත්‍යතුමාට කියන්නේ Designers ලාගේ පොඩි තරගයක් කරමු. අපි අනවශ්‍ය දේවල්වලට හුඟක් මුදල් වියදම් කරනවා. මේ නිෂ්පාදනකරුවන් අතර හැම එකක්ම සපත්තු කර්මාන්ත හෝ ජුවලිරි පැත්ත හෝ ඒ වාගේ අයව අරගෙන පොඩි තරගයක් හදලා, ඒ අයට යම් මුදලක් ගෙවන්න, ගිෆ්ට් එකක් වාගේ හදලා දෙන්න අවශ්‍ය කටයුතු කරන්න කියලා මම ඉල්ලනවා. ඉදිරියට මම මේ පිළිබඳව කථා කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. ගරු ඇමැතිතුමා නිතරම හම්බ වෙනවා. එතුමාගේ අමාත්‍යාංශයේ ලේකම්, පෞද්ගලික ලේකම් කීර්ති මහතා, වසන්ත මහතා, කිත්සිරි මහතා, ඇමැතිතුමාගේ පුතා එතුමන්ලාට ස්තුතිවන්ත වෙනවා. අපේ දායකත්වය ඇමැතිතුමාට නිසි ලෙස ලැබෙනවා කියමින් ඉදිරියට ඔබතුමාගේ අමාත්‍යාංශය හොඳම මහට යන්න කියලා ප්‍රාර්ථනා කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

[අ.භා.05.42]

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මෙම පළාත් සභාවේ ගම්පහ දිස්ත්‍රික්කය නියෝජනය කරන මන්ත්‍රීවරයෙක් හැටියට, ගම්පහ දිස්ත්‍රික්කය නියෝජනය කරන එකම ඇමැතිවරයා හැටියට, ඒ වාගේම මෙම අමාත්‍යාංශ උපදේශක කාරක සභාව නියෝජනය කරන මන්ත්‍රීවරයා හැටියටත් මෙම මුදල් ප්‍රකාශනයේදී ලලිත් වනිගරත්න ගරු ඇමැතිතුමාගේ අමාත්‍යාංශය වෙනුවෙන් කථා කරන්න අවස්ථාව ලබා දීම ගැන ස්තුතිවන්ත වෙනවා. විශේෂයෙන්ම මගේ කථාව ආරම්භ කරන්න ප්‍රථමයෙන් මම ස්තු තිවන්ත වෙන්න ඕනෑ, මේ ගෙවුණු වර්ෂයේ ඉතාමත් සාර්ථක විධියට උපදේශක කාරක සභා පවත්වලා ඒ අවශ්‍ය කරන පියවරවල් ගන්නට කටයුතු කරපු ලේකම්තුමියටත්, ඒ කාර්ය මණ්ඩලයටත්.

ඒ වාගේම අනෙක් අමාත්‍යාංශත් එක්ක සාපේක්ෂව කල්පනා කරන කොට මෙම අමාත්‍යාංශය ඇත්තටම සුහදශීලී නිලධාරී මණ්ලයක් ඉන්න අමාත්‍යාංශයක් හැටියට තමයි මම දකින්නේ. කවුරු මොන විධියට චෝදනා එල්ල කළත්, විශේෂයෙන් අමාත්‍යතුමාගේ පුත්‍රයා නුවන් ඇතුළු ඒ සියලු පෞද්ගලික කාර්ය මණ්ඩලයේ අයත් ඉතාමත් වගකීමෙන් සහ උවමනාවෙන් ඒ අමාත්‍යාංශයට අපි ගියාම අපේ කාර්ය භාරය ඉෂ්ට කරලා දෙනවා. දැන් මම වුණත් ඔය අමාත්‍යාංශයේ ඇමැති වුණා නම්, මම මගේ පුතාව තමයි පුද්ගලික ලේකම්ට ගන්නේ. මොකද, විශ්වාසවන්ත කෙනාව තමයි තියාගෙන ඉන්න ඕනෑ. අද චෝදනාවක් එල්ල කළා. මම දන්නේ නැහැ ඒක කොපමණ දුරට සාධාරණද කියලා. නමුත් එවැනි දේවල් මේ සභාවල් තුළ කථා නොකරනවා නම් හොඳයි කියන විශ්වාසය තමයි මගේ තිබෙන්නේ. ඊළඟට විශේෂයෙන්ම මෙම අමාත්‍යාංශය - අපේ සුනිල් වටගල ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ බොහෝ අංශ එක තැන තිබෙන්නේ. මේ අමාත්‍යාංශය බස්නාහිර පළාත් සභාවේ ලොකු ව්‍යාපාරයක් ලෙස සලකනවා නම් ආදායම් ලබන කොට්ඨාශ කිහිපයක්ම, අංශ කිහිපයක්ම තිබෙන්නේ මේ අමාත්‍යාංශයේ තමයි. ප්‍රවාහනය, පළාත් මාර්ග, සමුපකාර, කර්මාන්ත මේවා ඇවිල්ලා මෙතැනින් යන ඒවා නොවෙයි. සභාවට ආදායම් උත්පාදනය කරන අමාත්‍යාංශයක්. එතකොට ඒ අමාත්‍යාංශයට වඩා

නිර්මාණශීලී හැකියාවක් තිබෙන්න ඕනෑ, අලුත් අලුත් දේවල් දකින්න. අලුත් අලුත් දේවල් නිෂ්පාදනය කරන්න. අලුත් විධියට හිතන්න. මේ පළාතට උවමනා කරන විධියට (බාධා කිරීමක්) සැහෙන ලොකු ආදායම් ලබන්න පුළුවන් අමාත්‍යාංශයක්. ඒක නිසා මීට වඩා දියුණු තත්ත්වයකට මේ අමාත්‍යාංශය පත් කර ගන්න පුළුවන්. නමුත් මට පේන ස්වරූපය අනුව එකතැන පල් වෙලා තිබෙන, වැඩ කටයුත්ත කරගෙන යනවා මිසක් එතැනින් එහාට යන්න උත්සාහයක් දරන පාටක් නැහැ.

ඒ වාගේම තමයි මම චෝදනා කරන්න ඕනෑ තැන්වල චෝදනා කරන්න ඕනෑ. අපි පළාත් සභා මන්ත්‍රීවරු හැටියට Bus Halt සෑදීමේදී අපේ මුහුණ දාලා හදලා තිබුණා. නමුත් ඒ ව්‍යාපෘතිය බොහොම අසාර්ථකයි. අද කොළඹ මීගමුව පාරේ ගිහිල්ලා බලන්න, අපේ පළාත් සභා මන්ත්‍රීවරුගේ රූපය දාපු Bus Halt සතියයි, දෙකයි, තුනයි, හතරයි, පහයි, කඩලා ගියා. මම මේ පිළිබඳව මාස හයක් තිස්සේ කියනවා. අනේ මගේ අහවල් තැන තිබුණු එක කඩලා ගිහිල්ලා කියලා. අද වනකල් ඒ පිළිබඳව ක්‍රියාත්මක වුණේ නැහැ. හේතුව මොකක්ද කියලා දන්නේ නැහැ. Bus Halt වල ගුණාත්මක භාවය ඒ තරම් සාර්ථක මට්ටමක නැහැ. ඒ චෝදනා එන්නේ ඔබතුමාට තමයි. මේ පිළිබඳව අමාත්‍යවරයා හැටියට ඔබතුමා වග කියන්න ඕනෑ. නමුත් අංශ පත් කරලා තිබෙනවා නම්, ක්‍රියාත්මක වෙලා මේ පිළිබඳව කටයුතු කරන්න ඕනෑ. ඒක නිසා මම විශේෂයෙන්ම ඉල්ලා සිටිනවා. අඩුම ගණනින් මේ අවුරුද්ද ඉවර වෙන්න ඉස්සෙල්ලාවත් - ඔබතුමා කතෝලිකයෙක්. අපේ දිස්ත්‍රික්කය නියෝජනය කරන්නේ. අපට දෙන නත්තල් තෑග්ග හැටියටවත් ඒ Bus Halt ටික හදලා අවසන් කරලා දෙන්න.

**ගරු සුමිත් විජයමුණි ද සොයිසා**
Hon. Sumith Wijayamuni De Soysa

අසාර්ථකයි කියන්නේ Bus Halt හදන්න එපැයි කියන්නේ නැහැ නේ? ශක්තිමත්ව හදන්න කියලා කියන්නේ.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

හදලා තිබෙන ටික හයි කරලා දෙන්න. ශක්තිමත්ව හයි කරලා දෙන්න. ඒක තමයි ඉල්ලීම. ඇත්ත වශයෙන්ම ශක්තිමත්ව හදන්න කියලා තමයි කියන්නේ. එම ඉල්ලීමත් කරමින් තමුන්නාන්සේගේ විෂයය යටතට ගැනෙන පළාත් මාර්ග සම්බන්ධයෙන් වචන ස්වල්පයක කථා කරන්න ඕනෑ. අර කිව්වා වාගේ මම වත්තල ප්‍රාදේශීය සභාවේ සභාපති ධුරයට පත් වුණේ 1991 කාලයේදී. ඒ කාලයේ තමයි පළාත් පාලන ආයතන විසින් පළාත් සභාවෙන් ඉල්ලුවේ, මොනවාද පළාත් මාර්ග විධියට පළාත් සභාවට පවරා ගන්න ඕනෑ කියලා. ඉතින් මගේ අත්සනින් දීපු පාරවල් ටික තමයි තිබෙන්නේ. අදටත් එක අඟලක් ඊට වැඩිය මේ පළාත් සභාවට පවරාගෙන නැහැ. ඇත්ත වශයෙන්ම ඒක කනගාටුදායක කරුණක්. තමුන්නාන්සේත් ඔය කොළඹ, මීගමුව පාරේ යනවා. කොළඹ මීගමු පාරේ තොටලඟ ඉඳලා ජා-ඇළ යන්න පැය 1 1/2 ක් යනවා. මොකක්ද හේතුව? වත්තල හන්දිය, හැඳල හන්දිය, මහබාගේ හන්දිය, කඳාන, ජා-ඇළ. මේ ස්ථාන හතරම මංසන්ධි. ඒ මංසන්ධි ප්‍රධාන කොළඹ - මීගමු පාරට සම්බන්ධ වෙන්නේ, පළාත් මාර්ගවලින්. එතකොට පළාත් මාර්ගවල තමයි හැඳල හන්දියෙන් ආවොත් එහෙම ඇවරිවත්ත පාර, එහෙම නැත්නම් ඇළකන්දට යන පාර, මහබාගෙන් ආවොත් රාගම පාර, කඳානට ගියොත් කඳාන දුම්රියපොළ පාර, මේ ඔක්කෝම පළාත් මාර්ග ඇවිල්ලා තමයි ප්‍රධාන පාරට සම්න්ධ වෙන්නේ. යහපාලන ආණ්ඩුව ආපු කාලේ මහ මාර්ග ඇමැතිවරයාට පෞද්ගලිකව මම යෝජනාවක් කළා උඩින් ගුවන් පාලම් ටිකක් දාලා දෙන්න. එහෙම වුණොත් මේ තිබෙන මාර්ග තදබදය 50% ක් අපට අඩු කර ගන්න පුළුවන් කියලා. මොකද, මේ අතුරු පාරවල්වලට හරවන්න ගියාම තමයි කොළඹ මීගමු පාරේ මේ තදබදය තිබෙන්නේ. ඒ නිසා ඒවා ගැන කථා වුණේ නැහැ. පළාතේ පළාත් මාර්ග ඇමැතිවරයා හැටියට මේ පිළිබඳව කටයුතු කරන්න තමුන්නාන්සේටත් වගකීමක් තිබෙනවා.

ඊළඟට විශේෂයෙන්ම මම කියන්න ඕනෑ. මම දන්නේ නැහැ ඇයි එහෙම වෙන්නේ කියලා. මේ පළාත් මාර්ග එකේ ඇස්තමේන්තු සකස් කිරීමේදී හරි වැඩි වියදම් සහිත ඇස්තමේන්තුවක් තමයි සකස් කරන්නේ. මම ළඟදී දවසක් කොළඹ මීගමු පාරට සම්බන්ධ වැලිසර එහෙම නැත්නම් වැලිසර - ඇලපිටිවල මාර්ගය කියලා කියනවා. ඒ පාර ඇස්තමේන්තු කරලා දෙන්න කියලා කිව්වා, දෙපැත්ත හදලා ඒ තිබෙන ඒවා පොඩ්ඩක් කරන්න කියලා. මට හිතාගන්න බැරි ඇස්තමේන්තුවක් තමයි මේ පළාත් මාර්ගයෙන් ඉදිරිපත් කරන්නේ. මට හිතාගන්න බැහැ එපමණ අධික මුදලක් දරන්න සිද්ධ වෙන්නේ ඇයි කියලා ඇස්තමේන්තු හදද්දී. ඒ නිසා ඒ ගැන පොඩ්ඩක් සොයා බලන්න.

[ ගරු සිරිකමල් පිලිෂියන් ද සිල්වා ]

අසාමාන්‍ය ඇස්තමේන්තුවක් හදන්නේ. රුපියල් ලක්ෂ 50 න් කරන්න තිබෙන වැඩේට රුපියල් ලක්ෂ 90 ක් විතර දානවා. ඒ වාගේ. හිතාගන්න බැහැ. ඉතින් ඒ නිසා තමුන්නාන්සේ පොඩ්ඩක් සොයා බලන්න. මේ හැම එකකටම ඔබතුමාට වග කියන්න බැහැ. නිලධාරීන් ඉන්නවා. නිලධාරීන්ට තාක්ෂණික උපදෙස් දීලා තිබෙනවා. ඒ අය පොතේ විධියට යනවා කියන එක නොවෙයි මම මේ කියන්නේ. නමුත් ඊට වඩා විශාල වරදක් මෙතැන සිද්ධ වෙනවා. ඒක නිසා ඔබතුමා ඒ පිළිබඳව සොයා බලන්න කියලා ඉල්ලීමක් කරනවා. ඒ වාගේම තමයි මම වැඩිපුර කථා කරන්න යන්නේ නැහැ. අර බිඳුණු පුටුවට දැතේ සවිය වැඩ සටහන ඉතාමත් සාර්ථකව ඔබතුමාගේ කර්මාන්ත අමාත්‍යාංශයෙන් පසුගිය කාලයේ අපේ ඉල්ලීම්වලට අනුව වැඩ කටයුතු කරලා දුන්නා. ඒක ටිකක් වැඩි කරන්න. ඒක ටිකක් වැඩි කළාම - ඇත්ත වශයෙන්ම එක මන්ත්‍රීවරයෙකුට අවස්ථාවක් දෙකක් තමයි ලැබුණේ. තව මාස හතර පහක් ලබන අවුරුද්දේ තියෙයි කියලා විශ්වාස කරනවා. අඩුම ගණනේ මාස හතරක්වත් තියෙයි කියලා. ඒ කාර්ය මණ්ඩලය ගෙනැල්ලා ඒ කටයුත්ත ඉක්මණින්ම කරලා දෙන්න.

ඒ වාගේම තමයි විශේෂයෙන්ම මේ නිවාස ආධාර වැඩ පිළිවෙළ. තමුන්නාන්සේ දන්නවා මේ ආණ්ඩුව එනකොට ඩොලර් එක රුපියල් 160 ට තිබුණේ. අද රුපියල් 185 ක තත්ත්වයට ගිහිල්ලා තිබෙනවා. ඉතින් මේ බඩුවල මිල හැමදාම එක තත්ත්වයක පවතින්නේ නැහැ. රුපියල් 75,000 ක පමණ මුදලක් තමයි උපරිමය නිවාස ආධාරයක් විධියට දෙන්නේ. රුපියල් 75,000 කින් මොනවද කරන්න පුළුවන්? සිමෙන්ති කොට්ට 10 ක් ගෙනැල්ලා, වැලි ටිකක් ගෙනැල්ලා කපරාරු කර ගන්න ගියාම, කුළිය දීපුවාම ඉවරයි. ඒ නිසා නිවාස ආධාර ගන්න මිනිහාටත් ප්‍රයෝජනවත් වන විධියට, දෙන මිනිහාටත් පිනක් සිද්ධ වන විධියට නිවාස ආධාරයක් දෙන කොට අඩුම තරමින් රුපියල් ලක්ෂයකට වැඩියෙන් තමුන්නාන්සේ තීරණය කරලා ලබන අවුරුද්දේ ඒ පිළිබඳව කටයුතු කරන්න කියන කාරුණික ඉල්ලීම මම මේ වෙලාවේ කරන්න කැමැතියි. ඒ වාගේම තමයි විශේෂයෙන්ම පළාත් මාර්ග ගැන කථා කරන කොට වත්තල ආසනයට සම්බන්ධ වන වැලිකඩමුල්ල පාර. මේක පිළිබඳව මම හිතන්නේ පසුගිය දවස්වල විශාල ආන්දෝලනාත්මක කථාත් සිද්ධ වුණා. ඒ නිසා ඔබතුමාගෙන් මම ඉල්ලීමක් කරනවා. පැච් දාලා, කොත්තු රොටි ගහනවා වාගේ නම් මේ වැඩේ කරන්න එපා. ඇත්ත වශයෙන්ම මේක හරි අසාධාරණයි. අපි කියපුවාම ඇවිල්ලා කරනවා. ඊට පස්සේ සුමානයයි, දෙකයි. දැන් මාස තුනක් විතර තිස්සේ ඉඳලා එක දිගට වහිනවා. PRDA පාරවල්. මම කියන්නේ නැහැ වෙන පාරවල් හදන්න කියලා. PRDA පාරවල්. මේ පාරවල් හදද්දී ඇස්තමේන්තුව ගැනත් හිතලා බලන්න. වඩාත් ශක්තිමත් විධියට මේ මාර්ග සකස් කරලා දෙන්න කියන ඉල්ලීමත් කරනවා. විශේෂයෙන්ම වැලිකඩමුල්ල පාරත්, වැලිසර ඇලපිටිවල, ඒකට කියන්නේ ෂෙල්ටන් ජයසිංහ පාර කියලා. ඒ පාරවල්දෙක සම්බන්ධ කරලා දෙන්න කියන ඉල්ලීම කරනවා.

ඒ වාගේම තමයි තමුන්නාන්සේගේ අමාත්‍යාංශය යටතේ ග්‍රාම සංවර්ධන සමිති තිබෙනවා. මේවා ඔක්කෝම තිබෙන්නේ නාමිකව. මේ ග්‍රාම සංවර්ධන සමිති තිබෙන්නේ ප්‍රාදේශීය සභාවේ, නගර සභාවේ කොන්ත්‍රාත් කරන්න පිහිටුවා ගත්තු සභාපති, ලේකම්, භාණ්ඩාගාරික නිල වශයෙන් ලියාපදිංචි කරපු ග්‍රාම සංවර්ධන සමිති. ඒවාවලට කොන්ත්‍රාත් එක භාර දුන්නාම, කොන්ත්‍රාත් කරන්නේ වෙන කෙනෙක්. ග්‍රාම සංවර්ධන සමිතියට 5% ක් හරි කියක් හරි මුදලක් හම්බ වෙනවා. 5% යි. අර කරන කෙනෙක් දන්නවා. එතකොට ඒකෙන් තමයි අර ඉන්න නිලධාරී මණ්ඩලය යැපෙන්නේ. ඒගොල්ලෝ විනෝද ගමන් යනවා. විවිධ ව්‍යාපෘති කරනවා. මේක ඇත්තටම වැරැදි වැඩක්. ග්‍රාම සංවර්ධන සමිතියක් කියන්නේ කොන්ත්‍රාත් කරන සමිතියක් නොවෙයි. කොන්ත්‍රාත් කරන එක ඒකේ අතුරු කථාවක්. සිරිකමල් කියන දේශපාලන චරිතය ග්‍රාම සංවර්ධන සමිතියක සභාපතිවරයෙක් හැටියට තමයි දේශපාලනයට අවතීර්ණ වුණේ. මම ඔක්කෝම කියලා කියන්නේ නැහැ. බහුතරය එහෙම තමයි. ඒ නිසා මේ ගැන පසුවිපරමක් කරන්න කියන ඉල්ලීම තමුන්නාන්සේගෙන් මම ඉතාමත්ම කරුණාවෙන් ඉල්ලා සිටිනවා.

ඒ වාගේම සමුපකාර ව්‍යාපාරය කථා කළ යුතුම මාතෘකාවක්. අද මේ රටේ තිබෙන ප්‍රශ්නය මොකක්ද? අපේ පාර්ලිමේන්තුව තාවකාලිකව වැඩ තහනමට ලක් කරලා මොකක්ද ඉල්ලන්නේ? ඒකාබද්ධ විපක්ෂය ඉල්ලන්නේ මැතිවරණයක්. බොහොම පැහැදිලිව මැතිවරණයකට තව අවුරුදු 3 ½ ක විතර කාලයක්

තිබෙනවා. 2020 විතර වනකල්. නමුත ඉල්ලන්නේ මැතිවරණයක්. අපි දන්නවා මේ රටේ ඡන්ද තියෙනවා. ජනාධිපතිවරණ ඡන්දය තිබෙනවා. පාර්ලිමේන්තු ඡන්දය තිබෙනවා. පළාත් සභා ඡන්දය තිබෙනවා. පළාත් පාලන මැතිවරණය තියෙනවා. ඔය සමූපකාර ඡන්දය තමයි ගම්වල තිබෙන පොඩිම ඡන්දය. (බාධා කිරීමක්) නමුත් අද තමුන්නාන්සේගේ අමාත්‍ය ධූරය දරන කාලේ සමූපකාරවල බලය ඉවර වුණු ඒවායේ කීයක ඡන්දය තියලා තියෙනවාද කියලා තමුන්නාන්සේම හෘදය සාක්ෂියට තට්ටු කරලා බලන්න. ඒක තමයි කියන්නේ. නාම යෝජනා පත්‍ර උදුරපු එකත් මේ කාල සීමාවේ විතරක් නොවෙයි. මීට අවුරුදු 10 කට 15 කට ඉස්සෙල්ලාත් නාම යෝජනා පත්‍ර උදුරාගෙන ගිහිල්ලා තිබෙනවා. ඒ නිසා නාම යෝජනා පත්‍ර උදුරාගෙන ගිය හේතුවෙන්ම සමූපකාර ඡන්දය කල් දානවා කියන කථාව වැරැදියි. සම්පූර්ණ වැරැදි කථාවක්. නමුත් ඒකේ අවශ්‍යතාවයක් තිබුණේ නැහැ. මධ්‍යම රජයට හරි, විෂයය භාර අමාත්‍යවරයාට හරි, දේශපාලන අභිමථාර්තයක් මුදුන්පත් කර ගන්න හරි ඒ ඡන්ද පැවැත්වුයේ නැහැ. සමූපකාර කියලා කියන්නේ යූ.එන්.පී.ද, ශ්‍රී ලංකාද, ජේ.වී.පී. ද කියලා නැහැ. එතැන හිටියේ ගමේ සමූපකාර සේවයට කැමැති මිනිස්සු. ස්වෙච්ඡාවෙන් ඉදිරිපත් වෙලා ඒ සමූපකාර දියුණු කරන්න.

මම හොඳ උදාහරණයක් කියන්නම්. මම පෙත්සම් කාරක සභාවේ සාමාජිකයෙක් හැටියට ඉන්නවා. පෙත්සමක් දාලා තිබුණා ජොර්ජ් පෙරේරා ප්‍රධාන සංවිධායකතුමා මාර්ගයෙන්. සිංහාරමුල්ල කැලණිය විවිධ සේවා සමූපකාර සමිතියට විරුද්ධව තමයි ඒ පෙත්සම ආවේ. සිංහාරමුල්ල සමිතියට අයිති කඩ කාමරය නැවත ඉල්ලලා. එක්දහස් නවසිය හතළිස් ගණන්වල ඒක සද්භාවයෙන් දීලා තිබෙනවා රුපියල් පනහකටද, කීයකටද. දැන් එතැන ව්‍යාපාරයක් කෙරෙන්නේ නැහැ. අපි ගිහිල්ලා පෙත්සම් කාරක සභාවෙන් ස්ථානීය පරීක්ෂණයක් කරලා බැලුවා. එතැන ගෑස් ටින් ටිකක් තියාගෙන ඉන්නවා. කොපි පොත් පැන්සල් පොත් ටිකක් තියෙනවා. ගැහැණු ළමයෙක් ඉන්නවා. මම ඇහුවා පඩිය කීයක් දෙනවාද කියලා. රුපියල් 3500/- ක්ද ඔන්න කීයක්ද පඩියක් දෙනවා කිව්වා. කිසිම වෙළඳාමක් වෙන්නේ නැහැ. බොහොම සුළු ගණනයි දවසකට යන්නේ. දැන් ඒ ඉඩම අයිති කෙනා වයසක ගුරුවරියක්. විශ්‍රාම ගිහිල්ලා, මුණුබුරාට ගේ හදාගන්න කියලා ඉල්ලනවා. ඉල්ලනවා, ඉල්ලනවා දුන්නේ නැහැ. පෙත්සම් කාරක සභාවෙන් ස්ථානීය පරීක්ෂණයක් කරලා ලිඛිතව කිව්වා, මේක දෙන්න කියලා. ශත පහකට ගණන් ගත්තේ නැහැ. සභාපති ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩලය. තමුන්නාන්සේ ළඟට කීපාරක් ගෙනාවද? ශත පහකට ගණන් ගත්තේ නැහැ. ඉතින් මෙවැනි සමිති මොනවාටද? වුණු දේ දන්නවාද? අර විශ්‍රාමික විදුහල්පතිතුමිය ගිහිල්ලා - මම බොහොම වගකීමෙන් මේ කථාව කියන්නේ. සභාපතිතුමාට කිව්වා, මට මේක කරලා දෙන්න මගේ දරුවාගේ ප්‍රශ්නය විසඳන්න කියලා. රුපියල් ලක්ෂ පහක් අපට දෙන්න. අපි දෙන්නම් කිව්වා. ලක්ෂ පහ දෙන්න එකඟ වුණා. ඊට පස්සේ සතියේම සමූපකාරය ගලවාගෙන ගියා. මොකක්ද මේ? අපි පෙත්සම් කාරක සභාවෙන් තීන්දුවක් දීලා, තමුන්නාන්සේ ඇමැතිවරයා විධියට ආයාචනය කරලා, එහෙම පාලනය කර ගන්න බැහැ නේ? මේක තමයි ඇත්ත තත්ත්වය.

මේ සමූපකාර සමිතිවල තත්ත්වය පිළිඳව තමුන්නාන්සේට මම දෝෂාරෝපණයක් කරනවා නොවෙයි. පාර්ලිමේන්තු ඡන්දය තියන්න ඉස්සෙල්ලා, ජනාධිපති ඡන්දය තියන්න ඉස්සෙල්ලා, අපි විශ්වාස කරනවා මේ පළාත් සභාවේ ඡන්දය ලබන අවුරුද්දේ අප්‍රේල් මාසෙන් පස්සෙන් කොයි මොහොතක හරි එයි කියලා. ඒක එන්න ඉස්සෙල්ලා මේ සමූපකාර ටිකේ නිලවරණය පවත්වලා සමූපකාරයට ආදරය කරන මිනිස්සුනට මේක දෙන්න. නාම යෝජනා පත්‍ර උදුරගෙන දිව්වා අතීතයේ ඒ වාගේ ඕනෑතරම් කතන්දර තිබ්බා. එහෙම තිබුණා කියලා මේක නොතියා ඉන්න කාරණාවක් නොවෙයි නේ? ඒක නිසා මම ඔබතුමාගෙන් ඒ ඉල්ලීමත් කරමින් විශේෂයෙන්ම ඔබතුමා ඇහුම්කන් දෙන ඇමැතිවරයෙක්. කොපමණ බැන්නත්, මොතරම් චෝදනා එල්ල කළත් ඔබතුමා ඇහුම්කන් දීලා ඒ වැඩේ කරන්න ඕනෑ වෙලාට වැඩේ කරනවා. මම බොහෝ අවස්ථාවල ඔබතුමාට දුරකථනයෙන් කථා කරලා විශේෂයෙන්ම අපේ පල්ලිවල මංගල්‍ය, වෙන මොනවා හරි උත්සවයක් තියෙන කොට කියනවා අනේ මේ පාර පුළුවන් තරම් ඉක්මණින් මොනවා හරි කරලා දෙන්න කියලා. ක්ෂණිකව ඔබතුමා ක්‍රියාත්මක වෙලා නිලධාරීන් යොදවලා ඒ වැඩේ කරලා දීලා තිබෙනවා.

[ ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා ]

ඒ පිළිබඳව ස්තුතිවන්ත වෙමින් නැවත වතාවක් කෘෂිකර්ම අමාත්‍යාංශයේදී අවසානයේදී කරපු කථාවම තමයි කියන්න සිද්ධ වෙන්නේ. අද රටේ දේශපාලන තීන්දු තිබෙනවා. අද විශාල ව්‍යාකූල තත්ත්වයක අපි ඉන්නේ. පළාත් සභාවේ අයවැයට ඡන්දය පාවිච්චි කරන කොට අපට ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙන වෙලාවක්. ඒ නිසා තමුන්නාන්සේලාගේ කණ්ඩායම ශක්තිමත් කරලා මෙය ජයග්‍රහණය කර ගන්න කියන ඉල්ලීම කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මේ අවස්ථාවේ ගරු සභාපතිතුමා මූලාසනයේ අසුන් ගන්නවා ඇති.

***ඊට අනුකූලව ගරු නියෝජ්‍ය සභාපතිතුමා [යසපාල කෝරලගේ මහතා ] මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනාරූඪ විය.***
*Accordingly the Hon. Deputy Chairman [Mr. Yasapala Koralage] left the Chair and Hon. Chairman [Mr. Sunil Wijeratne] took the Chair*

***පූර්ණ කාරක සභාව නැවත පළාත් සභා තත්ත්වයට පත් කිරීම.***
*THE PROVINCIAL COUNCIL RESUMED.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මේ අවස්ථාවේදී පූර්ණ කාරක සභාව පළාත් සභාව බවට පත් කරනවා.

***ඊට අනුකූලව ප.ව. 05.59 ට පූර්ණ කාරක සභාව පළාත් සභාව බවට පත් විය.***
*Accordingly at 05.59 p.m. the Provincial Council resolved it self in to a committee of the whole Council.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මේ අවස්ථාවේ පූර්ණ කාරක සභාව පළාත් සභාව බවට පත් වුවා. කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග, ධීවර, සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සහ ගොවිජන සංවර්ධන අමාත්‍යාංශ වැය ශීර්ෂයන් පිළිවෙළින් 106, 117, 118, 119 හා 120 යන ශිර්ෂයන් යටතේ විවාදය 2018.12.05 වන දින පස්වරු 03.00 ට ආරම්භ කොට - පොඩ්ඩක් සභාවේ කාලය දීර්ඝ කරලා දෙන්න.

## පූර්ණ කාරක සභාවේ කාලය දීර්ඝ කිරීම
EXTENDING THE DURATION OF COMMITTEE OF THE WHOLE COUNCIL

**ගරු ලලිත් වනිගරත්න** (මාර්ග, ප්‍රවාහන, සමුපකාර සංවර්ධන හා වෙළඳ, නිවාස හා ඉදි කිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රාම සංවර්ධන අමාත්‍යතුමා)
Hon. Lalith Wanigarathne (Minister of Roads, Transport, Cooperative Development and Trade, Housing and Construction, Estate Sector Infrastructure Facilities, Industries and Rural Development)

ගරු සභාපතිතුමනි, *"අද දින සභාවේ වැඩ කටයුතු අවසන් වනතුරු සභාවේ කාලය දීර්ඝ කළ යුතු යැයි"*යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

**[පූර්ණ කාරක සභාවේ ප්‍රගතිය ]**
[Progress of the whole council]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

2018.12.05 වන දින පස්වරු 03.00 ට ආරම්භ කොට පස්වරු 06.00 දක්වා පැවැති අතර, එකී වැය ශීර්ෂයන් පිළිබඳ විවාදය එදින අවසන් නොවූ අතර, එදින තාවකාලිකව අත්සිට වූ විවාදය 2018.12.06 වන දින එනම් අද දින පෙරවරු 09.00 ට ආරම්භ කොට පෙරවරු 10.15 දක්වා පැවැත්විණි. ඒ අනුව එකී අමාත්‍යාංශයේ වැය ශීර්ෂයන් යටතේ විවාදයට අමාත්‍යතුමා සමග ගරු මන්ත්‍රීවරු 21 දෙනෙකු සම්බන්ධ වූ අතර, විවාදය අවසානයේ බෙදීමක් ඉල්ලූ බැවින් ශීර්ෂ අංක 106, 117, 118, 119 හා 120 යන වැය ශීර්ෂයන්ට පක්ෂය ඡන්ද 53 ක්ද, විරුද්ධව ඡන්ද 32 ක්ද, වැළකුණු ඡන්ද 00 ක්ද යනුවෙන් බෙදුණු අතර, එම වැය ශීර්ෂයන් වැඩි ඡන්ද 21 කින් සභා සම්මත වූ බව ප්‍රකාශ කරනවා.

ඉන් අනතුරුව ආරම්භ කරන ලද්දේ ශීර්ෂ අංක 108, 126 වැය ශීර්ෂයන්ට අදාළව අධ්‍යාපන හා සංස්කෘතික, කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යාංශයේ ප්‍රදානයන් පිළිබඳව සලකා බැලීමේ විවාදයයි. එකී විවාදය අද දින පෙරවරු 10.15 සිට පස්වරු 03.00 දක්වා පැවැති අතර, එකී අමාත්‍යාංශයේ වැය ශීර්ෂ යටතේ විවාදයට අමාත්‍යතුමා සමග ගරු මන්ත්‍රීවරුන් 22 දෙදෙනෙකු සම්බන්ධ විය. ඒ පිළිබඳව බෙදීමක් ඇති වූ

නිසා ඡන්ද විමසීමේදීඑම වැය ශීර්ෂයන්ට පක්ෂව ඡන්ද 52 ක්ද, විරුද්ධව ඡන්ද 34 ක්ද, වැළකුණු ඡන්ද 00 ක්ද යනුවෙන් බෙදුණු අතර, එම වැය ශීර්ෂයන් වැඩි ඡන්ද 18 කින් සභා සම්මත වූ බව ප්‍රකාශ කර සිටිනවා.

ඉන් පසුව ආරම්භ කරන් ලද්දේ ශීර්ෂ අංක 107, 121, 122, 123, 124, 125 හා 103 වැය ශීර්ෂයන්ට අදාළ මාර්ග, ප්‍රවාහන, සමූපකාර සංවර්ධන හා වෙළඳ, නිවාස ඉදි කිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රාම සංවර්ධන පිළිබඳ අමාත්‍යාංශයේ වැය ශීර්ෂයන් සලකා බැලීමේ විවාදයයි. අද දින පස්වරු 03.30 ට ආරම්භ වූ එකී විවාදය පස්වරු 06.00 දක්වා පැවැත්වුණු අතර, මෙදින අවසන් නොවූ විවාදය හෙට දින එනම්, 2018.12.07 වන දිනට කල් තැබූ බව පූර්ණ කාරක සභාවේ ප්‍රගතිය වශයෙන් ගරු මන්ත්‍රීතුමන්ලාට දැනුම් දෙනවා.

## කල් තැබීම
## ADJOURNMENT

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

*"දැන් මම මෙම සභාව කල් තබනවා."*

***ඊට අනුකූලව පළාත් සභාව අ.භා. 06.03 ට, 2018 දෙසැම්බර් මස 07 වන දින පූ.භා. 09.00 වන තෙක් කල් ගියේය.***

*Accordingly, the Provincial Council was adjourned at 06.03 p.m till 09.00 a.m, on 07.12.2018*